පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය ආර්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



# සංයුත්ත නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 2**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැඟීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 දෙසැම්බර්

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ දහවෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ නිදාන වර්ගයේ සංයුත්ත දෙකක් අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයර්‍යරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයර්‍යරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

20 - 9 - 54

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංගායනාවෝ

භාරතයේ පැවැත්වූ ශාසනයේ පිරිසිදු බැව් අපෙක්ෂාවෙන් කළ ධර්මසංගායනා තුන සහ ලංකාවේ පැවැත්වූ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ සංගායනාවද යන සංගායනාවෝ ප්‍රධාන වෙති. ධර්මය ලිවීම බුද්ධ කාලයේදී කෙරුණු බවට සාක්ෂ්‍ය තිබේ.

ප්‍රථම සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකට පසු 'අජාසත්' රජුගේ විශෙෂ අනුග්‍රහයෙන් රජගහනුවර 'සප්තපර්ණි'නම් ගල්ලෙනෙහිදී මහ කාශ්‍යප ස්ථවිරයන් ප්‍රධාන 500 ක් රහතුන් විසින් සත්මසකින් නිමකරණ ලදී.

දෙවෙනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයන් අවුරුදු 100 ක් ගතවූ පසු 'කාලාශොක' රජුගේ අනුග්‍රහයෙන් විශාලාමහනුවර වාළුකාරාමයේදී 'රේවත' ස්ථවිරයන් ප්‍රධාන 700 ක් රහතුන් විසින් අටමසකින් නිමවන ලදී.

තෙවෙනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 236 ට පසු 'ධර්මාශොක' රජුගේ අනුග්‍රහයෙන් පැළලුප් නුවර අශොකාරාමයේදී 'මොග්ගලිපුත්ත' ස්ථවිරයන් ප්‍රධාන 1000 ක රහතුන් විසින් නවමසකින් නිමවන ලදී.

ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම පෙර සිට පැවති නමුත් ලංකාවේ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 440 ක් ගතවූ පසු වලගම්බා රජුගේ අනුග්‍රහයෙන් මාතලේ අලුලෙනෙහිදී කරනලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


පිට

2. නිදාන වර්ගය

1. අභිසමය සංයුත්තය 373

(1) බුද්ධ වර්ගය 373

(2) ආහාර වර්ගය 422

(3) දසබල වර්ගය 457

(4) කළාරඛත්තිය වර්ගය 495

(5) ගහපති වර්ගය 546

(6) දුක්ඛ වර්ගය 574

(7) මහා වර්ගය 600

(8) ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගය 673

(9) අන්තර පෙය්‍යාලය

1. සත්ථු වර්ගය 684

2. සික්ඛා වර්ගය 692

3. යෝග වර්ගය 700

4. ඡන්ද වර්ගය 708

5. උස්සෝළ්හී වර්ගය 716

6. අප්පටිවානී වර්ගය 724

7. ආතප්ප වර්ගය 733

8. විරිය වර්ගය 741

9. සාතච්ච වර්ගය 749

10. සති වර්ගය 757

11. සම්පජඤ්ඤ වර්ගය 765

12. අප්පමාද වර්ගය 773

(10) අභිසමය වර්ගය 781

2. ධාතු සංයුත්තය

(1) නානත්ත වර්ගය 794

(2) සත්තධාතු වර්ගය 815


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය

# 2 නිදාන වර්ගය

## 1. අභිසමය සංයුත්තය.

(නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස)

## 1. බුද්ධ වර්ගය

### පටිච්ච සමුප්පාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. "මහණෙනි, පටිච්ච සමුප්පාදය දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙමියි" "එසේය ස්වාමීනියි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළ සේක.

3. "මහණෙනි, පටිච්චසමුප්පාදය නම් කවරේද? මහණෙනි, අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාර නිසා විඥ්ඥාණයෝද, විඥ්ඥාණය නිසා නාමරූපද නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, (තදින් අල්ලා ගැනීම) උපාදානය නිසා භවයද, භවය නිසා උප්පත්තියද, උප්පත්තිය නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි, මෙය පටිච්චසමුප්පාදයයි.

4. අවිද්‍යාව මුළුමනින් නැතිවීමෙන්ම සංස්කාරයන්ගේ නැතිවීමද, සංස්කාරයන්ගේ නැතිවීමෙන් විඤ්ඤාණයේ නැතිවීමද, විඤ්ඤාණයාගේ නැතිවීමෙන් නාමරූපයන්ගේ නැතිවීමද, නාමරූපයන්ගේ නැතිවීමෙන් සළායතනයන්ගේ නැතිවීමද, සළායතනයන්ගේ නැතිවීමෙන් ස්පර්ශය නැතිවීමද, ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවීමද, වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවීමද, තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවීමද, උපාදානය නැතිවීමෙන් භවය නැතිවීමද, භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවීමද ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවීමද වෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවීම වෙයි. මෙය භාග්‍යවතුන්වහන්සේ වදාළසේක. සතුටු සිතැති ඒ භික්ෂූහු බුදුන්ගේ දේශනාවට සතුටුවූහ.

---

## 2. විභඞ්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි කියා භික්ෂූන් ඇමතූහ. ස්වාමීනි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි පටිච්චසමුප්පාදය දෙශනා කරන්නෙමි. බෙදා දක්වන්නෙමි. එය මනාකොට අසව්. මෙනෙහි කරව්. කියන්නෙමියි'. "එසේය ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනාකළ සේක.

3. "මහණෙනි, පටිච්චසමුප්පාදය නම් කවරේද? මහණෙනි, අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාර නිසා විඥ්ඥාණයද, විඥ්ඥාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තෘෂ්ණාවද, තෘෂ්ණාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (උප්පත්තිය) ද, ජාතිය නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයද ඇති වෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවීම වෙයි.

4. "මහණෙනි, ජරාව සහ මරණය නම් කවරේද? ඒ ඒ සත්ව නිකායයෙහිවූ ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක්, දිරායාමක්, දත් වැටීමක්, කෙස් සුදුවීමක්, ඇඟ රැලිවැටීමක්, ආයුෂයාගේ ගෙවීයාමක්, ඉන්ද්‍රියයන්ගේ මේරීමක් වේද, මෙය ජරාවයයි කියනු ලැබේ මහණෙනි, මරණය නම් කවරක්ද? ඒ ඒ සත්වනිකායෙන් ඒ ඒ සත්වයන්ගේ යම් චුතවීමක්, පහවීයාමක්, බිඳීමක්, අතුරුදන් වීමක්, මෘත්‍යුසංඛ්‍යාත මරණයක්, කාලක්‍රියාවක්, ස්කන්ධයන්ගේ බිඳීමක්, මෘත ශරීර අත්හැරදැමීමක් වේද, මෙය මරණයයි කියනු ලැබේ.

5. "මහණෙනි; මෙසේ ඒ දිරීමද, මේ මැරීමද ජරා මරණයයි කියනු ලැබේ. මහණෙනි; ජාතිය (ඉපදීම) නම් කවරේද? ඒ ඒ සත්ව නිකායෙහි ඒ ඒ සත්වයන්ගේ යම් ඇතිවීමක්, හට ගැනීමක්, බැස ගැනීමක්, ඉපදීමක්, සත්වයන්ගේ ඇතිවීමක්, ආයතනයන්ගේ පහළවීමක් වේද මහණෙනි, මෙය ජාතියයි කියනු ලැබේ.

6. "මහණෙනි, භවය නම් කවරේද? මහණෙනි, කාමභවය, රූපභවය සහ අරූප භවයයි මේ භවයෝ තිදෙනෙකි. මහණෙනි, මෙය භවයයි කියනු ලැබේ.

7. "මහණෙනි; උපාදානය නම් කවරෙක්ද? මහණෙනි, කාමූපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය සහ අත්තවාදූපාදානයයි මේ උපාදානයෝ සිව්දෙනෙකි. මහණෙනි, මෙය උපාදානයයි කියනු ලැබේ.

8. "මහණෙනි, තණ්හාව නම් කවරේද? මහණෙනි, රූප තණ්හාව, සද්ද තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව

ඵොට්ඨබ්බ (ස්පර්ශ) තණ්හාව සහ ධර්ම තණ්හාවයයි මේ තණ්හා සමූහයන් සය දෙනෙකි. මහණෙනි; මෙය තණ්හාව යයි කියනු ලැබේ.

**9.** "මහණෙනි; වේදනාව නම් කවරේද? මහණෙනි; චක්ඛුස්පර්ශයෙන් ඇතිවන වේදනාව, ශ්‍රොතස්පර්ශයෙන් ඇතිවන වේදනාව, ඝ්‍රාණස්පර්ශයෙන් ඇතිවන වේදනාව ජිව්හාස්පර්ශයෙන් ඇතිවන වේදනාව, කායස්පර්ශයෙන් ඇතිවන වේදනාව සහ මනස්පර්ශයෙන් ඇතිවන වේදනාව යයි මේ වේදනා සමූහයන් සයදෙනෙකි. මහණෙනි; මෙය වේදනාවයයි කියනු ලැබේ.

**10.** "මහණෙනි; ස්පර්ශය නම් කවරේද? මහණෙනි; චක්ඛුස්පර්ශය, ශ්‍රොතස්පර්ශය, ඝ්‍රාණස්පර්ශය, ජිව්හාස්පර්ශය, කායස්පර්ශය සහ මනස්පර්ශයයි මේ ස්පර්ශ සමූහයෝ සදෙනෙකි. මහණෙනි, මෙය ස්පර්ශයයි කියනු ලැබේ.

**11.** "මහණෙනි; සළායතන නම් කවරේද? චක්ඛායතනය, සොතායතනය, ඝානායතනය, ජිව්හායතනය, කායායතනය සහ මනායතනයයි. මහණෙනි; මෙය සළායතනයයි කියනු ලැබේ.

**12.** "මහණෙනි; නාමය සහ රූපය නම් කවරක්ද? වේදනාව, සංඥාව, චේතනාව, ස්පර්ශය සහ මනසිකාරය යන මෙය නාමයයි කියනු ලැබේ. සතර මහා භූතයින් සහ සතර මහාභූත සමූහය නිසා පවත්නා රූපය යන මෙය රූපයයි කියනු ලැබේ. මහණෙනි; මෙසේ ඒ නාමයද මේ රූපයද නාම රූපයයි කියනු ලැබේ.

**13.** "මහණෙනි; විඤ්ඤාණය නම් කවරක්ද? මහණෙනි; චක්ඛු විඤ්ඤාණය, සොතවිඤ්ඤාණය, ඝානවිඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය සහ මනො විඤ්ඤාණයයි මේ විඤ්ඤාණ සමූහයෝ සදෙනෙකි. මහණෙනි, මෙය විඤ්ඤාණ යයි කියනු ලැබේ.

**14.** "මහණෙනි, සංඛාර නම් කවරීද? මහණෙනි, කාය සංඛාරය, වචීසංඛාරය සහ චිත්තසංඛාර යයි මේ සංඛාර තිදෙනෙකි. මහණෙනි; මොවුහු සංඛාරයෝ යයි කියනු ලැබෙත්.

15. "මහණෙනි; අවිජ්ජාව නම් කවරීද? මහණෙනි, යම් දුක නොදැනීමක්, දුකට හෙතුව නොදැනීමක්, දුක නැති කිරීම නොදැනීමක්, දුක් නැති කිරීමේ මාර්ගය නොදැනීමක් වේද, මහණෙනි; මෙය අවිජ්ජාව යයි කියනු ලැබේ.

16. "මහණෙනි; මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාරයන් නිසා විඥ්ඥාණයද, විඥ්ඥාණය නිසා නාම රූපද, නාම රූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදනය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇති වෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

17. "අවිද්‍යාව මුළුමනින් නැතිවීමෙන් සංස්කාරයන්ගේ නැතිවීම වෙයි. සංස්කාර නැතිවීමෙන් විඥ්ඥාණය නැති වෙයි. විඥ්ඥාණය නැතිවීමෙන් නාම රූප නැති වෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැති වෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැති වෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැති වෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැති වීම වේ.

---

## 3. ප්‍රතිපදා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. 'මහණෙනි, වැරදි පිළිවෙත හා හරි පිළිවෙත දේශනා කරන්නෙමි. එය අසව්, හොඳින් මෙනෙහි කරව්, කියන්නෙමි'යි (වදාළ සේක.) "එසේය ස්වාමීනි," කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "මහණෙනි, වැරදි පිළිවෙත නම් කවරේද? මහණෙනි, අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාරයන් නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක් ගොඩ ඇතිවේ. මහණෙනි, මෙය වැරදි පිළිවෙත යයි කියනු ලැබේ.

4. "මහණෙනි, හරි පිළිවෙත කවරීද? අවිද්‍යාවම මුළුමනින් නැතිවීමෙන් සංස්කාරයෝ නැතිවෙත්. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැති වෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැති වෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැති වෙයි. භවය නැතිවීමෙන් ජාතිය නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවේ. මහණෙනි, මෙය හරි පිළිවෙත යයි කියනු ලැබේ.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. විපස්සී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, විපස්සී නම් සම්මා සම්බුදුන්ට බුදුවීමට පළමු බෝසත් කාලයෙහි මේ සිත පහළ විය. 'මේ සත්වලෝකයා දුකට පැමිණියේ වෙයි. උපදී, ජරාවට පත්වෙයි, මැරෙයි, චුතවෙයි, පිළිසිඳ ගනියි, එතකුදු වුවත් ජරා මරණයෙන් යුත් මේ දුක නැති කිරීම නොදනී. කවර කලක ජරා මරණයෙන් යුත් මේ දුක නැතිකිරීම දකින්නේද?' කියායි.

ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇතිකල්හි ජරාව සහ මරණය ඇතිවේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද?" කියායි.

3. "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට බුදුවීමට පළමු බෝසත් කාලයෙහි ඇති තතු මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇතිකල වනාහි ජරාව සහ මරණය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

4. "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇති වේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇතිකල්හි වනාහි ඉපදීම ඇතිවේයයි (නුවණින්) අවබෝධ විය.

5. "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇතිකල්හි වනාහි භවය ඇතිවේද, කුමක් නිසා භවය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය (තදින්

ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇතිවෙයි, උපාදානය නිසා භවය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**6.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇතිකල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් තණ්හාව ඇතිකල්හි වනාහි උපාදනය ඇතිවෙයි, තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**7.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය, 'කුමක් ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවේද කුමක් නිසා තණ්හාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇතිකල්හි වනාහි තණ්හාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

**8.** මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

**9.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය."

**10.** "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇතිකල්හි වනාහි සළායතනයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද?' කියායි. මහණෙනි, විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයන් ඇති කල්හි වනාහි සළායතනයන් ඇතිවෙයි. නාමරූපයන් නිසා සළායතනයන් ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූපයන් ඇතිවේද, කුමක් නිසා නාමරූපයන් ඇතිවේද?' කියායි. මහණෙනි, විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇතිවෙයි, විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

12. "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි. මහණෙනි; විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයන් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි; විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇති වෙත්ද?, කුමක් නිසා සංස්කාරයෝ ඇතිවෙත්ද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇතිවෙත්. අවිද්‍යා නිසා සංස්කාරයෝ ඇතිවෙත්' කියා (නුවණින්) අවබෝධ විය.

14. "මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාර නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතියද, ජාතිය නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක්ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි, විපස්සී නම් බෝසතුන්ට වනාහි පහළවීම, යන පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළවිය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

**15.** "මහණෙනි; විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇතිනොවේ. ඉපදීම නැතිකිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ'යයි (නුවණින්) අවබෝධ විය.

**16.** මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට, ඇතිතතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදී නැති වේය'යි (නුවණින්) අවබෝධ විය.

**17.** "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද කුමක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැති කල්හි වනාහි භවය ඇති නොවේ. උපාදානය නැතිකිරීමෙන් භවය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**18.** "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය, 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැතිවේ, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද? කියායි. මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇතිනොවේ. තණ්හාව නැතිකිරීමෙන් උපාදානය නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**19.** "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**20.** "මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. "කුමක් නැතිකල්හි වනාහි වේදනාව නැතිවේද කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇති නොවේ. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**21.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

**22.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සළායතන නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතන නැතිවේද?' කියායි මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයෝ නැති කල්හි වනාහි සළායතන ඇති නොවේ. නාමරූපයෝ නැති කිරීමෙන් සළායතන නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

**23.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූපයෝ නැතිවේද, කවරක් නැති වීමෙන් නාමරූපයෝ නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු

මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූපයන් ඇති නොවේ. විඤ්ඤාණය නැති කිරීමෙන් නාමරූපයන් නැති වේයයි (නුවණින්) අවබෝධ විය.

**24.** "මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය නැති නොවේද? කවරක් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**25.** මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැති කිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර ඇති නොවේ. අවිද්‍යාව නැතිකිරීමෙන් සංස්කාර නැති වේයයි (නුවණින්) අවබෝධ විය.

**26.** මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, විපස්සී නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීමයයි පෙර නො ඇසූ නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළ විය."

---

## 5 සිඛී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි," කියා ඒ භික්ෂූහු බුදුන්ට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, බුද්ධත්වයට පෙරම බුදුනොවූ, බෝසත්වූම, භාග්‍යවත්වූ, අර්හත්වූ, සිඛී නම් සම්මාසම්බුදුන්ට මේ සිත පහළවිය. 'මේ සත්වලෝකයා (මේ සත්වලෝකයට) දුකසේ පැමිණියේ උපදීද, ජරාවට පත්වීද, මැරේද, චුතවේද, පිළිසිඳ ගනීද එතකුදු වුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැති කිරීම නොදනී. කවර කලක ජරාමරණයෙන් යුත් මේ දුක නැති කිරීම දකින්නේද?' කියායි. ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි ජරාව සහ මරණය ඇති වේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇති වේද?' කියායි.

3. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇති කල වනාහි ජරාව සහ මරණය ඇතිවෙයි. ඉපදීම නිසා ජරාව සහ මරණය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

4. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇති වේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇති කල්හි වනාහි ඉපදීම ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

5. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි භවය ඇති වේද, කුමක් නිසා භවය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය (තදින්

ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇති වෙයි. උපාදානය නිසා භවය ඇති වෙයි’ කියා නුවණින් අවබෝධ විය.

**6.** “මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. ‘කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේද?’ කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව ඇති කල්හි වනාහි උපාදානය ඇතිවෙයි’ තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**7.** “මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. ‘කුමක් ඇති කල්හි තණ්හාව ඇතිවේද කුමක් නිසා තණ්හාව ඇතිවේද?’ කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් ‘වේදනාව ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**8.** “මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. ‘කුමක් ඇති කල්හි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද?’ කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් ‘ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇති වෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි’ කියා (නුවණින්) අවබෝධ විය.

**9.** “මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. ‘කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇති වේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?’ කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් ‘සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි, සළායතනය නිසා ස්පර්ශය ඇති වෙයි, කියා (නුවණින්) අවබෝධ විය.

**10.** “මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. ‘කුමක් ඇතිකල්හි වනාහි සළායතනයන් ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද?’ මහණෙනි; සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් ‘නාමරූපයන් ඇති

කල්හි වනාහි සළායතනයන් ඇතිවෙයි. නාමරූපයන් නිසා සළායතනයන් ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූපයන් ඇතිවේද, කුමක් නිසා නාමරූපයන් ඇතිවේද?' කියායි. මහණෙනි; සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇතිවෙයි. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

12. "මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇතිකල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි. මහණෙනි; සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයන් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇති වෙයි කියා' (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි, සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සංස්කාරයන් ඇතිවේද?, කුමක් නිසා සංස්කාරයන් ඇතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇතිකල්හි වනාහි සංස්කාරයන් ඇති වෙයි. අවිද්‍යාව නිසා සංස්කාරයන් ඇතිවෙයි. කියා (නුවණින්) අවබෝධ විය.

14. 'මෙසේ මෙය වනාහි අවිද්‍යාව නිසා සංස්කාරද, සංස්කාර නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි; සිඛී නම් බෝසතුන්ට වනාහි ඇතිවීම, ඇතිවීම යයි පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළ විය. ඤාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

**15.** මහණෙනි; සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් සහ 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇති නොවේ. ඉපදීම නැති කිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ'යයි (නුවණින්) අවබෝධ විය.

**16.** "මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට, ඇතිතතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදීම නැතිවේය'යි (නුවණින්) අවබෝධවිය.

**17.** "මහණෙනි; සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද, කවරක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැති කල්හි වනාහි භවය ඇතිනොවේ. උපාදානය නැති කිරීමෙන් භවය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**18.** "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැති වේද, කවරක් නැති වීමෙන් උපාදානය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇති නොවේ. තණ්හාව නැති කිරීමෙන් උපාදානය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

**19.** "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැති කිරීමෙන් තණ්හාව නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

20. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි වේදනාව නැති වේද, කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇතිනොවේ. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

21. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි ස්පර්ශය නැති වේද, කවරක් නැති වීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

22. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි සළායතනයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතනයන් නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයන් නැති කල්හි වනාහි සළායතනයන් ඇති නොවේ. නාමරූපයන් නැති කිරීමෙන් සළායතනයන් නැතිවේයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූපයන් නැතිවේ, කවරක් නැතිවීමෙන් නාමරූපයන් නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූපයන් ඇති නොවේ විඤ්ඤාණය නැති කිරීමෙන් නාමරූපයන් නැති වේය'යි (නුවණින්) අවබෝධ විය.

**24.** "මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේද, කවරක් නැති වීමෙන් විඤ්ඤාණය නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැතිකිරීමෙන් විඤ්ඤාණය නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

**25.** "මහණෙනි, ඉක්බිතිව සිඛී නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැති කිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති සිඛී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර ඇති නොවේ. අවිද්‍යාව නැතිකිරීමෙන් සංස්කාර නැතිවේයයි' (නුවණින් අවබෝධ විය.

**26.** මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැති වීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැති වෙයි. මහණෙනි, සිඛී නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීම යයි පෙර නො ඇසූ විරූ ධර්මය විෂයෙහි නුවණැස පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය."

(පස්වන සිඛී සූත්‍රය නිමි)

---

## 6. වෙස්සභූ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, "වෙස්සභූ" නම් සම්මාසම්බුදුන්ට බුද්ධත්වයට පෙරම බුදුනොවූ, බෝසත් කලම, මේ සිත පහළවිය. 'මේ සත්වලෝකයා දුකට පැමිණියේ වෙයි, උපදී ජරාවට පත්වෙයි, මැරෙයි, චුතවෙයි, පිළිසිඳ ගනී, එතකුදු වුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැති කිරීම නොදනී. කවර කලක ජරා මරණයෙන් යුත් මේ දුක නැති කිරීම දකින්නේද?' කියායි. ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි ජරාව සහ මරණය ඇතිවේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද?' කියායි.

3. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇති කල වනාහී ජරාව සහ මරණය ඇති වෙයි. ඉපදීම නිසා ජරාව සහ මරණය ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

4. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇතිවේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇති කල්හි වනාහි ඉපදීම ඇති වේයයි. (නුවණින්) අවබෝධ විය.

5. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. කුමක් ඇති කල්හි වනාහි භවය ඇති වේද, කුමක් නිසා භවය ඇතිවේද?" කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන්

'උපාදානය (තදින් ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇති වෙයි. 'උපාදානය නිසා භවය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

6. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේ? කියායි. මහණෙනි ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'තණ්හාව' ඇති කල්හි වනාහි උපාදානය ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

7. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහී තණ්හාව ඇති වේද, කුමක් නිසා නිසා තණ්හාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවෙයි. වේදනාව නිසා තණ්හාව ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

8. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

9. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇති වෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

10. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි සළායතන ඇති

වේද, කුමක් නිසා සළායතන ඇතිවේද?' කියායි. මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාම රූපයන් ඇති කල්හි වනාහි සළායතන ඇති වෙයි. නාම රූපයන් නිසා සළායතන ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි නාමරූප ඇතිවේද, කුමක් නිසා නාමරූප ඇතිවේද?' කියායි. මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි වනාහි නාමරූප ඇති වෙයි. විඤ්ඤාණය නිසා නාම රූප ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

12. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි. මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයෝ ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇති වෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. "කුමක් ඇති කල්හි වනාහි සංස්කාර ඇතිවේද, කුමක් නිසා සංස්කාර ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති, වෙස්සභූ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇති කල්හි සංස්කාර ඇති වෙයි. අවිද්‍යාව නිසා සංස්කාර ඇති වෙත්' කියා (නුවණින්) අවබෝධ විය.

14. "මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාරයන් නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු

(එකම) දුක්ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට වනාහි පහළවීම යන පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

15. "මහණෙනි; වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇති නොවේ. ඉපදීම නැති කිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ'යයි (නුවණින්) අවබෝධ විය.

16. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට, ඇතිතතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදීම නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

17. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද, කවරක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැතිකල්හි වනාහි භවය ඇති නොවේ. උපාදානය නැති කිරීමෙන් භවය නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

18. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය, 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැතිවේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද? කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇති නොවේ. තණ්හාව නැතිකිරීමෙන් උපාදානය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

19. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

20. "මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. "කුමක් නැති කල්හි වනාහි වේදනාව නැතිවේද කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇති නොවේ. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

21. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

22. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි සළායතනයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතන නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයෝ නැති කල්හි වනාහි සළායතන ඇති නොවේ. නාමරූපයෝ නැතිකිරීමෙන් සළායතන නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූපයෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නැතිවේද, කවරක් නැතිවීමෙන් නාමරූපයෝ නැති වේද?" කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැතිකල්හි වනාහි නාමරූපයන් ඇති නොවේ. විඤ්ඤාණය නැතිකිරීමෙන් නාමරූපයන් නැතිවේයයි, (නුවණින්) අවබෝධ විය.

**24.** "මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේද, කවරක් නැති වීමෙන් විඤ්ඤාණය නැතිවේද?" කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**25.** මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැතිකිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති වෙස්සභූ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර ඇති නොවේ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාර නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

**26.** මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැති වීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැති වෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, වෙස්සභූ නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීමයයි පෙර නොඇසූ

කාරණයෙහි නුවණැස පහළවිය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය."

(භයවත වෙස්සභූ සූත්‍රය නිමි.)

---

## 7 කකුසඳ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, කකුසඳ නම් සම්මා සම්බුදුන්ට බුදුවීමට පළමු බෝසත් කාලයෙහි මේ සිත පහළ විය. 'මේ සත්වලෝකයා දුකට පැමිණියේ වෙයි උපදී, ජරාවට පත්වෙයි, මැරෙයි, චුතවෙයි, පිළිසඳ ගනියි, එතකුදු වුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැති කිරීම නොදනී. කවර කලක ජරා මරණයෙන් යුත් මේ දුක නැතිකිරීම දකින්නේද?' කියායි.

ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇතිකල්හි ජරාව සහ මරණය ඇතිවේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද?' කියායි.

**3.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට බුදුවීමට පළමු බෝසත් කාලයෙහි ඇති තතු මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇතිකල වනාහි ජරාව සහ මරණය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**4.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇති වේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද? කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇතිකල්හි වනාහි ඉපදීම ඇතිවේයයි (නුවණින්) අවබෝධ විය.

**5.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇතිකල්හි වනාහි භවය ඇතිවේද?, කුමක් නිසා භවය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය (තදින් ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇතිවෙයි, උපාදානය නිසා භවය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**6.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇතිකල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේද? කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් තණ්හාව ඇති කල්හි වනාහි උපාදානය ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**7.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය, 'කුමක් ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවේද කුමක් නිසා තණ්හාව ඇතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇතිකල්හි වනාහි තණ්හාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

**8.** මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද? කියායි. මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

**9.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද? කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය."

10. "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇතිකල්හි වනාහි සළායතනයන් ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද?' කියායි. මහණෙනි; කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයන් ඇති කල්හි වනාහි සළායතනයන් ඇතිවෙයි. නාමරූපයන් නිසා සළායතනයන් ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූපයන් ඇතිවේද, කුමක් නිසා නාමරූපයන් ඇතිවේද?' කියායි. මහණෙනි, කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇතිවෙයි, විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

12. "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි. මහණෙනි; කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයන් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි; කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇති වෙත්ද?, කුමක් නිසා සංස්කාරයෝ ඇතිවෙත්ද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇතිවෙත්. අවිද්‍යා නිසා සංස්කාරයෝ ඇතිවෙත්' කියා (නුවණින්) අවබෝධ විය.

14. "මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාර නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා

වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතියද, ජාතිය නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක්ගොඩ ඇතිවීමවෙයි. මහණෙනි, කකුසඳ නම් බෝසතුන්ට වනාහි පහළවීම, යන පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළවිය. ඤාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

15. "මහණෙනි; කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇති නොවේ. ඉපදීම නැතිකිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ' යයි (නුවණින්) අවබෝධ විය.

16. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට, ඇතිතතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදීම නැති වේය'යි (නුවණින්) අවබෝධ විය.

17. "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද කුමක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැති කල්හි වනාහි භවය ඇති නොවේ. උපාදානය නැතිකිරීමෙන් භවය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

18. "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය, 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැතිවේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද?' කියායි. මහණෙනි;

ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇතිනොවේ. තණ්හාව නැතිකිරීමෙන් උපාදානය නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

**19.** "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**20.** "මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. "කුමක් නැතිකල්හි වනාහි වේදනාව නැතිවේද කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි මහණෙනි; ඉක්බිති විපස්සී නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇති නොවේ. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**21.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

**22.** "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සළායතන නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතන නැතිවේද?' කියායි මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයෝ නැති කල්හි වනාහි සළායතන ඇති නොවේ. නාමරූපයෝ නැති කිරීමෙන් සළායතන නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූපයෝ නැතිවේද, කවරක් නැති වීමෙන් නාමරූපයෝ නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූපයන් ඇති නොවේ. විඤ්ඤාණය නැති කිරීමෙන් නාමරූපයන් නැති වේයයි (නුවණින්) අවබෝධ විය.

24. "මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය නැති නොවේද? කවරක් නැති වීමෙන් විඤ්ඤාණය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

25. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැති කිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කකුසඳ නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර ඇති නොවේ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාර නැති වේයයි (නුවණින්) අවබෝධ විය.

26. මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැති වීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ

උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, කකුසඳ නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීමයයි පෙර නො ඇසූ නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළ විය.”

(හත්වන කකුසඳ සූත්‍රය නිමි.)

---

## 8. කෝනාගම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනියි” කියා ඒ භික්ෂූහු බුදුන්ට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, බුද්ධත්වයට පෙරම බුදු නොවූ බෝසත්වූම, භාග්‍යවත්වූ, අර්හත්වූ, කෝනාගමන නම් සම්මා සම්බුදුන්ට මේ සිත පහළවිය. ‘මේ සත්වලෝකයා (මේ සත්වලෝකයට) දුකසේ පැමිණියේ උපදීද, ජරාවට පත්වීද, මැරේද, චුතවේද, පිළිසිඳ ගනීද, එතකුදු වුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැතිකිරීම නොදනී. කවර කලක ජරාමරණයෙන් යුත් මේ දුක නැතිකිරීම දකින්නේද?’ කියායි. ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. ‘කුමක් ඇති කල්හි ජරාව සහ මරණය ඇති වේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇති වේද?’ කියායි.

3. “මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇති කල වනාහි ජරාව සහ මරණය ඇතිවෙයි. ඉපදීම නිසා ජරාව සහ මරණය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**4.** "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇති වේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇති කල්හි වනාහි ඉපදීම ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**5.** "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් ඇතිකල්හි වනාහි භවය ඇතිවේද, කුමක් නිසා භවය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය (තදින් ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇතිවෙයි, උපාදානය නිසා භවය ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**6.** "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'තණ්හාව ඇති කල්හි වනාහි උපාදානය ඇතිවෙයි.' තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**7.** "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය, 'කුමක් ඇති කල්හි තණ්හාව ඇතිවේද කුමක් නිසා තණ්හාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇතිකල්හි වනාහි තණ්හාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

**8.** මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන්

'ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇති වෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**9.** "මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි, සළායතනයන් නිසා ස්පර්ශය ඇති වෙයි, කියා (නුවණින්) අවබෝධ විය."

**10.** "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇතිකල්හි වනාහි සළායතනයන් ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද?' මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයන් ඇති කල්හි වනාහි සළායතනයන් ඇතිවෙයි. නාමරූපයන් නිසා සළායතනයන් ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**11.** "මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූපයන් ඇතිවේද, කුමක් නිසා නාමරූපයන් ඇතිවේද?' කියායි. මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇතිවෙයි, විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**12.** "මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි. මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයෝ ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇතිවේද?, කුමක් නිසා සංස්කාරයෝ ඇතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇතිකල්හි වනාහි සංස්කාරයන් ඇතිවෙයි. අවිද්‍යාව නිසා සංස්කාරයන් ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

14. "මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරද, සංස්කාර නිසා විඥ්ඥාණයද, විඥ්ඥාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට වනාහි ඇතිවීම, ඇතිවීමයයි පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළවිය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

15. "මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇතිනොවේ. ඉපදීම නැති කිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ' යයි (නුවණින්) අවබෝධ විය.

16. මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදීම නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

17. "මහණෙනි; කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද, කවරක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැති කල්හි වනාහි භවය ඇතිනොවේ. උපාදානය නැතිකිරීමෙන් භවය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

18. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය, 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැති වේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇති නොවේ. තණ්හාව නැති කිරීමෙන් උපාදානය නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

19. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැති කිරීමෙන් තණ්හාව නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

20. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. "කුමක් නැති කල්හි වනාහි වේදනාව නැති වේද, කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇති නොවේ. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

21. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැති වීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි.

මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇතිතතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

22. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි සළායතනයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතනයන් නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයන් නැති කල්හි වනාහි සළායතනයන් ඇති නොවේ. නාමරූපයන් නැති කිරීමෙන් සළායතනයන් නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූපයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් නාමරූපයෝ නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූපයන් ඇති නොවේ. විඤ්ඤාණය නැති කිරීමෙන් නාමරූපයන් නැති වේය'යි (නුවණින්) අවබෝධ විය.

24. "මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය නැති නොවේද? කවරක් නැති වීමෙන් විඤ්ඤාණය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැතිකිරීමෙන් විඤ්ඤාණය නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

25. මහණෙනි, ඉක්බිතිව කෝනාගමන නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැති කිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කෝනාගමන නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර

ඇති නොවේ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාර නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

**26.** මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඥ්ඥාණය නැතිවේ. විඥ්ඥාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැති වෙයි. මහණෙනි, කෝනාගමන නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීම යයි පෙර නොඇසූ විරූ ධර්මය විෂයෙහි නුවණැස පහළ විය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළ විය."

(අටවන කෝනාගමන සූත්‍රය නිමි.)

---

## 9. කස්සප සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, "කස්සප" නම් සම්මාසම්බුදුන්ට බුද්ධත්වයට පෙරම බුදුනොවූ, බෝසත් කලම, මේ සිත පහළවිය. 'මේ සත්ත්වලෝකයා දුකට පැමිණියේ වෙයි,

උපදී, ජරාවට පත්වෙයි, මැරෙයි, චුතවෙයි, පිළිසිඳ ගනී, එතකුදු වුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැති කිරීම නොදනී. කවර කලක ජරා මරණයෙන් යුත් මේ දුක නැති කිරීම දකින්නේද?' කියායි. ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි ජරාව සහ මරණය ඇතිවේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද?' කියායි.

**3.** "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇති කල වනාහි ජරාව සහ මරණය ඇති වෙයි. ඉපදීම නිසා ජරාව සහ මරණය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**4.** "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් ඇති කල්හි ඉපදීම ඇතිවේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇති කල්හි වනාහි ඉපදීම ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය.

**5.** "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. කුමක් ඇති කල්හි වනාහි භවය ඇතිවේද, කුමක් නිසා භවය ඇති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය (තදින් ඇලීම) ඇති කල්හි වනාහි භවය ඇතිවෙයි, 'උපාදානය නිසා භවය ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**6.** "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'තණ්හාව' ඇති කල්හි වනාහි උපාදනය ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

**7.** "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය, 'කුමක් ඇති කල්හි තණ්හාව ඇතිවේද කුමක් නිසා තණ්හාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම්

බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවෙයි. වේදනාව නිසා තණ්හාව ඇතිවෙයි කියා (නුවණින්) අවබෝධ විය.

8. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි,' කියා (නුවණින්) අවබෝධ විය.

9. "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, 'කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇති වෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇති වෙයි කියා (නුවණින්) අවබෝධ විය."

10. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සළායතන ඇති වේද, කුමක් නිසා සළායතන ඇතිවේද?' කියායි. මහණෙනි, කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාම රූපයන් ඇති කල්හි වනාහි සළායතන ඇති වෙයි. නාමරූපන් නිසා සළායතන ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූප ඇතිවේද, කුමක් නිසා නාමරූප ඇතිවේද?' කියායි. මහණෙනි, කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇති වෙයි, විඤ්ඤාණය නිසා නාම රූප ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

12. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවේද?' කියායි.

මහණෙනි, කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාරයෝ ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇති වෙයි' සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි; කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සංස්කාර ඇතිවේද?, කුමක් නිසා සංස්කාර ඇති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව ඇති කල්හි සංස්කාර ඇති වෙයි. අවිද්‍යාව නිසා සංස්කාර ඇතිවෙත්' කියා (නුවණින්) අවබෝධ විය.

14. "මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝද, සංස්කාර නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතිය (ඉපදීම) ද, ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක්ගොඩ ඇතිවීම වෙයි. මහණෙනි, කස්සප නම් බෝසතුන්ට වනාහි පහළවීම, යන පෙර නොඇසූ මේ කාරණයෙහි නුවණැස පහළවිය. ඤාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

15. "මහණෙනි; කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ඉපදීම නැති කල්හි වනාහි ජරාමරණය ඇති නොවේ. ඉපදීම නැති කිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ,' යයි (නුවණින්) අවබෝධ විය.

16. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක්

නැතිවීමෙන් ඉපදීම නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට, ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවේ. භවය නැති කිරීමෙන් ඉපදීම නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

17. "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද, කවරක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'උපාදානය නැතිකල්හි වනාහි භවය ඇතිනොවේ. උපාදානය නැති කිරීමෙන් භවය නැතිවේය'යි (නුවණින්) අවබෝධ විය.

18. "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය, 'කුමක් නැති කල්හි වනාහි උපාදානය නැතිවේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය ඇතිනොවේ. තණ්හාව නැති කිරීමෙන් උපාදානය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

19. "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'වේදනාව නැති කල්හි වනාහි තණ්හාව ඇති නොවේ. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

20. "මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. "කුමක් නැති කල්හි වනාහි වේදනාව නැතිවේද කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි. මහණෙනි; ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව ඇති නොවේ. ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

21. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ස්පර්ශය නැතිවේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කවරක් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය ඇති නොවේ. සළායතනයන් නැති කිරීමෙන් ස්පර්ශය නැති වේයයි' (නුවණින්) අවබෝධ විය.

22. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි සළායතනයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතන නැතිවේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාමරූපයෝ නැති කල්හි වනාහි සළායතන ඇති නොවේ. නාමරූපයෝ නැතිකිරීමෙන් සළායතන නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි නාමරූප නැතිවේද, කවරක් නැතිවීමෙන් නාමරූපයන් නැති වේද?" කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැතිකල්හි වනාහි නාමරූප ඇති නොවේ. විඤ්ඤාණය නැති කිරීමෙන් නාමරූප නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

24. "මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ සිත පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේද? කවරක් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේද?" කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය ඇති නොවේ. සංස්කාර නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

25. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට මේ අදහස පහළ විය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාර නැතිවේද, කවරක් නැති කිරීමෙන් සංස්කාර නැති වේද?' කියායි. මහණෙනි, ඉක්බිති කස්සප නම් බෝසතුන්ට ඇති තතු මෙනෙහි කිරීමෙන්

අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාර ඇති නොවේ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාර නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

**26.** මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, කස්සප නම් බෝසතුන්ට වනාහි නැතිවීම නැතිවීමයයි පෙර නොඇසූ කාරණයෙහි නුවණැස පහළවිය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.”

(නවවන කස්සප සූත්‍රය නිමි.)

---

## 10. ගෞතම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ “මහණෙනි”යි භික්ෂූන් ඇමතූසේක. “ස්වාමීනි”යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, බුද්ධත්වයට පෙරම බුදු නොවූ, බෝසත්වූම මට මේ සිත පහළ විය. මේ සත්ත්ව ලෝකයා (මේ ලෝකයට)

දුකසේ පැමිණියේ, උපදී ද, ජරාවට පත් වේද, මැරේද, චුතවේද, පිළිසිඳ ගනීද, එතකුදු වුවත්, ජරාමරණයෙන් යුත් මේ දුක නැතිකිරීම නොදනී. කවර කලක වනාහි ජරා මරණයෙන් මේ දුක නැතිකිරීම දන්නේද?' කියායි. මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි ජරාව සහ මරණය ඇති වේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද?' කියායි.

3. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් ඉපදීම් ඇතිකල්හි වනාහි ජරාව සහ මරණය ඇතිවෙයි ඉපදීම නිසා ජරාව සහ මරණය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

4. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ඉපදීම ඇතිවේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට, ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'භවය ඇති කල්හි වනාහි ඉපදීම (ජාතිය) ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

5. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි භවය ඇතිවේද, කුමක් නිසා භවය ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට, ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් උපාදානය ඇතිකල්හි වනාහි භවය ඇතිවෙයි. 'උපාදානය නිසා භවය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

6. "මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, 'කුමක් නිසා උපාදානය ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට, ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'තණ්හාව ඇතිකල්හි වනාහි උපාදානය' ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

7. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවේද, 'කුමක් නිසා තණ්හාව ඇති වේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන්

සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'වේදනාව ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවෙයි. වේදනාව නිසා තණ්හාව ඇති වෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

8. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද?, කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් ස්පර්ශය ඇතිකල්හි වනාහි 'වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

9. "මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'සළායතන ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි. 'සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

10. මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. කුමක් ඇති කල්හි වනාහි 'සළායතනයන් ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'නාමරූප ඇති කල්හි වනාහි සළායතන' ඇති වෙයි. 'නාමරූප නිසා සළායතන ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

11. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූප ඇතිවේද, කුමක් නිසා නාමරූප ඇති වේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය ඇති කල්හි වනාහි නාමරූප ඇතිවෙයි. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධවිය.

12. "මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද?' 'කුමක් නිසා විඤ්ඤාණය ඇති වෙයිද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි

කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'සංස්කාර ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇති වෙයි, සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවෙයි' කියා (නුවණින්) අවබෝධ විය.

13. "මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇතිකල්හි වනාහි සංස්කාරයෝ ඇති වෙත්ද, කුමක් නිසා සංස්කාරයෝ ඇතිවෙත්ද?' කියායි. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් අවිද්‍යාව ඇති කල්හි වනාහි සංස්කාරයෝ ඇතිවෙත්. අවිද්‍යාව නිසා සංස්කාරයෝ ඇතිවෙත් යයි (නුවණින්) අවබෝධ විය.

14. "මහණෙනි, මෙසේ මෙය අවිද්‍යාව නිසා සංස්කාරයෝ ඇතිවෙති. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරාමරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැලපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ. මහණෙනි, මට වනාහි සමුදය සමුදය යයි පෙර නොඇසූ විරූ ධර්මය විෂයයෙහි නුවණැස පහළවිය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

15. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ජරා මරණය නැති වේද, කවරක් නැතිවීමෙන් ජරා මරණය නැති වේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'ඉපදීම නැති කල්හි වනාහි ජරා මරණය ඇති නොවේ. ඉපදීම නැතිකිරීමෙන් ජරාව සහ මරණය නැතිවේ'යයි (නුවණින්) අවබෝධවිය.

16. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ඉපදීම නැති වේද, කවරක් නැතිවීමෙන් ඉපදීම

නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සහ නුවණින් මෙනෙහි කිරීමෙන් 'භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවෙයි. භවය නැති කිරීමෙන් ඉපදීම නැති වේයයි, (නුවණින්) අවබෝධවිය.

17. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. කුමක් නැතිකල්හි වනාහි භවය නැතිවේද, කුමක් නැතිවීමෙන් භවය නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් උපදානය නැති කල්හි වනාහි භවය නැතිවෙයි. උපාදානය නැතිකිරීමෙන් භවය නැතිවේයයි කියා (නුවණින්) අවබෝධ විය.

18. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි උපාදානය (තදින් අල්ලාගැනීම) නැති වේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය නැතිවෙයි. තණ්හාව නැති කිරීමෙන් උපාදනය නැතිවේයයි (නුවණින්) අවබෝධවිය.

19. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව නැති කල්හි වනාහි තණ්හාව නැතිවෙයි. වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේයයි (නුවණින්) අවබෝධවිය.

20. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි වේදනාව නැතිවේද කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව නැතිවෙයි. ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

21. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැතිවීමෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්පර්ශය නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය නැතිවෙයි. සළායතනයන් නැතිකිරීමෙන් ස්පර්ශය නැතිවේයයි, (නුවණින්) අවබෝධ විය.

22. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි සළායතන (ෂට් ඉන්ද්‍රියයන්) නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතනයන් නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'නාම රූපයන් නැති කල්හි වනාහි සළායතනයන් නැතිවෙයි නාමරූපයන් නැතිකිරීමෙන් සළායතනයන් නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

23. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි නාමරූපයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් නාමරූපයන් නැතිවේද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූප නැතිවෙයි. විඤ්ඤාණය නැතිකිරීමෙන් නාමරූප නැතිවේයයි, (නුවණින්) අවබෝධ විය.

24. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි විඤ්ඤාණය නැතිවේද, කවරක් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේද?' කියායි. මහණෙනි ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සංස්කාර නැති කල්හි වනාහි විඤ්ඤාණය නැතිවෙයි. සංස්කාර නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි (නුවණින්) අවබෝධ විය.

25. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි සංස්කාරයෝ ඇති නොවෙත්ද, කවරක් නැතිවීමෙන් සංස්කාරයෝ නැතිවෙත්ද?' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'අවිද්‍යාව නැති කල්හි වනාහි සංස්කාරයෝ ඇති නොවෙත්. 'අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාරයන් නැතිවේයයි' (නුවණින්) අවබෝධ විය.

26. "මෙසේ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාරයන් නැතිවේ. සංස්කාරයන් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය) නැතිවෙයි. ජාතිය (උත්පත්තිය) නැතිවීමෙන් ජරාමරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැති වෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවීම වෙයි. මහණෙනි, මට වනාහි නිරෝධය නිරෝධයයි (නැතිවීම නැතිවීමයයි) පෙර නොඇසූ විරූ ධර්මය විෂයෙහි නුවණැස පහළවිය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

(දසවන ගෞතම සූත්‍රය නිමි)

---

පටිච්චසමුප්පාද සූත්‍රය, විභඞ්ග සූත්‍රය, ප්‍රතිපදා සූත්‍රය, විපස්සී සූත්‍රය, සිඛී සූත්‍රය, වෙස්සභූ සූත්‍රය, කකුසන්ධ සූත්‍රය, කෝනාගමන සූත්‍රය, කාශ්‍යප සූත්‍රය, සහ මහත් යසස් ඇති, ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ පිළිබඳවූ ගෞතම සූත්‍රයයි. (මේ වර්ගයේ සූත්‍ර දහයකි.)

පළමුවන බුද්ධ වර්ගය නිමි.

---

# 2. ආහාර වර්ගය.

## 1. ආහාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, උපන් සත්වයන්ගේ පැවැත්ම පිණිසද, උපදිමින් සිටින සත්වයින්ට උපකාරය පිණිසද පවත්නාවූ ආහාරයෝ (හේතු) සතරක් වෙත්. ඒ ආහාර සතර කවරහුද? මහත්වූ හෝ ඉතා කුඩාවූ හෝ කබලිංකාරාහරය (පිඬුකොට වළඳන ආහාරය) ද දෙවැනිවූ ඵස්සාහාරයද තුන්වැනිවූ මනොසංචෙතනාහාරයද සතරවැනිවූ විඤ්ඤාණාහාරයද යන මොහුයි. මහණෙනි, උපන් සත්වයින්ගේ පැවැත්ම පිණිසද, උපදිමින් සිටින්නාවූ සත්වයන්ට උපකාරය පිණිසද මේ සතර ආහාරයෝ පවතිත්.

3. "මහණෙනි මේ සතර ආහාරයෝ වනාහි කුමක් මුල්කොට ඇත්තාහුද? කුමක් හේතුකොට ඇත්තාහුද? කුමක් උප්පත්තිකොට ඇත්තාහුද? කුමක් ප්‍රභවකොට ඇත්තාහුද? මේ සතර ආහාරයෝ තණ්හාව මුල්කොට ඇත්තාහ. තණ්හාව හේතුකොට ඇත්තාහ. තණ්හාව උප්පත්තිකොට ඇත්තාහ. තණ්හාව ප්‍රභවකොට ඇත්තාහ.

4. "මහණෙනි, මේ තණ්හාව වනාහි කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්ති කොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? තණ්හාව වේදනාව මුල්කොට ඇත්තේය. වේදනාව හේතුකොට ඇත්තේය. වේදනාව උප්පත්තිකොට ඇත්තේය. වේදනාව ප්‍රභවකොට ඇත්තේය.

5. "මහණෙනි, මේ වේදනාව වනාහි කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්ති කොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? වේදනාව ස්පර්ශය මුල්කොට ඇත්තේය. ස්පර්ශය හේතුකොට ඇත්තේය. ස්පර්ශය උප්පත්තිකොට ඇත්තේය. ස්පර්ශය ප්‍රභවකොට ඇත්තේය.

6. "මහණෙනි, මේ ස්පර්ශය කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්ති කොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? ස්පර්ශය සළායතනයන් මුල්කොට ඇත්තේය. සළායතන හේතුකොට ඇත්තේය. සළායතන උප්පත්තිකොට ඇත්තේය. සළායතන ප්‍රභවකොට ඇත්තේය.

7. "මහණෙනි, මේ සළායතන වනාහි කුමක් මුල් කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්තිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? සළායතනයන් නාමරූපය මුල්කොට ඇත්තේය. නාමරූපය හේතුකොට ඇත්තේය. නාමරූපය උප්පත්තිකොට ඇත්තේය. නාමරූපය ප්‍රභවකොට ඇත්තේය.

8. "මහණෙනි මේ නාමරූපය වනාහි කුමක් හේතු කොට ඇත්තේද? කුමක් උප්පත්තිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? නාමරූපය විඤ්ඤාණය මුල්කොට ඇත්තේය. විඤ්ඤාණය හේතුකොට ඇත්තේය. විඤ්ඤාණය උප්පත්තිකොට ඇත්තේය විඤ්ඤාණය ප්‍රභවකොට ඇත්තේය.

9. "මහණෙනි, මේ විඤ්ඤාණය වනාහි කුමක් මුල් කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්තිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? විඤ්ඤාණය සංස්කාර මුල්කොට ඇත්තේය. සංස්කාර හේතුකොට ඇත්තේය. සංස්කාර උප්පත්තිකොට ඇත්තේය. සංස්කාර ප්‍රභවකොට ඇත්තේය.

10. "මහණෙනි, මේ සංස්කාර වනාහි කුමක් මුල්කොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් උප්පත්ති කොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? සංස්කාර අවිද්‍යාව මුල්කොට ඇත්තේය. අවිද්‍යාව හේතුකොට ඇත්තේය. අවිද්‍යාව උප්පත්තිකොට ඇත්තේය. අවිද්‍යාව ප්‍රභවකොට ඇත්තේය.

11. "මහණෙනි, මෙසේ වනාහි අවිද්‍යාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා, මරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ තනිකර සියලු දුක් සමූහයාගේ ඇතිවීම වෙයි.

12. "අවිද්‍යාව මුළුමනින් නැතිවීමෙන් සංස්කාරයන්ගේ නැතිවීම වේ. සංස්කාරයන් මුළුමනින් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නැමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ තනිකර සියලු දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

(පළමුවන ආහාර සූත්‍රය නිමි.)

---

## 2. ඵග්ගුන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "මහණෙනි, උපන් සත්වයින්ගේ පැවැත්ම පිණිසද, උපදිමින් සිටින සත්වයින්ට උපකාර පිණිසද, පවත්නාවූ මේ ආහාරයෝ (හෙතු) සතරක් වෙත්. කවර සතරක්ද යත්? මහත්වූ හෝ සියුම්වූ හෝ කබලිංකාර ආහාරය, දෙවැනිවූ ස්පර්ශාහාරය, තුන්වැනිවූ මනොසංචෙතනාහාරය, සතරවැනිවූ විඤ්ඤාණාහාරය යන මොහුයි. මහණෙනි, උපන් සත්වයින්ගේ පැවැත්ම පිණිසද, උපදිමින් සිටින්නාවූ සත්වයින්ට උපකාරය පිණිසද මේ සතර ආහාරයෝ පවතිත්.

3. මෙසේ වදාළ කල්හි, ආයුෂ්මත් "මෝළිය ඵග්ගුන" (නම් භික්ෂුව) භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය "ස්වාමීනි, කවරෙක් වනාහි විඤ්ඤාණය ආහාරය අනුභව කෙරේද?" කියායි.

භාග්‍යවතුන් වහන්සේ "ප්‍රශ්නය නුසුදුසුය"යි වදාළ සේක. 'අනුභව කෙරේයයි මම නොකියමි ඉදින් මම අනුභව කෙරේයයි කියම් නම්, "ස්වාමීනි, කවරෙක් වනාහි අනුභව කෙරේද? යන ප්‍රශ්නය සුදුසු වන්නේය. මම වනාහි මෙසේ නොකියමි මෙසේ නොකියන්නාවූ, මාගෙන් 'ස්වාමීනි, විඤ්ඤාණ ආහාරය කුමකට උපකාර වේද?' කියා මෙසේ යමෙක් අසයි නම්, එය සුදුසු ප්‍රශ්නයකි. විඤ්ඤාණ ආහාරය සසර නැවත ඉපදීමට උපකාර වෙයි. ඒ ඉපදීම ඇතිවූ කල්හි සළායතන ඇතිවෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේයයි කියා එහිදී විසඳීම සුදුසුය."

4. "ස්වාමීනි, කවරෙක් වනාහි ස්පර්ශය කෙරේද?

"ප්‍රශ්නය නුසුදුසුයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. 'ස්පර්ශය කෙරේයයි' මම නොකියමි. ඉදින් 'ස්පර්ශය කෙරේයයි' මම කියම් නම් එකල 'ස්වාමීනි, කවරෙක් වනාහි ස්පර්ශය කෙරේද?' යන ප්‍රශ්නය සුදුසු වන්නේය. මම වනාහි එසේ නොකියමි. එසේ නොකියන්නාවූ මාගෙන් 'ස්වාමීනි, ස්පර්ශය කුමක් නිසා ඇතිවේද?' කියා, මෙසේ යමෙක් අසයි නම් එය සුදුසු ප්‍රශ්නයකි. සළායතනයන් නිසා ස්පර්ශය ඇති වෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේයයි කියා එහිදී විසඳීම සුදුසුය."

**5.** "ස්වාමීනි, කවරෙක් වනාහි විඳීද?"

"ප්‍රශ්නය නුසුදුසුයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "විඳීයයි මම නොකියමි. ඉදින් මම විඳීයයි කියම් නම්, 'ස්වාමීනි, කවරෙක් වනාහි විඳීද?' යන ප්‍රශ්නය එහිදී සුදුසු වන්නේය. එසේ වනාහි මම නොකියමි. එසේ නොකියන්නාවූ මාගෙන් 'ස්වාමීනි කුමක් නිසා වේදනාව ඇතිවේද?' කියා, මෙසේ යමෙක් අසයි නම්, මෙය සුදුසු ප්‍රශ්නයකි. එහිදී ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි. වේදනාව නිසා තණ්හාව ඇතිවේයයි කියා විසඳීම සුදුසුය."

**6.** "ස්වාමීනි, කවරෙක් වනාහි ආශා කරයිද?"

භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක "මම ආශා කෙරේයයි නොකියමි. ඉදින් මම ආශා කෙරේයයි කියම් නම්, 'ස්වාමීනි, කවරෙක් වනාහි ආශා කෙරේද?' යන ප්‍රශ්නය එහිදී සුදුසු වන්නේය. එසේ වනාහි මම නොකියමි. එසේ නොකියන්නාවූ මාගෙන් 'ස්වාමීනි, කුමක් නිසා ආශාව ඇතිවේද?" කියා මෙසේ යමෙක් අසයි නම් මෙය සුදුසු ප්‍රශ්නයකි. එහිදී වේදනාව නිසා තණ්හාව (ආශාව) ඇතිවේ. තණ්හාව නිසා උපාදානය (දැඩිකොට අල්වාගැනීම) ඇති වේයයි කියා විසඳීම සුදුසුය."

**7.** "ස්වාමීනි, කවරෙක් වනාහි උපාදානය (දැඩිකොට අල්වාගැනීම) කෙරෙත්ද?"

භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක. "මම උපාදානය කෙරේයයි නොකියමි. ඉදින් මම උපාදානය කෙරේයයි කියම් නම් 'ස්වාමීනි, කවරෙක් වනාහි උපාදානය ඇති කෙරේද?' යන ප්‍රශ්නය එහිදී සුදුසු වන්නේය. එසේ වනාහි මම නොකියමි. එසේ නොකියන්නාවූ මාගෙන් 'ස්වාමීනි, කුමක්නිසා උපාදානය ඇතිවේද?' කියා මෙසේ යමෙක් අසයි නම්, මෙය සුදුසු ප්‍රශ්නයකි. එහිදී තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක,

පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද ඇතිවෙත්. මෙසේ මේ සියලු තනිකර දුක් සමූහය ඇතිවෙයි.

8. "එග්ගුනය, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ මුළුමනින් නැසීම හෙතුකොටගෙන ස්පර්ශය නැතිවේ. ස්පර්ශය නැතිවීම හෙතුකොටගෙන වේදනාව නැතිවේ. වේදනාව නැතිවීම හෙතුකොටගෙන තණ්හාව නැතිවේ. තණ්හාව නැතිවීම හෙතුකොටගෙන උපාදානය නැතිවේ. උපාදානය නැතිවීම හෙතුකොටගෙන භවය නැතිවේ. භවය නැතිවීම හෙතුකොට ගෙන ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීම හෙතුකොටගෙන ජරාව මරණය, ශෝකය. පරිදේව (හැඬීම) දුක්, දොම්නස් සහ උපායාසයෝ (තද ශෝක) නැතිවෙත්. මෙසේ මේ සියලු තනිකර දුක් සමූහය නැතිවෙයි.

(දෙවෙනි එග්ගුන සූත්‍රය නිමි.)

---

## 3 ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවෙසෙති. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරාව සහ මරණය නොදනිත්ද, ජරාමරණය ඇතිවීම නොදනිත්ද, ජරාමරණය නැතිවීම නොදනිත්ද, ජරා මරණය නැතිකරන මාර්ගය නොදනිත්ද, ඉපදීම නොදනිත්ද, ඉපදීම ඇතිවීම නොදනිත්ද, ඉපදීම නැතිවීම නොදනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය නොදනිත්ද, භවය නොදනිත්ද, භවය ඇතිවීම නොදනිත්ද, භවය නැතිවීම නොදනිත්ද, භවය නැතිකරන මාර්ගය නොදනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම)

නොදනිත්ද, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) ඇතිවීම නොදනිත්ද, උපාදානය (දැඩිව අල්වාගැනීම) නැතිවීම නොදනිත්ද, උපාදානය (දැඩිව අල්වාගැනීම) නැතිකරන මාර්ගය නොදනිත්ද, තණ්හාව නොදනිත්ද, තණ්හාව ඇතිවීම නොදනිත්ද, තණ්හාව නැතිවීම නොදනිත්ද, තණ්හාව නැති කරන මාර්ගය නොදනිත්ද, වේදනාව නොදනිත්ද, වේදනාව ඇතිවී නොදනිත්ද, වේදනාව නැතිවීම නොදනිත්ද, වේදනාව නැති කරන මාර්ගය නොදනිත්ද, ස්පර්ශය නොදනිත්ද, ස්පර්ශය ඇතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිවීම නොදනිත්ද, ස්පර්ශය නැති කරන මාර්ගය නොදනිත්ද, සළායතන (ෂට් ඉන්ද්‍රිය) නොදනිත්ද සළායතන (ෂට් ඉන්ද්‍රිය) ඇතිවීම නොදනිත්ද, සළායතන (ෂට් ඉන්ද්‍රිය) නැතිවීම නොදනිත්ද, සළායතන (ෂට් ඉන්ද්‍රිය) නැතිකරන මාර්ගය නොදනිත්ද, නාමය සහ රූපය නොදනිත්ද නාමය සහ රූපය ඇතිවීම නොදනිත්ද, නාමය සහ රූපය නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නොදනිත්ද, විඤ්ඤාණය ඇතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය නොදනිත්ද, සංස්කාරයන් නොදනිත්ද, සංස්කාරයන් ඇතිවීම නොදනිත්ද, සංස්කාරයන් නැතිවීම නොදනිත්ද, සංස්කාරයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ බවේ ඵලය හෝ බ්‍රාහ්ණ බවේ ඵලය හෝ මේ ආත්මයෙහි තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් ජරාව සහ මරණය දනිත්ද, ජරාමරණයන්ගේ ඇතිවීම දනිත්ද, ජරා මරණය නැතිවීම දනිත්ද, ජරාමරණය නැති කරන මාර්ගය දනිත්ද, ඉපදීම දනිත්ද, ඉපදීම ඇතිවීම දනිත්ද, ඉපදීම නැතිවීම දනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය දනිත්ද, භවය දනිත්ද, භවය ඇතිවීම දනිත්ද, භවය නැතිවීම දනිත්ද, භවය නැතිකරන මාර්ගය දනිත්ද, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) දනිත්ද, උපාදානය (දැඩිව

අල්ලා ගැනීම) ඇතිවීම දනිත්ද, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිවීම දනිත්ද, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිකරන මාර්ගය දනිත්ද, තණ්හාව දනිත්ද? තණ්හාව ඇතිවීම දනිත්ද, තණ්හාව නැතිවීම දනිත්ද, තණ්හාව නැති කරන මාර්ගය දනිත්ද, වේදනාව දනිත්ද, වේදනාව ඇතිවීම දනිත්ද, වේදනාව නැති වීම දනිත්ද, වේදනාව නැතිකරන මාර්ගය දනිත්ද, ස්පර්ශය දනිත්ද, ස්පර්ශය ඇතිවීම දනිත්ද, ස්පර්ශය නැතිවීම දනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) ඇතිවීම දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නැතිවීම දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නැති කරන මාර්ගය දනිත්ද, නාමරූපයන් දනිත්ද, නාමරූපයන් ඇතිවීම දනිත්ද, නාමරූපයන් නැතිවීම දනිත්ද, නාමරූපයන් නැති කරන මාර්ගය දනිත්ද, විඤ්ඤාණය දනිත්ද, විඤ්ඤාණය ඇතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය දනිත්ද, සංස්කාරයන් දනිත්ද, සංස්කාරයන් ඇතිවීම දනිත්ද, සංස්කාරයන් නැතිවීම දනිත්ද, සංස්කාරයන් නැතිකරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙති. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ ඵලයද, බ්‍රාහ්මණ භාවයේ ඵලයද මේ ආත්මයෙහිම තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරෙත්.

(ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)

---

## 4. "ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය" (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ ධර්මයන් නොදනිත්ද, මේ ධර්මයන්ගේ ඇතිවීම නොදනිත්ද, මේ ධර්මයන්ගේ නැතිවීම නොදනිත්ද, මේ ධර්මයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, කිනම් ධර්මයන් නොදනිත්ද? කිනම් ධර්මයක්හුගේ ඇතිවීම නොදනිත්ද? කිනම් ධර්මයක්හුගේ නැතිවීම නොදනිත්ද? කිනම් ධර්මයක්හුගේ නැතිවෙන මාර්ගය නොදනිත්ද? ජරා මරණය නොදනිත්ද, ජරා මරණයන්ගේ ඇතිවීම නොදනිත්ද, ජරාමරණයන්ගේ නැතිවීම නොදනිත්ද, ජරා මරණය නැතිවෙන මාර්ගය නොදනිත්ද, ඉපදීම නොදනිත්ද, ඉපදීම ඇතිවීම නොදනිත්ද, ඉපදීම නැතිවීම නොදනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය නොදනිත්ද, භවය නොදනිත්ද, භවය ඇතිවීම නොදනිත්ද, භවය නැතිවීම නොදනිත්ද, භවය නැතිකරන මාර්ගය නොදනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම) ඇතිවීම නොදනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවීම නොදනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිකරන මාර්ගය නොදනිත්ද, තණ්හාව නොදනිත්ද තණ්හාව ඇතිවීම නොදනිත්ද, තණ්හාව නැතිවීම නොදනිත්ද, තණ්හාව නැතිකරන මාර්ගය නොදනිත්ද, වේදනාව නොදනිත්ද, වේදනාව ඇතිවීම නොදනිත්ද, වේදනාව නැතිවීම නොදනිත්ද, වේදනාව නැති කරන මාර්ගය නොදනිත්ද, ස්පර්ශය නොදනිත්ද, ස්පර්ශය ඇතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය නොදනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නොදනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) ඇතිවීම නොදනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නැතිවීම නොදනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නැතිකරන මාර්ගය නොදනිත්ද, නාමරූපයන් නොදනිත්ද, නාමරූපයන් ඇතිවීම නොදනිත්ද, නාමරූපයන් නැතිවීම නොදනිත්ද, නාම රූපයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, විඤ්ඤාණය නොදනිත්ද, විඤ්ඤාණය ඇතිවීම නොදනිත්ද, විඤ්ඤාණය

නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය නොදනිත්ද, සංස්කාරයන් නොදනිත්ද, සංස්කාරයන්ගේ ඇතිවීම නොදනිත්ද, සංස්කාරයන්ගේ නැතිවීම නොදනිත්ද, සංස්කාරයන් නැතිවන මාර්ගය නොදනිත්ද, මේ ධර්මයන් නොදනිත්ද, මේ ධර්මයන්ගේ ඇතිවීම නොදනිත්ද, මේ ධර්මයන්ගේ නැතිවීම නොදනිත්ද, මේ ධර්මයන් නැතිවන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙති. ඒ ආයුෂ්මත්හුද ශ්‍රමණභාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මභාවයෙහි තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ ධර්මයන් දනිත්ද, මේ ධර්මයන්ගේ ඇතිවීම දනිත්ද, මේ ධර්මයන්ගේ නැතිවීම දනිත්ද, මේ ධර්මයන් නැතිවන මාර්ගය දනිත්ද, කිනම් ධර්මයක් දනිත්ද, කිනම් ධර්මයක්හුගේ ඇතිවීම දනිත්ද? කිනම් ධර්මයක්හුගේ නැතිවීම දනිත්ද? කිනම් ධර්මයක්හුගේ නැතිවෙන මාර්ගය දනිත්ද? ජරාමරණය දනිත්ද, ජරාමරණයාගේ ඇතිවීම දනිත්ද, ජරාමරණය නැතිවීම දනිත්ද, ජරාමරණය නැතිවෙන මාර්ගය දනිත්ද, ඉපදීම දනිත්ද, ඉපදීම ඇතිවීම දනිත්ද, ඉපදීම නැතිවීම දනිත්ද, ඉපදීම නැතිවෙන මාර්ගය දනිත්ද, භවය දනිත්ද, භවය ඇතිවීම දනිත්ද, භවය නැතිවීම දනිත්ද, භවය නැතිවෙන මාර්ගය දනිත්ද, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) දනිත්ද උපාදානය (දැඩිව අල්ලාගැනීම) ඇතිවීම දනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවීම දනිත්ද, උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවෙන මාර්ගය දනිත්ද, තණ්හාව දනිත්ද, තණ්හාව ඇතිවීම දනිත්ද, තණ්හාව නැතිවීම දනිත්ද, තණ්හාව නැතිවෙන මාර්ගය දනිත්ද, වේදනාව දනිත්ද, වේදනාව ඇතිවීම දනිත්ද, වේදනාව නැතිවීම දනිත්ද වේදනාව නැති වෙන මාර්ගය දනිත්ද ස්පර්ශය දනිත්ද, ස්පර්ශය ඇතිවීම දනිත්ද, ස්පර්ශය නැතිවීම දනිත්ද, ස්පර්ශය නැතිවෙන මාර්ගය දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) දනිත්ද,

සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) ඇතිවීම දනිත්ද, සළායතන (ෂට් ඉන්ද්‍රිය) නැතිවීම දනිත්ද, සළායතනයන් (ෂට් ඉන්ද්‍රිය) නැතිවෙන මාර්ගය දනිත්ද, නාමරූපයන් දනිත්ද, නාමරූපයන් ඇතිවීම දනිත්ද, නාමරූපයන් නැතිවීම දනිත්ද, නාමරූපයන් නැතිවෙන මාර්ගය දනිත්ද, විඥ්ඥාණය දනිත්ද, විඥ්ඥාණය ඇතිවීම දනිත්ද, විඥ්ඥාණය නැතිවීම දනිත්ද, විඥ්ඥාණය නැතිවෙන මාර්ගය දනිත්ද, සංස්කාරයන් දනිත්ද, සංස්කාරයන්ගේ ඇතිවීම දනිත්ද, සංස්කාර නැතිවීම දනිත්ද, සංස්කාර නැතිවෙන මාර්ගය දනිත්ද, මේ ධර්මයන් දනිත්ද, මේ ධර්මයන්ගේ ඇතිවීම දනිත්ද, මේ ධර්මයන්ගේ නැතිවීම දනිත්ද, මේ ධර්මයන්ගේ නැතිවෙන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හුද ශ්‍රමණ භාවයේ ඵලයද, බ්‍රාහ්මණ භාවයේ ඵලයද, මේ ආත්මභාවයෙහි තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරති.

(සතරවන ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)

---

## 5. කාත්‍යායන ගෝත්‍ර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති කච්චායනගොත්ත නම් මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තෙක සිටියේය. එක් පැත්තක සිටියාවූ, ඇවැත් කච්චායනගොත්ත නම් මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් දෘෂ්ටියයි කියනු ලබයි. ස්වාමීනි කෙතෙක් කරුණකින් වනාහි සම්‍යක්දෘෂ්ටිය වේද?"

3. කච්චායනය, මේ ලෝවැසි තෙම බොහෝ සෙයින් 'ඇත්තේය යන දෘෂ්ටියෙහිද, නැත්තේය යන දෘෂ්ටියෙහිද

පිහිටියේ වෙයි. කච්චායනය, ලෝකයේ ඇතිවීම ඇතිසැටියෙන් මනා නුවණින් දකින්නාට වනාහි ලෝකයෙහි නැත්තේය යන යම් දෘෂ්ටියක් වේ නම් එය නොවෙයි. කච්චායනය, ලෝකයේ නැතිවීම ඇතිසැටියෙන් මනා නුවණින් දකින්නාට ලෝකයෙහි ඇත්තේය යන යම් දෘෂ්ටියක් වේ නම් එය, නොවෙයි කච්චායනය, මේ ලෝවැසි තෙම වනාහි බොහෝ සෙයින් උපාය උපාදාන අභිනිවෙස නම්වූ තෘෂ්ණාදෘෂ්ටීන් විසින් බඳනා ලද්දේ වෙයි. (එහෙත්) මේ ආර්ය ශ්‍රාවකතෙම අකුසල් සිතට පිහිටවූ, නිවාසස්ථානවූ, නිදනස්ථානයවූ උපාය උපාදානයයි කියනලද තෘෂ්ණාදෘෂ්ටි දෙකින් මෙය මාගේ ආත්මයයි නොපැමිණෙයි, නොගනියි, නොපිහිටයි. උපදිනුයේද පඤ්චස්කන්ධ දුකමය, නිරුද්ධ වන්නේද පඤ්චස්කන්ධ දුකමය, එයින් අන්‍යවූ සත්වයෙක් පුද්ගලයෙක් නොවේයයි සැක නොකරයි, දෙයාකාරයකින් නොසිතයි, ඔහුට මෙහි ප්‍රත්‍යක්ෂවූම ඥානයක් වෙයි. කච්චායනය, මෙතෙක් කරුණුවලින් සම්‍යක්දෘෂ්ටිය වෙයි.

4. කච්චායනය, සියල්ල ඇත යන මේ ශාස්වත දෘෂ්ටිය වනාහි එක් අන්තයකි. සියල්ල නැත යන මේ උච්ඡේද දෘෂ්ටිය දෙවෙනි අන්තයයි. කච්චායනය, මේ අන්ත දෙකට නොපැමිණ, තථාගතයන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවෙන් ධර්මය දේශනා කරන සේක. (කෙසේද?) අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙති. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොමනස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක්ගොඩ ඇතිවේ. අවිජ්ජාව සහමුලින් නැතිවීමෙන් සංස්කාරයෝ නැතිවෙති. සංස්කාරයන් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන

නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවේ. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවේය කියායි."

(කාත්‍යායන ගොත්‍ර සූත්‍රය නිමි.)

---

## 6. ධර්ම කථික සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, ධර්මකථිකයාය, ධර්මකථිකයායයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ධර්ම කථිකයෙක් වෙයිද?"

3. "ඉදින් මහණතෙම ජරා මරණයට කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, ජරා මරණ නැතිකිරීම පිණිසද, ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ජරා මරණයට කලකිරීම පිණිසද නොඇලීම පිණිසද සහ ජරා මරණ නැතිකිරීම පිණිසද පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම (ධර්මානුධර්ම පටිපන්න) ලෝකෝත්තර ධර්මයට අනුව පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ජරා මරණයට කලකිරීම හේතුකොටගෙන, නොඇලීම හේතුකොටගෙන, ජරා මරණ නැතිකිරීම හේතුකොටගෙන, සතර උපාදානයන්ගේ අල්වා ගැනීමෙන් මිදුනේ වේද, ඒ

මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

3. "ඉදින් මහණතෙම ඉපදීමට කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ජාතියට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ජාතියට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේ වේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයි කීමට සුදුසුය.

4. "ඉදින් මහණතෙම භවයට කලකිරීම, නොඇලීම එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම භවයට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම භවයට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේ වේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

5. "ඉදින් මහණතෙම උපාදානයට (තද ඇල්මට) කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම උපාදානයට (තද ඇල්මට) කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම උපාදානයට (තද ඇල්මට) කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර

උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**6.** "ඉදින් මහණතෙම තණ්හාවට කලකිරීම; නොඇලීම එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම තණ්හාවට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම තණ්හාවට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**7.** "ඉදින් මහණතෙම වේදනාවට කලකිරීම, නොඇලීම එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම වේදනාවට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේවෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධමර්යට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම වේදනාවට කලකිරීමෙන්, නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**8.** "ඉදින් මහණතෙම ස්පර්ශයට කලකිරීම නොඇලීම එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ස්පර්ශයට කලකිරීම, නොඇලී සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම ස්පර්ශයට කලකිරීමෙන් නොඇලීමෙන් එය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේ වේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

9. "ඉදින් මහණතෙම සළායතනයන්ට කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදේශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සළායතනයන්ට කලකිරීම, නොඇලීම සහ එය නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සළායතනයන්ට කලකිරීමෙන් නොඇල්මෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේ වේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

10. "ඉදින් මහණතෙම නාමරූපයන්ට කලකිරීම, නොඇලී, එය නැතිකිරීම පිණිස ධර්මදෙශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණ තෙම නාමරූපයන්ට කලකිරීම, නොඇලීම සහ එය නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම නාමරූපයන්ට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණ තෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

11. "ඉදින් මහණතෙම විඤ්ඤාණයට කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදෙශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණ තෙම විඤ්ඤාණයට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින්

මහණතෙම විඤ්ඤාණයට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

12. "ඉදින් මහණතෙම සංස්කාරයන්ට කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදෙශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණ තෙම සංස්කාරයන්ට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම සංස්කාරයන්ට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

13. "ඉදින් මහණතෙම අවිජ්ජාවට කලකිරීම, නොඇලීම, එය නැතිකිරීම පිණිස ධර්මදෙශනා කෙරේද, ඒ මහණතෙම ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණ තෙම අවිජ්ජාවට කලකිරීම, නොඇලීම සහ එය නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඒ මහණතෙම ලෝකොත්තර ධර්මයට අනුකූලවූ, ධර්මයට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් මහණතෙම අවිජ්ජාවට කලකිරීමෙන් නොඇලීමෙන් එය නැතිකිරීමෙන් සහ සතර උපාදානයන්ගේ වශයෙන් කිසිවක් නොගැනීමෙන් වැළකුණේවේද, ඒ මහණතෙම මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

---

## 7. අචේල කස්සප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ, "කලන්දකනිවාප" නම් ලත් වේළුවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන්

වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, රජගහ නුවරට පිඬුපිණිස වැඩිසේක.

**2.** "අචේල කාශ්‍යපතෙම වනාහි වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුවේය. දැක, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූද, සිහිකටයුතුවූද, කථාව කොට නිමවා, එක් පසෙක සිටියේය. එක් පසෙක සිටියාවූ, අචේල කාශ්‍යපතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ඉදින් අපට ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දෙතොත් අපි භවත් ගෞතමයන්ගෙන් කිසියම් කාරණයක් අසන්නෙමු"යි කියායි. කාශ්‍යප "ඇතුළුගමට පිවිසියෙමු. ඒතාක් ප්‍රශ්නය ඇසීමට කාලය නොවේයයි වදාළ සේක.

**3.** අචේල කාශ්‍යප තෙම වනාහි දෙවෙනුවත් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ඉදින් අපට ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දෙතොත් අපි භවත් ගෞතමයන්ගෙන් කිසියම් කාරණයක් අසන්නෙමු කියායි."

"කාශ්‍යපය, ඇතුළුගමට පිවිසියෙමු. ඒතාක් ප්‍රශ්නය ඇසීමට කාලය නොවේයයි" වදාළ සේක.

**4.** අචේල කාශ්‍යපෙතම වනාහි තෙවෙනුවත් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ඉදින් අපට ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දෙතොත් අපි භවත් ගෞතමයන්ගෙන් කිසියම් කාරණයක් අසන්නෙමු" කියායි.

"කාශ්‍යපය, ඇතුළුගමට පිවිසියෙමු. ඒ තාක් ප්‍රශ්නය ඇසීමට කාලය නොවේයයි" වදාළ සේක.

මෙසේ කීකල්හි අචේල කාශ්‍යපතෙම මෙය කීයේය. අපි වනාහි භවත් ගෞතමයන්ගෙන් බොහෝ කොට අසනු කැමති නොවෙමු" කියායි. "කාශ්‍යපය, යමක් ඇසීමට කැමැත්තෙහි නම් එය අසවයි" වදාළ සේක.

**5.** "භවත් ගෞතමයිනි, කිමෙක්ද දුක, තමා විසින් කරන ලද්දේද?"

"කාශ්‍යපය, එසේ නොකියවයි," භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද දුක, අනුන් විසින් කරන ලද්දේද?"

"කාශ්‍යපය, එසේ නොකියවයි," භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද දුක, තමා විසින් සහ අනුන් විසින් කරන ලද්දේද?"

"කාශ්‍යපය, එසේ නොකියවයි," භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද දුක, තමා විසින් සහ අනුන් විසින් නොකරන ලද්දේ සිය කැමැත්තෙන් (ඉබේ) ඇතිවූයේද?"

"කාශ්‍යපය, එසේ නොකියවයි," භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**6.** "භවත් ගෞතමයිනි, කිමෙක්ද දුකක් නැද්ද?"

"කාශ්‍යපය, දුක වනාහි නැත්තේ නොවේ. දුක වනාහි ඇත්තේය."

"එසේ වී නම් භවත් ගෞතම තෙමේ දුක නොදනියිද? නොදකියිද?"

"කාශ්‍යපය, මම වනාහි දුක නොදන්නෙම් නොවෙමි, නොදක්නෙම් නොවෙමි. කාශ්‍යපය, මම වනාහි දුක දනිමි. කාශ්‍යපය, මම වනාහි දුක දකිමියි" වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද? දුක තමා විසින් කරන ලද්දේ දැයි මෙසේ අසන ලද්දේ වනාහි 'කාශ්‍යපය, එසේ නොකියවයි' කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද? දුක අනුන් විසින් කරන ලද්දේදැයි මෙසේ අසන ලද්දේ වනාහි 'කාශ්‍යපය, එසේ නොකියවයි' කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද? දුක තමා විසින් සහ අනුන් විසින් කරන ලද්දේ දැයි මෙසේ අසන

ලද්දේ වනාහි කාශ්‍යපය, එසේ නොකියවයි' කියහි. භවත් ගෞතමයිනි කිමෙක්ද? දුක තමා විසින් නොකරන ලද්දේ. අනුන් විසින් නොකරන ලද්දේ, සිය කැමැත්තෙන් (ඉබේ) ඇතිවූයේ දැයි මෙසේ අසන ලද්දේ වනාහි 'කාශ්‍යපය, එසේ නොකියවයි' කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද? දුකක් නැද්දැයි මෙසේ අසන ලද්දේ වනාහි 'කාශ්‍යපය, දුක වනාහි නැත්තේ නොවේ. 'කාශ්‍යපය, දුක වනාහි ඇත්තේය'යි කියහි. එසේ වී නම් භවත් ගෞතම තෙමේ දුක නොදනියිද නොදකියි දැයි අසන ලද්දේ වනාහි 'කාශ්‍යපය, මම වනාහි දුක නොදන්නෙම් නොවෙමි. කාශ්‍යපය, මම වනාහි දුක දනිමියි' කියහි.

7. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට දුක කියා දෙන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට දුක දේශනා කරන සේක්වා."

"කාශ්‍යපය, හෙතෙම කෙරෙයි, හෙතෙම විඳීයයි මුලදීම මෙසේ ගෙන දුක තමා විසින් කරන ලද්දේයයි කියන තැනැත්තේ, ශාස්වත දෘෂ්ටියට (නිත්‍ය ආත්මයක් ඇත යන දෘෂ්ටියට) පැමිණෙයි. කාශ්‍යපය, අනිකෙක් කරයි, අනිකෙක් විඳීයයි මුලදී මෙසේ ගෙන වේදනාවෙන් යුක්තවූ කල්හි දුක අනුන් විසින් කරන ලදැයි කියන තැනැත්තේ උච්ඡේද දෘෂ්ටියට (කරන්නා මෙතනින්ම කෙළවර වෙයි යන දෘෂ්ටිය) පැමිණෙයි. කාශ්‍යපය, ඒ මේ ශාස්වත, උච්ඡේද යන අන්ත දෙකට නොපැමිණ, මද්ධ්‍යම ප්‍රතිපදාවෙහි සිටියේ. තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක. (කෙසේද?)

8. "අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවෙයි. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ ඉපදීම (ජාතිය) නිසා ජරා මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්,

දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක් ගොඩ ඇතිවෙයි.

**9.** "අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන්ම සංස්කාරයෝ නැතිවෙත්. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය නැති වීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙයි. මෙසේ මේ සියලු එකම දුක් ගොඩ නැතිවෙයි කියායි."

**10.** මෙසේ වදාළ කල්හි අචේල කාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරු කරන්නේද, (තණකොළ ආදියෙන්) වැසුනක් වැහුම් හරින්නේද, මංමුළාවූවෙකුට මඟ හෝ කියන්නේද, (ගණඅඳුරෙහි) ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම පින්වතුන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරනලදී. ස්වාමීනි, ඒ ධර්මය ඇසූ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද, සංඝයාද සරණ කොට යමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි, උපසම්පදාව ලබන්නෙමි"යි කීයේය.

**11.** "කාශ්‍යපය, අන්‍ය ශාසනයක පැවිදිව සිටියෙක් වනාහි (ඉදින්) මේ ශාසනයෙහි පැවිද්ද කැමැති වේද; උපසම්පදාව කැමති වේද, හෙතෙම සාරමාසයක් පිරිවෙස් පුරයි. සාරමස පසුවීමෙන් වැස නිමවන ලද පිරිවෙස් ඇත්තන් විසින් සතුටු කරන ලද සිත් ඇති, භික්ෂූහු, කැමති වන්නාහු නම් භික්ෂු භාවයෙහි පැවිදි කරවත්, උපසම්පදා කරවත්. එතකුදුවුවත් මා විසින් පුද්ගලයන්ගේ නානත්වය දැනගන්නා ලදී."

"ඉදින් ස්වාමීනි, ශාසනයෙහි පැවිද්ද කැමැත්තාවූ, උපසම්පදාව කැමැත්තාවූ, අන් සසුනක පැවිදිව විසුවෝ සාරමසක් පිරිවෙස් පුරද්ද, සාරමස අවසන් වීමෙන් සතුටු කරන ලද, සිත් ඇති භික්ෂූහු කැමැත්තාහු නම් ඒ වැස නිමවන ලද පිරිවෙස් ඇතියන් භික්ෂු භාවයෙහි පැවිදි කෙරෙද්ද, උපසම්පදා කෙරෙද්ද, මම සතර අවුරුද්දක් පිරිවෙස් පුරමි. සාර අවුරුද්දකින් පසු සතුටු කරන ලද සිත් ඇති භික්ෂූහු වැස නිමවන ලද පිරිවෙස් ඇති මා භික්ෂු භාවයෙහි පැවිදි කෙරෙත්වා; උපසම්පදා කෙරෙත්වා' යනුයි.

12. අචේල කාශ්‍යපතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබීය. උපසම්පදාව ලැබීය. අලුත උපසම්පදාවූ ඇවැත් අචේල කාශ්‍යප ස්ථවිරතෙම වනාහි තනිව පිරිසෙන් වෙන්ව, ප්‍රමාද නොව, කෙලෙස් තවන වීර්යය ඇතිව, නිවණ කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නේය, නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, ඒ අති උතුම් වූ, බ්‍රහ්මචරියාව මේ ආත්යෙහි තෙමේම දැන, අවබෝධ කොට, ඊට පැමිණ, වාසය කළේය. ඉපදීම නැති විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසන් කරන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මයෙහි කළයුතු අන් කිසිවක් නැතැයි දැන ගත්තේය. ඇවැත් කාශ්‍යප තෙම එක්තරා රහතන් වහන්සේ නමක්ද වූයේය.

(හත්වන අචේල සූත්‍රය නිමි.)

---

## 8. තිම්බරුක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක.

2. ඉක්බිති 'තිම්බරුක' පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි වැඩ සිටිසේක්ද, එතැන්හි පැමිණියේය.

පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටුවිය යුතු වූත්, සිහිකට යුතු වූත් කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය.

3. එක් පැත්තක හුන්නාවූ, තිම්බරුක පරිබ්‍රාජකතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. 'භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් තමා විසින් කරන ලද්දේද?"

"තිම්බරුකය, එසේ නොකියව"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් අනුන් විසින් කරන ලද්දේද?"

"තිම්බරුකය, එසේ නොකියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් තමා සහ අනුන් විසින් කරන ලද්දේද?"

"තිම්බරුකය, එසේ නොකියව"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් තමා සහ අනුන් විසින් නොකරන ලද්දේ, සිය කැමැත්තෙන් (ඉබේ) ඇතිවූයේද?"

"තිම්බරුකය, එසේ නොකියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

4. "භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් නැද්ද?"

"තිම්බරුකය, සැප දුක් වනාහි නැත්තේ නොවේ. තිම්බරුකය, සැප දුක් වනාහි ඇත්තේය."

එසේ වීනම්, භවත් ගෞතම තෙම සැප දුක් නො දනියිද?"

"තිම්බරුකය, මම වනාහි සැප දුක් නොදන්නෙම් නොවෙමි. තිම්බරුකය, මම වනාහි සැප දුක් දනිමි."

"භවත් ගෞතමයිනි, කිමෙක්ද? සැප දුක් තමා විසින් කරන ලද්දේ දැයි මෙසේ අසන ලද්දේ වනාහි 'තිම්බරුකය, එසේ

නොකියව”යි කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද? සැප දුක් අනුන් විසින් කරන ලද්දේ දැයි මෙසේ අසන ලද්දේ වනාහි ‘තිම්බරුකය, එසේ නොකියව’යි කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් තමා විසින් නොකරන ලද්දේ, අනුන් විසින් නොකරන ලද්දේ සිය කැමැත්තෙන් (ඉබේ) ඇති වූයේ දැයි මෙසේ අසන ලද්දේ වනාහි ‘තිම්බරුකය, එසේ නොකියව’යි කියහි. භවත් ගෞතමයිනි, කිමෙක්ද, සැප දුක් නැද්දැයි මෙසේ අසන ලද්දේ වනාහි ‘තිම්බරුකය, සැප දුක් වනාහි නැත්තේ නොවේ. තිම්බරුකය, සැප දුක් වනාහි ඇත්තේයි’ කියහි. එසේ නම් භවත් ගෞත තෙමේ සැප දුක් නොදනියිද, නොදකියි දැයි අසන ලද්දේ ‘තිම්බරුකය, මම වනාහි සැප දුක් නොදන්නෙම් නොවෙමි. තිම්බරුකය, මම වනාහි සැප දුක් දනිමියි කියති. භවත් ගෞතයන් වහන්සේ මට සැප දුක් කියා දෙන සේක්වා. භවත් ගෞතමයන් වහන්සේ මට සැප දුක් දේශනා කරන සේක්වා.”

**5.** “තිම්බරුකය, ඒ වේදනා ඔහු විඳීයයි මෙසේ ඇති කල්හි වනාහි සැප දුක් තමා විසින් කරන ලද්දේයයි මෙසේ මම නොකියමි. තිම්බරුකය, අන්‍යවූ වේදනා අනිකෙක් විඳීයයි මෙසේ වේදනාවෙන් යුක්තවූ කල්හි වනාහී සැප දුක් අනුන් විසින් කරන ලද්දේයයි මම නොකියමි. තිම්බරුකය, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, මධ්‍යම ප්‍රතිපදාවෙන් තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

**6.** “අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවෙයි. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායනත නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදනය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

7. "අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන්ම සංස්කාර නැතිවෙයි. සංස්කාරයන් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැති වෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ නැතිවේයයි (වදාළ සේක.)

8. "මෙසේ වදාළ කල්හි තිම්බරුක පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරු කරන්නේද, (තණකොළ ආදියෙන්) වැසුනක් වැහුම් හරින්නේද, මංමුළාවූවෙකුට මඟ හෝ කියන්නේද, (ගණඅඳුරෙහි) ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරන ලදී. ස්වාමීනි, ඒ ධර්මය ඇසූ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද, සංඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණ ගිය උපාසකයකු කොට මා සලකන සේක්වා."

---

## 9. බාලපණ්ඩිත සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසීගියාවූ, තණ්හාවෙන් යුක්තවූ, බාලයාගේ මේ කය (අවිජ්ජාවෙන් වැසීගිය හෙයින් සහ තණ්හාවෙන් යුක්තවූ හෙයින්) මෙසේ ඇති වූයේය. මෙසේ මේ අධ්‍යාත්මිකවූ, තමාගේ කයද, බාහිරවූ, අනුන්ගේ කයදැයි මෙසේ මෙය දෙකකි. ඒ අධ්‍යාත්මික තමාගේ කයත් බාහිරවූ අන්‍යයාගේ කයත් යන කරුණු දෙක නිසා ස්පර්ශය ඇතිවේ. ඒ ස්පර්ශය ඇතිවෙන කරුණු සයක්ම වෙත්. යම් ඒ කරුණු වලින් හෝ ඒ කරුණු අතුරෙන් එක්තරා කරුණකින් ස්පර්ශ කරන ලද්දාවූ බාලතෙම සැප දුක් විඳීද,

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසීගියාවූ, තණ්හාවෙන් යුක්තවූ, පණ්ඩිතයාගේ මේ කය (අවිජ්ජාවෙන් වැසීගිය හෙයින් හා තණ්හාවෙන් යුක්තවූ හෙයින්) මෙසේ ඇති වූයේය. මෙසේ මේ අධ්‍යාත්මිකවූ තමාගේ කයද, බාහිරවූ අනුන්ගේ කයදැයි මෙසේ මෙය දෙකකි. ඒ අධ්‍යාත්මික බාහිර කරුණු දෙක නිසා ස්පර්ශය ඇතිවේ. ඒ ස්පර්ශය ඇතිවන්නාවූ කරුණු සයකි. ඒ කරුණු වලින් හෝ ඒ කරුණු අතුරෙන් එක්තරා කරුණකින් හෝ ස්පර්ශය කරන ලද්දාවූ පණ්ඩිතතෙම සැප දුක් විඳීද, මහණෙනි, බාලයාගේ සහ පණ්ඩිතයාගේ කය හට ගැනීමාදියෙහිදී බාලයාට වඩා පණ්ඩිතයාගේ ඇති විශේෂය කවරේද? අධික විශේෂය කවරේද? වෙනස්වූ කාරණය කුමක්ද?"

4. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින් කියා දෙතොත් ඉතා හොඳය.

"මහණෙනි, එසේ වී නම් අසව්. ඉතා හොඳින් සිතේ තබා ගනිව් කියන්නෙමියි" වදාළ සේක. "එහෙමයි ස්වාමීනි." කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

6. "මහණෙනි, යම් අවිජ්ජාවකින් වැසුනාවූ, යම් තණ්හාවකින් යුක්තවූ බාලයාගේ මේ කය ඇතිවූයේ වේද,

බාලයාගේ ඒ අවිජ්ජා තොමෝ නැති නොවූවාය. ඒ තණ්හා තොමෝ ක්ෂය නොවූවාය. එයට හේතු කවරේද? මහණෙනි, බාලතෙම දුක් නැතිකිරීම පිණිස මනාකොට බ්‍රහ්මචරියාවෙහි නොහැසුරුනේය. ඒ නිසා බාලතෙම කය බිඳීමෙන් අන්‍යවූ කයකට (පිළිසිඳ ගැනීම වශයෙන්) යන්නේ වෙයි. හෙතෙම අන්‍යවූ කයකට (පිළිසිඳ ගැනීම් වශයෙන්) යන්නේ ඉපදීමෙන්ද, දිරීමෙන් සහ මැරීමෙන්ද, ශෝක වීමෙන්ද, හැඬීමෙන්ද, දුකින්ද, දොම්නසින්ද, වැළපීමෙන්ද නොමිදෙයි, දුකින් නොමිදේයයි කියමි.

7. "මහණෙනි, යම් අවිජ්ජාවකින් වැසුනාවූ, යම් තණ්හාවකින් යුක්තවූ පණ්ඩිතයාගේ මේ කය ඇතිවූයේ වේද, පණ්ඩිතයාගේ ඒ අවිජ්ජා තොමෝ නැතිවූවාය. ඒ තණ්හා තොමෝ ක්ෂය වූවාය. එයට හේතු කවරේද? මහණෙනි, පණ්ඩිත තෙම දුක් නැතිකිරීම පිණිස මනාකොට බ්‍රහ්මචරියාවෙහි හැසුරුණේය. ඒ නිසා පණ්ඩිතතෙම කය බිඳීමෙන් අන්‍යවූ කයකට (පිළිසිඳ ගැනීම වශයෙන්) නොයන්නේ වෙයි. හෙතෙම අන්‍යවූ කයකට (පිළිසිඳ ගැනීම් වශයෙන්) නොයන්නේ, ඉපදීමෙන්ද, දිරීමෙන් සහ මැරීමෙන්ද, ශෝකයෙන්ද, හැඬීමෙන්ද, දුකින්ද, දොම්නසින්ද, වැළපීමෙන්ද මිදෙයි. දුකින් මිදේයයි කියමි. මහණෙනි, බාලයාගේ හා පණ්ඩිතයාගේ ඇති විශේෂය නම්, අධික විශේෂය නම්, වෙනස්වූ කාරණය නම් මේ බ්‍රහ්මචරියාවෙහි හැසිරීමයි."

## 10. ප්‍රත්‍යය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවෙසෙති. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මම තොපට පටිච්චසමුප්පාදයද (හෙතු ධර්මයද) පටිච්චසමුප්පන්න ධර්මයන්ද (ඵල ධර්මයන්ද) දේශනා කරන්නෙමි එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළ සේක. 'එසේය ස්වාමීනි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

3. "මහණෙනි, පටිච්චසමුප්පාදය (හෙතු ධර්ම) නම් කවරේද? මහණෙනි, තථාගතවරයන් උපන් කල්හිද, තථාගත වරයන් නූපන් කල්හිද ඉපදීම නිසා ජරාව සහ මරණය ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාව ප්‍රත්‍යයන් හෙතුකොටගෙන ප්‍රත්‍යයන්ගේ පැවැත්ම මේ ඵලයන්ට මේ හෙතූන් බව ඇත්තේය. එය තථාගතතෙම අවබෝධ කෙරෙයි. වටහාගනියි. අවබෝධකොට වටහාගෙන, කියයි. දෙශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මතුකොට දක්වයි.

4. "මහණෙනි, ඉපදීම නිසා ජරාව සහ මරණය ඇති වේ. එය බලව්යයි ද කියයි.

5. "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද නූපන් කල්හිද, භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි. ධර්ම නිසාමයයි. ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගත තෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, "භවය නිසා ජාතිය" ඇතිවේ. එය බලව්යයි ද කියායි. මහණෙනි, මෙසේ වනාහි ඒ "භවය නිසා ජාතිය" යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන් ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍ය වීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

**6.** "මහණෙනි, තථාගතයන්වහන්සේ උපන් කල්හිද නූපන් කල්හිද උපාදානය (තද ඇල්ම) නිසා භවය ඇතිවේ. නූපන් මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි. ධර්ම නිසාමයයි ජරාමරණාදීන්ට ප්‍රත්‍යක්ෂවීමයි. එය තථාගත තෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනාකෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, "උපාදානය නිසා භවය" ඇතිවේ. එය බලව්යයිද කියායි. මහණෙනි, මෙසේ වනාහි ඒ "උපාදානය නිසා භවය" ඇතිවේ. යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

**7.** "මහණෙනි, තථාගතයන්වහන්සේ උපන් කල්හිද නූපන් කල්හිද තණ්හාව නිසා උපාදානයෝ ඇතිවෙත්. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි, ධර්ම නිසාමයයි. ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගතතෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි, පණවයි. පිහිටුවයි, විවරණ කෙරෙයි, බෙදයි, මහණෙනි, "තණ්හාව නිසා උපාදානයෝ" ඇතිවෙත් යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

**8.** "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද නූපන් කල්හිද, වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමය, ස්වභාව ධර්මයයි, ධර්ම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නිසාමයයි. ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගතතෙම අවබෝධ කෙරෙයි, වටහා ගනියි, අවබෝධකොට වටහාගෙන කියයි, දේශනා කෙරෙයි, පණවයි, පිහිටුවයි, විවරණකෙරෙයි, තවද, මහණෙනි, "වේදනාව නිසා තණ්හාව" ඇතිවේ. එය බලව්යයිද කියයි. මහණෙනි, මෙසේ වනාහි ඒ "වේදනාව නිසා තණ්හාව" ඇතිවේ යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

**9.** "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි, ධර්ම නිසාමයයි ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගත තෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, "ස්පර්ශය නිසා වේදනාව" ඇතිවේ. එය බලව්යයිද කියායි. මහණෙනි, මෙසේ වනාහි ඒ "ස්පර්ශය නිසා වේදනාව" ඇතිවේ යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යය වීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

**10.** "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද, සළායතනයන් (ඉන්ද්‍රියන්) නිසා ස්පර්ශය ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාවධර්මයයි. ධර්ම නිසාමයයි. ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය ස්වභාව ධර්මයයි තථාගතතෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි.

පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, "සළායතනයන් නිසා ස්පර්ශය" ඇතිවේ. එය බලව්යයිද කියයි. මහණෙනි, මෙසේ වනාහි ඒ "සළායතනයන් නිසා ස්පර්ශය" ඇතිවේ. යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක් සමගියට පැමිණි ප්‍රත්‍යයයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

11. "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද, නාමරූපයන් නිසා සළායතනයෝ ඇතිවෙත්. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි. ධර්ම නිසාමයයි, ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගත තෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහා ගෙන කියයි. දේශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, නාමරූපයන් නිසා සළායතනයන් ඇතිවේ. එය බලව්යයිද කියායි. මහණෙනි, මෙසේ වනාහි ඒ "නාමරූපයන් නිසා සළායතනයන්" ඇතිවේ. යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

12. "මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද, විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාවධර්මයයි ධර්ම නිසාමයයි, ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගතතෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, "විඤ්ඤාණය නිසා නාම

රූප” ඇතිවේ. එය බලව්යයිද කියායි. මහණෙනි, මෙසේ වනාහි ඒ “විඥ්ඥාණය නිසා නාම රූප” ඇතිවේ යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්ම ප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හෙතුඵල ධර්මයයි) කියනු ලැබේ.

13. “මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද, සංස්කාරයන් නිසා විඥ්ඥාණය ඇතිවේ. මේ ප්‍රත්‍යය ස්වභාවය වනාහි ස්වභාවයෙන් සිටියේමයි. ස්වභාව ධර්මයයි, ධර්ම නිසාමයයි, ජරාමරණාදීන්ට ප්‍රත්‍යයවීමයි. එය තථාගතතෙම අවබෝධ කෙරෙයි. වටහා ගනියි. අවබෝධ කොට, වටහාගෙන කියයි. දේශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. මහණෙනි, “සංස්කාරයන් නිසා විඥ්ඥාණය” ඇතිවේ. එය බලව් යයිද කියයි. මහණෙනි, මෙසේ වනාහි ඒ සංස්කාරයන් නිසා විඥ්ඥාණය ඇතිවේ, යන තන්හි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධර්මයාගේ ඇතිවීමක්, සමගියට පැමිණි ප්‍රත්‍යයන්හිදී මොහොතකුදු එයින් උපදින ධර්මයන්ගේ නැතිවීමක්, අන්‍යවූ, ධර්මප්‍රත්‍යය කරණකොට ගෙන අන්‍ය ධර්මයන්ගේ ඇතිවීමක්, ජරාමරණයන්ට ප්‍රත්‍යයවීමක් වේද, මහණෙනි, මෙයට පටිච්චසමුප්පාදයයි (හේතුඵල ධර්මයයි) කියනු ලැබේ.

14. “මහණෙනි, තථාගතයන් වහන්සේ උපන් කල්හිද, නූපන් කල්හිද, අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. මහණෙනි, මෙසේ එහි එසේම වන බවක්, නොවරදින බවක්, අන් ආකාරයකින් නොවන බවක්, මේ ඵලය මේ හේතුවෙන් වන බවක් ඇත්තේද, මහණෙනි, මේ වනාහි පටිච්චසමුප්පාදයයි කියනු ලැබේ.

15. “මහණෙනි, පටිච්චසමුප්පන්න ධර්මයෝ (හේතුඵල ධර්මයෝ) කවරහුද? මහණෙනි, ජරාව සහ මරණය අනිත්‍යය.

ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂය වන ස්වභාව ඇත්තේය. වැය වන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, ජාතිය (ඉපදීම) අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂය වෙන ස්වභාව ඇත්තේය. වැය වෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, භවය අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, උපාදානය (තද ඇලීම) අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, තණ්හාව අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, වේදනාව අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, ස්පර්ශය අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, සළායතන (ඉන්ද්‍රිය) අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය.

ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, නාමරූප අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, විඤ්ඤාණය අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, සංස්කාර අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, අවිජ්ජාව අනිත්‍යය. ප්‍රත්‍යයන් එක්කොට කරන ලද්දේය. ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ක්ෂයවෙන ස්වභාව ඇත්තේය. වැයවෙන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය.

"මහණෙනි, මොවුහු පටිච්චසමුප්පන්න ධර්මයෝයයි (හේතුඵලධර්මයෝයයි) කියනු ලැබෙත්.

**16.** "මහණෙනි, යම් හෙයකින් වනාහී ආර්‍ය ශ්‍රාවකයා විසින් මේ පටිච්චසමුප්පාදයද, මේ පටිච්චසමුප්පන්න ධර්මයන්ද ඇතිසැටි යහපත් නුවණින් මනාකොට දක්නා ලද්දාහු වෙත්ද, එවිට ඒ ආර්‍ය ශ්‍රාවකතෙම මම අතීතකාලයෙහි වූයෙම්දෝ අතීත කාලයෙහි නූවූයෙම්දෝ කවර ජාති ඇත්තෙකු වූයෙම්දෝ අතීත කාලයෙහි රූපය කෙසේ වූයෙම්දෝ, මම අතීත කාලයෙහි කවර ජාති ඇත්තෙකු වී පසුව කවර ජාති ඇත්තෙකු වූයෙම්දෝ කියා අතීතයට දුවන්නේය යන යමක් ඇත්නම් ඊට කරුණු නැත. මම අනාගත කාලයෙහි වෙම්දෝ, අනාගත කාලයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවෙම්දෝ, අනාගත කාලයෙහි කවර ජාති ඇත්තෙකු වෙම්දෝ, අනාගත කාලයෙහි රූපය කෙසේ වෙම්දෝ, අනාගත කාලයෙහි කවර ජාති ඇත්තෙකුවී, පසුව කවර ජාති ඇත්තෙකු වෙම්දෝයි අනාගතයට දුවන්නේය යන යමක් ඇත්නම් ඊට කරුණු නැත. මේ වර්තමාන කාලය ගැන හෝ තමාගේ පඤ්චස්කන්ධය මම වෙම්දෝ, නොවෙම්දෝ, කවර ජාති ඇත්තෙකු වෙම්දෝ (රූපය) කෙසේ වෙම්දෝ මේ සත්වතෙම කොහෙන් වනාහි ආයේද; හෙතෙම කොහි යන්නේදැයි සැක ඇති වන්නේය යන යමක් වේනම් ඊට කරුණු නැත. ඊට හේතුව කවරේද? මහණෙනි, ආර්යශ්‍රාවකයා විසින් මේ පටිච්චසමුප්පාදයද; මේ පටිච්චසමුප්පන්න ධර්මයෝද ඇති සැටි යහපත් නුවණින් මනාකොට දක්නාලද හෙයිනි.

දෙවෙනි ආහාර වර්ගයයි.

ආහාර සූත්‍රය, ඵග්ගුණ සූත්‍රය; සමණ බ්‍රාහ්මණ සූත්‍ර දෙක, කච්චායනගොත්ත සූත්‍රය, ධම්මකථී සූත්‍රය, අචේල සූත්‍රය, තිම්බරුක සූත්‍රය, බාලපණ්ඩිත සූත්‍රය සහ ප්‍රත්‍යය සූත්‍රයයි මේ ආහාර වර්ගයෙහි සූත්‍ර දසයකි.

# 3. දසබල වර්ගය.

## 1. දසබල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, දසබලයකින් යුක්තවූද, සිව් වැදෑරුම් විශාරද භාවයකින් යුක්තවූද, තථාගතතෙම ශ්‍රෙෂ්ඨස්ථානයට පැමිණේ. පිරිසෙහි සිංහනාද කෙරෙයි. උතුම්වූ ධර්මචක්‍රය පවත්වයි. (කෙසේද?) මේ රූපයය, මේ රූපයාගේ හේතුවය, මේ රූපයාගේ නැතිවීමය. මේ වේදනාවය, මේ වේදනාවේ හේතුවය, මේ වේදනාවගේ නැතිවීමය. මේ සංඥාවය, මේ සංඥාවගේ හේතුවය, මේ සංඥාවගේ නැතිවීමය. මේ සංස්කාරයෝය, මේ සංස්කාරයන්ගේ හේතුවය, මේ සංස්කාරයන්ගේ නැතිවීමය. මේ විඥ්ඥාණයය, මේ විඥ්ඥාණයාගේ හේතුවය, මේ විඥ්ඥාණයාගේ නැතිවීමය. මෙසේ මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන් ඇති කල්හි, මේ සංස්කාරාදී ඵලය ඇතිවේ. මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන්ගේ ඉපදීමෙන් සංස්කාරාදී ඵල උපදී. මේ අවිජ්ජාදී ප්‍රත්‍යය නැති කල්හි සංස්කාරාදී ඵල ඇති නොවේ. මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන්ගේ නැතිවීමෙන් මේ සංස්කාරාදී ඵල නැතිවේ.

3. "හේ මෙසේයි:- අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. සංස්කාරයන් නිසා විඥ්ඥාණය ඇතිවෙත්. විඥ්ඥාණය නිසා නාමරූපයන් ඇතිවෙත්. නාමරූප නිසා සළායතන ඇතිවෙත්. සළායතනයන් නිසා ස්පර්ශ ඇතිවෙත්. ස්පර්ශයන් නිසා වේදනාව ඇතිවෙත්. වේදනාව නිසා තණ්හාව ඇතිවෙත්. තණ්හාව නිසා උපාදානය ඇතිවෙත්. උපාදානය නිසා භවය ඇතිවෙත්. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙත්. ජාතිය (ඉපදීම)

නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ද ඇතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක්ගොඩ ඇතිවේ. අවිජ්ජාව නැති කිරීමෙන්ම සංස්කාරයන්ගේ නැතිවීම වෙයි. සංස්කාරයන්ගේ නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවේ. නාමරූපයන්ගේ නැතිවීමෙන් සළායතන නැතිවේ. සළායතනයන්ගේ නැතිවීමෙන් ස්පර්ශ නැතිවේ. ස්පර්ශයන්ගේ නැතිවීමෙන් වේදනාව නැතිවේ. වේදනාවන්ගේ නැතිවීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාවන්ගේ නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානයන්ගේ නැතිවීමෙන් භවය නැතිවේ. භවයන්ගේ නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද නැති වෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවේය කියායි.

---

## 2. දසබල සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, දසබලයකින් යුක්තවූද, සිව් වැදෑරුම් විශාරදභාවයකින් යුක්තවූද තථාගතතෙම ශ්‍රෙෂ්ඨස්ථානයට පැමිණේ. පිරිසෙහි සිංහනාද කෙරෙයි. උතුම්වූ ධර්මචක්‍රය පවත්වයි. (කෙසේද?) මේ රූපය, මේ රූපයන්ගේ හේතුවය, මේ රූපයන්ගේ නැතිවීමය. මේ වේදනාවය, මේ වේදනාවේ හේතුවය, මේ වේදනාවගේ නැතිවීමය. මේ සංඥාවය, මේ සංඥාවගේ හේතුවය, මේ සංඥාවගේ නැතිවීමය. මේ සංස්කාරයෝය, මේ සංස්කාරයන්ගේ හේතුවය, මේ

සංස්කාරයන්ගේ නැතිවීමය. මේ විඤ්ඤාණයය, මේ විඤ්ඤාණයාගේ හේතුවය, මේ විඤ්ඤාණයාගේ නැතිවීමය. මෙසේ මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන් ඇතිකල්හි, මේ සංස්කාරාදී ඵලය ඇතිවේ. මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන්ගේ ඉපදීමෙන් සංස්කාරාදී ඵල උපදී. මේ අවිජ්ජාදී ප්‍රත්‍යය නැතිකල්හි සංස්කාරාදී ඵල ඇති නොවේ. මේ අවිජ්ජාදී ප්‍රත්‍යයන්ගේ නැතිවීමෙන් මේ සංස්කාරාදී ඵල නැතිවේ.

3. "මහණෙනි, මෙසේයි:- අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවෙත්. විඤ්ඤාණය නිසා නාම රූපයන් ඇතිවෙත්. නාම රූප නිසා සළායතන ඇතිවෙත්. සළායතනයන් නිසා ස්පර්ශ ඇති වෙත්. ස්පර්ශ නිසා වේදනාව ඇතිවෙත්. වේදනාව නිසා තණ්හාව ඇතිවෙත්. තණ්හාව නිසා උපාදානය ඇතිවෙත්. උපාදානය නිසා භවය ඇතිවෙත්. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙත්. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ද ඇතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක්ගොඩ ඇතිවේ. අවිජ්ජාව නැතිකිරීමෙන් සංස්කාරයන්ගේ නැතිවීම වෙයි. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවේ. නාම රූපයන්ගේ නැතිවීමෙන් සළායතන නැතිවේ. සළායතනයන්ගේ නැතිවීමෙන් ස්පර්ශ නැතිවේ. ස්පර්ශයන්ගේ නැතිවීමෙන් වේදනාව නැතිවේ. වේදනාවන්ගේ නැතිවීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාවන්ගේ නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානයන්ගේ නැතිවීමෙන් භවය නැතිවේ. භවයන්ගේ නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවේය කියායි.

4. "මහණෙනි, මා විසින් මෙසේ ධර්මය මනාකොට කියනලදී. වසා නොතබනලදී. වැසුම් හරිනලදී. දල්වන ලදී. සුන්-බුන්-පිරිද්දීම් සහ ගැට නැතිකරන ලදී. මහණෙනි, මෙසේ මා විසින් මනාකොට කියනලද, වසා නොතබනලද, වැසුම්

හරිනලද, දල්වනලද, සුන්-බුන්-පිරිද්දීම් සහ ගැට නැතිකරනලද ධර්මයෙහි, ශ්‍රද්ධාවෙන් (ශාසනයෙහි) පැවිදිවූ කුල දරුවා විසින් කැමැති සේ ශරීරයෙහි සමද, නහරද, ඇටද, ඉතිරි වේවා! මස් හා ලේ වියලේවා! පුරුෂ ශක්තියෙන්, පුරුෂ වීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතු යමක් වේද, එයට නොපැමිණ, වීර්යය අත්හැරීමක් නොවන්නේ යයි වීර්යය පටන් ගැනීම සුදුසුමය. මහණෙනි, කුසීත පුද්ගලතෙම පවිටුවූ, අකුශල ධර්මයන්ගෙන් ගැවසී ගත්තේ දුකින් වසයි. මහත්වූ අර්ථයෙන්ද (රහත් බැවින්ද) පිරිහෙයි. මහණෙනි, පටන්ගන්නා ලද වීර්යය ඇත්තේ වනාහි පවිටුවූ අකුශල ධර්මයන්ගෙන් වෙන්වූයේ සැපසේ වාසය කෙරෙයි. මහත්වූ, අර්ථයද (රහත් බවද) සම්පූර්ණ කෙරෙයි.

**5.** "මහණෙනි, හීනවූ ශ්‍රද්ධාදියෙන් අග්‍රවූ රහත් බවට නොපැමිණෙයි. අග්‍රවූ ශ්‍රද්ධාදියෙන් අග්‍රවූ රහත් බවට පැමිණෙයි. මහණෙනි, ප්‍රසන්නවූද, පිදියයුතුවූද, මේ බ්‍රහ්මචරියාව ශාස්තෘන්වහන්සේගේ සම්මුඛයෙහි වූයේය.

**6.** "මහණෙනි, ඒ නිසා නොපැමිණි ධර්මයන්ට පැමිණීම පිණිස, අවබෝධ නොකළ ධර්මය අවබෝධ කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ ධර්මය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස, වීර්ය ආරම්භ කරව්. මෙසේ (වනාහි) අපගේ මේ පැවිද්ද වඳනොවන්නේය. ඵල සහිත වන්නේය. වැඩීම් සහිත වන්නේය. අපි යමෙකුන්ගේ චීවර, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පසය සහ බෙහෙත් පිරිකර වළඳමුද, ඔවුන්ගේ ඒ සත්කාරයෝ අප කෙරෙහි මහත්ඵල මහානිසංශ වන්නෝය. මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි. මහණෙනි, තමාගේ අර්ථය බලාපොරොත්තු වන්නාහු විසින්ද අප්‍රමාදයෙන් යුක්තවන්නට සුදුසුමය. මහණෙනි, පරාර්ථය බලාපොරොත්තු වන්නාහු විසින්ද අප්‍රමාදයෙන් යුක්ත වන්නට සුදුසුමය. මහණෙනි, උභයාර්ථය (ආත්මාර්ථය හා පරාර්ථය) බලාපොරොත්තු වන්නාහු විසින්ද අප්‍රමාදයෙන් යුක්ත වන්නට සුදුසුමය යනුයි.

---

## 3. උපනිසා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මම දන්නහුගේම දක්නහුගේම ආශ්‍රවයන් ක්ෂයකිරීම කියමි. නොදන්නහුගේ නොදක්නහුගේ ආශ්‍රවයන් ක්ෂය කිරීම නොකියමි. මහණෙනි, කුමක් දන්නහුගේ කුමක් දක්නහුගේ ආශ්‍රවයන් ක්ෂයවේද? රූපය මෙසේය. රූපයේ ඇතිවීම මෙසේය. රූපයාගේ නැතිවීම මෙසේය. වේදනාව මෙසේය. වේදනාවේ ඇතිවීම මෙසේය. වේදනාවේ නැතිවීම මෙසේය. සංඥාව මෙසේය. සංඥාවේ ඇතිවීම මෙසේය. සංඥාවේ නැතිවීම මෙසේය. විඥ්ඥාණය මෙසේය. විඥ්ඥාණයේ ඇතිවීම මෙසේය. විඥ්ඥාණයේ නැතිවීම මෙසේය. කියායි. මහණෙනි, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙයි.

"මහණෙනි, යම් හේතුවකින් ඒ ආශ්‍රව ක්ෂය නම් අර්හත් ඵලය ලත් කල්හි ඒ පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂා (මෙනෙහි කරන) ඥානය ඇතිවන්නේය. එයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, ප්‍රත්‍යවෙක්ෂා ඥානයට හේතු කවරේද? අර්හත් ඵලයයි කියයුතු වන්නේය. මහණෙනි, මම අර්හත්ඵලයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, අර්හත් ඵල හෙතු කවරේද?

3. රහත් මාර්ගයයි කියයුතු වන්නේය. මහණෙනි, මම අර්හත් මාර්ගයද හේතු සහිතයි කියමි. හේතු රහිතයි නොකියමි.

"මහණෙනි, අර්හත් මාර්ගයට හේතු කවරේද? කලකිරීමේ නුවණයයි කියයුතු වන්නේය. මහණෙනි, මම කලකිරීමේ නුවණද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි;

මහණෙනි, කලකිරීමේ ඥාණයට හේතු කවරේද? තත්වූ පරිදි නුවණින් දැකීමයයි කියයුතු වන්නේය. මහණෙනි, මම තත්වූ පරිදි නුවණින් දැකීමද හේතු සහිත යයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, තත්වූ පරිදි නුවණින් දැකීමට හේතු කවරේද? සමාධියයි කිය යුතු වන්නේය. මහණෙනි, මම සමාධියද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, සමාධියට හේතු කවරේද? සැපයයි කියයුතු වන්නේය. මහණෙනි, මම සැපයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, සැපයට හේතු කවරේද? පීඩාවන්ගේ සංසිඳීම යයි කියයුතු වන්නේය. මහණෙනි, මම පීඩාවන්ගේ සංසිඳීමද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නො කියමි. මහණෙනි, පීඩාවන්ගේ සංසිඳීමට කරුණු කවරේද? අධික ප්‍රීතියයි කියයුතු වන්නේය. මහණෙනි, මම අධික ප්‍රීතියද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, අධික ප්‍රීතියට හේතු කවරේද? දුර්වල ප්‍රීතියයි කියයුතු වන්නේය. මහණෙනි, මම දුර්වල ප්‍රීතියද හේතු සහිත යයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, දුර්වල ප්‍රීතියට හේතු කවරේද? ශ්‍රද්ධාවයයි කිය යුතු වන්නේය. මහණෙනි, මම ශ්‍රද්ධාවද හේතු සහිතයයි කියමි. හේතු රහිත යයි නොකියමි. මහණෙනි, ශ්‍රද්ධාවට හේතු කවරේද? දුකයි කිය යුතු වන්නේය. මහණෙනි, මම දුකද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, දුකට හේතු කවරේද? ඉපදීමයයි කියයුතු වන්නේය. මහණෙනි, මම ඉපදීමද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, ඉපදීමට හේතු කවරේද? (කර්ම) භවයයි කිය යුතු වන්නේය. මහණෙනි, මම කර්ම භවයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, කර්ම භවයට හේතු කවරේද? උපාදානයයි කිය යුතු වන්නේය. මහණෙනි, මම උපාදානයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, උපාදානයට හේතු කවරේද? තණ්හාව යයි කියයුතු වන්නේය. මහණෙනි, මම තණ්හාවද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, තණ්හාවට හේතු කවරේද? වේදනාවයයි කිය යුතු වන්නේය.

මහණෙනි, මම වේදනාවද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි වේදනාවට හේතු කවරේද? ස්පර්ශයයි කියයුතු වන්නේය. මහණෙනි, මම ස්පර්ශයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, ස්පර්ශයට හේතු කවරේද? සළායතනයයි කියයුතු වන්නේය. මහණෙනි, මම සළායතනයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි සළායතනයට හේතු කවරේද? නාම රූපයයි කියයුතු වන්නේය. මහණෙනි, මම නාම රූපයද හේතු සහිතයයි කියමි හේතු රහිතයි නොකියමි. මහණෙනි, නාමරූපයට හේතු කවරේද? විඤ්ඤාණයි කිය යුතු වන්නේය. මහණෙනි, මම විඤ්ඤාණයද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, විඤ්ඤාණයට හේතු කවරේද? සංස්කාරයි කිය යුතු වන්නේය. මහණෙනි, මම සංස්කාරයන්ද හේතු සහිතයයි කියමි. හේතු රහිතයයි නොකියමි. මහණෙනි, සංස්කාරයන්ට හේතු කවරේද? අවිජ්ජාවයයි කිය යුතු වන්නේය.

4. "මහණෙනි, මෙසේ වනාහි අවිජ්ජාව නිසා සංස්කාරයන්ද සංස්කාරයන් නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණය නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනද, සළායතන නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා (කර්ම) භවයද, භවය නිසා ජාතියද (ඉපදීම) ජාතිය නිසා දුකද, දුක නිසා ශ්‍රද්ධාවද, ශ්‍රද්ධාව නිසා දුර්වල ප්‍රීතියද, දුර්වල ප්‍රීතිය නිසා ප්‍රබල ප්‍රීතියද, ප්‍රබල ප්‍රීතිය නිසා පීඩාවන්ගේ සංසිඳීමද (පටිපස්සද්ධිය) පීඩාවන්ගේ සංසිඳීම නිසා (ධ්‍යානයට පූර්වභාගවූ) සැපයද, (ධ්‍යානයට පූර්වභාගවූ) සැපය නිසා පාදක ධ්‍යාන සමාධියද, (පාදකධ්‍යාන) සමාධිය නිසා (යථාභූත ඤාණ දර්ශනය) ඇති තතු නුවණින් දැකීමද, ඇතිතතු නුවණින් දැකීම නිසා කලකිරෙන නුවණ (නිර්වේද ඥානය) ද, කලකිරෙන නුවණ නිසා රහත් මාර්ගයද, රහත් මාර්ගය නිසා අර්හත් පලයද, අර්හත් ඵල නිසා ප්‍රත්‍යවෙක්ෂා ඥානය (මාර්ගඵල නිර්වාණ පහකළ කෙලෙස් මෙනෙහිකරන ඥානය) වෙයි.

5. "මහණෙනි, යම්සේ පර්වතයාගේ මත්තෙහි මහත් ධාරාවෙන් යුත් වැසි වසින කල, ඒ දිය ක්‍රමයෙන් පහත්ව පවත්නාවූ, පර්වත බෑවුම් නියඟට පැලුනු පැළිවලත් සහ කුඩා ඇළවල් පිරෙයිද, පර්වත, පර්වත බෑවුම්, නියඟට පැලුනු පැළිවලත් සහ කුඩා ඇළවල් පිරීම නිසා, කුඩා වළවල් පිරෙයිද, කුඩා වළවල් පිරීම නිසා මහ වළවල් පිරෙයිද, මහ වළවල් පිරීම නිසා කුඩා කුඩා ගංගා පිරෙයිද, කුඩා කුඩා ගංගා පිරීම නිසා මහ ගංගා පිරෙයිද, මහ ගංගා පිරීමෙන් මහ මූද පිරෙයිද, මහණෙනි, මෙසේම අවිජ්ජාව නිසා සංස්කාරයද, සංස්කාර නිසා විඤ්ඤාණයද, විඤ්ඤාණ නිසා නාමරූපද, නාමරූප නිසා සළායතනයන්ද සළායතනයන් නිසා ස්පර්ශයද, ස්පර්ශය නිසා වේදනාවද, වේදනාව නිසා තණ්හාවද, තණ්හාව නිසා උපාදානයද, උපාදානය නිසා භවයද, භවය නිසා ජාතියද, ජාතිය නිසා දුකද, දුක නිසා ශ්‍රද්ධාවද, ශ්‍රද්ධාව නිසා දුර්වල ප්‍රීතියද, දුර්වල ප්‍රීතිය නිසා ප්‍රබල ප්‍රීතියද, ප්‍රබල ප්‍රීතිය නිසා පීඩාවන්ගේ සංසිඳීමද, පීඩාවන්ගේ සංසිඳීම නිසා සැපයද, සැපය නිසා සමාධියද (සිතේ එකමුතු කමද) සමාධිය නිසා ඇතිතතු දැකීමේ නුවණද, ඇතිතතු දැකීමේ නුවණ නිසා කලකිරීමේ නුවණද, කලකිරීමේ නුවණ නිසා විරාගයද (මාර්ගයද) විරාගය නිසා විමුක්තියද, (රහත් බවද) විමුක්තිය නිසා (ආශ්‍රවයන් ක්ෂය කළ කල්හි ඇතිවෙන) ප්‍රත්‍යවෙක්ෂා ඥානයද ඇතිවෙයි.

---

## 4. අඤ්ඤතිත්ථිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ "වේළුවනාරාමයෙහි" වැඩ වාසය කරන සේක. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ පෙරවරු කාලයෙහි ඇඳ පාත්‍ර සිවුරු ගෙන රජගහනුවරට පිඬු පිණිස වැඩිසේක. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මේ සිත ඇති විය. 'රජගහනුවර පිඬු පිණිස යාමට තවම උදෑසන වැඩිය. ඒ නිසා මම අන්‍ය තීර්ථක

පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනකද එතන්හි පැමිණෙම් නම් හොඳය' කියායි.

2. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූයේය. සතුටුවිය යුතුවූත්, සිහි කටයුතුවූත් කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය කීවාහුය.

3. "ඇවැත්නි, ශාරිපුත්‍රය, දුක තමා විසින් කරන ලද්දේයයි පණවන, කර්මවාද ඇති සමහර මහණ බමුණෝ වෙති. ඇවැත්, ශාරිපුත්‍රය, දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවන, කර්මවාද ඇති සමහර මහණ බමුණෝ වෙති. ඇවැත්, ශාරිපුත්‍රය, දුක තමා විසින්ද, අනුන් විසින්ද කරන ලද්දේයයි පණවන, කර්මවාද ඇති සමහර මහණ බමුණෝ වෙති. ඇවැත්, ශාරිපුත්‍රය, දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව ඉබේ ඇතිවූයේයයි පණවන, කර්මවාද ඇති සමහර මහණ බමුණෝ වෙති. ඇවැත්, ශාරිපුත්‍රය, මේ සතරවාදයන්හිදී, ගෞතම මහණතෙම කිනම් වාද ඇත්තේද? කුමක් කියන්නේද? කෙසේ විසඳනු ලබන්නාවූ අපි ශ්‍රමණ ගෞතමයන් කියන ලද්ද කිව්වෝ වෙමුද, ශ්‍රමණ ගෞතමයන් බොරුවෙන් යටකොට නොකියමුද, ධර්මයට අනුව කියමුද, කිනම් ධාර්මිකවූ වාදයක් (නුවණ ඇතියන් විසින්) ගැරහිය යුතු බවට නොපැමිණේද?" කියායි.

4. "ඇවැත්නි, 'දුක වනාහි හේතූන් නිසා ඇතිවූයේයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. කුමක් නිසා ඇතිවීද? ස්පර්ශය නිසා ඇතිවිය. මෙසේ මෙය කියන්නේ භාග්‍යවතුන් වහන්සේ කියන ලද්ද කියන්නේද වන්නේය. භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් යටකොට නොකියන්නේය. කිසියම් ධාර්මිකවූ, වාදයක් ධර්මය අනුව කියන්නේය (නුවණ ඇතියන් විසින්) ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "ඇවැත්නි, ඒ සතරවාදයන්හිදී, කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේ යයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරණ ලද්දේයයි පණවත්ද? එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද, අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද එයද ස්පර්ශය නිසා ඇති වේ. කර්මවාදී වූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව ඉබේ ඇතිවූයේ යයි පණවත්ද එයද ස්පර්ශය නිසා ඇතිවේ.

**6.** "ඇවැත්නි, ඒ සතරවාදයන්හිදී, කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේ යයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේ යයි පණවත්ද ඔවුහුද ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද, අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, ඔවුහුද වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසිනුත් නොව අනුන් විසිනුත් නොව ඉබේ ඇතිවූයේ යයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ."

**7.** ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් හා සමඟවූ මේ කථා සල්ලාපය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ඇසුවේය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම රජගහනුවර පිඬු පිණිස වැඩ සවස පිණ්ඩපාතයෙන් වැළකුණේ භාග්‍යවතුන් වන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම වනාහි යම්තාක් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් හා සමග කථා සල්ලාපයක් වූයේද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැල කළේය.

8. "සාදු! සාදු!! ආනන්දය, එය යම්සේ මනාකොට ප්‍රකාශ කරන්නේ නම් ඒ ආකාරයෙන් ශාරීපුත්‍ර තෙම ප්‍රකාශ කරන්නේය. ආනන්දය, දුක වනාහි හේතූන් නිසා උපන්නේ යයි මා විසින් කියන ලදී. කුමක් නිසාද? ස්පර්ශය නිසා යයි මෙසේ මෙය කියන්නේ මා කියන ලද්ද කියන්නේද වන්නේය. මා බොරුවෙන් යටකොට නොකියන්නේය. ධර්මය අනුව කියන්නේය. කිසියම් ධාර්මිකවූ වාදයක් (නුවණ ඇතියන් විසින්) ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේය. ආනන්දය, එහිදී, කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, එයත් ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේ යයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. ආනන්දය, ඒ සතරවාදයන්හිදී, කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ දුක මා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව ඉබේ ඇතිවූයේ යයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ.

9. "ආනන්දය, මම එක් කාලයක මේ රජගහනුවර සමීපයෙහිවූ, "කලන්දක නිවාප" නම් ලත් වෙළුවනාරාමයෙහි වාසය කරමි. ආනන්දය, ඉක්බිති මම වනාහි පෙරවරු කාලයෙහි

හැඳ පාත්‍ර සිවුරු ගෙන, රජගහනුවරට පිඬු සිඟා ගියෙමි. ආනන්දය, ඒ මට මේ අදහස ඇතිවිය. 'තවම රජගහනුවරට පිඬු පිණිස යාමට උදෑසන වැඩිය. (ඒනිසා) මම අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනෙක්හිද, එතැන්හි පැමිණෙම් නම් හොඳය' කියායි. ආනන්දය, ඉක්බිති මම අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ගේ ආරාමය යම් තැනෙක්හිද එතැනට පැමිණියෙමි. පැමිණ, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු වූයෙමි. සතුටු විය යුතුවූත්, සිහි කටයුතුවූත්, කථාව කොට අවසානකර, එක්පැත්තක හුන්නෙමි. ආනන්දය, එක් පැත්තක හුන්නාවූ මට වනාහි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙය කීවාහුය.

**10.** "ඇවැත් ගෞතමයිනි, දුක තමා විසින් කරන ලද්දේ යයි පණවන කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ගෞතමයිනි දුක අනුන් විසින් කරන ලද්දේයි පණවන, කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ගෞතමයිනි, දුක තමන් විසින්ද, අනුන් විසින්ද, කරන ලද්දේයයි පණවන, කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ගෞතමයිනි, දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයි පණවන, කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. මේ සතර වාදයන්හිදී, අපේ ඇවැත් ගෞතමතෙම කිනම් වාද ඇත්තේද? කෙසේ පැහැදිලි කරන්නාවූ, අපි ඇවැත් ගෞතමයන් කියන ලද්දට අනුව කියන්නෝ වෙමුද, ඇවැත් ගෞතමයන් කෙසේ බොරුවෙන් යටකොට කියන්නෝ නොවෙමුද, ධර්මානුකූලව ධර්මය කෙසේ පැහැදිලි කරන්නෙමුද, (ඇවැත් ගෞතමයන්ගේ) කිසි ධාර්මිකවූ ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරැහිය යුතු බවට නොපැමිණෙන්නේද,' කියායි.

**11.** "ආනන්දය, මෙසේ කියනලද, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මම මෙසේ කීවෙමි. ඇවැත්නි, මා විසින් දුක (පටිච්ච සමුප්පන්නයයි) හේතූන් නිසා ඇතිවූයේයයි කියනලදී. කුමක් නිසාද? ස්පර්ශය නිසායයි මෙසේ කියන්නේ මා කියන

ලද්ද අනුව කියන්නේද වන්නේය. මා බොරුවෙන් යටකොට නොකියන්නේද වන්නේය. ධර්මානුකූලව ධර්මය පැහැදිලි කරන්නේය. කිසි ධාර්මිකවූ වාද ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරැහිය යුතු බවට නොපැමිණෙන්නේය. කියායි. ඇවැත්නි, ඒ සතර වාදයන්හිදී, කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරනලද්දේයි පණවත්ද, එයත් ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද, අනුන් විසින්ද කරණ ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින්ද කරණ ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. ඇවැත්නි, මේ සතරවාදයන්හිදී, කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද, අනුන් විසින්ද කරන ලද්දේයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ.

**12.** "ස්වාමීනි ආශ්චර්යයි, ස්වාමීනි, අද්භූතයි, එක් පදයකින් සියලු අර්ථ කියන ලද්දේ වන්නේය (එහෙයිනි) ස්වාමීනි, මේ අර්ථය විස්තර වශයෙන් කියනු ලබන්නේ, ගැඹුරු වන්නේද, ගැඹුරු ආලෝකයක් ඇත්තේද වන්නේය."

"එසේ වී නම් ආනන්දය, මෙහිදී තොපටම වැටහේවා."

"ස්වාමීනි, ඉදින් මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ආනන්දය, ජරා මරණය කුමක් නිදානකොට ඇත්තේද? කුමක්

හේතුව කොට ඇත්තේද? කුමක් ඉපදීම කොට ඇත්තේද? කුමක් පටන්ගැන්ම කොට ඇත්තේද?' කියායි.

"ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ විස්තර කරන්නෙමි. ඇවැත්නි, ජරා මරණය වනාහි ඉපදීම නිදානකොට ඇත්තේය. ඉපදීම හේතුකොට ඇත්තේය. ඉපදීම හටගැනීම කොට ඇත්තේය, ඉපදීම පටන්ගැනීමකොට ඇත්තේය,' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ විස්තර කරන්නෙමි.

13. "ඉදින් ස්වාමීනි මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ආනන්දය, ඉපදීම වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් හේතුකොට ඇත්තේද? කුමක් හටගැනීම්කොට ඇත්තේද? කුමක් පටන්ගැන්ම කොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ විස්තර කරන්නෙමි. ඇවැත්නි, ජාතිය වනාහි භවය නිදානකොට ඇත්තේය. භවය හේතුකොට ඇත්තේය. භවය ඉපදීමකොට ඇත්තේය. භවය පටන්ගැන්මකොට ඇත්තේය.

14. "ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ විස්තර කරන්නෙමි. ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ආනන්දය, භවය වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි. 'ඇවැත්නි, භවය වනාහි උපාදානය නිදානකොට ඇත්තේය. උපාදානය සමුදයකොට ඇත්තේය. උපාදානය ජාතිකොට ඇත්තේය. උපාදානය ප්‍රභවකොට ඇත්තේය.' ස්වාමීනි, මෙසේ අසන ලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි.

15. "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ආනන්දය, උපාදානය වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි. 'ඇවැත්නි,

උපාදානය වනාහි තණ්හාව නිදානකොට ඇත්තේය, තණ්හාව සමුදයකොට ඇත්තේය. තණ්හාව ජාතිකොට ඇත්තේය. තණ්හාව ප්‍රභවකොට ඇත්තේය.' ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි.

16. "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ආනන්දය, තණ්හාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි. 'ඇවැත්නි, තණ්හාව වනාහි වේදනාව නිදානකොට ඇත්තේය, වේදනාව සමුදයකොට ඇත්තේය. වේදනාව ජාතිකොට ඇත්තේය. වේදනාව ප්‍රභවකොට ඇත්තේය.' ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි.

17. "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ආනන්දය, වේදනාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි. 'ඇවැත්නි, වේදනාව වනාහි ස්පර්ශය නිදානකොට ඇත්තේය, ස්පර්ශය සමුදයකොට ඇත්තේය. ස්පර්ශය ජාතිකොට ඇත්තේය. ස්පර්ශය ප්‍රභවකොට ඇත්තේය.' ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි.

18. "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ආනන්දය, ස්පර්ශය වනාහි කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි. 'ඇවැත්නි, ස්පර්ශය වනාහි සළායතනය නිදානකොට ඇත්තේය, සළායතනය සමුදයකොට ඇත්තේය. සළායතනය ජාතිකොට ඇත්තේය. සළායතනය ප්‍රභවකොට ඇත්තේය.' ස්වාමීනි, මෙසේ අසනලද්දාහු මම මෙසේ විස්තර කරන්නෙමි.

19. "ඇවැත්නි, හය වැදෑරුම් ස්පර්ශායතනයන්ගේ සහමුලින් නැතිවීමෙන්ම ස්පර්ශය නැතිවේ. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවේ. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවේ. තණ්හා නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරාව සහ මරණයද, ශොකවීම්, හැඬීම් දුක්වීම්, දොම්නස් සහ වැළපීම් නැතිවෙත්. මෙසේ මේ සියලු එකම දුක්ගොඩ නැතිවේ. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ විස්තර කරන්නෙමි.

---

## 5. භූමිජ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසළවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ඇවැත් භූමිජතෙම සවස්කාලයෙහි විවේක ස්ථානයෙන් නැගීසිටියේ, ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන් යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන් හා සමග සතුටු වූයේය. සතුටු වියයුතු වූත්, සිහි කටයුතුවූත්, කථාවකොට අවසාන කර, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ඇවැත් භූමිජතෙම වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්හට මෙය කීයේය.

3. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, සැපදුක් තමා විසින් කරන ලද්දේයයි පණවන කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ශාරිපුත්‍රයෙනි, සැප දුක් අනුන් විසින් කරන ලද්දේයයි පණවන, කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත්නි, ශාරිපුත්‍රයිනි, සැප දුක් තමන් විසින්ද, අනුන් විසින්ද කරන ලද්දේයයි පණවන, කර්මවාදීවූ ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ශාරිපුත්‍රයිනි, සැප දුක් තමන් විසින් කරන ලද්දක් හෝ අනුන් විසින් කරන ලද්දක් හෝ නොව ඉබේ ඇති වූයේයයි

පණවන, කර්මවාදීවූ, ඇතැම් මහණ බමුණෝ වෙති. ඇවැත් ශාරිපුත්‍රයිනි, මේ සිව්වාදයන්හිදී අපගේ භාග්‍යවත්තෙම කිනම් වාද ඇත්තේද? කුමක් කියන්නේද? කෙසේ පැහැදිළි කරන්නාවූ, අපි ඇවැත් ගෞතමයන් කියන ලද්දට අනුව කියන්නෝ වෙමුද, ඇවැත් ගෞතමයන් කෙසේ බොරුවෙන් යටකොට කියන්නේද නොවෙමුද, ධර්මානුකූලව ධර්මය කෙසේ පැහැදිළි කරන්නෙමුද, (ඇවැත් ගෞතමයන්ගේ) කිසි ධාර්මිකවූ වාද ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේද" කියායි.

4. "ඇවැත්නි, සැපදුක් පටිච්චසමුප්පන්නයයි (නිසා උපන්නේයයි) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. කුමක් නිසාද? ස්පර්ශය නිසායයි මෙසේ කියන්නේ, භාග්‍යවතුන් වහන්සේ කියනලද්ද අනුව කියන්නේද, වන්නේය. භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් යටකොට නොකියන්නේද වන්නේය. ධර්මානුකූලව ධර්මය පැහැදිළි කරන්නේය. කිසි ධර්මිකවූ වාද ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරහිය යුතුබවට නොපැමිණෙන්නේය කියායි. ඇවැත්නි, ඒ සිව්වාදයන්හිදී, කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, එයත් ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැපදුක් අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව ඉබේ ඇතිවූයේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. ඇවැත්නි, ඒ සිව් වාදයන්හිදී කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැපදුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන

නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින්ද, අනුන් විසින්ද කරණ ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැප දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැප දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ.”

5. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් හා වූ මේ කථා සල්ලාපය ඇසුවේය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම්තාක් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් හා ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් හා කථා සල්ලාපයක් වූයේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට කීයේය. “සාදු! සාදු!! ආනන්දය, සැරියුත් තෙම එය මනාකොට පැහැදිළි කරනු ලබන්නේ, යම්සේ පැහැදිලි කරන්නේද, ආනන්දය, (එසේ) මා විසින් සැප දුක් වනාහි පටිච්චසමුප්පන්නයයි (නිසා ඇතිවූයේයයි) කියන ලදී. කුමක් නිසාද? ස්පර්ශය නිසායි මෙසේ කියන්නේ මා කියන ලද්ද අනුව කියන්නේද වන්නේය. මා බොරුවෙන් යට කොට නොකියන්නේද වන්නේය. ධර්මානුකූලව ධර්මය පැහැදිළි කරන්නේය. කිසි ධාර්මිකවූ වාදප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේ යයි කියායි. ආනන්දය, ඒ සිව්වාදයන්හිදී, කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් කරන ලද්දේයයි පණවත්ද එයත් ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේ යයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇති වේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා

විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇති වූයේ යයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවේ. ආනන්දය, ඒ සිව්වාදයන්හිදී, කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැප දුක් විඳිති, යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැප දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ, යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව සැප දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. කර්මවාදීවූ යම් ඒ මහණ බමුණෝ සැප දුක් තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේ යයි පණවත්ද, ඔවුහු වනාහි, ස්පර්ශය නැතිව සැප දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. ආනන්දය, කයින් කළ යුත්තක් ඇති කල්හි හෝ කායද්වාරයෙහි උපන් චේතනාව හේතුකොටගෙන තමා තුළ සැප දුක් උපදියි. ආනන්දය, වචනයෙන් කළ යුත්තක් ඇති කල්හි වාග් ද්වාරයෙහි උපන් චේතනාව හේතුකොටගෙන තමා තුළ සැප දුක් උපදියි, ආනන්දය, මනසින් කළ යුත්තක් ඇති කල්හි මනොද්වාරයෙහි උපන් චේතනාව හේතුකොටගෙන තමා තුළ සැප දුක් උපදියි. යමෙක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, අවිජ්ජාව නිසාම (අනුන්ගේ මෙහෙයීමක් නැති බැවින්) තමා හෝ ඒ කාය සංස්කාරය රැස්කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, අනුන් හෝ ඒ කාය සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය, (කර්ම විපාක) දන්නේ හෝ ඒ කාය සංස්කාර රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය (කර්මය දැන, විපාක) නොදන්නේ හෝ ඒ කාය සංස්කාර රැස්කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය, තෙමේ හෝ ඒ වාක් සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය,

අනුන් හෝ ඒ වාක් සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, (කර්ම විපාක) දන්නේ හෝ ඒ වාක් සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, (කර්මය දැන, විපාක) නොදන්නේ හෝ ඒ වාක් සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය, තෙමේ හෝ ඒ චිත්ත සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ආනන්දය, අනුන් හෝ ඒ චිත්ත සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, (කර්මය විපාක) දන්නේ හෝ ඒ චිත්ත සංස්කාරය රැස් කෙරෙයි. යමක් නිසා අධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ආනන්දය, (කර්ම විපාක) නොදන්නේ හෝ ඒ චිත්ත සංස්කාරය රැස් කෙරෙයි. ආනන්දය, මේ ධර්මයන්හි අවිජ්ජා තොමෝ පිළිවෙළින් සම්බන්ධවූවාය.

**6.** "ආනන්දය, අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන්ම යම් කායික සිතුවිලි නිසා කයෙහි අද්ධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ඒ කය ඇති නොවෙයි. යමක් නිසා වචනයෙහි අද්ධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ඒ වචනය ඇති නොවෙයි. යමක් නිසා සිතෙහි අද්ධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ඒ සිත ඇති නොවෙයි. යම් සිතුවිලි මුල්කොට වනාහි අද්ධ්‍යාත්මිකවූ සැපදුක් උපදීද, ඒ සිතුවිලි තමා පිහිටා නොසිටින බැවින් ඒ සැප දුක්වලට කෙත නොවේ. යම් සිතුවිලි මුල්කොට වනාහි අද්ධ්‍යාත්මිකවූ, සැප දුක් උපදීද, ඒ සිතුවිලි තමා පිහිටා නොසිටින බැවින් ඒ සැප දුක්වලට වස්තු නොවේ. යම් සිතුවිලි මුල්කොට වනාහි අද්ධ්‍යාත්මිකවූ; සැප දුක් උපදීද, ඒ සිතුවිලි තමා ප්‍රත්‍යය නොවන බැවින් ඒ සැප දුක් වලට හේතු නොවේ. යම් සිතුවිලි මුල්කොට වනාහි අද්ධ්‍යාත්මිකවූ සැප දුක් උපදීද, ඒ සිතුවිලි තම, කරුණු නොවෙන බැවින් ඒ සැප දුක්වලට හේතු නොවේ.

## 6. උපවාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති ඇවැත් "උපවාණ' තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් උපවාණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි දුක තමා විසින් කරන ලද්දේයයි පණවන ඇතැම් මහණ බමුණෝ වෙති. ස්වාමීනි, දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවන මහණ බමුණෝ වෙති. ස්වාමීනි; දුක තමන් විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයයි පණවන මහණ බමුණෝ වෙති. ස්වාමීනි, දුක තමන් විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයයි පණවන මහණ බමුණෝ වෙති. ස්වාමීනි, මෙහිදී අපේ භාග්‍යවතුන් වහන්සේ කිනම් වාද ඇතිසේක්ද? කුමක් කියන සේක්ද? කෙසේ පැහැදිළි කරන්නාවූ, අපි ඇවැත් ගෞතමයන් කියන ලද්දට අනුව කියන්නෝ වෙමුද, ඇවැත් ගෞතමයන් කෙසේ බොරුවෙන් යටකොට කියන්නෝ නොවෙමුද; ධර්මානුකූලව ධර්මය කෙසේ පැහැදිලි කරන්නෙමුද, (ඇවැත් ගෞතමයන්ගේ) කිසි ධාර්මිකවූ වාද ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) හැරගිය යුතු බවට නොපැමිණෙන්නේද, කියායි."

3. "උපවාණය, දුක වනාහි පටිච්චසමුප්පන්නයයි (නිසා උපන්නේයයි) මා විසින් කියන ලදී. කුමක් නිසාද? ස්පර්ශය නිසායයි මෙසේ කියන්නේ මා කියන ලද්ද අනුව කියන්නේද වන්නේය. මා බොරුවෙන් යටකොට නොකියන්නේද වන්නේය. ධර්මානුකූලව ධර්මය පැහැදිළි කරන්නේය. කිසි ධාර්මිකවූ වාද ප්‍රවෘත්තියක් (වාදානුපාතයක්) ගැරැහිය යුතු බවට නොපැමිණෙන්නේය.

4. "උපවාණය, එහිදී යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, එයත් ස්පර්ශය නිසා ඇතිවෙයි.

යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවෙයි. යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද අනුන් විසින්ද කරන ලද්දේයයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇතිවෙයි. යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයි පණවත්ද, එයද ස්පර්ශය නිසා ඇති වෙයි.

5. "උපවාණය, මෙහිදී යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. යම් ඒ මහණ බමුණෝ දුක අනුන් විසින් කරන ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින්ද අනුන් විසින්ද කරණ ලද්දේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ. යම් ඒ මහණ බමුණෝ දුක තමා විසින් හෝ අනුන් විසින් හෝ කරන ලද්දක් නොව, ඉබේ ඇතිවූයේයයි පණවත්ද, ඔවුහු වනාහි ස්පර්ශය නැතිව දුක් විඳිති යන මේ කරුණ විද්‍යමාන නොවේ."

**(භයවන උපවාණ සූත්‍රය නිමි)**

---

## 7. පච්චය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අවිජ්ජාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්, සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව

ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණ, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස් වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ. මහණෙනි, ජරාමරණය කවරේද? ඒ ඒ සත්වනිකායෙහිවූ, ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක්, දිරායාමක්, දත් වැටීමක්, කෙස් සුදුවීමක්, ඇඟ රැළි වැටීමක්, ආයුෂයාගේ ගෙවීයාමක්, ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, මෙය ජරාවයයි කියනු ලැබේ. ඒ ඒ සත්ව නිකායෙන් ඒ ඒ සත්වයන්ගේ යම් චුතවීමක්, පහවීයාමක්, බිඳීමක්, අතුරුදහන් වීමක්, මෘත්‍යු නම් මරණයක්, කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳීමක්, මෘතශරීර අත්හැර දැමීමක් වේද, මෙය මරණයයි කියනු ලැබේ. ඒ දිරීමද, මේ මැරීමද මෙසේයි. මහණෙනි මෙය ජරාමරණයයි කියනු ලැබේ. ජාතිය (ඉපදීම) ඇතිවීමෙන් ජරා මරණය ඇතිවේ. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා මරණය නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ජරාමරණය නැතිකරන මාර්ගයයි. හේ කවරේද? සම්මා දිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්‍යක් වචනය, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සතිය සහ සම්මා සමාධිය.

3. "මහණෙනි, ඉපදීම කවරේද? ඒ ඒ සත්ත්ව නිකායෙහි ඒ ඒ සත්ත්වයින්ගේ යම් ඇතිවීමක්, හටගැනීමක්, බැසගැනීමක් ඉපදීමක්, සත්ත්වයින්ගේ ඇතිවීමක් ආයතනයන්ගේ පහළවීමක් වේද, මහණෙනි, මෙය ජාතියයි කියනු ලැබේ. (කර්ම) භවය ඇතිවීමෙන් ඉපදීම ඇතිවේ. (කර්ම) භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ඉපදීම නැතිකරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්‍යක් වචනය, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සතිය සහ සම්මා සමාධියයි.

4. "මහණෙනි, භවය කවරේද? මහණෙනි, කාමභවය, රූප භවය සහ අරූප භවයයි මේ භව තුනෙකි. මහණෙනි, මෙය භවයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, උපාදානය කවරේද? මහණෙනි, කාමුපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතූපාදානය සහ අත්තවාදූපාදානයයි මේ උපාදානයන් සිව්දෙනෙක් වේ. මහණෙනි, මෙය උපාදානයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, තණ්හාව කවරේද? මහණෙනි, රූප තණ්හාව, සද්ද තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව, පොට්ඨබ්බ තණ්හාව සහ ධර්ම තණ්හාව යයි මේ තණ්හා සමූහයන් සය දෙනෙක් වේ. මහණෙනි, මෙය තණ්හාවයයි කියනු ලැබේ.

**7.** "මහණෙනි, වේදනාව කවරේද? මහණෙනි, චක්ඛු සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, සෝත සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, ඝාණ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, ජිව්හා සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, කාය සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව සහ මනෝ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව යයි මේ වේදනා සමූහ සයකි. මහණෙනි, මෙය වේදනාව යයි කියනු ලැබේ.

**8.** "මහණෙනි, ස්පර්ශය කවරේද? මහණෙනි, චක්ඛු සම්ඵස්සය, සෝත සම්ඵස්සය, ඝාණ සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය සහ මනෝ සම්ඵස්සයයි මේ ස්පර්ශ සමූහ සයකි. මහණෙනි, මෙය ස්පර්ශයයි කියනු ලැබේ.

**9.** "මහණෙනි, සළායතන (ඉන්ද්‍රියයන්) කවරේද? මහණෙනි චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය කායායතනය සහ මනායතන යයි. මහණෙනි, මෙය සළායතනයයි කියනු ලැබේ.

**10.** "මහණෙනි, නාමරූප කවරේද? වේදනාව, සංඥාව, චේතනාව, ස්පර්ශය සහ මනසිකාරය යන මෙය නාමයයි කියනු ලැබේ. සතර මහා භූතයින් සහ සතර මහා භූත සමූහය ගෙන පවත්නා රූපය යන මෙය රූපයයි කියනු ලැබේ. ඒ නාමයද, මේ රූපයද මෙසේයි. මහණෙනි, මෙය නාම රූපයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. "මහණෙනි, විඤ්ඤාණය කවරේද? මහණෙනි, චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය සහ මනෝ විඤ්ඤාණයයි මේ විඤ්ඤාණ සමූහ සයකි මහණෙනි, මෙය විඤ්ඤාණයයි කියනු ලැබේ.

12. "මහණෙනි, සංස්කාර කවරේද? මහණෙනි, කාය සංඛාරය, වචීසංඛාරය, චිත්තසංඛාරයයි මේ සංස්කාර තිදෙනෙකි. මහණෙනි, මොවුහු සංස්කාරයෝයයි කියනු ලැබෙත්.

"මහණෙනි, යම් හේතුවකින් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ (දුක්ඛසත්‍යය වශයෙන්) ප්‍රත්‍යය දනීද, මෙසේ (සමුදය සත්‍යය වශයෙන්) ප්‍රත්‍යය ඇතිවීම දනීද, මෙසේ (නිරෝධ සත්‍යය වශයෙන්) ප්‍රත්‍යය නැතිවීම දනීද, මෙසේ (මාර්ග සත්‍යය වශයෙන්) ප්‍රත්‍යය නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙම මාර්ග දෘෂ්ටියෙන් යුක්ත යයි කියාද මාර්ග දර්ශනයෙන් යුක්තයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ග විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම්වූ ධර්මශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ."

---

## 8. භික්ෂු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවනාරාමයෙහි අනේපිඩු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ජරාමරණය දනියි. ජරාමරණයට හේතුව දනියි. ජරාමරණය නැතිවීම දනියි. ජරාමරණය නැතිකරන මාර්ගය දනියි. ජාතිය දනියි. ජාතිය ඇතිවීම දනියි. ජාතිය නැතිවීම දනියි. ජාතිය නැතිකරන මාර්ගය දනියි. භවය දනියි. භවය ඇතිවීම දනියි. භවය නැතිවීම දනියි. භවය නැතිකරන මාර්ගය දනියි. ඉපදීම දනියි. ඉපදීම ඇතිවීම දනියි. ඉපදීම නැතිවීම දනියි. ඉපදීම නැතිකරන මාර්ගය දනියි. තණ්හාව දනියි. තණ්හාව ඇතිවීම දනියි. තණ්හාව නැතිවීම දනියි. තණ්හාව නැතිකරන මාර්ගය දනියි. වේදනාව දනියි. වේදනාව ඇතිවීම දනියි. වේදනාව නැතිවීම දනියි. වේදනාව නැති කරන මාර්ගය දනියි. ස්පර්ශය දනියි. ස්පර්ශය ඇතිවීම දනියි. ස්පර්ශය නැතිවීම දනියි. ස්පර්ශය නැතිකරන මාර්ගය දනියි. සළායතන දනියි. සළායතන ඇතිවීම දනියි. සළායතන නැතිවීම දනියි. සළායතන නැතිකරන මාර්ගය දනියි. නාමරූප දනියි. නාමරූප ඇතිවීම දනියි. නාමරූප නැතිවීම දනියි. නාමරූප නැතිකරන මාර්ගය දනියි. විඤ්ඤාණය දනියි. විඤ්ඤාණය ඇතිවීම දනියි. විඤ්ඤාණය නැතිවීම දනියි. විඤ්ඤාණය නැතිකරන මාර්ගය දනියි. සංස්කාර දනියි. සංස්කාර ඇතිවීම දනියි. සංස්කාර නැතිවීම දනියි. සංස්කාර නැති කරන මාර්ගය දනියි.

3. මහණෙනි, ජරාමරණය කවරේද? ඒ ඒ සත්වනිකායෙහිවූ; ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක්, දිරායාමක්, දත්වැටීමක්, කෙස් සුදුවීමක්, ඇඟ රැළිවැටීමක්, ආයුෂයාගේ ගෙවීයාමක්, ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, මෙය ජරාවයයි කියනු ලැබේ. ඒ ඒ සත්ව නිකායෙන් ඒ ඒ සත්වයන්ගේ යම් චුතවීමක්, පහවීයාමක්, බිඳීමක්, අතුරුදහන්වීමක්, මෘත්‍යුනම්වූ මරණයක්, කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳීමක්, මෘතශරීර අත්හැර දැමීමක් වේද, මෙය මරණයයි කියනු ලැබේ. ඒ මෙසේයි. ඒ දිරීමද මේ මැරීමද මෙසේයි.

4. "මහණෙනි, මෙය ජරායයි කියනු ලැබේ. ජාතිය (ඉපදීම) ඇතිවීමෙන් ජරාමරණය ඇතිවේ. ජාතිය (ඉපදීම) නැති වීමෙන්

ජරාමරණය නැතිවේ. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම ජරාමරණය නැතිකිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මා සතිය, සම්මාසමාධියයි.

**5.** "මහණෙනි, ජාතිතොමෝ කවරීද? ඒ ඒ සත්වනිකායෙහි ඒ ඒ සත්වයින්ගේ යම් ඇතිවීමක්, හටගැනීමක්, බැස ගැනීමක්, ඉපදීමක්, සත්ත්වයින්ගේ ඇතිවීමක්, ආයතනයන්ගේ පහළවීමක් වේද, මහණෙනි, මෙය ජාතියයි කියනු ලැබේ. භවය ඇතිවීමෙන් ජාතිය ඇතිවේ භවය නැතිවීමෙන් ජාතිය නැතිවේ. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම ජාතිය නැති කිරීමට ගමන් කරන, මාර්ගයයි හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය, සම්මාසමාධියයි.

**6.** "මහණෙනි, භවය කවරේද? මහණෙනි, කාම භවය, රූප භවය සහ අරූප භවයයි මේ භව තුනෙකි. මහණෙනි, මෙය භවයයි කියනු ලැබේ. උපාදානය ඇතිවීමෙන් භවය ඇතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම භවය නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. මේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය සම්මාවායාමය සම්මාසතිය, සහ සම්මාසමාධියි.

**7.** "මහණෙනි, උපාදානය කවරේද? මහණෙනි, කාමූපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය සහ අත්තවාදූපාදන යයි මේ උපාදානයන් සිව් දෙනෙක්වේ. මහණෙනි, මෙය උපාදානයයි කියනු ලැබේ. තණ්හාව ඇතිවීමෙන් උපාදානය ඇතිවේ. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම උපාදානය නැති කිරීමට ගමන්කරන මාර්ගයයි හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මාසමාධියයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

8. "මහණෙනි, තණ්හාතොමෝ කවරීද? මහණෙනි, රූප තණ්හාව, සද්ද තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව, ඵොට්ඨබ්බ තණ්හාව සහ ධර්ම තණ්හාව යයි මේ තණ්හා සමූහයන් සය දෙනෙක් වේ. මහණෙනි, මෙය තණ්හාව යයි කියනු ලැබේ. වේදනාව ඇතිවීමෙන් තණ්හාතොමෝ ඇති වන්නීය. වේදනාව නැතිවීමෙන් තණ්හාතොමෝ නැති වන්නීය. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම තණ්හාව නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මා ආජීවය, සම්මාවායාමය, සම්මාසතිය, සහ සම්මාසමාධියයි.

9. "මහණෙනි, වේදනා තොමෝ කවරීද? මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, සෝතසම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, ඝාණසම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, ජිව්හා සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව, කාය සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව සහ මනොසම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව යයි මේ වේදනා සමූහ සයකි. මහණෙනි මෙය වේදනාවයයි කියනු ලැබේ. ස්පර්ශය ඇතිවීමෙන් වේදනාව ඇති වෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම වේදනාව නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මාසමාධියයි.

10. "මහණෙනි, ස්පර්ශය කවරේද? මහණෙනි, චක්ඛුසම්ඵස්සය, සෝත සම්ඵස්සය, ඝාණ සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය සහ මනොසම්ඵස්සයි. මේ ස්පර්ශ සමූහ සයකි. මහණෙනි, මෙය ස්පර්ශයයි කියනු ලැබේ. සළායතන ඇතිවීමෙන් ස්පර්ශය ඇතිවේ. සළායතන නැති වීමෙන් ස්පර්ශය නැතිවෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ස්පර්ශ නැතිකිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය සම්මාසතිය, සහ සම්මාසමාධියයි.

11. "මහණෙනි, සළායතන කවරේද? චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය සහ මනොායතනයයි. මහණෙනි, මෙය සළායතනයයි කියනු ලැබේ. නාමරූප ඇතිවීමෙන් සළායතන ඇතිවේ. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවේ. මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම සළායතනය නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මා කම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මාසමාධියයි.

12. "මහණෙනි, නාමරූප කවරේද? වේදනාව, සංඥාව, චේතනාව, ස්පර්ශය සහ මනසිකාරය යන මෙය නාමයයි කියනු ලැබේ. සතර මහා භූතයින් සතර මහා භූත සමූහය ගෙන පවත්නා රූපය යන මෙය රූපයයි කියනු ලැබේ. ඒ නාමයද, මේ රූපයද, මෙසේයි. මහණෙනි, මෙය නාම රූපයයි කියනු ලැබේ. විඥ්ඥාණය ඇතිවීමෙන් නාම රූප ඇතිවේ. විඥ්ඥාණය නැතිවීමෙන් නාම රූප නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම නාම රූප නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය සම්මා සඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මා ආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මාසමාධිය.

13. "මහණෙනි, විඥ්ඥාණය කවරේද? මහණෙනි, චක්ඛුවිඥ්ඥාණය, සොතවිඥ්ඥාණය, ඝාණවිඥ්ඥාණය, ජිව්හාවිඥ්ඥාණය කායවිඥ්ඥාණය සහ මනෝවිඥ්ඥාණයයි මේ සමූහ සයකි. මහණෙනි, මෙය විඥ්ඥාණයයි කියනු ලැබේ. සංස්කාර ඇතිවීමෙන් විඥ්ඥාණය ඇතිවේ. සංස්කාර නැතිවීමෙන් විඥ්ඥාණය නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම විඥ්ඥාණය නැතිකිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මා දිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මා සමාධියයි.

14. "මහණෙනි, සංස්කාර කවරේද? මහණෙනි, කායසංඛාරය, වචීසංඛාරය, චිත්තසංඛාරයයි මේ සංස්කාර

තිදෙනෙකි. මහණෙනි, මොවුහු සංස්කාරයෝ යයි කියනු ලැබෙත්. අවිජ්ජාව ඇතිවීමෙන් සංස්කාර ඇතිවේ. අවිජ්ජා නැතිවීමෙන් සංස්කාර නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය සංස්කාර නැති කිරීමට ගමන් කරන මාර්ගයයි. හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචා, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මා සතිය සහ සම්මාසමාධියයි.

මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ ජරා මරණය දනීද, මෙසේ ජරාමරණයට හේතුව දනීද, මෙසේ ජරාමරණය නැතිවීම දනීද මෙසේ ජරාමරණය නැති කරන මාර්ගය දනීද,

15. "මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේ යයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ කලකිරීමේ නුවණ ඇත්තේ යයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

16. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ ජාතිය දනීද, (ඉපදීම) ඇතිවීම දනීද, ජාතිය (ඉපදීම) නැතිවීම දනීද, ජාතිය (ඉපදීම) නැති කරන මාර්ගය දනීද, මහණෙනි මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ගනම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

17. මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ භවය දනීද, භවය ඇතිවීම දනීද, භවය නැතිවීම දනීද, භවය නැති කරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ග

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද මාර්ග නම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

18. "මහණෙනි, යම්හෙයකින් මහණතෙම මෙසේ උපාදානය දනීද, උපාදානය ඇතිවීම දනීද, උපාදානය නැතිවීම දනීද, උපාදානය නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, යම් ආර්ය ශ්‍රාවකතෙම මාර්ග දෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ග විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යා ධර්ම ශ්‍රෝතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

19. "මහණෙනි, යම් හෙයකින් මහණ තෙම මෙසේ තණ්හාව දනීද, තණ්හාව ඇතිවීම දනීද, තණ්හාව නැතිවීම දනීද, තණ්හාව නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්ත යයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

20. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ වේදනාව දනීද, වේදනාව ඇතිවීම දනීද, වේදනාව නැතිවීම දනීද, වේදනාව නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද,

මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

21. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ ස්පර්ශය දනීද, ස්පර්ශය ඇතිවීම දනීද, ස්පර්ශය නැතිවීම දනීද, ස්පර්ශය නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

22. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ සළායතන (ඉන්ද්‍රිය) දනීද, සළායතන (ඉන්ද්‍රිය) ඇතිවීම දනීද, සළායතන (ඉන්ද්‍රිය) නැතිවීම දනීද, සළායතන (ඉන්ද්‍රිය) නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

23. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ නාම රූපදනීද, නාමරූප ඇතිවීම දනීද, නාමරූප නැතිවීම දනීද, නාමරූප නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ග

විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්මශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

24. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ විඤ්ඤාණය දනීද, විඤ්ඤාණය ඇතිවීම දනීද, විඤ්ඤාණය නැතිවීම දනීද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්මශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

25. "මහණෙනි, යම් හෙයකින් මහණතෙම මෙසේ සංස්කාර දනීද, සංස්කාර ඇතිවීම දනීද, සංස්කාර නැතිවීම දනීද, සංස්කාර නැතිකරන මාර්ගය දනීද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකතෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්තයයි කියාද, මාර්ගදර්ශනයෙන් යුක්තයයි කියාද, මේ සද්ධර්මයට ආයේයයි කියාද, මේ සද්ධර්මය දකියි කියාද, මාර්ගඥානයෙන් යුක්තයයි කියාද, මාර්ගවිද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ.

---

## 9. සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන

සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වනාහි ජරාමරණය නොදනිත්ද, ජරාමරණයට හේතුව නොදනිත්ද, ජරා මරණයන්ගේ නැතිවීම නොදනිත්ද, ජරා මරණයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, ඉපදීම නොදනිත්ද, ඉපදීමට හේතුව නොදනිත්ද, ඉපදීම නැතිවීම නොදනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය නොදනිත්ද, භවය නොදනිත්ද, භවයට හේතුව නොදනිත්ද, භවයන්ගේ නැතිවීම නොදනිත්ද, භවයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, උපාදානය නොදනිත්ද, උපාදානයට හේතුව නොදනිත්ද, උපාදානයන්ගේ නැතිවීම නොදනිත්ද, උපාදානයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, තණ්හාව නොදනිත්ද, තණ්හාවට හේතුව නොදනිත්ද, තණ්හාවන්ගේ නැතිවීම නොදනිත්ද, තණ්හාවන් නැතිකරන මාර්ගය නොදනිත්ද, වේදනාව නොදනිත්ද, වේදනාවට හේතුව නොදනිත්ද, වේදනාවන්ගේ නැතිවීම නොදනිත්ද, වේදනාවන් නැති කරන මාර්ගය නොදනිත්ද, ස්පර්ශය නොදනිත්ද ස්පර්ශයට හේතුව නොදනිත්ද, ස්පර්ශයන්ගේ නැතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය නොදනිත්ද, සළායතන (ඉන්ද්‍රිය) නොදනිත්ද, සළායතනයට හේතුව නොදනිත්ද, සළායතනයන්ගේ නැතිවීම නොදනිත්ද, සළායතනයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, නාම රූප නොදනිත්ද, නාම රූපයන්ට හේතුව නොදනිත්ද, නාම රූපයන්ගේ නැතිවීම නොදනිත්ද, නාම රූපයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, විඤ්ඤාණය නොදනිත්ද, විඤ්ඤාණයට හේතුව නොදනිත්ද, විඤ්ඤාණය නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය නොදනිත්ද, සංස්කාර නොදනිත්ද, සංස්කාරයන්ට හේතුව නොදනිත්ද, සංස්කාර නැතිවීම නොදනිත්ද, සංස්කාර නැතිකරන මාර්ගය නොදනිත්ද,

මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි හෝ ශ්‍රමණ සම්මත නොවෙති. බ්‍රාහ්මණයන් කෙරෙහි හෝ බ්‍රාහ්මණ සම්මත නොවෙත්.

"මහණෙනි, ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය හෝ බ්‍රාහ්මණාර්ථය හෝ මේ ආත්මයෙහි තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය නොකරති.

3. "මහණෙනි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ජරාමරණය දනිත්ද, ජරාමරණය ඇතිවීම දනිත්ද, ජරාමරණය නැතිවීම දනිත්ද, ජරා මරණය නැතිවෙන මාර්ගය දනිත්ද, ජාතිය (ඉපදීම) දනිත්ද, ජාතිය (ඉපදීම) ඇතිවීම දනිත්ද, ජාතිය (ඉපදීම) නැතිවීම දනිත්ද, ජාතිය (ඉපදීම) නැතිවෙන මාර්ගය දනිත්ද, භවය දනිත්ද, භවය ඇතිවීම දනිත්ද, භවය නැතිවීම දනිත්ද, භවය නැතිවෙන මාර්ගය දනිත්ද, උපාදානය දනිත්ද, උපාදානය ඇතිවීම දනිත්ද, උපාදානය නැතිවීම දනිත්ද, උපාදානය නැතිකරන මාර්ගය දනිත්ද, තණ්හාව දනිත්ද, තණ්හාව ඇතිවීම දනිත්ද, තණ්හාව නැතිවීම දනිත්ද, තණ්හාව නැතිකරන මාර්ගය දනිත්ද, වේදනාව දනිත්ද, වේදනාව ඇතිවීම දනිත්ද, වේදනාව නැතිවීම දනිත්ද, වේදනාව නැතිකරන මාර්ගය දනිත්ද, ස්පර්ශය දනිත්ද, ස්පර්ශය ඇතිවීම දනිත්ද, ස්පර්ශය නැතිවීම දනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය දනිත්ද, සළායතන (ඉන්ද්‍රිය) දනිත්ද, සළායතන ඇතිවීම දනිත්ද, සළායතනයන් නැතිවීම දනිත්ද, සළායතන නැතිකරන මාර්ගය දනිත්ද, නාමරූප දනිත්ද, නාමරූප ඇතිවීම දනිත්ද, නාමරූප නැතිවීම දනිත්ද, නාමරූප නැති කරන මාර්ගය දනිත්ද, විඤ්ඤාණය දනිත්ද, විඤ්ඤාණය ඇතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය දනිත්ද, සංස්කාර දනිත්ද, සංස්කාර ඇතිවීම දනිත්ද, සංස්කාර නැතිවීම දනිත්ද, සංස්කාර නැතිකරන මාර්ගය දනිත්ද,

4. "මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි

බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය හෝ බ්‍රාහ්මණාර්ථය තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරති.”

---

## 10. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ “මහණෙනියි” කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනි” කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරා මරණය නොදනිත්ද, ජරා මරණය ඇතිවීම නොදනිත්ද, ජරා මරණය නැතිවීම නොදනිත්ද, ජරා මරණය නැතිවෙන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි ජරා මරණය ඉක්මවා සිටිති, යන මෙය විද්‍යමාන නොවේ.

“ඉපදීම නොදනිත්ද, ඉපදීම ඇතිවීම නොදනිත්ද, ඉපදීම නැතිවීම නොදනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි ජාතිය (ඉපදීම) ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

“භවය නොදනිත්ද, භවය ඇතිවීම නොදනිත්ද, භවය නැතිවීම නොදනිත්ද, භවය නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි භවය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

“උපාදානය (දැඩිව ඇල්ම) නොදනිත්ද, උපාදානය ඇතිවීම නොදනිත්ද, උපාදානය නැතිවීම නොදනිත්ද, උපාදානය නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි උපාදානය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

“තණ්හාව නොදනිත්ද, තණ්හාව ඇතිවීම නොදනිත්ද, තණ්හාව නැතිවීම නොදනිත්ද, තණ්හාව නැතිකරන මාර්ගය

නොදනිත්ද, ඔවුහු වනාහි තණ්හාව ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"වේදනාව නොදනිත්ද, වේදනාව ඇතිවීම නොදනිත්ද, වේදනාව නැතිවීම නොදනිත්ද, වේදනාව නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි වේදනාව ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"ස්පර්ශය නොදනිත්ද ස්පර්ශය ඇතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි ස්පර්ශය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"සළායතන (ඉන්ද්‍රිය) නොදනිත්ද, සළායතන ඇතිවීම නොදනිත්ද, සළායතන නැතිවීම නොදනිත්ද, සළායතන නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි සළායතන ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"නාමරූපය නොදනිත්ද නාමරූප ඇතිවීම නොදනිත්ද, නාමරූප නැතිවීම නොදනිත්ද, නාමරූප නැතිකරන මාර්ගය නොදනිත්ද ඔවුහු වනාහි නාමරූප ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"විඤ්ඤාණය නොදනිත්ද, විඤ්ඤාණය ඇතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය නොදනිත්ද ඔවුහු වනාහි විඤ්ඤාණය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

"සංස්කාර නොදනිත්ද, සංස්කාර ඇතිවීම නොදනිත්ද, සංස්කාර නැතිවීම නොදනිත්ද, සංස්කාර නැතිකරන මාර්ගය නොදනිත්ද, ඔවුහු වනාහි සංස්කාරය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන නොවේ.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ජරාමරණය දනිත්ද, ජරාමරණය ඇතිවීම දනිත්ද, ජරා මරණය නැතිවීම දනිත්ද, ජරා මරණය නැතිකරන මාර්ගය

දනිත්ද, ඔවුහු වනාහි ජරා මරණය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"ජාතිය (ඉපදීම) දනිත්ද, ජාතිය (ඉපදීම) ඇතිවීම දනිත්ද, (ජාතිය) ඉපදීම නැතිවීම දනිත්ද, ජාතිය (ඉපදීම) නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි ජාතිය (ඉපදීම) ඉක්වා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"භවය දනිත්ද, භවය ඇතිවීම දනිත්ද, භවය නැතිවීම දනිත්ද, භවය නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි භවය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"උපාදානය (තද ඇල්ම) දනිත්ද, උපාදානය ඇතිවීම දනිත්ද, උපාදානය නැතිවීම දනිත්ද, උපාදානය නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි උපාදානය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"තණ්හාව දනිත්ද, තණ්හාව ඇතිවීම දනිත්ද, තණ්හාව නැතිවීම දනිත්ද, තණ්හාව නැති කරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි තණ්හාව ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"වේදනාව දනිත්ද, වේදනාව ඇතිවීම දනිත්ද, වේදනාව නැතිවීම දනිත්ද, වේදනාව නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි වේදනාව ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"ස්පර්ශය දනිත්ද, ස්පර්ශය ඇතිවීම දනිත්ද, ස්පර්ශය නැතිවීම දනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි ස්පර්ශය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"සළායතන (ඉන්ද්‍රිය) දනිත්ද, සළායතන ඇතිවීම දනිත්ද, සළායතන නැතිවීම දනිත්ද, සළායතන නැති කරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි සළායතන ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"නාමරූප දනිත්ද, නාමරූප ඇතිවීම දනිත්ද, නාමරූප නැතිවීම දනිත්ද, නාමරූප නැති කරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි නාමරූප ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"විඤ්ඤාණය දනිත්ද, විඤ්ඤාණය ඇතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිවීම දනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය දනිත්ද ඔවුහු වනාහි විඤ්ඤාණය ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

"සංස්කාර දනිත්ද, සංස්කාර ඇතිවීම දනිත්ද, සංස්කාර නැතිවීම දනිත්ද, සංස්කාර නැතිකරන මාර්ගය දනිත්ද, ඔවුහු වනාහි සංස්කාර ඉක්මවා සිටිති යන මෙය විද්‍යමාන වේ.

**තුන්වෙනි දසබල වර්ගයි.**

---

(දසබල සූත්‍ර දෙකය, උපනිසා සූත්‍රය, අඤ්ඤතිත්ථිය සූත්‍රය, භූමිජ සූත්‍රය, උපවාණ සූත්‍රය, පච්චය සූත්‍රය, භික්ෂු සූත්‍රය සහ ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍ර දෙකදැයි යන මේ සූත්‍ර දහයක්වූ

තුන්වෙනි දසබල වර්ගයයි.

---

# 4. කළාරඛත්තිය වර්ගය.

## 1. භූතමිදං සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි, වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරුන්ට කථා කළ සේක. "ශාරිපුත්‍රයෙනි, මෙය පාරායන සූත්‍රයෙහි අජිත මාණවකයා විසින් අසන ලද ප්‍රශ්නයේදී, (මා විසින්) දේශනා කරන ලදී."

'නිදුකාණෙනි, නුවණැත්තාවූ ඔබවහන්සේ මේ ශාසනයෙහි දැනගන්නා ලද ධර්මය ඇති, යම් අය වෙත්ද, හික්මෙන්නාවූ යම් ආර්ය පුද්ගලයෝ සත් දෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ප්‍රතිපත්තිය අසන ලද මට කියා දෙනු මැනවි.'

2. "ශාරිපුත්‍රයෙනි, සංක්ෂේපයෙන් කියන ලද මෙහි අර්ථ විස්තර වශයෙන් කෙසේ දත යුතු දැයි ඇසූහ. මෙසේ ඇසූ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍රතෙමේ නිශ්ශබ්ද විය. දෙවෙනුවත් භාග්‍යවතුන් වහන්සේ ශාරිපුත්‍ර තෙරුන්හට කථා කළ සේක. ශාරිපුත්‍රයෙනි, මෙය "පාරායන" සූත්‍රයෙහි අජිතමාණවකයා විසින් අසන ලද ප්‍රශ්නයේදී, (මා විසින්) දේශනා කරන ලදී.

'නිදුකාණෙනි, නුවණැත්තාවූ ඔබ මේ ශාසනයෙහි දැනගන්නා ලද ධර්මය ඇති, යම් අය වෙත්ද, හික්මෙන්නාවූ යම් ආර්ය පුද්ගලයෝ සත් දෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ප්‍රතිපත්තිය අසන ලද මට කියා දෙනු මැනවි.'

"ශාරිපුත්‍රයෙනි, මෙය විස්තර වශයෙන් කෙසේ තේරුම දත යුතුද කියායි මෙසේ වදාළ කල්හි, දෙවනුවත් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙම නිශ්ශබ්ද විය.

3. තෙවෙනුවත් භාග්‍යවතුන් වහන්සේ ශාරිපුත්‍ර තෙරුන් හට කථාකළසේක. "ශාරිපුත්‍රයෙනි, මෙය "පාරායන" සූත්‍රයෙහි අජිත මාණවකයා විසින් අසන ලද ප්‍රශ්නයේදී, (මා විසින්) දේශනා කරන ලදී.

'නිදුකාණෙනි, නුවණැත්තාවූ ඔබ මේ ශාසනයෙහි දැනගන්නා ලද ධර්මය ඇති, යම් අය වෙත්ද, හික්මෙන්නාවූ යම් ආර්ය පුද්ගලයෝ සත් දෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ප්‍රතිපත්තිය අසන ලද මට කියා දෙනු මැනවි.'

"ශාරිපුත්‍රයෙනි, මෙය විස්තර වශයෙන් කෙසේ තේරුම දතයුතුද කියායි. මෙසේ වදාළ කල්හි, තෙවනුවත් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙම නිශ්ශබ්ද විය.

4. "ශාරිපුත්‍රයෙනි, මේ හටගත් පඤ්චස්කන්ධය දක්නෙහි දැයි" ඇසූහ. 'ස්වාමීනි, මේ හටගත් පඤ්චස්කන්ධය ඇතිසැටියෙන් විදර්ශනා, ඥානයෙන් හා මාර්ගඥානයෙන් මනාකොට දකීයයි' කීයේය. මේ හටගත් පඤ්චස්කන්ධය තත්ත්වාකාරයෙන් විදර්ශනා ඥානයෙහි මාර්ග ඥානයෙන්

මනාකොට දැක, පඤ්චස්කන්ධයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි. මේ පඤ්චස්කන්ධය හේතූන් නිසා හට ගන්නේයයි තත්ත්වාකාරයෙන් විදර්ශනා ඥානයෙන් සහ මාර්ග ඥානයෙන් දකියි. මේ පඤ්චස්කන්ධය හේතූන් නිසා හට ගත්තේයයි ඇතිසේ විදර්ශනා ඥානයෙන් සහ මාර්ගඥානයෙන් මනාකොට දැන, හේතුවෙන් හටගත් පඤ්චස්කන්ධයෙහි කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැති කිරීම පිණිස පිළිපන්නේවෙයි. යම් පඤ්චස්කන්ධයක් වෙයිද එය හේතූන්ගේ නිරුද්ධවීමෙන් නිරුද්ධවන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ විදර්ශනාඥානයෙන් හා මාර්ගඥානයෙන් මනාකොට දකියි. යම් පඤ්චස්කන්ධයක් වේද, එය හේතූන්ගේ නිරෝධයෙන් නිරුද්ධ වන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ විදර්ශනා ඥානයෙන් හා මාර්ග ඥානයෙන් මනාකොට දැක, නිරුද්ධවන ස්වභාවය ඇත්තාවූ පඤ්චස්කන්ධයේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයි. ස්වාමීනි, මෙසේ වනාහි සේඛ පුද්ගල තෙමේ වෙයි.

5. "ස්වාමීනි, කෙසේ වනාහි ධර්මය දැන ගන්නා ලද තැනැත්තේ වෙයිද? ස්වාමීනි හටගත් මේ පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දකී. මේ හටගත් පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැක, පඤ්චස්කන්ධයට කලකිරීමෙන් නොඇලීමෙන් (එය) නැති කිරීමෙන් සතර උපාදානයන්ගෙන් කිසි ධර්මයක් නොගෙන, මිදුනේ වෙයි. මේ පඤ්චස්කන්ධය හෙතූන් නිසා හටගත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ග ඥානයෙන් මනාකොට දකියි. මේ පඤ්චස්කන්ධය හේතූන් නිසා හටගත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැක, හේතූන් නිසා හටගත් පඤ්චස්කන්ධය කලකිරීමෙන්, නො ඇලීමෙන්, (එය) නැති කිරීමෙන්, සතර උපාදානයන්ගෙන් (කිසි ධර්මයක් නොගෙන) මිදුනේ වෙයි. ඒ හේතූන්ගේ නැතිවීමෙන් හේතූන්ගෙන්

හටගන්නා යම් පඤ්චස්කන්ධයක් වෙයිද, එය හේතූන්ගේ නිරුද්ධවීමෙන් නිරුද්ධවන ස්වභාවය ඇත්තේයයි විදර්ශනා සහිත මාර්ගඥානයෙන් දකියි. හේතූන්ගෙන් හටගන්නා යම් පඤ්චස්කන්ධයක් වෙයිද එය හේතූන්ගේ නිරුද්ධවීමෙන් නිරුද්ධවන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ දැක, පඤ්චස්කන්ධයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැති කිරීමෙන්, සතර උපාදානයන්ගෙන් (කිසි ධර්මයක් නොගෙන) මිදුනේ වෙයි. ස්වාමීනි, මෙසේ වනාහි ධර්මය දැනගන්නා ලද තැනැත්තේ (අසේඛ) වෙයි. ස්වාමීනි, මෙසේ වනාහි පාරායන සූත්‍රයෙහි වූ, අජිත ප්‍රශ්නයේදී යමක් වදාරණ ලදද, එනම්:-

> "නිදුකාණෙනි, නුවණැත්තාවූ ඔබ මේ ශාසනයෙහි දැනගන්නා ලද ධර්මය ඇති, යම් අය වෙත්ද, හික්මෙන්නාවූ යම් ආර්ය පුද්ගලයෝ සත්දෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ප්‍රතිපත්තිය අසනලද මට කියා දෙනු මැනවි" යනුයි.

**6.** "ස්වාමීනි, කෙටියෙන් දේශනා කළ මෙහි අර්ථ මෙසේ විස්තර වශයෙන් දනිමියි කීය." "සාදු! සාදු!! ශාරිපුත්‍රය මේ හටගත් පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දකියි. මේ හටගත් පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැක, පඤ්චස්කන්ධයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැති කිරීම පිණිස, පිළිපන්නේ වෙයි. මේ පඤ්චස්කන්ධය හේතූන් නිසා හටගත්තේයයි ඇති සැටියෙන් විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දකියි. මේ පඤ්චස්කන්ධය හේතූන් නිසා හටගත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැන හේතූන් නිසා හටගත් පඤ්චස්කන්ධයේ කලකිරීම පිණිස නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයි යම් පඤ්චස්කන්ධයක් වූයේද ඒ හේතූන් නැතිවීමෙන්, එය නැතිවන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දකී. යම් පඤ්චස්කන්ධයක් වූයේද, ඒ හේතූන්ගේ නැතිවීමෙන් නැතිවන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන්

මනාකොට දැක, පඤ්චස්කන්ධයේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස (එය) නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයි. ශාරිපුත්‍රයෙනි, මෙසේ වනාහි හික්මෙන්නෙක් වෙයි.

7. "ශාරිපුත්‍රයෙනි, කෙසේ වනාහි ධර්මය දැනගන්නාලද පුද්ගල තෙමේ වෙයිද? ශාරිපුත්‍රයෙනි, හටගත් මේ පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දකී. මේ හටගත් පඤ්චස්කන්ධය ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැක, පඤ්චස්කන්ධයට කලකිරීමෙන් නො ඇලීමෙන් (එය) නැතිකිරීමෙන් සතර උපාදානයන්ගෙන් කිසි ධර්මයක් නොගෙන, මිදුනේ වෙයි. මේ පඤ්චස්කන්ධය හේතුන් නිසා හටගත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් මනාකොට දැක, හේතුන් හටගත් නිසා හටගත් පඤ්චස්කන්ධයට කලකිරීමෙන්; නො ඇලීමෙන්, (එය) නැති කිරීමෙන්, සතර උපාදානයන්ගෙන් (කිසි ධර්මයක් නොගෙන) මිදුනේ වෙයි. යම් පඤ්චස්කන්ධයක් වූයේද, ඒ හේතුන්ගේ නැතිවීමෙන් එය නැතිවන ස්වභාව ඇත්තේයයි ඇතිසේ විදර්ශනා සහිත මාර්ගඥානයෙන් දකියි. යම් පඤ්චස්කන්ධයක් වූයේද, හේතූන් නැතිවීමෙන් එය නැතිවන ස්වභාවය ඇත්තේයයි ඇතිසේ දැක, පඤ්චස්කන්ධයේ නැතිවීමට කලකිරීමෙන්, නො ඇලීමෙන්, (එය) නැතිකිරීමෙන් සතර උපාඥානයන්ගෙන් (කිසි ධර්මයක් නොගෙන) මිදුනේ වෙයි. ශාරිපුත්‍රයෙනි, මෙසේ වනාහි පාරායන සූත්‍රයෙහිවූ, අජිත ප්‍රශ්නයෙදී යමක් වදාරණ ලදද එනම්:-

"නිදුකාණෙනි, නුවණැත්තාවූ, ඔබ මේ ශාසනයෙහි දැන ගන්නාලද ධර්මය ඇති, යම් අය වෙත්ද, හික්මෙන්නාවූ යම් ආර්ය පුද්ගලයෝ සත් දෙනෙක් වෙත්ද, ඔවුන්ගේ ප්‍රතිපත්තිය අසන ලද මට කියාදෙනු මැනවි" යනුයි. ශාරිපුත්‍රයෙනි, කෙටියෙන් වදාළ මේ දේශනාවේ අර්ථ විස්තර වශයෙන් මෙසේ දත යුතුයි වදාළේය.

(පළමුවන භූතමිදං සූත්‍රයයි)

---

## 2. කළාරඛත්තිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති "කළාරඛත්තිය" නම් මහණතෙම ආයුෂ්මත් සැරියුත් තෙරුන් යම්තැනකද, එතැනට පැමිණියේය පැමිණ, ආයුෂ්මත් සැරියුත් තෙරුන් හා සමග සතුටුවිය. සතුටු වියයුතුවූත්, සිහිකටයුතුවූත්, කථාවකොට නිමවා, එක් පැත්තෙක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, "කළාරඛත්තිය" මහණතෙම වනාහි ආයුෂ්මත් සැරියුත් තෙරුන් හට මෙය කීයේය. "ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, "මෝලියඵග්ගුණ" මහණතෙම ශික්ෂාව ප්‍රතික්ෂේපකොට (උපසම්පදා ශීලය ඉවත් කොට) ගිහි වූයේය. ඒ ඇවැත්තෙම මේ ශාසනයෙහි පිහිට ඒකාන්තයෙන් නොලැබීය. එසේ වුවත් ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරතෙම මේ ශාසනයෙහි පිහිට ලැබුවේද? ඇවැත්නි, මම වනාහි (ඒ ගැන) සැක නොකරමි. ඇවැත්නි නැවත ඉපදීම වනාහි නැතිකරන ලදද, ඇවැත්නි, මම වනාහි (ඒ ගැන) සැක නොකරමි.

2. ඉක්බිති "කළාරඛත්තිය" මහණතෙම ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තෙක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ "කළාරඛත්තිය" මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් විසින් රහත් බව ප්‍රකාශ කරන ලදී. (කෙසේද?) 'ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරනලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' කියායි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවකට කථාකළේය. "මහණ, නුඹ මෙහි එව. මාගේ වචනයෙන් සැරියුත්තෙරුන් කැඳවන්න" කියායි. "එසේය ස්වාමීනි" කියා ඒ මහණතෙම භාග්‍යවතුන්වහන්සේට උත්තරදී, ආයුෂ්මත්

ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයෙනි, ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවනසේකැයි" කියායි. ඇවැත්නි යහපති, කියා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම ඒ මහණහට උත්තරදී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්හට වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. "ශාරිපුත්‍රයෙනි, නුඹ විසින් රහත් බව ප්‍රකාශකරනු ලැබීය යනු සැබෑද? (කෙසේද?) 'ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරන ලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' කියායි "ස්වාමීනි, මේ පදයන්ගෙන්, මේ අක්ෂරයන්ගෙන් අදහස නොකියනලදී. ශාරිපුත්‍රයෙනි, යම්කිසි ක්‍රමයකින් වනාහි කුලපුත්‍රතෙම රහත් බව ප්‍රකාශ කෙරේද, එසේ ප්‍රකාශ කරන ලද්ද ප්‍රකාශ කරන ලද්ද වශයෙන් දතයුතුය. ස්වාමීනි, මමද එසේ කියන්නෙම් නොවේද? ස්වාමීනි, මේ පදයන්ගෙන්, මේ අක්ෂරයන්ගෙන් අදහස නොකියන ලදී" යනුවෙනි.

4. "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ අසත් නම්, 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ ඔබ විසින් රහත් බව පළකරන ලද්දේද? (කෙසේද?) ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරන ලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද ඔබ කිමැයි පැහැදිලි කරන්නේද?"

5. "ස්වාමීනි, ඉදින් මාගෙන් මෙසේ අසත් නම්, 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ, ඔබ විසින් රහත් බව ප්‍රකාශ කරන ලද්දේද? (කෙසේද?) 'ඉපදීම නැති වූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරනලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දේ මම මෙසේ විසඳන්නෙමි. ඇවැත්නි, යමක්

හේතුකොට ඉපදීම ඇතිවේද, ඒ හේතුවගේ නැතිවීමෙන් ඉපදීමේ හේතුව නැතිවූ කල්හි ඉපදීම් නම් ඵලය නැතිවූයේයයි දැනගන්නා ලදී. ඉපදීමේ හේතුව නැතිවූ කල්හි ඉපදීම් නම් ඵලය නැතිවූයේයයි දැන, 'ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරන ලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දේ, මම මෙසේ විසඳන්නෙමි".

**6.** "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, ජාතිය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද?' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ, ඔබ කිමැයි පැහැදිළි කරන්නෙහිද?" "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, ජාතිය (ඉපදීම) වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි. 'ඇවැත්නි, ජාතිය වනාහි භවය (කර්මභවය) නිදානකොට ඇත්තේය. කර්මභවය හේතුකොට ඇත්තේය. භවය ජාති (උත්පත්ති) කොට ඇත්තේය. භවය පටන්ගැන්මකොට ඇත්තේය. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි.

**7.** "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ වනාහි අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, භවය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාති (උප්පත්ති) කොට ඇත්තේද, කුමක් ප්‍රභව කොට ඇත්තේද' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසන ලද්දේ, ඔබකිමැයි පැහැදිළි කරන්නෙහිද? ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි භවය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද? කියායි.

ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිලි කරන්නෙමි. 'ඇවැත්නි, භවය වනාහි උපාදානය (තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වාගැනීම) නිදානකොට ඇත්තේය. කර්මඋපාදානය හේතුකොට ඇත්තේය. උපාදානය ජාති (උත්පත්ති) කොට ඇත්තේය. උපාදානය පටන්ගැන්ම කොට ඇත්තේය. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිලි කරන්නෙමි.

8. "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ වනාහි අසත් නම්:- උපාදානය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාති (උප්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද?' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ ඔබ කිමැයි පැහැදිළි කරන්නෙහිද?" "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, උපාදානය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිලි කරන්නෙමි. 'ඇවැත්නි, උපාදානය වනාහි තණ්හාව නිදානකොට ඇත්තේය. කර්ම තණ්හාව හේතුකොට ඇත්තේය. තණ්හාව ජාති (උත්පත්ති) කොට ඇත්තේය. තණ්හාව පටන්ගැන්මකොට ඇත්තේය. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිලි කරන්නෙමි."

9. "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ වනාහි අසත්නම්:- ඇවැත් ශාරිපුත්‍රයෙනි, තණ්හාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද?' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ ඔබ කිමැයි පැහැදිළි කරන්නෙහිද?' 'ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, තණ්හාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්ම කොට ඇත්තේද?' කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි. 'ඇවැත්නි, තණ්හාව වනාහි වේදනාව නිදානකොට ඇත්තේය.

කර්මවේදනාව හේතුකොට ඇත්තේය. වේදනාව ජාති (උත්පත්ති) කොට ඇත්තේය. වේදනාව පටන් ගැන්මකොට ඇත්තේය. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි.

10. "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ වනාහි අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, වේදනාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්මකොට ඇත්තේද? කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ ඔබ කිමැයි පැහැදිළි කරන්නෙහිද?" 'ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, වේදනාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාති (උත්පත්ති) කොට ඇත්තේද, කුමක් පටන්ගැන්ම කොට ඇත්තේද?" කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි. 'ඇවැත්නි, වේදනාව වනාහි ස්පර්ශය නිදාන කොට ඇත්තේය. කර්ම ස්පර්ශය හේතුකොට ඇත්තේය. ස්පර්ශය ජාති (උත්පත්ති) කොට ඇත්තේය. ස්පර්ශය පටන් ගැන්ම කොට ඇත්තේය. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි.

11. "ඉදින් ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ වනාහි අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ ඔබට වනාහි වේදනාවන්හි යම් ඇලීමක් (නන්දියක්) වේද, එය එළඹ නොසිටියේද?' කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ ඔබ කිමැයි පැහැදිළි කරන්නෙහිද?" "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ ඔබට වනාහි වේදනාවන්හි යම් ඇලීමක් (නන්දියක්) වේද, එය එළඹ නොසිටියේද'? කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දේ, මම මෙසේ විසඳන්නෙමි. (කෙසේද?) 'ඇවැත්නි, මේ වේදනාවෝ වනාහි තිදෙනෙක් වෙති. (ඒ) තිදෙන කවරේද? සැප වේදනාව, දුක් වේදනාව සහ නොදුක් නොසැප වේදනාවයි. ඇවැත්නි, මේ ත්‍රිවිධ වේදනාවෝ වනාහි අනිත්‍යයෝ

වෙති. යමක් අනිත්‍යද, එය දුක්ය කියා දන්නාලදී. (ඒ නිසා) වේදනාවන්හි යම් ඇලීමක් (නන්දියක්) වේද, එය එළඹ නොසිටියේය. කියායි. ස්වාමීනි, මෙසේ අසනලද්දේ මම මෙසේ විසඳන්නෙමියි" කීයේය.

12. "ශාරිපුත්‍රයෙනි, සාදු! සාදු!! ශාරිපුත්‍රය, යම්කිසි විඳීමක් වේනම් එය දුකමය. අර්ථය කෙටියෙන් පැහැදිළි කිරීම සඳහා මෙයද එක් ක්‍රමයකි.

"ඉදින් ශාරිපුත්‍රයෙනි, මෙසේ අසත් නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කෙබඳු මිදීමකින් ඔබ රහත් බව ප්‍රකාශ කරන ලද්දේද? (කෙසේද?) ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරනලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි. කියායි. ශාරිපුත්‍රයෙනි, මෙසේ අසනලද්දේ ඔබ කිමැයි පැහැදිළි කරන්නේද?" "ඉදින් ස්වාමීනි, මාගෙන් මෙසේ අසත්නම්:- 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිනම් මිදීමකින් වනාහි ඔබ රහත් බව ප්‍රකාශකරන ලද්දේද? (කෙසේද?) 'ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරන ලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි කියායි. ස්වාමීනි මෙසේ අසන ලද්දේ මම මෙසේ පැහැදිළි කරන්නෙමි. 'ඇවැත්නි, මම අද්ධ්‍යාත්මික සංස්කාරයන් නිමිති වශයෙන් ගෙන, පැමිණි රහත් බැවින් සියලු සිව් වැදෑරුම් උපාදානයන් නැතිකිරීමෙන් යම් ආකාර සිහියකින් වාසයකරන මාහට ආශ්‍රවයෝත් නොඋපදිත්ද, තමහට අවමන් නොකරන්නෙම්ද, එවැනි සිහියෙන් යුක්තව වාසය කරමි'. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ පැහැදිළි කරන්නෙමි". "ශාරිපුත්‍රයෙනි, සාදු! සාදු!! ශාරිපුත්‍රයෙනි, යම් ආශ්‍රවයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුද 'එහි මම සැක නොකරමි. ඔව්හු මා විසින් පහකරන ලද්දාහුයයි සැක නොඋපදවමි යන මෙයද ඒ අර්ථය කෙටියෙන් පැහැදිළි කිරීමට එක්තරා ක්‍රමයකි' භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාරා සුගතයන් වහන්සේ ආසනයෙන් නැගිට වෙහෙරට වැඩිසේක.

13. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් භික්ෂූන්ට කථා කළේය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පෙර (මා විසින්) නොදත් ප්‍රශ්නයක් මාගෙන් අසනලදී. ඒ මට භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැනගැනීමට ප්‍රමාදවිය. ඇවැත්නි, යම් හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ මාගේ මුල් ප්‍රශ්නයේ විසඳුමට සතුටුවූසේක්ද (එවිට) ඇවැත්නි, ඒ මට මේ සිත පහළවිය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් දවාලකුදු මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන් වහන්සේ රැයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රැයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන් වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන් වහන්සේ එක් රෑ දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම එක් රෑ දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් දෙකකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් දෙකකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් තුනකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් තුනකුදු වෙනස්

වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් හතරකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් හතරකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් පසකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් පසකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් හයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් හයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

"ඉදින් භාග්‍යවතුන්වහන්සේ රෑ දාවල් හතකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රෑ දාවල් හතකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

14. ඉක්බිති "කළාරඛත්තිය" නම් මහණතෙම ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටුවිය. සතුටු වියයුතුවූත් සිහි කටයුතුවූත් කථාවකොට නිමවා එක් පැත්තක හුන්නාහුය. එක්පැත්තක හුන්නාවූ 'කළාරඛත්තිය' මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් (මහත්වූ)

සිංහනාදයක් කරනලදී. (කෙසේද?) 'ඇවැත්නි, (මා) මුලින් දැන නොසිටියාවූ (ඉදින්) ශාරිපුත්‍රයෙනි, ඔබෙන් මෙසේ අසත්නම්:- ශාරිපුත්‍රයෙනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ ඔබ විසින් රහත්බව පළකරන ලද්දේද? (කෙසේද?) 'ඉපදීම නැතිවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර අවසානය. කළයුත්ත කරනලදී. මේ ආත්මයේදී කළයුතු අනිකක් නැතැයි දනිමි' යන මේ මුල් ප්‍රශ්නය භාග්‍යවතුන් වහන්සේ මාගෙන් ඇසූ සේක. භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැනගැනීමට ඒමට පමා විය.

'ඇවැත්නි, යම් හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම ප්‍රශ්නයට අනුව මට සතුටුවූසේක්ද, ඇවැත්නි, ඒ මට මේ අදහස ඇතිවිය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රැයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම් මම රැයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ එක් රෑ දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම එක් රෑ දවාලකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් දෙකකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දෙකකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් තුනකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දාවල් තුනකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් හතරකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දාවල් හතරකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් පහකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දාවල් පහකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් හයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දාවල් හයකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

'ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දාවල් හතකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මාගෙන් මේ අර්ථය අසන්නේ නම්, මම රෑ දාවල් හතකුදු වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමි.

15. "මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ ශ්‍රාවක පාරමීඥානය වනාහි (ඔහු විසින්) මනාකොට අවබෝධ කරනලදී. යම් පාරමීඥානයක් මනාකොට අවබෝධ කරනලද හෙයින් මම දවාලකුදු ඉදින් ශාරිපුත්‍රයන්ගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ තේරුම අසන්නෙම් නම්

දවාලකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස්වූ පද වශයෙන් වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රැයකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රැයකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම එක් රෑ දවාලකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් එක් රෑ දවාලකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් දෙකකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රෑ දාවල් දෙකකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස් ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් තුනකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රෑ දාවල් දෙකකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් හතරකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රෑ දාවල් හතරකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් පහකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය

අසන්නෙම් නම් රෑ දාවල් පහකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් හයකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රෑ දාවල් හයකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

"ඉදින් මම රෑ දාවල් හතකුදු ශාරිපුත්‍රගෙන් වෙනස් වෙනස්වූ පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මේ අර්ථය අසන්නෙම් නම් රෑ දාවල් හතකුදු ශාරිපුත්‍රතෙම වෙනස් වෙනස් පද වශයෙන්, වෙනස් වෙනස්වූ ක්‍රම වශයෙන් මට මේ අර්ථය කියන්නේය.

(දෙවෙනි කළාරඛත්තිය සූත්‍රය නිමි.)

---

## 3. ඤාණවත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නුඹලාට ඤාණවස්තූන් හතළිස් හතරක් දේශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි (දේශනා කළසේක.) 'එසේය ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, ඤාණවස්තු හතළිස් හතර කවරේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ජරාමරණ දන්නා ඥාණය. ජරාමරණ හේතුන් දන්නා ඥාණය, ජරා මරණයන්ගේ නිරුද්ධවීම දන්නා ඥාණය, ජරාමරණ නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාව දන්නා ඥාණය.

"ජාතිය දන්නා ඥාණය, ජාති හේතුව දන්නා ඥාණය, ජාති නිරෝධය දන්නා ඥාණය, ජාති නිරෝධගාමිනී පටිපදාව දන්නා ඥාණය.

භවය දන්නා ඥාණය, භව හේතුව දන්නා ඥාණය, භව නිරෝධය දන්නා ඥාණය, භව නිරෝධගාමිනී පටිපදාව දන්නා ඥාණය.

උපාදානය දන්නා ඥාණය, උපාදාන හේතුව දන්නා ඥාණය, උපාදාන නිරෝධය දන්නා ඥාණය, උපාදාන නිරෝධගාමිනී පටිපදාව දන්නා ඥාණය.

තණ්හාව දන්නා ඥාණය, තණ්හා හේතුව දන්නා ඥාණය, තණ්හා නිරෝධය දන්නා ඥාණය, තණ්හා නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

වේදනා දන්නා ඥාණය, වේදනා හේතුව දන්නා ඥාණය, වේදනා නිරෝධය දන්නා ඥාණය, වේදනා නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

ස්පර්ශය දන්නා ඥාණය, ස්පර්ශය හේතුව දන්නා ඥාණය, ස්පර්ශය නිරෝධය දන්නා ඥාණය, ස්පර්ශය නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

සළායතන දන්නා ඥාණය, සළායතන හේතුව දන්නා ඥාණය, සළායතන නිරෝධය දන්නා ඥාණය, සළායතන නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

"නාමරූප දන්නා ඥාණය, නාමරූප හේතුව දන්නා ඥාණය, නාමරූප නිරෝධය දන්නා ඥාණය, නාමරූප නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

"විඤ්ඤාණ දන්නා ඥාණය, විඤ්ඤාණ හේතුව දන්නා ඥාණය, විඤ්ඤාණ නිරෝධය දන්නා ඥාණය, විඤ්ඤාණ නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඥාණය.

"සංඛාර දන්නා ඤාණය, සංඛාර හේතුව දන්නා ඤාණය, සංඛාර නිරෝධය දන්නා ඤාණය, සංඛාර නිරෝධ ගාමිනී පටිපදාව දන්නා ඤාණය.

"මහණෙනි, මොහු ඤාණ වස්තු හතලිස් හතර යයි" කියනු ලැබෙත්"

4. "මහණෙනි, ජරාමරණය කවරේද? ඒ ඒ සත්ව නිකායෙහිවූ, ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක්, දිරායාමක්, දත් වැටීමක්, කෙස් සුදුවීමක්, ඇඟ රැළි වැටීමක්, ආයුෂයාගේ ගෙවීයාමක්, ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, මෙය ජරාවයි කියනු ලැබේ. ඒ ඒ සත්වනිකායෙන් ඒ ඒ සත්වයන්ගේ යම් චුතවීයාමක්, පහවීයාමක්, බිඳීමක්, අතුරුදන් වීමක්, මෘත්‍යුනම්වූ මරණයක්, කාලක්‍රියාවක්, ස්කන්ධයන්ගේ බිඳීමක්, මෘතශරීරයාගේ අත්හැර දැමීමක් වේද, මෙය මරණයයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මේ දිරීමද; මේ මැරීමද, ජරා මරණයයි කියනු ලැබේ ජාති හේතුකොට ගෙන (උප්පත්තිය ඇතිවීමෙන්) ජරා මරණ ඇතිවේ. ජාති නිරෝධයෙන් (උප්පත්තිය නැති කිරීමෙන්) ජරා මරණය නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම ජරා මරණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයයි (කියනු ලැබේ.) හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මාසංකප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මා ආජීවය සම්මාවායාමය. සම්මාසතිය සහ සම්මාසමාධියයි.

5. "මහණෙනි, යම් හේතුවකින් ආර්ය ශ්‍රාවක තෙම මෙසේ ජරා මරණය දනීද, මෙසේ ජරා මරණයන්ගේ හේතු දනීද, මෙසේ ජරා මරණයන්ගේ නැතිවීම දනීද, මෙසේ ජරා මරණ නැතිකරන මාර්ගය දනීද, මෙය ඔහුගේ චතුස්සත්‍යය දක්නා ඥානය වන්නේය. හෙතෙම නුවණින් දක්නාලද, නුවණින් අවබෝධ කරන ලද කල් නොගොස් අනතුරුවම ඵල දෙන ස්වභාවය ඇති, පැමිණියාවූ නුවණින් බැසගන්නා ලද, මේ චතුරාර්ය සත්‍යධර්මයන් දක්නා ඥානයෙන් අතීත අනාගත කාල දැනගන්නාවූ ඥානයටද පමුණුවන්නේය. අතීත කාලයෙහිවූ, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරා

මරණය දැනගත්තාහුද, ජරාමරණයන්ගේ හේතු දැනගත්තාහුද, ජරා මරණයන්ගේ නැතිවීම දැනගත්තාහුද, ජරා මරණය නැතිකරන මාර්ගය දැනගත්තාහුද ඔහු සියලු දෙනම, මම මෙකල්හි යම්සේ දැනගත්තෙම්ද, එසේම දැන ගත්තාහුය. අනාගත කාලයෙහි වෙන යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරාමරණය දැනගන්නාහුද, ජරා මරණයන්ගේ හේතු දැනගන්නාහුද, ජරා මරණයන්ගේ නැතිවීම දැනගන්නාහුද, ජරාමරණය නැතිකරන මාර්ගය දැනගන්නාහුද, ඔවුහු සියලු දෙනම මම යම්සේ මෙකල්හි දැන් දනිම්ද, එසේ දැනගන්නාහුය' කියායි මෙය ඔහුගේ මාර්ගඥානයට අනුව පහළවන්නාවූ ඥානයයි. (ප්‍රත්‍යවෙක්ෂා ඥානයයි.)

**6.** "මහණෙනි, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකයාහට මාර්ග ඥානයද, ප්‍රත්‍යවෙක්ෂා ඥානයද යන මේ ඥාන දෙක පිරිසිදු වෙත්ද, නිර්මල වෙත්ද, මහණෙනි, මේ ආර්යශ්‍රාවක තෙම මාර්ගදෘෂ්ටියෙන් යුක්ත වූයේයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්ත වූයේයයි කියාද, මේ මාර්ග සද්ධර්මයට පැමිණියේයයි කියාද, මේ මාර්ග සද්ධර්මය දකීයයි කියාද, ශෛක්ෂ ඥානයෙන් යුක්තයයි කියාද ශෛක්ෂ විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද, කියනු ලැබේ.

**7.** "මහණෙනි, ජාතිය නම් කවරේද? ඒ ඒ සත්ව නිකායෙහි ඒ ඒ සත්වයින්ගේ යම් ඇතිවීමක්, හටගැනීමක්, බැසගැනීමක්, ඉපදීමක්, ස්කන්ධයන්ගේ ඇතිවීමක්, ආයතනයන්ගේ පහළවීමක් වේද, මහණෙනි, මෙය ජාතියයි (උප්පත්තියයි) කියනු ලැබේ.

"මහණෙනි, භවය නම් කවරේද? මහණෙනි, කාම භවය, රූප භවය, සහ අරූප භවයයි කියා මේ භවයෝ තිදෙනෙක් වෙත්. මහණෙනි, මෙය භවයයි කියනු ලැබේ.

"මහණෙනි, උපාදානය කවරේද? මහණෙනි, කාමුපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය සහ අත්තවාදුපාදානයයි කියා

මේ උපාදානයෝ (දැඩිව අල්වා ගන්නෝ) සිව් දෙනෙක් වෙති. මහණෙනි, මෙය උපාදානයයි (දැඩිව අල්වා ගැනීමයයි) කියනු ලැබේ.

"මහණෙනි, තණ්හාව කවරේද? මහණෙනි, රූප තණ්හාව, සද්ද තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව, ඵොට්ඨබ්බ තණ්හාව සහ ධර්ම තණ්හාව යයි කියා, මේ තණ්හා සමූහයෝ සදෙනෙක් වෙති. මහණෙනි, මෙය තණ්හාවයයි කියනු ලැබේ.

"මහණෙනි, වේදනාව කවරේද? මහණෙනි, ඇස හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව, කණ හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව, නහය හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව, දිව හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව, කය හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව සහ සිත හා ගැටීමෙන් ඇතිවෙන වේදනාව යයි කියා මේ වේදනා සමූහයෝ සදෙනෙක් වෙති. මහණෙනි, මෙය වේදනාවයයි කියනු ලැබේ.

"මහණෙනි, ස්පර්ශය කවරේද? මහණෙනි, චක්ඛුස්පර්ශය, ශ්‍රොත ස්පර්ශය, ඝ්‍රාණ ස්පර්ශය, ජිව්හා ස්පර්ශය, කාය ස්පර්ශය සහ මනස් ස්පර්ශයයි කියා මේ ස්පර්ශ සමූහයෝ සදෙනෙක් වෙති. මහණෙනි, මෙය ස්පර්ශයයි කියනු ලැබේ.

"මහණෙනි, සළායතන කවරේද? මහණෙනි, චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය සහ මනායතනයයි කියා මේ ආයතන සමූහයෝ සදෙනෙක් වෙති. මහණෙනි, මෙය සළායතනයයි කියනු ලැබේ.

"මහණෙනි, නාමරූප කවරේද? වේදනාව, සංඥාව, චේතනාව, ස්පර්ශය සහ මනසිකාරය යන මෙය නාමයයි කියනු ලැබේ. සතර මහා භූතයින් සහ සතර මහා භූතයන් නිසා පවත්නා රූපයද යන මෙය රූපයයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මේ නාමයද, රූපයද නාම රූපයයි කියනු ලැබේ.

"මහණෙනි, විඤ්ඤාණය කවරේද? මහණෙනි, චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා

විඤ්ඤාණය, කාය විඤ්ඤාණය සහ මනෝ විඤ්ඤාණයයි කියා මේ විඤ්ඤාණ සමූහයෝ සදෙනෙක් වෙති. මහණෙනි, මෙය විඤ්ඤාණයයි කියනු ලැබේ.

"මහණෙනි, සංස්කාර කවරේද? මහණෙනි, කාය සංඛාරය, වචී සංඛාරය සහ චිත්ත සංඛාරයයි කියා මේ සංස්කාරයෝ තිදෙනෙක් වෙති. මහණෙනි, මොවුහු සංස්කාරයෝ යයි කියනු ලැබෙත්.

"අවිජ්ජාව ඇතිවීමෙන් සංස්කාර ඇතිවේ. අවිජ්ජාව නැතිවීමෙන් සංස්කාර නැතිවේ. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම සංස්කාර නැතිකිරීම පිණිස ගමන් කළ යුතු මාර්ගයයි (කියනු ලැබේ.) හේ කවරේද? සම්මාදිට්ඨිය, සම්මා සංකප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය සහ සම්මාසමාධියයි.

8. "මහණෙනි, යම් හෙයකින් ආර්යශ්‍රාවක තෙම වනාහි මෙසේ සංස්කාරයන් දනීද, මෙසේ සංස්කාරයන්ගේ හේතු දනීද, මෙසේ සංස්කාරයන්ගේ නැතිවීම දනීද, මෙසේ සංස්කාරයන් නැතිකරන මාර්ගය දනීද, මෙය මාර්ගඥානය වන්නේය. හෙතෙම නුවණින් දක්නාලද, නුවණින් දන්නා ලද, කල් නොගොස් ඵලදෙන ස්වභාවය ඇති, අවබෝධ කරනලද, නුවණින් පිවිසෙන ලද, මේ චතුරාර්ය සත්‍ය දන්නා ඥානයෙන්, අතීත කාල අනාගත කාල දක්නා නුවණටද පමුණුවයි. අතීත කාලයෙහිවූ යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සංස්කාරයන් දැනගත්තාහුද, සංස්කාරයන්ගේ හේතු දැනගත්තාහුද, සංස්කාරයන්ගේ නැතිවීම් දැනගත්තාහුද, සංස්කාරයන් නැතිකරන මාර්ගය දැන ගත්තාහුද ඔවුහු සියලු දෙනම, මම යම්සේ මෙකල්හි දනිම්ද, එසේම දැන ගත්තාහුය. අනාගත කාලයෙහි වෙන යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සංස්කාරය දැනගන්නාහුද, සංස්කාරයන්ගේ හේතු දැනගන්නාහුද, සංස්කාරයන්ගේ නැතිවීම දැනගන්නාහුද, සංස්කාර නැති කරන මාර්ගය දැනගන්නාහුද, ඔවුහු සියලු

දෙනම මම යම්සේ මෙකල්හි දැන් දනිම්ද, එසේ දැනගන්නාහුය කියායි. මෙය ඔහුගේ මාර්ගඥානයට අනුව පහළවන ඥානයයි (ප්‍රත්‍යවේක්ෂා ඥානයයි.)

**9.** "මහණෙනි, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකයාගේ මාර්ග ඥානයද, ප්‍රත්‍යවේක්ෂා ඥානයද යන මේ ඥාන දෙක වනාහි පිරිසිදු වෙත්ද, නිර්මල වෙත්ද, මහණෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙම මාර්ග දෘෂ්ටියෙන් යුක්තවූයේයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තවූයේ යයි කියාද, මේ මාර්ග සද්ධර්මයට පැමිණියේයයි කියාද, මේ මාර්ග සද්ධර්මය දකීයයි කියාද, ශෛක්ෂ ඥානයෙන් යුක්තයයි කියාද, ශෛක්ෂ විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද, කියනු ලැබේ."

**(තුන්වෙනි ඤාණ වත්ථු සූත්‍රය නිමි.)**

---

## 4. ඤාණවත්ථු සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ඤාණවස්තූන් හැත්තෑ හතක් නුඹලාට දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි (දේශනා කළසේක.) එසේය, 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

**3.** "මහණෙනි, ඤාණවස්තු හැත්තෑහත කවරහුද?

(1) ඉපදීම නිසා ජරා මරණය ඇතිවේය යන නුවණ.

(2) ඉපදීම නැති කල්හි ජරා මරණය නැතිවේය යන නුවණ.

(3) අතීත කාලයෙහිද ඉපදීම නිසා ජරා මරණය ඇති වූයේය යන නුවණ.

(4) ඉපදීම නැතිවූ කල්හි ජරා මරණය නැතිවූයේය, යන නුවණ.

(5) අනාගත කාලයෙහිද ඉපදීම නිසා ජරා මරණය ඇතිවන්නේය යන නුවණ.

(6) ඉපදීම නැති කල්හි ජරා මරණය ඇති නොවන්නේය යන නුවණ.

(7) යම් ඒ (ඉපදීම නිසා ජරා මරණය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

(8) භවය නිසා ඉපදීම ඇතිවේය යන නුවණ.

(9) භවය නැති කල්හි ඉපදීම නැතිවේය යන නුවණ.

(10) අතීත කාලයෙහිද භවය නිසා ඉපදීම ඇතිවූයේය යන නුවණ.

(11) භවය නැතිවූ කල්හි ඉපදීම නැතිවූයේය යන නුවණ.

(12) අනාගත කාලයෙහිද භවය නිසා ඉපදීම ඇති වන්නේය යන නුවණ.

(13) භවය නැති කල්හි ඉපදීම ඇති නොවන්නේය යන නුවණ.

(14) යම් ඒ (භවය නිසා ඉපදීම ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(15) උපාදානය නිසා භවය ඇතිවේය යන නුවණ.

(16) උපාදානය නැතිකල්හි භවය නැතිවේය යන නුවණ.

(17) අතීත කාලයෙහිද උපාදානය නිසා භවය ඇති වූයේය යන නුවණ.

(18) උපාදානය නැතිවූ කල්හි භවය නැතිවූයේය යන නුවණ.

(19) අනාගත කාලයෙහිද උපාදානය නිසා භවය ඇති වන්නේය යන නුවණ.

(20) උපාදානය නැති කල්හි භවය ඇතිනොවන්නේය යන නුවණ.

(21) යම් ඒ (උපාදානය නිසා භවය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

(22) තණ්හාව නිසා උපාදානය ඇතිවේය යන නුවණ.

(23) තණ්හාව නැති කල්හි උපාදානය නැතිවේය යන නුවණ.

(24) අතීත කාලයෙහිද තණ්හාව නිසා උපාදානය ඇති වූයේය යන නුවණ.

(25) තණ්හාව නැතිවූ කල්හි උපාදානය නැතිවූයේය යන නුවණ.

(26) අනාගත කාලයෙහිද තණ්හාව නිසා උපාදානය ඇතිවන්නේය යන නුවණ.

(27) තණ්හාව නැති කල්හි උපාදානය ඇති නොවන්නේය යන නුවණ.

(28) යම් ඒ (තණ්හාව නිසා උපාදානය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක් වේද එයද ක්ෂයවන ස්වභාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

**(29)** වේදනාව නිසා තණ්හාව ඇතිවේය යන නුවණ.

**(30)** වේදනාව නැතිකල්හි තණ්හාව නැතිවේය යන නුවණ.

**(31)** අතීත කාලයෙහිද වේදනාව නිසා තණ්හාව ඇති වූයේ යන නුවණ.

**(32)** වේදනාව නැතිවූ කල්හි තණ්හාව නැතිවූයේය යන නුවණ.

**(33)** අනාගත කාලයෙහිද වේදනාව නිසා තණ්හාව ඇති වන්නේය යන නුවණ.

**(34)** වේදනාව නැතිකල්හි තණ්හාව ඇති නොවන්නේය යන නුවණ.

**(35)** යම් ඒ (වේදනාව නිසා තණ්හාව ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

**(36)** ස්පර්ශය නිසා වේදනාව ඇතිවේය යන නුවණ.

**(37)** ස්පර්ශය නැති කල්හි වේදනාව නැතිවේය යන නුවණ.

**(38)** අතීතකාලයෙහිද ස්පර්ශය නිසා වේදනාව ඇති වූයේය යන නුවණ.

**(39)** ස්පර්ශය නැතිවූ කල්හි වේදනාව නැතිවූයේ යන නුවණ

**(40)** අනාගත කාලයෙහිද ස්පර්ශය නිසා වේදනාව ඇති වන්නේ යන නුවණ.

**(41)** ස්පර්ශය නැති කල්හි වේදනාව ඇති නොවන්නේය යන නුවණ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(42) යම් ඒ (ස්පර්ශය නිසා වේදනාව ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

(43) සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේය යන නුවණ.

(44) සළායතන නැති කල්හි ස්පර්ශය නැතිවේය යන නුවණ.

(45) අතීත කාලයෙහිද සළායතන නිසා ස්පර්ශය ඇතිවූයේය යන නුවණ.

(46) සළායතන නැතිවූ කල්හි ස්පර්ශය නැතිවූයේය යන නුවණ.

(47) අනාගත කාලයෙහිද සළායතන නිසා ස්පර්ශය ඇතිවන්නේය යන නුවණ.

(48) සළායතන නැති කල්හි ස්පර්ශය ඇති නොවන්නේය යන නුවණ.

(49) යම් ඒ (සළායතනය නිසා ස්පර්ශය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

(50) නාමරූප නිසා සළායතනයන් ඇතිවේය යන නුවණ.

(51) නාමරූප නැති කල්හි සළායතන නැතිවේය යන නුවණ.

(52) අතීත කාලයෙහිද නාමරූප නිසා සළායතන ඇති වූයේ යන නුවණ.

(53) නාමරූප නැතිවූ කල්හි සළායතන නැතිවූයේය යන නුවණ.

(54) අනාගත කාලයෙහිද නාමරූප නිසා සළායතන ඇතිවන්නේය යන නුවණ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**(55)** නාමරූප නැතිකල්හි සළායතන ඇති නොවන්නේ යන නුවණ.

**(56)** යම් ඒ (නාමරූප නිසා සළායතනය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

**(57)** විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේය යන නුවණ.

**(58)** විඤ්ඤාණය නැති කල්හි නාමරූප නැතිවේය යන නුවණ.

**(59)** අතීත කාලයෙහිද විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවූයේය යන නුවණ.

**(60)** විඤ්ඤාණය නැතිවූ කල්හි නාමරූප නැතිවූයේය යන නුවණ.

**(61)** අනාගත කාලයෙහිද විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවන්නේය යන නුවණ.

**(62)** විඤ්ඤාණය නැතිකල්හි නාමරූප ඇති නොවන්නේය යන නුවණ.

**(63)** යම් ඒ (විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

**(64)** සංස්කාරය නිසා විඤ්ඤාණය ඇතිවේය යන නුවණ

**(65)** සංස්කාරය නැති කල්හි විඤ්ඤාණය නැතිවේය යන නුවණ.

**(66)** අතීත කාලයෙහිද සංස්කාරය නිසා විඤ්ඤාණය ඇතිවූයේය යන නුවණ.

**(67)** සංස්කාරය නැතිවූ කල්හි විඤ්ඤාණය නැතිවූයේය යන නුවණ.

**(68)** අනාගත කාලයෙහිද සංස්කාරය නිසා විඤ්ඤාණය ඇතිවන්නේය යන නුවණ.

**(69)** සංස්කාරය නැතිකල්හි විඤ්ඤාණය ඇති නොවන්නේය යන නුවණ.

**(70)** යම් ඒ (සංස්කාරය නිසා විඤ්ඤාණය ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

**(71)** අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේය යන නුවණ.

**(72)** අවිජ්ජාව නැති කල්හි සංස්කාරය නැතිවේය යන නුවණ.

**(73)** අතීත කාලයෙහිද අවිජ්ජාව නිසා සංස්කාර ඇති වූයේය යන නුවණ.

**(74)** අවිජ්ජාව නැතිවූ කල්හි සංස්කාරය නැතිවූයේය යන නුවණ.

**(75)** අනාගත කාලයෙහිද අවිජ්ජාව නිසා සංස්කාරය ඇතිවන්නේය යන නුවණ.

**(76)** අවිජ්ජාව නැති කල්හි සංස්කාරය ඇති නොවන්නේය යන නුවණ.

**(77)** යම් ඒ (අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේය යන) පටිච්චසමුප්පාදය දන්නා නුවණක්වේද, එයද ක්ෂයවන ස්වභාව ඇත්තේය. විනාශවන ස්වභාව ඇත්තේය. නොඇලෙන ස්වභාව ඇත්තේය. නැතිවෙන ස්වභාව ඇත්තේය යන නුවණ.

"මහණෙනි, මොවුහු ඤාණවස්තු සැත්තෑසතයයි කියනු ලැබෙත්.

**(සිව්වන ඤාණවත්ථු සූත්‍රය නිමි.)**

---

# 5. අවිජ්ජා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා, මරණද, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවේ. මෙසේ මේ තනිකර දුක් සමූහයාගේ පහළවීම ඇතිවේ."

3. මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ජරාමරණය වනාහි කවරේද? මේ ජරාමරණය වනාහි කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක. "මහණ ජරාමරණය කවරේද? මේ ජරා මරණය කාගේ දැයි' මෙසේ හෝ යමෙක් කියන්නේද, මහණ, ජරාමරණය අනිකකි. මේ ජරාමරණය වනාහි අනිකකුගේයයි. මෙසේ හෝ යමෙක් කියන්නේද මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි ආර්ය මාර්ගයට පැමිණීමක් නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටි හෝ ඇති කල්හි ආර්ය මාර්ගයට පැමිණීමක් නොවේ. මහණ ඒ මේ අන්ත දෙකට නොපැමිණ, ජාතිය නිසා ජරාමරණය ඇතිවේ යයි" තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** "ස්වාමීනි, ජාතිය කවරේද? මේ ජාතිය කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක:- "මහණ, ජාතිය කවරේද? මේ ජාතිය කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, ජාතිය අනිකකි. මේ ජාතිය වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, භවය නිසා ජාතිය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

**5.** "ස්වාමීනි, භවය කවරේද? මේ භවය කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක:- "මහණ, භවය කවරේද? මේ භවය කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, භවය අනිකකි. මේ භවය වනාහි අනිකකුගේයයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ උපාදානය නිසා භවය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක".

**6.** "ස්වාමීනි, උපාදානය කවරේද? මේ උපාදානය කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක:- "මහණ, උපාදානය කවරේද? මේ උපාදානය කාගේදැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, උපාදානය අනිකකි. මේ උපාදානය වනාහි අනිකකුගේයයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග

බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, තණ්හාව නිසා උපාදානය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

7. "ස්වාමීනි, තණ්හාව කවරේද? මේ තණ්හාව කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේකඃ- "මහණ, තණ්හාව කවරේද? මේ තණ්හාව කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, තණ්හාව අනිකකි. මේ තණ්හාව වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ වේදනාව නිසා තණ්හාව ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

8. "ස්වාමීනි, වේදනාව කවරේද? මේ වේදනාව කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේකඃ- "මහණ, වේදනාව කවරේද? මේ වේදනාව කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, වේදනාව අනිකකි. මේ වේදනාව වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

9. "ස්වාමීනි, ස්පර්ශය කවරේද? මේ ස්පර්ශය කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේකඃ- "මහණ, ස්පර්ශය කවරේද? මේ ස්පර්ශය කාගේ දැයි? මෙසේ හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යමෙක් කියන්නේ වේද, මහණ, ස්පර්ශය අනිකකි. මේ ස්පර්ශය වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, සළායතන නිසා ස්පර්ශය ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

10. "ස්වාමීනි, සළායතන කවරේද? මේ සළායතන කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේකː- "මහණ, සළායතන කවරේද? මේ සළායතන කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, සළායතන අනිකකි. මේ සළායතන වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, නාමරූප නිසා සළායතන ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

11. "ස්වාමීනි, නාමරූප කවරේද? මේ නාමරූප කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේකː- "මහණ, නාමරූප කවරේද? මේ නාමරූප කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, නාමරූප අනිකකි. මේ නාමරූප වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, විඤ්ඤාණය

නිසා නාමරූප ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

12. "ස්වාමීනි, විඥ්ඥාණය කවරේද? මේ විඥ්ඥාණය කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක:- "මහණ, විඥ්ඥාණය කවරේද? මේ විඥ්ඥාණය කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, විඥ්ඥාණය අනිකකි. මේ විඥ්ඥාණය වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේ, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, සංස්කාර නිසා විඥ්ඥාණය ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

13. "ස්වාමීනි, සංස්කාර කවරේද? මේ සංස්කාර කාගේද?" භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නය නුසුදුසුයයි වදාළ සේක:- "මහණ, සංස්කාර කවරේද? මේ සංස්කාර කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණ, සංස්කාර අනිකකි. මේ සංස්කාර වනාහි අනිකකුගේ යයි මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය, ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි යන දෘෂ්ටිය හෝ ඇති කල්හි හෝ මාර්ග බ්‍රහ්මචර්යාව නොවේ. මහණ, මේ අන්ත දෙකට නොපැමිණ, අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ යයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක".

14. "ස්වාමීනි, අවිද්‍යාව ඉතිරි නොකොට පහකිරීම හේතුකොටගෙන ඔහුට "ජරාමරණ නම් කවරේද? මේ කවරකුගේ ජරාමරණද කියා හෝ ජරාමරණ අනිකකි, මේ ජරාමරණ අනිකකුගේය කියා හෝ එයම ජීවයයි එයම ශරීරයයි

කියා හෝ ජීවය අනිකකි ශරීරය අනිකකි කියා හෝ යම් දෘෂ්ටි වරදවා සහමුලින් ගැනීම් විපරිත ගැනීම් වෙත්ද ඒ සියල්ල අවිද්‍යාව ඉතිරි නොකොට පහකිරීම හේතු කොටගෙන යමෙකුට ජරා මරණය අනිකකි, මේ ජරාමරණය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයම යයි කියා හෝ, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ පවත්නාවූ ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල්සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

15. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. ජාතිය කවරේද, මේ ජාතිය කාගේදැයි කියා හෝ ජාතිය අනිකකැයි. කියා හෝ මේ ජාතිය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල්සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

16. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. භවය කවරේද, මේ භවය කාගේදැයි කියා හෝ භවය අනිකකැයි කියා හෝ මේ භවය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල්සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

17. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. උපාදානය කවරේද, මේ උපාදානය කාගේ දැයි කියා හෝ උපාදානය අනිකකැයි කියා හෝ මේ උපාදානය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**18.** "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. තණ්හාව කවරේද, මේ තණ්හාව කාගේ දැයි කියා හෝ තණ්හාව අනිකකැයි කියා හෝ මේ තණ්හාව අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**19.** "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. වේදනාව කවරේද? මේ වේදනාව කාගේ දැයි කියා හෝ වේදනාව අනිකකැයි, කියා හෝ මේ වේදනාව අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**20.** "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන්

කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. ස්පර්ශය කවරේද, මේ ස්පර්ශය කාගේ දැයි කියා හෝ ස්පර්ශය අනිකකැයි, කියා හෝ මේ ස්පර්ශය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

21. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. සළායතන කවරේද, මේ සළායතන කාගේ දැයි කියා හෝ සළායතන අනිකකැයි කියා හෝ මේ සළායතන අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

22. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. නාමරූප කවරේද, මේ නාමරූප කාගේ දැයි කියා හෝ නාමරූප අනිකකැයි. කියා හෝ මේ නාමරූප අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

23. "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. විඤ්ඤාණය කවරේද, මේ විඤ්ඤාණය කාගේ දැයි කියා හෝ විඤ්ඤාණය අනිකකැයි. කියා හෝ මේ විඤ්ඤාණය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**24.** "මහණ, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. සංස්කාර කවරේද, මේ සංස්කාර කාගේදැයි කියා හෝ සංස්කාර අනිකකැයි කියා හෝ මේ සංස්කාර අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය, අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**(පස්වන අවිජ්ජා සූත්‍රය නිමි.)**

---

## 6. අවිජ්ජා සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණ, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස් වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

3. "මහණෙනි, ජරාමරණ කවරේද? මේ ජරාමරණය වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'ජරාමරණය අනිකකිය. මේ ජරාමරණය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියා වාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, ජාතිය නිසා ජරාමරණය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක.

4. "මහණෙනි, ජාතිය කවරේද? මේ ජාතිය වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද? මහණෙනි, 'ජාතිය අනිකකි. මේ ජාතිය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, භවය නිසා ජාතිය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

5. "මහණෙනි, භවය කවරේද? මේ භවය වනාහි කාගේදැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'භවය අනිකකි. මේ භවය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ

වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, භවය නිසා උපාදානය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක.

**6.** "මහණෙනි, උපාදානය කවරේද? මේ උපාදානය වනාහි කාගේදැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'උපාදානය අනිකකි. මේ උපාදානය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, උපාදානය නිසා තණ්හාව ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

**7.** "මහණෙනි, තණ්හාව කවරේද? මේ තණ්හාව වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'තණ්හාව අනිකකි. මේ තණ්හාව වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, තණ්හාව නිසා වේදනාව ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

**8.** "මහණෙනි, වේදනාව කවරේද? මේ වේදනාව වනාහි කාගේදැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'වේදනාව අනිකකි. මේ වේදනාව වනාහි අනිකකුගේයයි' මෙසේ

හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, වේදනාව නිසා ස්පර්ශය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

9. "මහණෙනි, ස්පර්ශය කවරේද? මේ ස්පර්ශය වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, ස්පර්ශය අනිකකි. මේ ස්පර්ශය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, ස්පර්ශය නිසා සළායතන ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක.

10. "මහණෙනි, සළායතන කවරේද? මේ සළායතන වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'සළායතන අනිකකි. මේ සළායතන වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, සළායතන නිසා නාමරූප ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

11. "මහණෙනි, නාමරූප කවරේද? මේ නාමරූප වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'නාමරූප අනිකකි. මේ නාමරූප වනාහි අනිකකුගේයයි' මෙසේ

හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ නාමරූප නිසා විඤ්ඤාණය ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

12. "මහණෙනි, විඤ්ඤාණය කවරේද? මේ විඤ්ඤාණය වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, විඤ්ඤාණය අනිකකි. මේ විඤ්ඤාණය වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියාවාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, විඤ්ඤාණය නිසා සළායතන ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

13. "මහණෙනි, සංස්කාර කවරේද? මේ සංස්කාර වනාහි කාගේ දැයි? මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මහණෙනි, 'සංස්කාර අනිකකි. මේ සංස්කාර වනාහි අනිකකුගේයයි' මෙසේ හෝ යමෙක් කියන්නේ වේද, මේ කීම් දෙකම ඒකාර්ථය. ව්‍යඤ්ජන පමණක් වෙනසි. මහණෙනි, ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචර්යාවාසය නොවේ. මහණෙනි, ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචරියා වාසය නොවේ. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, සංස්කාර නිසා සළායතන ඇතිවේයයි තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.

14. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක්

මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. ජරාමරණය කවරේද? මේ ජරාමරණය කාගේදැයි කියා හෝ අවිද්‍යාව ඉතිරි නොකොට පහකිරීම හේතුකොටගෙන යමෙකුට ජරාමරණය අනිකකි. මේ ජරාමරණය අනිකෙකුගේයයි කියා හෝ ජීවයත් එයය, ශරීරයත් එයමයයි කියා හෝ, ජීවය අනිකකි ශරීරය අනිකකියි කියා හෝ පවත්නාවූ මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරිත දැකීම් වෙත්ද, ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

15. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද, ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, ජාතිය කවරේද? මේ ජාතිය කාගේදැයි කියා හෝ, ජාතිය අනිකකැයි කියා හෝ ජාතිය අනිකකුගේයයි කියා හෝ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ, ජීවය අනිකකි. ශරීරයත් අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

16. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, භවය කවරේද? මේ භවය කාගේදැයි කියා හෝ භවය අනිකකැයි අනිකෙකුගේයයි කියා හෝ මේ භවය අනිකකුගේ යයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

17. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වේත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, උපාදානය කවරේද? මේ උපාදානය කාගේදැයි කියා හෝ උපාදානය අනිකකැයි, කියා හෝ මේ උපාදානය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

18. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වේත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, තණ්හාව කවරේද? මේ තණ්හාව කාගේදැයි කියා හෝ තණ්හාව අනිකකැයි කියා හෝ මේ තණ්හාව අනිකකුගේ යයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

19. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වේත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, වේදනාව කවරේද? මේ වේදනාව කාගේදැයි කියා හෝ වේදනාව අනිකකැයි කියා හෝ මේ වේදනාව අනිකෙකුගේයයි කියා හෝ ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**20.** "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, ස්පර්ශය කවරේද? මේ ස්පර්ශය කාගේදැයි කියා හෝ ස්පර්ශය අනිකකැයි කියා හෝ මේ ස්පර්ශය අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු, තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නො උපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**21.** "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, සළායතන කවරේද? මේ සළායතන කාගේදැයි කියා හෝ සළායතන අනිකකැයි කියා හෝ මේ සළායතන අනිකකුගේයයි කියා හෝ, ජීවයත් එයය. ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

**22.** "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, භවය කවරේද? මේ නාමරූප කාගේදැයි කියා හෝ නාමරූප අනිකකැයි කියා හෝ මේ නාමරූප අනිකකුගේයයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන්, කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

23. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, විඤ්ඤාණය කවරේද? මේ විඤ්ඤාණය කාගේදැයි කියා හෝ විඤ්ඤාණය අනිකකැයි කියා හෝ මේ විඤ්ඤාණය අනිකකුගේ යයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයම යයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

24. "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි වැරදි දැකීම් විපරීත දැකීම් වෙත්ද ඒ සියල්ල ප්‍රහීණ වෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු නැවත වැඩීම නොකරන ලද්දාහු මතු නූපදින ස්වභාව ඇත්තාහු වෙත්. මහණෙනි, සංස්කාර කවරේද? මේ සංස්කාර කාගේදැයි කියා හෝ සංස්කාර අනිකකයි කියා හෝ මේ සංස්කාර අනිකකුගේ යයි කියා හෝ ජීවයත් එයය ශරීරයත් එයමයයි කියා හෝ ජීවය අනිකකි. ශරීරය අනිකකියි කියා හෝ දෘෂ්ටි ඇත්තාවූ ඔහුට ඒ සියල්ල ප්‍රහීණවෙත්. මුල් සිඳින ලද්දාහු තල් කඳක් මෙන් කරන ලද්දාහු, නැවත වැඩීම නොකරන ලද්දාහු, මතු නොඋපදින ස්වභාව ඇත්තාහු වෙත්.

(හයවන අවිජ්ජා සූත්‍රය නිමි)

---

## 7. නතුම්හාක සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි" කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ කය නුඹලාගේ නොවේ. අනුන්ගේද නොවේ. මහණෙනි, මේ කය පුරාණවූ කර්මයෙන් උපන්නේය. ප්‍රත්‍යයන්ගෙන් කරන ලද්දේය. චේතනාව මුල් කොට ඇත්තේයයිද, වේදනාව වස්තුයයිද දතයුතුය. මහණෙනි, එහිදී, ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූ තැන් ඇති) ආර්යශ්‍රාවකතෙම වනාහි "පටිච්චසමුප්පාදයම" මනාකොට නුවණින් මෙනෙහි කරයි. 'මෙසේ මේ හේතුව ඇති කල්හි මේ ඵලය ඇති වෙයි. මේ හේතුව ඇතිවීමෙන් මේ ඵලය ඇතිවේ. මේ හේතුව නැති කල්හි මේ ඵලය නැතිවේ. මේ හේතුව නැතිවීමෙන් මේ ඵලය නැතිවේ, යනුවෙනි. හේ මෙසේයි:-

3. "අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. (ඉපදීම) ජාතිය නිසා ජරාමරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම්, ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් සමූහය ඇතිවේ.

4. අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන්ම සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැති වෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැති වෙයි, භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය) නැතිවෙයි ජාතිය (උත්පත්තිය) නැතිවීමෙන් ජරා මරණ, ශෝක පරිදේව, දුක්,

දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් සමූහය නැතිවෙයි.

(හත්වන නතුම්හාක සූත්‍රය නිමි.)

---

## 8. චේතනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් සිතයිද, යමක් කල්පනා කෙරෙයිද, යමක් නැවත නැවත පවතියිද, මෙය කර්මවිඤ්ඤාණයාගේ පැවැත්මට හේතු වෙයි. හේතුව ඇතිකල්හි කර්ම විඥානයාගේ පිහිටීම වෙයි. කර්ම විඥානය පිහිටි කල්හි, වැඩුණු කල්හි, මත්තෙහි නැවත භවයක ඉපදීම වෙයි. මත්තෙහි නැවත භවයක ඉපදීම ඇති කල්හි, මත්තෙහි ජාති, ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහය ඇතිවෙයි. මහණෙනි, ඉදින් නොසිතයිද, කල්පනා නොකෙරෙයිද, එතකුදු වුවත් නැවත නැවත පවතියිද, මෙය කර්ම විඤ්ඤාණයාගේ පැවැත්ම පිණිස හේතු වෙයි. හේතුව ඇති කල්හි, කර්ම විඤ්ඤාණය පිහිටයි. ඒ කර්ම විඤ්ඤාණය පිහිටි කල්හි, වැඩුණු කල්හි, මත්තෙහි නැවත භවයක ඉපදීම ඇතිවෙයි. මත්තෙහි ඉපදීම ඇති කල්හි ජාති, ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස් වීම් සහ වැළපීම් ඇති වෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

3. "මහණෙනි, යම් හේතුවකින් ඉදින් නොසිතයිද, කල්පනා නොකෙරෙයිද, නොපවතියිද මෙය විඤ්ඤාණයාගේ පැවැත්ම

පිණිස හේතු නොවෙයි. හේතු නැති කල්හි කර්ම විඥානය නොපිහිටයි. කර්මවිඥානය නොපිහිටි කල්හි, නොවැඩුණු කල්හි, මත්තෙහි නැවත භවයක ඉපදීම නොවෙයි. මත්තෙහි නැවත භවයක ඉපදීම නැතිකල්හි, මත්තෙහි ජාති, ජරා, මරණ, ශෝක, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් සමූහය නැතිවේ.

(අටවන චේතනා සූත්‍රය නිමි.)

---

## 9. චේතනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’ යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් සිතයිද, යමක් කල්පනා කෙරෙයිද, යමක් නැවත නැවත පවතියිද, මෙය කර්මවිඤ්ඤාණයාගේ පැවැත්මට හේතු වෙයි. හේතුව ඇතිකල්හි කර්මවිඤ්ඤාණය පිහිටයි. කර්මවිඤ්ඤාණය පිහිටි කල්හි, කර්මවිඤ්ඤාණය වැඩුණු කල්හි, නාමරූපයාගේ බැසගැනීම වෙයි. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරාමරණද ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

3. "මහණෙනි ඉදින් නොසිතයිද, කල්පනා නොකෙරෙයිද, එහෙත් නැවත නැවත පවතියිද, මෙය විඤ්ඤාණයාගේ පැවැත්ම පිණිස හේතුව වෙයි. හේතුව ඇති කල්හි කර්මවිඤ්ඤාණය

පිහිටයි. කර්මවිඤ්ඤාණය පිහිටි කල්හි විඤ්ඤාණය වැඩුණු කල්හි නාමරූපයාගේ බැසගැනීම වෙයි. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරාමරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

4. "මහණෙනි, යම් හේතුවකින් ඉදින් නොසිතයිද, කල්පනා නොකෙරෙයිද, නොපවතියිද මෙය විඤ්ඤාණයාගේ පැවැත්මට හේතු නොවෙයි. හේතු නැති කල්හි කර්ම විඤ්ඤාණය නොපිහිටයි. කර්මවිඤ්ඤාණය නොපිහිටි කල්හි, ඒ විඤ්ඤාණය නොවැඩුණු කල්හි, නාමරූපයාගේ බැසගැනීම (ඇති) නොවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැති වෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැති වෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක්ගොඩ නැතිවෙයි.

(නවවන චේතනා සූත්‍රය නිමි.)

---

## 10. චේතනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යමක් සිතයිද, යමක් කල්පනා කෙරෙයිද, යමක් නැවත නැවත පවතියිද, මෙය කර්මවිඥ්ඥාණයාගේ පැවැත්මට හේතු වෙයි. හේතුව ඇතිකල්හි කර්ම විඥ්ඥාණය පිහිටයි. කර්මවිඥ්ඥාණය පිහිටි කල්හි, කර්මවිඥ්ඥාණය වැඩුණු කල්හි, තණ්හාව ඇතිවෙයි. තණ්හාව ඇති කල්හි නිමිති වැටහීමෙන් ප්‍රතිසන්ධි වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම වෙයි. නිමිති වැටහීමෙන් ප්‍රතිසන්ධි වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම ඇති කල්හි චුතිය හා ඉපදීම වෙයි. චුතිය හා ඉපදීම ඇති කල්හි මත්තෙහි ජාති, ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම් සහ වැළපීම් ඇති වෙත්. මෙසේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

3. "මහණෙනි ඉදින් නොසිතයිද, කල්පනා නො කෙරෙයිද, එහෙත් පවතියිද, මෙය කර්මවිඥ්ඥාණයාගේ පැවැත්මට හේතුව වෙයි. හේතු ඇති කල්හි කර්මවිඥ්ඥාණය පිහිටයි. කර්මවිඥ්ඥාණය පිහිටි කල්හි, වැඩුණු කල්හි, තණ්හාව ඇතිවෙයි. තණ්හාව ඇති කල්හි, නිමිති වැටහීමෙන් ප්‍රතිසන්ධි වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම වෙයි. නිමිති වැටහී ප්‍රතිසන්ධි වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම ඇතිකල්හි චුතිය හා උත්පත්තිය වෙයි. චුතිය හා උත්පත්තිය ඇති කල්හි මත්තෙහි ජාති, ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහය ඇතිවෙයි.

4. "මහණෙනි, යම් හේතුවකින් නොසිතයිද, කල්පනා නොකෙරෙයිද, නොපවතියිද මෙය කර්මවිඥ්ඥාණයාගේ පැවැත්මට හේතු නොවෙයි. හේතු නැති කල්හි කර්ම විඥ්ඥාණය නොපිහිටයි. කර්මවිඥ්ඥාණය නොපිහිටි කල්හි, නොවැඩුණු කල්හි තණ්හාව ඇති නොවෙයි. තණ්හාව නැති කල්හි, නිමිති වැටහීමෙන් ප්‍රතිසන්ධි වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම ඇතිනොවෙයි. නිමිති වැටහී ප්‍රතිසන්ධියේ වශයෙන් විඥ්ඥාණයාගේ පැවැත්ම නැති කල්හි චුතිය හා උත්පත්තිය නොවෙයි. චුතිය හා උත්පත්තිය නැති කල්හි මත්තෙහි ජාති, ජරාමරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ වැළපීම්

නැතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් සමූහය නැතිවේයයි (වදාළ සේක.)

(දසවන චේතනා සූත්‍රය නිමි.)

---

(භූතමිදං සූත්‍රය, කළාරඛත්තිය සූත්‍රය, ඤාණවත්ථු සූත්‍ර දෙකය, අවිජ්ජා සූත්‍ර දෙකය, නතුම්හාක සූත්‍රය සහ චේතනා සූත්‍ර තුනයයි මේ වර්ගයෙහි සූත්‍ර දහයකි.)

**(හතරවන කළාරඛත්තිය වර්ගය නිමි.)**

---

## 5. ගහපති වර්ගය.

### 1. පඤ්චවෙර භය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති අනේපිඬු සිටුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, අනේපිඬු සිටු හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "ගෘහපතිය, යම් කලක ආර්ය ශ්‍රාවකයාට පස්වැදෑරුම් භය සහ වෛර චේතනා සංසිඳුනාහු වෙත්ද, සිව් වැදෑරුම් සෝතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයිද, නිදොස්වූ පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේද, අවබෝධ කරන ලද්දේද හෙතෙම කැමැති වන්නේ තෙමේම තමා පැහැදිලි කරන්නේය. (කෙසේද?) 'මම නිරයෙහි ඉපදීම් නැත්තේ වෙමි. තිරිසන් යෝනියෙහි ඉපදීම් නැත්තේ වෙමි.

ප්‍රේත ලෝකයෙහි ඉපදීම් නැත්තේ වෙමි. නපුරු ගති ඇති, සැප නැති, අපායෙහි ඉපදීම් නැත්තේ වෙමි. මම දුකට ඇද නොවැටෙන ස්වභාව ඇත්තාවූ, ප්‍රථම මාර්ගයට පැමිණීමෙන් නිවණට නියතවූ, මතු මාර්ගත්‍රයට ගමන් කරන්නාවූ, ආර්ය මාර්ග ශ්‍රෝතයට පැමිණියේ වෙමියි' කියායි.

3. "කවර පස් වැදෑරුම් භයක් සහ වෛරයක් සංසිඳුවන ලද්දාහුවෙත්ද? ගෘහපතිය, සතුන් මරන්නා සතුන් මැරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, චෛතසික වූද, දුක් දොම්නස් විඳියිද, සතුන් මැරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

4. "ගෘහපතිය, සොරකම් කරන්නා සොරකම් කිරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, චෛතසිකවූද දුක් දොම්නස් විඳියිද, හොරකම් කිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

5. "ගෘහපතිය, කාමයන්හි වරදවා හැසිරෙන්නා, කාමයන්හි වරදවා හැසිරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූද, දුක් දොම්නස් විඳියිද, කාමයන්හි හැසිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

6. "ගෘහපතිය, බොරු කියන්නා, බොරු කීම නිසා මෙලොවද, යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, පර ලොවද යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, චෛතසික වූද, දුක් දොම්නස් විඳියිද, බොරු කීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

7. "ගෘහපතිය, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නා, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය නිසා, මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද,

පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූ, දුක් දොම්නස් විඳියිද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානයෙන් වෙන් වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳෙන්නේ වෙයි. මෙසේ මේ පස්වැදෑරුම් භය සහ වෛරය සංසිඳුනාහු වෙත්.

8. "කිනම් සිව් වැදෑරුම් සෝතාපත්ති අංගවලින් යුක්තවූයේ වෙයිද? ගෘහපතිය, ආර්ය ශ්‍රාවක තෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි (කෙසේද?) ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද අර්හත්ය, සම්මාසම්බුද්ධය, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය, ශෝභන ගමන් ඇත්තේය, ලෝකය දත්තේය, පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු වැනිය. දෙව් මිනිසුන්ගේ ගුරුය, චතුරාර්යසත්‍යය, අවබෝධ කළේය. භාග්‍යවත්ය කියායි. ධර්මයෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්තවූයේ වෙයි. (කෙසේද?) ධර්මය මනා කොට බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදී. තෙමේම දතයුතුය. කල් නොයවා විපාක දෙන්නේය. නිවණට පමුණුවන්නේය. නුවණැත්තන් විසින් තම තමා කෙරෙහි ලා දතයුත්තේය, කියායි. සංඝයා කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනා කොට ගමන් ගත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම කෙලින් ගමන් ගත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම නිවණ කරා ගමන් ගත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම සාමීචි කර්මයට සුදුසුවන සේ ගමන් ගත්තේය. යම් මේ පුරිස යුගල සතරකින් යුත් අෂ්ටාර්ය පුද්ගලයෝ වෙත්ද, මේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම සිව් පසය පිදීමට සුදුසුය. ආගන්තුක සත්කාරයට සුදුසුය. පරලොව අදහා දෙන දානයට සුදුසුය. ලෝකයාගේ ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසුය. ලෝකයාගේ අති උතුම් පින් කුඹුරය. කඩතොලු නොවූ, සිදුරු නොවූ, පුල්ලි නොඉසුනාවූ, තණ්හාවෙන් මිදුනාවූ, බුද්ධාදී ආර්යයන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තණ්හා දිට්ඨි වශයෙන්

පරාමර්ෂණය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවත්නාවූ, ආර්යයන් කැමැතිවූ ශීලයෙන් (පඤ්ච ශීලයෙන්) යුක්තවූයේ වෙයි. මේ සිව් වැදෑරුම් සෝතාපත්ති අංගයන්ගෙන් යුක්ත වූයේ වෙයි.

9. "කිනම් නිදොස්වූ, පටිච්චසමුප්පාද ධර්මයක් නුවණින් මනා කොට දක්නා ලද්දේ, මනා කොට අවබෝධ කරන ලද්දේ වේද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙම පටිච්චසමුප්පාදයම මනා කොට ඇතිසේ නුවණින් මෙනෙහි කරයි. කෙසේද, මේ හේතුව ඇති කල්හි මේ ඵලය ඇතිවෙයි. මේ හේතුව ඉපදීමෙන් මේ ඵලය උපදියි. මේ හේතුව නැති කල්හි මේ ඵලය නැතිවේ. මේ හේතුව නැතිවීමෙන් මේ ඵලය නැතිවේ, කියායි. හේ මෙසේයිඃ-

10. "අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණද, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය ඇතිවෙයි.

11. "අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන්ම සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැති වෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැති වෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක,

පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය නැතිවේ. මේ නිර්මලවූ, පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේ, මනාකොට අවබෝධ කරන ලද්දේ වෙයි.

12. "ගෘහපතිය, යම් කලක වනාහි ආර්ය ශ්‍රාවකයාගේ මේ පස් වැදෑරුම් භය සහ වෛරයෝ සංසිඳුනෝ වෙත්ද, මේ සිව්වැදෑරුම් සෝතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයිද, මේ නිර්මලවූ පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේ මනාකොට අවබෝධ කරන ලද්දේ වෙයිද, හෙතෙම කැමැති වන්නේ, තෙමේම තමා පැහැදිලි කරන්නේය. (කෙසේද?) මම නිරයෙහි ඉපදීම නැතිකළ අයෙක් වෙමි. තිරිසන් යෝනියෙහි ඉපදීම නැතිකළ අයෙක් වෙමි. ප්‍රේත යෝනියෙහි ඉපදීම නැති කළ අයෙක් වෙමි. නපුරු ගති ඇති, සැප නැති, අපායෙහි ඉපදීම් නැති අයෙක් වෙමි. මම දුකට ඇදවැටෙන ස්වභාව නැත්තාවූ, ප්‍රථම මාර්ගයට පැමිණීමෙන් නිවණට නියතවූ, මතු මාර්ගත්‍රයට ගමන් කරන්නාවූ, ආර්ය මාර්ග ශ්‍රෝතයට පැමිණියෙමි' කියායි."

(පළමු වන පඤ්චවේරභය සූත්‍රය නිමි.)

---

## 2. පඤ්චවේරභය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, යම් කලක වනාහි ආර්ය ශ්‍රාවකයාගේ පස්වැදෑරුම් භය සහ වෛරයෝ සංසිඳුණාහු වෙත්ද,

සිව්වැදෑරුම් ශ්‍රොතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයිද, නිර්මලවූ පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේ මනාකොට අවබෝධ කරන ලද්දේ වෙයිද, හෙතෙම කැමැති වන්නේ තෙමේම තමා පැහැදිලි කරන්නේය. (කෙසේද?) 'මම නිරයෙහි ඉපදීම නැතිකළ අයෙක් වෙමි. මම නිරයෙහි ඉපදීම් නැත්තේ වෙමි. තිරිසන් යෝනියෙහි ඉපදීම් නැත්තේ වෙමි. ප්‍රේත ලෝකයෙහි ඉපදීම් නැත්තේ වෙමි. නපුරු ගති ඇති, සැප නැති, අපායෙහි ඉපදීම් නැත්තේ වෙමි. මම දුකට ඇදනොවැටෙන ස්වභාව ඇත්තාවූ, ප්‍රථම මාර්ගයට පැමිණීමෙන් නිවනට නියතවූ, මතු මාර්ගත්‍රයට ගමන් කරන්නාවූ, ආර්ය මාර්ග ශ්‍රොතයට පැමිණියේ වෙමි' කියායි.

**4.** "කිනම් භය සහ වෛරයෝ සංසිඳුනාහු වෙත්ද? මහණෙනි, සතුන් මරන්නා සතුන් මැරීම නිසා මෙලොවද, යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූද දුක් දොම්නස් විඳියි. සතුන් මැරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

**5.** "මහණෙනි, සොරකම් කරන්නා සොරකම් කිරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇතිකෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසික වූද දුක්දොම්නස් විඳියිද, සොරකම් කිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

**6.** "මහණෙනි, කාමයන්හි වරදවා හැසිරෙන්නා කාමයන්හි වරදවා හැසිරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූද දුක් දොම්නස් විඳියිද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

**7.** "මහණෙනි, බොරු කියන්නා බොරු කීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද

යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූද දුක් දොම්නස් විඳියිද, බොරු කීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

8. "මහණෙනි, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කරන්නා මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කිරීම නිසා මෙලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, පරලොවද යම් භයක් සහ වෛරයක් ඇති කෙරෙයිද, චෛතසිකවූද දුක් දොම්නස් විඳියිද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කිරීමෙන් වෙන්වූවහුට මෙසේ ඒ භය සහ වෛරය සංසිඳුනේ වෙයි.

මේ පස්වැදෑරුම් භය සහ වෛර සංසිඳුනාහු වෙත්.

9. "කවර සිව්වැදෑරුම් සෝතාපත්ති අංගයන්ගෙන් යුක්ත වූයේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්තවූයේ වෙයි (කෙසේද?) ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද අර්හත්හ. සම්මාසම්බුද්ධයහ. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තයහ. ශෝභන ගමන් ඇතිසේක. ලෝකය දත්සේක. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු වැනිසේක දෙව්මිනිසුන්ගේ ගුරුවූසේක. චතුරාර්ය සත්‍යය අවබෝධ කළසේක. භාග්‍යවත්හ කියායි.

10. "ධර්මය කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. (කෙසේද?) ධර්මය මනාකොට බුදුරජාණන් වහන්සේ විසින් වදාරණලදී. තෙමේම දතයුතුය. කල් නොයවා විපාක දෙන්නේය. නිවණට පමුණු වන්නේය. නුවණ ඇත්තන් විසින් තම තමා කෙරෙහි ලා දතයුත්තේය කියායි.

'සංඝයා කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාකොට ගමන් ගත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම කෙලින් ගමන් ගත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම නිවන කරා ගමන් ගත්තේය. භාග්‍යවතුන්

වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම සාමීචිකර්මයට සුදුසු වන සේ ගමන් ගත්තේය. යම් මේ පුරුෂ යුගල සතරකින් යුත් අෂ්ටාර්ය පුද්ගලයෝ වෙත්ද, මේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම සිව්පසය පිදීමට සුදුසුය. ආගන්තුක සත්කාරයට සුදුසුය. පරලොව අදහා දෙන දානයට සුදුසුය. ලෝකයාගේ ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසුය. ලෝකයාගේ අති උතුම් පින් කුඹුරය, කියායි.

11. "කඩතොලුනොවූ, සිදුරුනොවූ, පුල්ලි නොඉසුනු තණ්හාවෙන් මිදුනාවූ, බුද්ධාදී ආර්යයන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තණ්හාදිට්ඨි වශයෙන් පරාමර්ශනය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවත්නාවූ, ආර්යයන් කැමැතිවූ, ශීලයෙන් (පඤ්චශීලයෙන්) යුක්තවූයේ වෙයි. මේ සිව් වැදෑරුම් සොතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයි. කෙසේ නිර්මලවූ, පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේ, මනාකොට අවබෝධකරන ලද්දේ වෙයිද?

12. "මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවකතෙම පටිච්චසමුප්පාදයම මනාකොට ඇතිසේ, නුවණින් මෙනෙහි කෙරෙයි. කෙසේද? මේ හේතුව ඇති කල්හි මේ ඵලය ඇතිවේ. මේ හේතුව ඉපදීමෙන් මේ ඵලය උපදියි. මේ හේතුව නැතිකල්හි මේ ඵලය ඇති නොවේ. මේ හේතුව නැතිවීමෙන් මේ ඵලය නැතිවේ කියායි.

"හේ මෙසේයි:- අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණයද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත් මෙසේ මේ එකම දුක් සමූහය ඇතිවෙයි.

13. "මහණෙනි, යම් කලක වනාහි ආර්ය ශ්‍රාවකයාගේ මේ පස්වැදෑරුම් භය සහ වෛරයෝ සංසිඳුනාහු වෙත්ද, මේ සිව් වැදෑරුම් සොතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයිද, මේ නිර්මලවූ පටිච්චසමුප්පාද ධර්මය නුවණින් මනාකොට දක්නා ලද්දේ මනාකොට අවබෝධ කරන ලද්දේ වෙයිද, හෙතෙම කැමතිවන්නේ, තෙමේම තමා පැහැදිළි කරන්නේය. (කෙසේද?) 'මම නිරයෙහි ඉපදීම නැති කළ අයෙක් වෙමි. තිරිසන් යෝනියෙහි ඉපදීම නැති කළ අයෙක් වෙමි. ප්‍රේත යෝනියෙහි ඉපදීම නැති කළ අයෙක්වෙමි. නපුරු ගති ඇති සැප නැති අපායෙහි ඉපදීම නැති අයෙක් වෙමි මම දුකට ඇදහැලෙන ස්වභාව නැත්තාවූ, ප්‍රථම මාර්ග ප්‍රතිලාභයෙන් නිවන නියමවූ මතු මාර්ගත්‍රයට ගමන් කරන්නාවූ ආර්යමාර්ග ශ්‍රෝතයට පැමිණියේ වෙමි, කියායි."

(දෙවෙනි පඤ්චවේරභය සූත්‍රය නිමි.)

---

## 3 දුක්ඛසූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලදද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, දුක් ඇතිවීමද, නැතිවීමද දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි (දේශනා කළසේක.) 'එසේය, ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, දුක් ඇතිවීම කවරේද? ඇසද, රූපයන්ද, නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන්

ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

"කණද, ශබ්දයන්ද නිසා සොතවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

"නැහැයද ගන්ධයන්ද නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

"දිවද, රසයන්ද නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

"කයද, ස්පර්ශයන්ද නිසා කායවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

"සිතද ධර්මයන්ද නිසා මනොවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීමයි.

4. "මහණෙනි, දුක නැතිවීම කවරේද? ඇසද රූපයන්ද නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ

නැතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

5. "කණද, ශබ්දයන්ද නිසා සොතවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන්ම උපදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

6. "නැහැයද ගන්ධයන්ද නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

7. "දිවද, රසයන්ද නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

8. "කයද ස්පර්ශයන්ද නිසා කායවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

**9.** "සිතද ධර්මයන්ද නිසා මනොවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව මුළුමනින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොමනස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි දුක නැතිවීමයි.

(තුන්වන දුක්ඛ සූත්‍රය නිමි.)

---

## 4. ලෝක සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි, වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ලෝකයේ ඇතිවීමද; නැතිවීමද, දේශනා කරන්නෙමි. එය අසව්. මනා කොට මෙනෙහි කරව්, කියන්නෙමියි" (දේශනා කළසේක.) "එසේය ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, ලෝකයේ ඇතිවීම කවරේද? ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

4. "කණද, ශබ්දයන්ද නිසා සෝත විඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා මරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

5. "නැහැයද, ගන්ධයන්ද නිසා ඝානවිඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

6. "දිවද, රසයන්ද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

7. "කයද, ස්පර්ශයන්ද නිසා කාය විඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා

වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

8. "සිතද, ධර්මයන්ද නිසා මනෝවිඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මහණෙනි, මෙය වනාහි ලෝකයේ ඇතිවීමයි.

9. "මහණෙනි, ලෝකයේ නැතිවීම කවරේද? ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැති කිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.

10. "කණද, ශබ්දයන්ද නිසා සෝත විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. “නැහැයද, ගන්ධයන්ද නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.

12. “දිවද, රසයන්ද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.

13. “කයද ස්පර්ශයන්ද නිසා කාය විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.

14. “සිතද, ධර්මයන්ද නිසා මනො විඤ්ඤාණය උපදියි තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි. මහණෙනි, මෙය වනාහි ලෝකයේ නැතිවීමයි.”

(සිව් වන ලෝක සූත්‍රය නිමි.)

---

## 5. ඤාතික සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ නෑයන්ගේ ගම උළු සෙවිලි කොට කරන ලද, මහා ප්‍රාසාදයෙහි (ගිඤ්ජකාවසථයෙහි) වැඩ වසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුදකලාව විවේකයෙන් සිටියේ මේ ධර්මක්‍රමය වදාළ සේක.

2. “ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

3. “කණද, ශබ්දයන්ද නිසා සෝත විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

4. “නැහැයද, ගන්ධයන්ද නිසා ඝාණවිඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා

වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

**5.** "දිවද, රසයන්ද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

**6.** "කයද, ස්පර්ශයන්ද නිසා කාය විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවේ.

**7.** "සිතද, ධර්මයන්ද නිසා මනෝ විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ ඇතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය ඇතිවේ.

**8.** "ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

9. "කණද, ශබ්දයන්ද නිසා සෝත විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

10. "නැහැයද, ගන්ධයන්ද නිසා ඝාණ විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

11. "දිවද, රසයන්ද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

12. "කයද, ස්පර්ශයන්ද නිසා කාය විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා

වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

13. "සිතද, ධර්මයන්ද නිසා මනෝ විඤ්ඤාණය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. ඒ තණ්හාව සහමුලින් නැතිකිරීමෙන්ම උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි."

14. "එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ඇසෙන තන්හි සිටියේ වෙයි. සමීපස්ථානයෙහි සිටියාවූ, ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ දුටුසේක. දැක, ඒ භික්ෂුවට මෙය කීසේක. "මහණ, නුඹ අපගේ මේ ධර්ම ක්‍රමය ඇසූයෙහිද?" "එසේය, ස්වාමීනි," "මහණ, නුඹ මේ ධර්ම ක්‍රමය උගණුව. මහණ, නුඹ මේ ධර්මක්‍රමය පුරුදු කරව. මහණ, නුඹ මේ ධර්මක්‍රමය සිතින් ධාරණය කරව. මහණ, මේ ධර්ම ක්‍රමය අර්ථයෙන් යුක්තය. මාර්ග බ්‍රහ්මචරියාවට පිහිටව සිටියේයයි" වදාළ සේක.

(පස්වන ඤාතික සූත්‍රය නිමි.)

---

## 6. අඤ්ඤතර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

ඉක්බිති එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු වියයුතු වූත් සිහිකටයුතු වූත් කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ඒ බ්‍රාහ්මණ තෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "භවත් ගෞතමයිනි, කිමෙක්ද? හෙතෙම කෙරෙයිද? හෙතෙම විඳියිද?" "බමුණ, හෙතෙම කෙරෙයි. හෙතෙම විඳියි යන මෙය වනාහි එක් අන්තයකි." "භවත් ගෞතමයිනි, කිමෙක්ද? අනිකෙක් කෙරෙයිද? අනිකෙක් විඳියිද"? "බමුණ, අනිකෙක් කෙරෙයි. අනිකෙක් විඳියි යන මෙය වනාහි දෙවෙනි අන්තයයි. බමුණ, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, තථාගත තෙම මධ්‍යම ප්‍රතිපදාවෙන් ධර්මය දේශනා කරයි. (කෙසේද?)

3. "අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාම රූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරාමරණයද, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය ඇතිවෙයි."

4. "අවිජ්ජාව සහමුලින් නැතිකිරීමෙන් සංස්කාර නැති වේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත් මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි." කියායි.

**5.** මෙසේ කීකල්හි ඒ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරු කරන්නේද, (තණකොළ ආදියෙන්) වැසුනක් වැහුම් හරින්නේද, මංමුළාවූවෙකුට මග හෝ කියන්නේද (ගණ අඳුරෙහි) ඇස් ඇත්තේ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරන ලදී. භවත් ගෞතමයන් වහන්සේ අද සිට මා දිවිහිම් කොට සරණ ගිය උපාසකයකු කොට සලකන සේක්වායි" කියායි.

(භයවන අඤ්ඤතර සූත්‍රය නිමි.)

---

## 7. ජාණුස්සෝණි සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති ජාණුස්සෝණි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහි කටයුතු වූත් කථාව කොට නිමවා, එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ජාණුස්සෝණි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයිනි, කිම? සියල්ල ඇත්තේද"? "බමුණ, සියල්ල ඇත යන මෙය වනාහි එක් අන්තයෙකි" "භවත් ගෞතමයිනි, කිම? සියල්ල නැත්තේද?" "බමුණ, සියල්ල නැත යන මෙය වනාහි දෙවෙනි අන්තයයි. බමුණ, මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ දහම් දෙසන සේක. (කෙසේද?) අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය

ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා මරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවේ. අවිජ්ජාව සහමුළින් නැති කිරීමෙන්ම සංස්කාර නැතිවේ. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැති වෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැති වෙයි, භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි" කියායි.

මෙසේ වදාළ කල්හි ජාණුස්සෝණි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරුකරන්නේද, (තණකොළ ආදියෙන්) වැසුනක් වැහුම් හරින්නේද, මංමුළා වූවෙකුට මග හෝ කියන්නේද, (ගණ අඳුරෙහි) ඇස් ඇත්තේ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරන ලදී. භවත් ගෞතමයන් වහන්ස අද සිට, දිවිහිම් කොට සරණගිය, උපාසකයකු කොට මා සලකන සේක්වායි" කියායි.

(හත්වන ජාණුස්සෝණි සූත්‍රය නිමි.)

---

## 8. ලෝකායතික සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති ලෝකායතික බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටුවිය යුතුවූත් සිහි කටයුතුවූත් කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ලෝකායතික බ්‍රාහ්මණතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයිනි, කිම? සියල්ල ඇත්තේද?" "බමුණ, සියල්ල ඇත යන මෙය වනාහි පළමුවන ලෝකායත දෘෂ්ටියයි" (බාල පෘථග්ජන ලෝකයාගේ මහත්වූ ආශ්‍රව සහිත ශාස්වත දෘෂ්ටියයි) "භවත් ගෞතමයිනි, කිම? සියල්ල නැත්තේද?" "බමුණ, සියල්ල නැත යන මෙය වනාහි දෙවෙනි ලෝකායත දෘෂ්ටියයි." (බාල පෘථග්ජන ලෝකයාගේ මහත්වූ, ආශ්‍රව සහිත උච්ඡේද දෘෂ්ටියයි) 'භවත් ගෞතමයිනි, කිම? සියල්ල එක් ස්වභාව ඇත්තේද?" "බමුණ, සියල්ල එක් ස්වභාව ඇත්තේය යන මෙය වනාහි තෙවෙනි ලෝකායත දෘෂ්ටියයි." (බාල පෘථග්ජන ලෝකයාගේ මහත්වූ, ආශ්‍රව සහිත ශාස්වත දෘෂ්ටියයි) "භවත් ගෞතමයිනි, කිම? සියල්ල වෙනස් වෙනස් ස්වභාවයෙන් යුක්තද?" "බමුණ, සියල්ල වෙනස් වෙනස් ස්වභාවයෙන් යුක්තය යන මෙය වනාහි සිව්වන ලෝකායත දෘෂ්ටියයි. (බාල පෘථග්ජන ලෝකයාගේ මහත්වූ, ආශ්‍රව සහිත උච්ඡේද දෘෂ්ටියයි) බමුණ, ඒ මේ අන්ත දෙකට නොපැමිණ, තථාගතයන් වහන්සේ මද්ධ්‍යම ප්‍රතිපදාවෙන් දහම් දෙසන සේක.

2. "(කෙසේද?) අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඥ්ඥාණය ඇතිවේ. විඥ්ඥාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව

නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ, උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරාමරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි. අවිජ්ජාව සහමුලින් නැති කිරීමෙන්ම සංස්කාර නැතිවෙයි. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි, වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැති වෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි, භවය නැතිවීමෙන් ජාතිය (උප්පත්තිය) නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි කියායි."

3. මෙසේ වදාළ කල්හි ලෝකායතික බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරු කරන්නේද, තණකොළ ආදියෙන් වැසුනක් වැහුම් හරින්නේද, මංමුළාවූවෙකුට මග හෝ කියන්නේද, (ගණ අඳුරෙහි) ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරන ලදී. භවත් ගෞතමයන් වහන්සේ අද සිට දිවි ඇතිතෙක් සරණ ගිය උපාසකයෙකු කොට මා සලකන සේක්වා.

**(අටවන ලෝකායතික සූත්‍රය නිමි)**

---

## 9. ආර්යශ්‍රාවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූ තැන් ඇති) ආර්ය ශ්‍රාවකයාහට මෙසේ අදහස් නොවෙයි. (කෙසේද?) කුමක් ඇති කළ කුමක් ඇතිවෙයිද, කුමක් ඉපදීමෙන් කුමක් උපදියිද, කුමක් ඇති කල්හි සංස්කාරයෝ ඇතිවෙත්ද? කුමක් ඇති කල්හි විඤ්ඤාණය ඇතිවේද? කුමක් ඇති කල්හි නාමරූප ඇතිවෙයිද? කුමක් ඇති කල්හි සළායතන ඇති වෙයිද? කුමක් ඇති කල්හි ස්පර්ශය ඇතිවෙයිද? කුමක් ඇති කල්හි වේදනා තොමෝ ඇතිවන්නීද? කුමක් ඇති කල්හි තණ්හා තොමෝ ඇතිවන්නීද? කුමක් ඇති කල්හි උපාදානය ඇතිවෙයිද? කුමක් ඇති කල්හි භවය ඇතිවෙයිද? කුමක් ඇති කල්හි ජාතිය ඇතිවෙයිද? කුමක් ඇතිකල්හි ජරා මරණය ඇතිවෙයිද? කියායි. මහණෙනි, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවකයා හට මෙහිදී ස්වකීය ඤාණයම ඇතිවෙයි. (කෙසේද?) මේ අවිජ්ජාව ඇති කල්හි මේ සංස්කාරයෝ ඇතිවෙත්. මේ සංස්කාරයන් ඇති කල්හි මේ විඤ්ඤාණය ඇතිවෙයි. විඤ්ඤාණය ඇති කල්හි නාමරූප ඇතිවෙයි. නාමරූප ඇති කල්හි සළායතන ඇතිවෙයි. සළායතන ඇති කල්හි ස්පර්ශය ඇතිවෙයි. ස්පර්ශය ඇති කල්හි වේදනාව ඇතිවෙයි. වේදනාව ඇති කල්හි තණ්හාව ඇතිවෙයි. තණ්හාව ඇති කල්හි උපාදානය ඇතිවෙයි. උපාදානය ඇති කල්හි භවය ඇතිවෙයි. භවය ඇති කල්හි ජාතිය ඇතිවෙයි. ජාතිය ඇති කල්හි ජරාමරණය ඇතිවෙයි. මේ ලෝකය මෙසේ ඇතිවේයයි හෙතෙම මෙසේ දැනගනියි.

3. “මහණෙනි, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්යශ්‍රාවකයාට මෙසේ අදහස් නොවෙයි. කිමෙක්ද, කුමක්

නැති කල කුමක් නිරුද්ධවෙයිද, කුමක් නිරුද්ධවීමෙන් කුමක් නිරුද්ධවේද, කුමක් නැති කල සංස්කාරය ඇතිනොවෙද්ද? කුමක් නැති කල්හි විඤ්ඤාණය ඇතිනොවේද, කුමක් නැති කල නාමරූප ඇතිනොවේද? කුමක් නැතිකල සළායතන ඇති නොවේද, කුමක් නැති කල ස්පර්ශය ඇති නොවේද, කුමක් නැතිකල වේදනාව ඇති නොවේද, කුමක් නැතිකල තණ්හාව ඇති නොවේද, කුමක් නැති කල උපාදානය ඇති නොවේද, කුමක් නැති කල භවය ඇති නොවේද, කුමක් නැති කල ජාතිය ඇති නොවේද, කුමක් නැති කල ජරාමරණය ඇති නොවේද කියායි.

4. "මහණෙනි, ඉක්බිති ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාහට ස්වකීය ඤාණය මෙහිදී ඇතිවෙයි. (කෙසේද?) මේ අවිජ්ජාව නැති කල සංස්කාරයෝ ඇති නොවෙත්. මේ සංස්කාර නැති කල මේ විඤ්ඤාණය ඇති නොවේ. විඤ්ඤාණය නැති කල නාම රූප ඇති නොවේ. නාමරූප නැති කල සළායතන ඇති නොවේ. සළායතන ඇති නොවීමෙන් ස්පර්ශය ඇති නොවේ. ස්පර්ශය ඇති නොවීමෙන් වේදනාව ඇති නොවේ. වේදනාව ඇති නොවීමෙන් තණ්හාව ඇති නොවේ. තණ්හාව ඇති නොවීමෙන් උපාදානය ඇති නොවේ. උපාදනය ඇති නොවීමෙන් භවය ඇති නොවේ. භවය ඇති නොවීමෙන් ජාතිය ඇති නොවේ. ජාතිය නැති කල ජරාමරණය ඇති නොවේය කියායි. මෙසේ මේ ලෝකය නැතිවේයයි ඒ ආර්යශ්‍රාවක තෙම මෙසේ දැන, ගනියි.

"මහණෙනි, යම් කලක ආර්යශ්‍රාවක තෙම මෙසේ ලෝකයේ ඇතිවීමත්, නැතිවීමත්. ඇති පරිදි දැන ගනියිද, මහණෙනි, මේ ආර්යශ්‍රාවක තෙම මාර්ග දෘෂ්ටියෙන් යුක්ත වූයේයයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්ත වූයේයයි කියාද, මේ මාර්ග සද්ධර්මයට පැමිණියේයයි කියාද, මේ මාර්ග සද්ධර්මය දකීයයි කියාද, ශෛක්ෂ ඥානයෙන් යුක්තයයි කියාද, ශෛක්ෂ විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම් ධර්ම ශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ,

කලකිරීමේ නුවණ ඇත්තේයයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද, කියනු ලැබේ.”

(නවවන ආර්යශ්‍රාවක සූත්‍රය නිමි)

---

## 10. ආර්යශ්‍රාවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනි” කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාහට මෙසේ අදහස් නොවෙයි. කිමෙක්ද? කුමක් ඇති කල කුමක් වෙයිද, කිමෙක් ඉපදීමෙන් කුමක් උපදියිද, කුමක් ඇති කල සංස්කාරයෝ ඇති වෙත්ද, කුමක් ඇති කල විඤ්ඤාණය ඇති වේද, කුමක් ඇති කල නාමරූප ඇතිවේද, කුමක් ඇති කල සළායතන ඇතිවේද, කුමක් ඇති කල ස්පර්ශය ඇතිවේද, කුමක් ඇති කල වේදනාව ඇතිවේද, කුමක් ඇති කල තණ්හාව ඇතිවේද, කුමක් ඇති කල උපාදානය ඇතිවේද, කුමක් ඇති කල භවය ඇතිවේද, කුමක් ඇති කල ජාතිය ඇතිවේද? කුමක් ඇති කල ජරා මරණය ඇතිවේද කියායි.

3. “මහණෙනි, ඉක්බිති ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්යශ්‍රාවකයාහට මෙහිදී ස්වකීය ඥාණය ඇතිවෙයි. මේ අවිජ්ජාව ඇති කල සංස්කාරයෝ ඇතිවෙති. සංස්කාර ඇති කල විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය ඇති කල නාමරූප ඇතිවෙයි. නාමරූප ඇති කල සළායතන ඇති වෙයි. සළායතන ඇති කල ස්පර්ශය ඇතිවෙයි. ස්පර්ශය ඇති කල වේදනාව ඇතිවෙයි. වේදනාව ඇති කල තණ්හාව ඇති වෙයි. තණ්හාව ඇති කල උපාදානය ඇතිවෙයි. උපාදානය ඇති කල භවය

ඇතිවෙයි. භවය ඇති කල ජාතිය ඇතිවෙයි. ජාතිය ඇති කල ජරා මරණය ඇතිවෙයි කියායි. මෙසේ මේ ලෝකය ඇතිවේයයි ඒ ආර්යශ්‍රාවකතෙම දැනගනියි.

**4.** "මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාහට මෙසේ අදහස් නොවෙයි. කිමෙක්ද? කුමක් නැති කල කුමක් නැතිවේද, කුමක් නැතිකිරීමෙන් කුමක් නැතිවේද, කුමක් නැති කල සංස්කාරයෝ ඇති නොවෙත්ද, කුමක් නැති කල විඥ්ඥාණය ඇති නොවේද, කුමක් නැති කල නාමරූප ඇති නොවේද, කුමක් නැති කල සළායතන ඇති නොවේද, කුමක් නැති කල ස්පර්ශය ඇති නොවේද, කුමක් නැති කල වේදනාව ඇති නොවේද, කුමක් නැති කල තණ්හාව ඇති නොවේද, කුමක් නැති කල උපාදානය ඇති නොවේද, කුමක් නැති කල භවය ඇති නොවේද, කුමක් නැති කල ජාතිය ඇති නොවේද, කුමක් නැති කල ජරා මරණය ඇති නොවේද කියායි.

**5.** "මහණෙනි, මෙහිදී ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාහට ස්වකීය ඥාණය ඇතිවේ. (කෙසේද?) මේ අවිජ්ජාව නැති කල සංස්කාරයෝ ඇති නොවෙති. සංස්කාරයන් නැති කල විඥ්ඥාණය ඇති නොවේ. විඥ්ඥාණය නැති කල නාමරූප ඇති නොවේ. නාමරූප නැති කල සළායතන ඇති නොවේ. සළායතන නැති කල ස්පර්ශය ඇති නොවේ. ස්පර්ශය නැති කල වේදනාව ඇති නොවේ. වේදනාව නැති කල තණ්හාව ඇති නොවේ. තණ්හාව නැති කල උපාදානය ඇති නොවේ. උපාදානය නැති කල භවය ඇති නොවේ. භවය නැති කල ජාතිය ඇති නොවේ. ජාතිය නැති කල ජරා මරණය ඇති නොවේය කියායි. මෙසේ මේ ලෝකය නැතිවේයයි ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ දැනගනියි.

**6.** "මහණෙනි, යම් කලක වනාහි ආර්යශ්‍රාවකතෙම මෙසේ ලෝකයෙහි ඇතිවීමත්, නැතිවීමත් ඇති සේ දැනගනියිද, මහණෙනි, මේ ආර්යශ්‍රාවකතෙම මාර්ග දෘෂ්ටියෙන් යුක්තවූයේ යයි කියාද, මාර්ග දර්ශනයෙන් යුක්තවූයේයයි කියාද, මේ මාර්ග සද්ධර්මයට පැමිණියේයයි කියාද, මේ මාර්ග සද්ධර්මය දකීයයි

කියාද, ශෛක්ෂඥානයෙන් යුක්තයයි කියාද ශෛක්ෂ විද්‍යාවෙන් යුක්තයයි කියාද, මාර්ග නම් ධර්මශ්‍රොතයට පැමිණියේයයි කියාද, පෘථග්ජන භූමිය ඉක්මවූ, කලකිරීමේ නුවණ ඇත්තේ යයි කියාද, නිර්වාණ මාර්ගයට පැමිණ සිටීයයි කියාද කියනු ලැබේ."

(දසවන ආර්යශ්‍රාවක සූත්‍රය නිමි.)

---

(පස්වන ගහපති වර්ගයයි.)

(පඤ්චවේරභය සූත්‍ර දෙකය, දුක්ඛ සූත්‍රය, ලෝක සූත්‍රය, ඤාතික සූත්‍රය, අඤ්ඤතර සූත්‍රය, ජාණුස්සෝණි සූත්‍රය, ලෝකායතික සූත්‍රය සහ ආර්යශ්‍රාවක සූත්‍ර දෙකදැයි මේ වර්ගයෙහි සූත්‍ර දහයකි.)

---

# 6. දුක්ඛ වර්ගය.

## 1. පරිවීමංසමාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සියලු ආකාරයෙන් මනාව දුක් නැතිකිරීම සඳහා සොයා බලන්නාවූ මහණතෙම කෙතෙක් කරුණුවලින් සොයා බලන්නේද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තෝය. භාග්‍යවතුන් වහන්සේ අප ධර්මයන්ට පමුණුවනසේක. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තෝය. ස්වාමීනි, මේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියාදෙනසේක් නම් (භාග්‍යවතුන් වහන්සේටම වැටහෙනසේක් නම්) ඉතා හොඳයයි කීවාහුය.

3. "මහණෙනි, එසේවී නම් අසව්, මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළ සේක. "එසේය ස්වාමීනි," කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

"මහණෙනි, මේ ශාසනයෙහි කරුණු විමසා බලන්නාවූ මහණතෙම යම් මේ ජරා මරණ නම් අනේකවිධවූ, නානාප්‍රකාර දුකක් මේ ලෝකයෙහි උපදියි. මේ දුක වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමකින් හටගන්නේද, කුමක් ඇති කල ජරා මරණය ඇතිවෙයිද, කුමක් නැති කල ජරා මරණය ඇති නොවේදැයි විමසා බලන්නේය. හෙතෙම මෙසේ විමසා බලන්නේ යම් මේ ජරා මරණ නම් අනේක විධවූ, නානාප්‍රකාර දුකක් ලෝකයෙහි උපදීද, මේ දුක වනාහි ජාතිය නිදානකොට ඇත්තේය. ජාතිය හේතුකොට ඇත්තේය. ජාතිය නිසා පවත්නේය. ජාතිය කරණකොට හටගන්නේය. ජාතිය ඇති කල ජරා මරණය ඇතිවෙයි ජාතිය නැති කල ජරා මරණය ඇති නොවෙයි කියා දැන ගනියි. ඒ මහණතෙම ජරා මරණයද දැනගනියි. ජරා මරණයාගේ හේතුවද දැනගනියි. ජරා මරණය නැතිවීමද දැනගනියි. ජරා මරණය නැතිකරන යම් මාර්ගයක්වේද එයත් දැනගනියි. නිවනට අනුකූල ප්‍රතිපත්තියෙහි හැසිරෙන්නේද වෙයි. මහණෙනි, මේ මහණතෙම සියලු අයුරින් මනාකොට දුක් නැතිකිරීම පිණිස, ජරා මරණය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

4. "නැවතද විමසා බලන්නේ මේ ජාතිය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක්

නිසා පවත්නේද, කුමකින් හටගන්නේද, කුමක් ඇති කල්හි ඉපදීම (ජාතිය) ඇතිවේද, කුමක් නැතිකල්හි ඉපදීම (ජාතිය) ඇති නොවේදැයි විමසා බලන්නේය. එසේ විමසා බලන්නාවූ මහණතෙම ඉපදීම කර්මභවය නිදානකොට ඇත්තේය. කර්ම භවය හේතුකොට ඇත්තේය. කර්ම භවය නිසා පවත්නේය. කර්ම භවය කරණකොට හටගන්නේය. කර්ම භවය ඇති කල ඉපදීම (ජාතිය) ඇතිවේ. කර්ම භවය නැති කල ඉපදීම (ජාතිය) ඇති නොවේයයි දැනගන්නේය. හෙතෙම ඉපදීමද දනියි. ඉපදීමට හේතුවද දනියි. ඉපදීම නැතිවීමද දනියි. ඉපදීම නැතිවෙන යම් මාර්ගයක්වේද, එයත් දනියි. හෙතෙම නිවනට අනුකූල පිළිවෙතෙහි හැසිරෙන්නේද වෙයි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට, දුක් නැතිකිරීම පිණිස, ඉපදීම නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

**5.** "නැවතද විමසා බලන්නේ මේ භවය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් නිසා හටගන්නේද, කුමකින් ඇතිවන්නේද?, කුමක් ඇති කල කර්මභවය ඇතිවේද, කුමක් නැති කල කර්මභවය ඇති නොවේද කියායි. මෙසේ විමසා බලන්නාවූ හෙතෙම භවය උපාදානය (දැඩි තණ්හාව) නිදානකොට ඇත්තේය. උපාදානය හේතුකොට ඇත්තේය. උපාදානය ජාතිකොට ඇත්තේය. උපාදානය ප්‍රභවකොට ඇත්තේය. උපාදානය ඇති කල භවය ඇතිවෙයි. උපාදානය නැති කල භවය ඇති නොවෙයි කියායි. හෙතෙම භවයද දැනගනියි. භවයට හේතුවද දැනගනියි. භවය නැතිවීමද දැනගනියි භවය නැති කිරීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද, එයත් දැනගනියි. නිවණට අනුකූල පිළිවෙතෙහි හැසුරුණේ වෙයි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැති කිරීම පිණිස, භවය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

**6.** "නැවතද විමසන්නාවූ මහණතෙම මේ උපාදානය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල උපාදානය ඇතිවේද, කුමක් නැති කල උපාදානය ඇති නොවේද කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැන ගනියි. (කෙසේද?) උපාදානය තණ්හාව නිදානකොට ඇත්තේය. තණ්හාව හේතුකොට ඇත්තේය. තණ්හාව ඉපදීමේ හේතුකොට ඇත්තේය. තණ්හාව ප්‍රභව (මුල්) කොට ඇත්තේය. තණ්හාව ඇති කල උපාදානය ඇතිවෙයි. තණ්හාව නැති කල උපාදානය ඇති නොවෙයි කියායි හෙතෙම උපාදානයද දැනගනියි. උපාදානය ඇතිවීමට හේතුවද දැන ගනියි. උපාදානය නැතිකිරීමද දැනගනියි. උපාදානය නැති කිරීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද, එයත් දැනගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස උපාදානය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

7. "මේ තණ්හාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද කුමක් උත්පත්ති හේතුකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල තණ්හාව ඇතිවේද, කුමක් නැති කල තණ්හාව ඇති නොවේද කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) තණ්හාව වේදනාව නිදානකොට ඇත්තේය. වේදනාව හේතුකොට ඇත්තේය. වේදනාව ඉපදීමේ හේතුකොට ඇත්තේය. වේදනාව ප්‍රභව (මුල්) කොට ඇත්තේය. වේදනාව ඇති කල තණ්හාව ඇති වෙයි. වේදනාව නැති කල තණ්හාව ඇති නොවෙයි කියායි. හෙතෙම තණ්හාවද දැනගනියි. තණ්හාව ඇතිවීමට හේතුවද දැනගනියි. තණ්හාව නැතිකිරීමද දැනගනියි. තණ්හාව නැතිකිරීමට සුදුසුවූ යම් මාර්ගයක් වෙයිද, එයත් දැනගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස තණ්හාව නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

8. "මේ වේදනාව වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද,

කුමක් ඇති කල වේදනාව ඇතිවේද, කුමක් නැති කල වේදනාව ඇති නොවේද, කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) වේදනාව ස්පර්ශය නිදාන කොට ඇත්තේය. ස්පර්ශය හේතුකොට ඇත්තේය. ස්පර්ශය ඉපදීමේ හේතුකොට ඇත්තේය. ස්පර්ශය ප්‍රභව (මුල්) කොට ඇත්තේය. ස්පර්ශය ඇති කල වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නැති කල වේදනාව ඇති නොවෙයි කියායි. හෙතෙම වේදනාවද දැනගනියි. වේදනාව ඇතිවීමට හේතුවද දැන ගනියි. වේදනාව නැතිකිරීමද දැනගනියි. වේදනාව නැති කිරීමට සුදුසුවූ යම් මාර්ගයක් වෙයිද එයත් දැනගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැති කිරීම පිණිස වේදනාව නැතිකිරීම පිණිස පිළිපන්නේ යයි කියනු ලැබේ.

**9.** "මේ ස්පර්ශය වනාහි කුමක් නිදානකොට ඇත්තේද කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල ස්පර්ශය ඇතිවේද, කුමක් නැති කල ස්පර්ශය ඇති නොවේද කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) ස්පර්ශය සළායතන නිදානකොට ඇත්තේය. සළායතන හේතුකොට ඇත්තේය. සළායතන ඉපදීමේ හේතුකොට ඇත්තේය සළායතන ප්‍රභව (මුල) කොට ඇත්තේය. සළායතන ඇති කල ස්පර්ශය ඇතිවෙයි. සළායතන නැති කල ස්පර්ශය ඇති නොවෙයි කියායි. හෙතෙම ස්පර්ශයද දැනගනියි. ස්පර්ශය ඇතිවීමට හේතුවද දැනගනියි. ස්පර්ශය නැතිකිරීමද දැනගනියි. ස්පර්ශය නැතිකිරීමට සුදුසුවූ යම් මාර්ගයක් වෙයිද එයත් දැනගනියි. මහණෙනි, මේ මහණ තෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස, ස්පර්ශය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

**10.** "මේ සළායතන වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල සළායතන ඇතිවේද, කුමක් නැති කල

සළායතන ඇති නොවේද කියායි, හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි (කෙසේද?) සළායතන නාමරූප නිදාන කොට ඇත්තේය. නාමරූප හේතුකොට ඇත්තේය නාමරූප ඉපදීමේ හේතුකොට ඇත්තේය. නාමරූප ප්‍රභව (මුල්) කොට ඇත්තේය. නාමරූප ඇති කල සළායතන ඇති වෙයි. නාමරූප නැති කල සළායතන ඇති නොවෙයි කියායි. හෙතෙම සළායතනද දැනගනියි. සළායතන ඇතිවීමට හේතුවද දැනගනියි. සළායතන නැතිකිරීමද දැනගනියි. සළායතන නැතිවීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද එයත් දැන ගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනා කොට දුක් නැතිකිරීම පිණිස, සළායතන නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

11. "මේ නාමරූප වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල නාමරූප ඇතිවේද, කුමක් නැති කල නාමරූප ඇති නොවේද කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) නාමරූප විඤ්ඤාණය නිදාන කොට ඇත්තේය. විඤ්ඤාණය හේතුකොට ඇත්තේය. විඤ්ඤාණය ඉපදීමේ හේතුකොට ඇත්තේය. විඤ්ඤාණය ප්‍රභව (මුල්) කොට ඇත්තේය. විඤ්ඤාණය ඇති කල නාමරූප ඇතිවෙයි. විඤ්ඤාණය නැති කල නාමරූප ඇති නොවෙයි කියායි. හෙතෙම නාමරූපද දැනගනියි. නාමරූප ඇතිවීමට හේතුවද දැනගනියි. නාමරූප නැතිකිරීමද දැනගනියි. නාමරූප නැතිකිරීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද එයත් දැනගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස, නාමරූප නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

12. "මේ විඤ්ඤාණය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් හටගන්නා හේතුවකොට ඇත්තේද, කුමක් උත්පත්ති හේතුවකොට ඇත්තේද, කුමක් මුල් (ප්‍රභව) කොට ඇත්තේද, කුමක් ඇති කල විඤ්ඤාණය ඇතිවේද, කුමක් නැති කල

විඤ්ඤාණය ඇති නොවේද කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) විඤ්ඤාණය සංස්කාර නිදාන කොට ඇත්තේය. සංස්කාර හේතුකොට ඇත්තේය. සංස්කාර ඉපදීමේ හේතුකොට ඇත්තේය. සංස්කාර ප්‍රභව (මුල්) කොට ඇත්තේය. සංස්කාර ඇති කල විඤ්ඤාණය ඇති වෙයි. සංස්කාර නැති කල විඤ්ඤාණය ඇති නොවෙයි කියායි. හෙතෙම විඤ්ඤාණයද දැනගනියි. විඤ්ඤාණය ඇතිවීමට හේතුවද දැනගනියි. විඤ්ඤාණය නැතිකිරීමද දැනගනියි. විඤ්ඤාණය නැතිකිරීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද, එයත් දැනගනියි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස, විඤ්ඤාණය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

13. "මේ සංස්කාරයෝ වනාහි කුමක් නිදාන කොට ඇත්තෝද, කුමක් සමුදයකොට ඇත්තෝද, කුමක් ජාතිකොට ඇත්තෝද, කුමක් ප්‍රභවකොට ඇත්තෝද, කුමක් ඇති කල සංස්කාරයෝ ඇතිවෙත්ද, කුමක් නැති කල සංස්කාරයෝ ඇති නොවෙත්ද කියායි. හෙතෙම විමසන්නේ මෙසේ දනියි. (කෙසේද?) සංස්කාරයෝ අවිජ්ජාව නිදානකොට ඇත්තෝය. අවිජ්ජාව හේතුවකොට ඇත්තෝය. අවිජ්ජාව ජාතිකොට ඇත්තෝය. අවිජ්ජාව ප්‍රභවකොට ඇත්තෝය. අවිජ්ජාව ඇති කල සංස්කාරයෝ ඇති වෙයි. අවිජ්ජාව නැති කල සංස්කාරයෝ ඇති නොවෙති කියායි. හෙතෙම සංස්කාරයන්ද දනියි. සංස්කාරයන්ගේ හේතුවද දනියි. සංස්කාර නැතිවීමද දනියි. සංස්කාර නැතිවීමට සුදුසුවූ, යම් මාර්ගයක් වෙයිද, එයත් දැනගනියි. නිවනට අනුකූල පිළිවෙතෙහි පිළිපදින්නේද වෙයි. මහණෙනි, මේ මහණතෙම සියලු ආකාරයෙන් දුක් නැතිකිරීම පිණිස, සංස්කාර නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

14. "මහණෙනි, අවිජ්ජාවෙන් යුක්තවූ, මේ පුද්ගලතෙම ඉදින් කුශලකර්ම රැස්කෙරෙයිද, (ඔහුගේ) විඤ්ඤාණය කුශල සහගත වෙයි. ඉදින් අකුශල කර්ම රැස් කෙරෙයිද, (ඔහුගේ) විඤ්ඤාණය අකුශල සහගත වෙයි. ඉදින් අරූපාවචර කර්ම

රැස් කෙරෙයිද (ඔහුගේ) විඥ්ඥාණය අරූපාවචර කුශල සහගත වෙයි.

15. "මහණෙනි, යම් කලක වනාහි මහණහුගේ අවිද්‍යාව නැතිවූයේ වෙයිද, අර්හත් මාර්ගඥානය පහළවූයේ වෙයිද, හෙතෙම අවිද්‍යාව දුරුවීමත් අර්හත් මාර්ගඥානය ලැබීමත්, හේතු කොටගෙන කුශල කර්මද රැස් නොකෙරෙයි. අකුශල කර්මද රැස් නොකෙරෙයි. අරූපාවචර කර්මද රැස් නොකෙරෙයි. රැස් නොකරන්නේ, සිත නොමෙහෙයවන්නේ ලෝකයෙහි කිසිවක් (තණ්හාදී වශයෙන්) නොගනියි. (තණ්හාදී වශයෙන්) නොගන්නේ භය නොවෙයි. භය නොවන්නෙන්, තෙමේම පිරිනිවන් පායි. ඉපදීම ක්ෂය වූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර, නිමවන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මේ ආත්මයෙහි කළයුතු අනිකක් නැතැයි දැනගනියි.

16. "හෙතෙම ඉදින් සැප වේදනාවක් විඳීද, ඒ වේදනා තොමෝ අනිත්‍යයයි දැනගනී. (තණ්හා වශයෙන්) වැදගැනීම නුසුදුසුයයි දැනගනියි සතුටුවීමට නුසුදුසුයයි දැනගනියි. හෙතෙම ඉදින් දුක් වේදනාවක් විඳියිද ඒ වේදනාව අනිත්‍යයයි දැනගනියි. (තණ්හා වශයෙන්) වැදගැනීම නුසුදුසුයයි දැනගනියි. සතුටුවීමට නුසුදුසුයයි දැනගනියි. ඉදින් හෙතෙම නොදුක් නොසැප වේදනාවක් විඳීද, ඒ වේදනාව අනිත්‍යයයි දැනගනියි. (තණ්හා වශයෙන්) වැදගැනීමට නුසුදුසුයයි දැනගනියි. සතුටුවීමට නුසුදුසුයයි දැනගනියි හෙතෙම ඉදින් සැපවේදනාවක් විඳියිද, එහි නොබැඳී ඒ වේදනාව විඳියි. හෙතෙම ඉදින් දුක් වේදනාවක් විඳියිද, එහි නොබැඳී ඒ වේදනාව විඳියි. හෙතෙම ඉදින් නොදුක් නොසැප වේදනාවක් විඳියිද, එහි නොබැඳී ඒ වේදනාව විඳියි. හෙතෙම කය කෙළවරකොට ඇති වේදනාවක් විඳිනු ලබන්නේ, කය කෙළවරකොට ඇති වේදනාවක් විඳිමියි දැනගනියි. (හෙතෙම) දිවි කෙළවරකොට ඇති වේදනාවක් විඳිනු ලබන්නේ, දිවි කෙළවරකොට ඇති වේදනාවක් විඳිමියි දැන ගනියි. කය බිඳීමෙන් ජීවිත ක්ෂයවීමට පෙර මේ ලෝකයෙහිදීම සතුටු නොවන්නාවූ, සියලු වේදනා

සිසිල් බවට පැමිණෙන්නාහුයයිද, ධාතු ශරීරයෝ ඉතුරුවන්නාහුයයිද කියා දැනගනියි.

17. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් කුඹලා වලන් පුච්චන පෝරණුවෙන් උණුසුම් කළයක් ගෙන සමවූ භූමියෙහි තබන්නේ නම් ඒ කළයෙහි යම් උණුසුමක් වූයේද, එය එතැන්හිදීම නැති වන්නේය. කළ කබොලු ඉතිරිවෙත්. මහණෙනි, එසේම මහණ තෙම වනාහි කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිනු ලබන්නේ, කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමියි දැනගනියි. (හෙතෙම) ජීවිතය කෙළවර කොට ඇති වේදනාවක් විඳිනු ලබන්නේ, ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිමියි දැනගනියි. කය බිඳීමෙන් ජීවිතක්ෂය වීමට පෙර මේ ලෝකයෙහි දීම නොසතුටු වන්නාවූ, සියලු වේදනා සිසිල් වන්නාහුයයිද, ධාතු ශරීරයෝ ඉතුරු වන්නාහුයයිද කියා දැනගනියි.

18. "මහණෙනි, (තොපි) ඒ ගැන කෙසේ සිතන්නහුද? කිම, ක්ෂීණාශ්‍රව මහණතෙම කුශල ක්‍රියා හෝ රැස්කරන්නේද? අකුශල ක්‍රියා හෝ රැස්කරන්නේද? අරූප කුශල් හෝ රැස්කරන්නේද?" "ස්වාමීනි, එය නොවේමය". "සංස්කාර නිරෝධයෙන් සියලු ආකාරයෙන් සංස්කාර නැතිවූ කල්හි වනාහි කිම විඤ්ඤාණය දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය" "විඤ්ඤාණ නිරෝධයෙන් සියලු ආකාරයෙන් විඤ්ඤාණය නැතිවූ කල්හි වනාහි කිම නාම රූප දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය" "නාම රූප නිරෝධයෙන් සියලු ආකාරයෙන් නාම රූප නැතිවූ කල්හි වනාහි කිම සළායතන දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය". "සළායතන නිරෝධයෙන් සියලු ආකාරයෙන් සළායතන නැතිවූ කල්හි වනාහි කිම ස්පර්ශය දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය". "ස්පර්ශ නිරෝධයෙන් සියලු ආකාරයෙන් ස්පර්ශය නැතිවූ කල්හි වනාහි කිම වේදනාව දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය" වේදනා නිරෝධයෙන් සියලු ආකාරයෙන් වේදනාව නැතිවූ කල්හි වනාහි කිම තණ්හාව දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය". "තණ්හා නිරෝධයෙන් සියලු ආකාරයෙන් තණ්හාව නැතිවූ කල්හි වනාහි කිම

උපාදානය දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය". "උපාදාන නිරෝධයෙන් සියලු ආකාරයෙන් උපාදානය නැතිවූ කල්හි වනාහි කිම, භවය දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය". "භව නිරෝධයෙන් සියලු ආකාරයෙන් භවය නැතිවූ කල්හි වනාහි කිම, ජාතිය (ඉපදීම) දක්නහුද"? "ස්වාමීනි එය නොවේමය". "ජාති නිරෝධයෙන් සියලු ආකාරයෙන් ජාතිය (ඉපදීම) නැතිවූ කල්හි වනාහි කිම, ජරා මරණය දක්නහුද"? "ස්වාමීනි, එය නොවේමය"

**19.** "සාදු! සාදු!! මහණෙනි, ඒ වනාහි මෙසේමය. මහණෙනි, එය අන් අයුරෙකින් නොවේ. මහණෙනි, එය එසේමයයි අදහව් සැකහැර පිළිගනිව්. දුක්ඛයාගේ කෙළවර මෙය යයි මෙහි සැක නැත්තෝවව්"යයි වදාළේය.

**(පළමුවන පරිවීමංසමාන සූත්‍රය නිමි)**

---

## 2. උපාදාන සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි රස විඳ ගැනීම අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, යම්සේ දර කරත්ත දහයකින් හෝ දර කරත්ත විස්සකින් හෝ දර කරත්ත තිහකින් හෝ දර කරත්ත හතළිසකින් හෝ මහ ගිනි කඳක් දල්වන්නේය, පුරුෂයෙක් එහි කලින් කල වියලි තණ දමන්නේ, වියලි ගොම වැරටි දමන්නේ, වියලි දර දමන්නේ වේද මහණෙනි, එසේ වනාහි ඒ (දර ආදිය) නිසා ඒ හේතුවෙන් ඒ ගිනිකඳ බොහෝ දීර්ඝ කාලයක් දැල්වෙන්නේ වේද, මහණෙනි එසේම තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි රසවිඳ ගැනීම අනුව බලමින් වසන්නාගේ තණ්හාව වැඩෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

4. "මහණෙනි, තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

5. "මහණෙනි, යම්සේ දරකරත්ත දහයකින් හෝ දර කරත්ත විස්සකින් හෝ දරකරත්ත තිහකින් හෝ දර කරත්ත හතළිහකින් හෝ මහ ගිනි කඳක් දල්වන්නේ පුරුෂයෙක් එහි කලින්කල වියලි තණ නොදමන්නේ, වියලි ගොම වැරටි නොදමන්නේ, වියලි දර නොදමන්නේ වේද, මහණෙනි, එසේ ඒ ගිනිකඳ වනාහි පූර්වවූ දර ආදිය නැතිවී යාමෙන් සහ අන්‍යවූ දර ආදිය නොලැබීමෙන් හේතු නැති වූයේ නිවී යන්නේය. මහණෙනි, එසේම තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම)

නැති වෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම), දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි' කියායි.

**(දෙවෙනි උපාදාන සූත්‍රය නිමි.)**

---

## 3. සංයෝජන සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණු වන්නාවූ ධර්මයන්හි රසවිඳගැනීම අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, යම්සේ තෙල්ද වැටියද නිසා තෙල් පහන දැල්වෙන්නේද, එහි පුරුෂයෙක් කලින් කල තෙල් වත්කරන්නේද, වැටි දමන්නේද, මහණෙනි, එසේ වනාහි ඒ තෙල් පහන ඒ (තෙල් ආදිය) නිසා, ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් දැල්වෙන්නේද, මහණෙනි, එසේම වනාහි සංයෝජනයන්ට අරමුණු වන්නාවූ ධර්මයන්හි රසවිඳ ගැනීම අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ

උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

4. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණු වන්නාවූ ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ නැති වන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි.

5. "මහණෙනි, යම්සේ තෙල්ද වැටියද නිසා තෙල් පහන දැල්වෙන්නේද, එහි පුරුෂයෙක් කලින්කල තෙල් වත්නොකරන්නේද, වැටි නොදමන්නේද, මහණෙනි, මෙසේ වනාහි ඒ තෙල් පහන පූර්වවූ, (තේලාදී) හේතූන් නැතිවීයාමෙන් සහ අන්‍යවූ ආහාර නොලැබීමෙන් නිරාහාර වූයේ නිවී යන්නේය. මහණෙනි, එසේම වනාහි සංයෝජනයන්ට අරමුණුවන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ නැති වන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

**(තෙවෙනි සංයෝජන සූත්‍රය නිමි.)**

---

## 4. සංයෝජන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි කියා භික්ෂූන් ඇමතූහ. ස්වාමීනියි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, යම්සේ වනාහි තෙල්ද නිසා වැටියද නිසා තෙල් පහන දැල්වෙන්නේද, එහි පුරුෂයෙක් කලින් කල තෙල් වත් කරන්නේද, වැටි දමන්නේද, මහණෙනි, එසේ වනාහි ඒ තෙල් පහන ඒ (තේලාදිය) නිසා, ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් දැල් වෙන්නේද, මහණෙනි, එසේම වනාහි සංයෝජනයන්ට අරමුණුවන ධර්මයන්හි රසවිඳීම් අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, (හැඬීම්) දුක් දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි.

**3.** "මහණෙනි, යම්සේ තෙල්ද නිසා වැටියද නිසා තෙල් පහන දැල්වෙන්නේද, එහි පුරුෂයෙක් කලින් කල තෙල් වත්නොකරන්නේද, වැටි නොදමන්නේද, මහණෙනි, මෙසේ වනාහි ඒ තෙල් පහන පූර්වවූ, (තෙල් ආදී) හේතූන් නැතිවීයාමෙන් සහ අන්‍යවූ ආහාර නොලැබීමෙන් නිරාහාර වූයේ නිවීයන්නේය. මහණෙනි, එසේම වනාහි සංයෝජනයන්ට අරමුණුවූ ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හාතොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැති වෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවේ.

**(සිව්වන සංයෝජන සූත්‍රය නිමි.)**

---

## 5. මහාරුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තෘෂ්ණා දෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, යම්සේ වනාහි මහගසක් ඒ ගසේ යටට ගමන් කරන්නාවූ, යම් මුල්වෙත්ද, හරහට ගමන් කරන්නාවූ යම් මුල්වෙත්ද, ඒ සියල්ල උඩට ඕජාව ගෙන යෙත්ද, මහණෙනි, මෙසේ වනාහි ඒ මහ ගස ඒ (ඕජාව) නිසා, ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය. මහණෙනි, එසේම වනාහි තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වා ගනු ලබන ධර්මයන්හි රස විඳ ගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙත්.

4. "මහණෙනි, තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අරමුණු කරනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තෘෂ්ණාතොමෝ නැති වන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැති වෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම)

නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැති වෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි.

5. "මහණෙනි, යම්සේ මහ ගසක් වේද, ඉක්බිති පුරුෂයෙක් උදැල්ලක් සහ කූඩයක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ ගසේ මුල් කපන්නේය. මුල් කපා, මුල් හාරන්නේය. මුල්හාරා, යටත් පිරිසෙයින් සැවැන්න මුල් පමණවූද මුල් උදුරන්නේය. හෙතෙම කඩ කඩ කොට කපන්නේය. කඩ කඩ කොට පලන්නේය. පළා කැබලි-කැබලි කරන්නේය. කැබලි-කැබලි කොට, පවනෙහි සහ අව්වෙහි වේලන්නේය. පවනෙහි සහ අව්වෙහි වේලා ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා, අළු කරන්නේය. අළුකොට තද සුළඟෙහි හෝ පොලා හරින්නේය. ඉක්මණින් ගලා බසින්නාවූ, දියදහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. මහණෙනි, එසේ වනාහි ඒ මහගස මුල් කපන ලද්දේ, තල් කඳක් මෙන් කරන ලද්දේ, මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත්කරන ලද්දේ, වන්නේය. මහණෙනි, එසේම වනාහි තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

**(පස්වන මහාරුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. මහාරුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, යම් සේ වනාහි මහ ගසක් ඒ ගසේ යටට ගමන් කරන්නාවූ, යම් මුල්වෙත්ද, හරහට ගමන් කරන්නාවූ යම් මුල්වෙත්ද, ඒ සියල්ල උඩට ඕජාව ගෙන යෙත්, මහණෙනි, මෙසේ වනාහි ඒ මහ ගස ඒ (ඕජාව) නිසා ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය. මහණෙනි, එසේම වනාහි තෘෂ්ණා දෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරා මරණද ශෝක, පරිදේව හැඬීම්, දුක් දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු (එකම) දුක් ගොඩ ඇතිවේ.

**3.** "මහණෙනි, යම්සේ මහ ගසක් වේද, ඉක්බිති පුරුෂයෙක් උදැල්ලක් සහ කුඩයක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ මුල් කපන්නේය. මුල්කපා මුල් හාරන්නේය. මුල්හාරා යටත් පිරිසෙයින් සෑවැන්න මුල් පමණවූද මුල් උදුරන්නේය. හෙතෙම ඒ ගස කඩ කඩ කොට කපන්නේය. කඩ කඩ කොට කපා, පළන්නේය, පළා, කැබලි කැබලි කරන්නේය. කැබලි කැබලිකොට, පවනෙහි සහ අවුවෙහි වේලන්නේය. පවනෙහි සහ අවුවෙයි වේලා, ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා, අළු කරන්නේය. අළුකොට, තද සුළඟෙහි හෝ පොලා හරින්නේය. ශීඝ්‍රයෙන් (ඉක්මණින්) ගලා බස්නාවූ, දිය පහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. මහණෙනි, මෙසේ වනාහි ඒ මහ ගස මුල් කපන ලද්දේ තල් කඳක් මෙන් කරන ලද්දේ, මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත් කරන ලද්දේ වන්නේය. මහණෙනි, එසේ වනාහි තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව (දොස්) අනුව බලමින්

වාසය කරන්නාගේ තණ්හා තොමෝ නැති වන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

**(භයවන රුක්ඛ සූත්‍රය නිමි)**

---

## 7. තරුණ රුක්ඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණුවන ධර්මයන්හි රසවිඳගැනීම් අනුව බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරාමරණ, ශෝක, දුක්, දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, (එලහට නොගත්) තරුණ ගසක් වේද, පුරුෂයෙක් කලින්කල ඒ ගසේ මුල් ශුද්ධකරන්නේද කලින් කල (පොහොර) පස් දෙන්නේද, කලින් කල ජලය දෙන්නේද, මහණෙනි, මෙසේ වනාහි ඒ තරුණවූ, (එලහට නොගත්) ගස එය ආහාර කොට ඇත්තේ, ඒ හේතුවෙන් වැඩීමට, දියුණුවීමට, මහත්වීමට පැමිණෙන්නේය. මහණෙනි එසේම වනාහි සංයෝජනයන්ට අරමුණුවූ ධර්මයන්හි රස විඳගැනීම අනුව

බලමින් වාසය කරන්නාගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා මරණ, ශෝක, පරිදේව දුක් දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇති වෙයි.

4. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණුවූ ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හාතොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක් දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ නැතිවෙයි.

5. "මහණෙනි, යම්සේ වනාහි තරුණ ගසක් වේද, ඉක්බිති පුරුෂයෙක් කුඩයක් සහ උදැල්ලක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ ගසේ මුල් කපන්නේය. මුල් කපා, මුල් හාරන්නේය. මුල්හාරා, යටත් පිරිසෙයින් සැවැන්න මුල් පමණවූද, මුල් උදුරන්නේය. හෙතෙම ඒ ගස කඩ කඩ කොට කපන්නේය. කඩ කඩ කොට කපා, පළන්නේය. පළා කැබලි කැබලි කරන්නේය. කැබලි කැබලි කොට, පවනෙහි සහ අවුවෙහි වේලන්නේය. පවනෙහි සහ අවුවෙහි වේලා, ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා අළු කරන්නේය. අළුකොට, තද සුළඟෙහි හෝ පොලාහරින්නේය. සීඝ්‍රයෙන් (ඉක්මණින්) ගලා බස්නාවූ, දියදහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. මහණෙනි, එසේ වනාහි ඒ තරුණ ගස මුල් කපන ලද්දේ, තල් කඳක් මෙන් කරන ලද්දේ, මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත්කරන ලද්දේ වන්නේය.

6. "මහණෙනි, මෙසේම වනාහි දස සංයෝජන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ.

උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්) දුක් දොම්නස් සහ උපායාසයෝ (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ නැතිවෙයි.

**(හත්වන තරුණ රුක්ඛ සූත්‍රය නිමි)**

---

## 8. නාමරූප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි කියා භික්ෂූන් ඇමතූසේක. ස්වාමීනියි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණු වන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ නාමරූපයට බැස ගැනීම වෙයි. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය (දැඩිව අල්ලා ගැනීම) ඇතිවේ. උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, යම්සේ මහ ගසක් වේද, ඒ ගසේ යටට ගමන් කරන්නාවූ, යම් යටට බස්නා මුල් වෙත්ද, හරහට ගමන් කරන්නාවූ යම් මුල් වෙත්ද, ඒ සියල්ලම උඩට ඕජාව ගෙනයෙත්. මහණෙනි, එසේ වනාහි ඒ මහ ගස ඒ (ඕජාව) නිසා ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය.

4. "මහණෙනි, එසේම වනාහි දස සංයෝජනය ධර්මයන්හි රස විඳ ගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ නාම රූපයට බැසගැනීම වෙයි. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය (දැඩිව අල්ලා ගැනීම) ඇතිවේ. උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරාමරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි.

5. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණු වන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ නාමරූපයට බැස ගැනීම නොවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය (දැඩිව අල්ලා ගැන්ම) නැතිවෙයි. උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් නැතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය නැතිවෙයි.

6. "මහණෙනි, යම්සේ මහ ගසක් වේද, ඉක්බිති පුරුෂයෙක් උදැල්ලක් සහ කුඩයක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ ගසේ මුල් කපන්නේය. මුල් කපා මුල් හාරන්නේය. මුල් හාරා, යටත් පිරිසෙයින් සැවැන්න මුල් පමණවූද, මුල් උදුරන්නේය. හෙතෙම ඒ ගස කඩ කඩ කොට කපන්නේය. කඩ කඩ කොට කපා, පළන්නේය. පළා, කැබලි කැබලි කරන්නේය. කැබලි කැබලි කොට පවනෙහි සහ අවුවෙහි වේලන්නේය. පවනෙහි සහ අවුවෙහි වේලා, ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා අළු කරන්නේය. අළුකොට, තද සුළඟෙහි හෝ පොලා හරින්නේය. ශීඝ්‍රයෙන් (ඉක්මණින්) ගලා බස්නාවූ දිය දහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. මහණෙනි, මෙසේ වනාහි

ඒ මහ ගස මුල් කපන ලද්දේ තල් කඳක් මෙන් කරන ලද්දේ මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත්කරන ලද්දේ වන්නේය.

7. "මහණෙනි, මෙසේ වනාහි සංයෝජනයන්ට අරමුණුවන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ නාම රූපයන්ට බැස ගැනීම නොවෙයි. නාමරූපයන් නැතිවීමෙන් සළායතනයන් නැතිවෙයි. සළායතනයන් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේ. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය (දැඩිව අල්ලා ගැන්ම) නැතිවෙයි. උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝකවීම් හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් නැතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය නැතිවෙයි.

**(අටවන නාමරූප සූත්‍රය නිමි)**

## 9. විඤ්ඤාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණුවන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ විඤ්ඤාණයට බැසගැනීමවෙයි. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි. නාමරූප නිසා සළායතන ඇතිවෙයි. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය (දැඩිව අල්ලා ගැනීම) ඇතිවේ. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නිසා භවය

ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි.

3. "මහණෙනි, මහගසක් යම්සේ වේද, ඒ ගසේ යටට යන්නාවූ, යම් යටට බස්නාවූ මුල් වෙත්ද, හරහට ගමන් කරන්නාවූ යම් මුල් වෙත්ද, ඒ සියල්ලම උඩට ඕජාව ගෙනයෙත් මහණෙනි, එසේ වනාහි ඒ මහගස ඒ ඕජාව නිසා ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය.

4. "මහණෙනි, එසේම වනාහි දස සංයෝජනයන්ට අරමුණු වන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ විඤ්ඤාණයට බැසගැනීම වෙයි. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි. නාමරූප නිසා සළායතන ඇති වෙයි. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය (දැඩිව අල්ලාගැනීම) ඇතිවේ. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නිසා භවය ඇතිවේ. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේ. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක්ගොඩ ඇතිවෙයි.

5. "මහණෙනි, සංයෝජනයන්ට අරමුණු වන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ විඤ්ඤාණයට බැසගැනීම නොවෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැති වීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් නැතිවෙත් මෙසේ මේ එකම දුක් සමූහය නැතිවෙයි.

6. "මහණෙනි, මහගසක් යම්සේ වේද, ඉක්බිති පුරුෂයෙක් උදැල්ලක් සහ කුඩයක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ ගසේ මුල් කපන්නේය. මුල් කපා, මුල් හාරන්නේය. මුල් හාරා, යටත්පිරිසෙයින් සැවැන්න මුල් පමණවූද, මුල් උදුරන්නේය. හෙතෙම ඒ ගස කඩ කඩ කොට කපන්නේය. කඩ කඩ කොට කපා, පළන්නේය. පළා, කැබලි කැබලි කොට පවනෙහි සහ අවුවෙහි වේලන්නේය. පවනෙහි සහ අවුවෙහි වේලා, ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා අළුකරන්නේය. අළුකොට තද සුළඟෙහි හෝ පොලා හරින්නේය. ශීඝ්‍රයෙන් (ඉක්මණින්) ගලාබස්නාවූ දියදහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. මහණෙනි, මෙසේ වනාහි ඒ මහගස මුල් කපන ලද්දේ. තල් කඳක්මෙන් කරන ලද්දේ. මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත්කරන ලද්දේ වන්නේය.

7. "මහණෙනි. මෙසේ වනාහි දස සංයෝජන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ විඤ්ඤාණයට බැසගැනීම නොවෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවේ. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවේ. ස්පර්ශයනැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් නැතිවෙත්. මෙසේ මේ එකම දුක් සමූහය නැතිවෙයි.

**(නවවන විඤ්ඤාණ සූත්‍රය නිමි).**

---

## 10. නිදාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ "කම්මාස්සදම්ම" නම්වූ කුරුරට වැස්සන්ගේ නියම්ගම

ගොදුරුගම් කොට කුරුරට වාසය කරනසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හිඳගත්තේය. එක්පැත්තක හිඳගත්තාවූ, ඇවැත් ආනන්ද තෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ පටිච්චසමුප්පාදය ඉතා ගැඹුරු වූයේත්, ගැඹුරු දැකුම් ඇත්තේත් වේද, එතකුදු වුවත් මට වනාහි නොගැඹුරුව නොගැඹුරුව මෙන් වැටහෙයි" කියායි.

2. "ආනන්දය, එසේ නොකියව. ආනන්දය, එසේ නොකියව. ආනන්දය, මේ පටිච්චසමුප්පාදය ගැඹුරු වූයේද, ගැඹුරු දැකුම් ඇත්තේද වෙයි. ආනන්දය, මෙසේ මේ ධර්මයාගේ නොදැනීමෙන්, අවබෝධ නොකිරීමෙන්, ප්‍රතිවෙධ නොකිරීමෙන්, මේ ප්‍රජාතොමෝ නූල් අවුලක් මෙන් වූවා, කැදැල්ලක් මෙන් වූවා. මුදුතණ හා බබුස්තණ මෙන් වූවා. සැප නැත්තාවූ, නපුරුගති ඇත්තාවූ, විෂම වැටීම් ඇත්තාවූ, සංසාරය ඉක්මවා නොයන්නීය. ආනන්දය, තෘෂ්ණා දෘෂ්ටි ආදීන් විසින් අල්වා ගනු ලබන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (උත්පත්තිය) ඇතිවෙයි. ජාතිය (උත්පත්තිය) නිසා ජරා මරණ, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවේ. මෙසේ මේ එකම දුක්ගොඩ ඇතිවෙයි.

3. "ආනන්දය, යම්සේ වනාහි මහ ගසක් වේද, ඒ ගසේ යටට ගමන්කරන්නාවූ යම් මුල්වෙත්ද, හරහට ගමන් කරන්නාවූ යම් මුල් වෙත්ද, ඒ සියල්ල උඩට ඕජාවගෙන යෙත්ද, ආනන්දය, මෙසේ වනාහි ඒ මහගස ඒ (ඕජාව) නිසා ඒ හේතුවෙන් බොහෝ දීර්ඝ කාලයක් සිටින්නේය. ආනන්දය, එසේම වනාහි තෘෂ්ණා දෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි රස විඳගැනීම අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ වැඩෙන්නීය. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය

(දැඩිව අල්ලා ගැනීම) නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (උත්පත්තිය) ඇතිවෙයි. ජාතිය (උත්පත්තිය) නිසා ජරා මරණ ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ එකම දුක්ගොඩ ඇතිවෙයි.

4. "ආනන්දය, තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය) නැතිවෙයි. ජාතිය (උත්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් සහ උපායාස (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ එකම දුක්ගොඩ නැතිවෙයි.

5. "ආනන්දය, යම්සේ මහගසක් වේද, ඉක්බිති පුරුෂයෙක් උදැල්ලක් සහ කුඩයක් ගෙන එන්නේය. (අවුත්) හෙතෙම ඒ ගසේ මුල් කපන්නේය. මුල් කපා, මුල් හාරන්නේය. මුල් හාරා, යටත්පිරිසෙයින් සැවැන්න මුල් පමණවූද, මුල් උදුරන්නේය. හෙතෙම ඒ ගස කඩකඩ කොට කපන්නේය. කඩ කඩ කොට කපා, පළන්නේය. පළා, කැබලි කැබලි කරන්නේය. කැබලි කැබලි කොට, පවනෙහි සහ අවුවෙහි වේලන්නේය. පවනෙහි සහ අවුවෙහි වේලා, ගින්නෙන් පුළුස්සන්නේය. ගින්නෙන් පුළුස්සා අළු කරන්නේය. අළුකොට, තද සුළඟෙහි හෝ පොලා හරින්නේය. ශීඝ්‍රයෙන් (ඉක්මණින්) ගලා බස්නාවූ, දියදහරින් යුත් ගඟෙහි හෝ පාකර හරින්නේය. ආනන්දය, මෙසේ වනාහි ඒ මහ ගස මුල් කපන ලද්දේ තල් කඳක් මෙන් කරන ලද්දේ මත්තෙහි නොවැඩෙනසේ අභාවයට පත්කරන ලද්දේ වන්නේය. ආනන්දය, මෙසේම වනාහි තෘෂ්ණාදෘෂ්ටි ආදීන් විසින් අල්වාගනු ලබන ධර්මයන්හි ආදීනව අනුව බලමින් වාසය කරන්නහුගේ තණ්හා තොමෝ නැතිවන්නීය. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය (දැඩිව අල්ලාගැනීම) නැති වීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය) නැතිවෙයි. ජාතිය (උත්පත්තිය) නැතිවීමෙන්

ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් සහ උපායාස (වැළපීම්) නැතිවෙත්. මෙසේ මේ එකම දුක්ගොඩ නැතිවේ.

**(දසවන නිදාන සූත්‍රය නිමි.)**

---

(පරිවීමංසමාන සූත්‍රය, උපාදාන සූත්‍රය, සංයෝජන සූත්‍ර දෙකය, මහාරුක්ඛ සූත්‍ර දෙකය, හත්වන තරුණරුක්ඛ සූත්‍රය, නාමරූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය සහ නිදාන සූත්‍රයයි මේ වර්ගයෙහි ඒ සූත්‍ර දසය වේ.)

(හයවන දුක්ඛවර්ගය නිමි.)

---

# 7. මහා වර්ගය.

## 1. අස්සුතවන්තු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූ තැන් නැති) පෘථග්ජනතෙම සතර මහා ධාතුවෙන් ඇතිවූ, මේ කයට කලකිරෙන්නේද, නෑලෙන්නේද, (එය) අත්හරිනු කැමැති වන්නේද වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, මේ සතර මහා ධාතුවෙන් හටගත් කයේ වැඩීමද, පිරිහීමද, ඇතිවීමද, නැතිවීමද දකියි. ඒ නිසා එහිදී, අශ්‍රැතවත් පෘථග්ජන තෙම කලකිරෙන්නේද වෙයි. නෑලෙන්නේද වෙයි. අත්හැරීමට කැමැති වන්නේද වෙයි. මහණෙනි, යමකට වනාහි සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ එහි කලකිරීමෙහි සමර්ථ නොවේ, නො

ඇලීමෙහි සමර්ථ නොවේ. මිදීමෙහි සමර්ථ නොවේ. ඊට හේතු කවරේද? අශ්‍රැතවත් පෘථග්ජනයා විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'ඒ සිත මගේය, මම වෙමිය, මාගේ ආත්මයයි, වැළඳගන්නා ලදී. මමායනය කරනලදී. දෘෂ්ටියෙන් අල්ලාගන්නා ලදී. එහෙයින් අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ එහි කලකිරීමට සමර්ථ නොවේ. නොඇලීමට සමර්ථ නොවේ. මිදීමට සමර්ථ නොවේ.

3. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම 'සිත මමයයි ගන්නවාට වඩා මේ සතර මහා ධාතුවෙන් හටගත් කය මමයයි ගැනීම හොඳය.' ඊට හේතු කවරේද? මහණෙනි, සතර මහා ධාතුවෙන් හටගත්තාවූ, අවුරුද්දක් සිටින්නාවූද, දෑවුරුද්දක් සිටින්නාවූද, තුන් අවුරුද්දක් සිටින්නාවූද, සතර අවුරුද්දක් සිටින්නාවූද, පස් අවුරුද්දක් සිටින්නාවූද, දස අවුරුද්දක් සිටින්නාවූද, විසි අවුරුද්දක් සිටින්නාවූද, තිස් අවුරුද්දක් සිටින්නාවූද, හතළිස් අවුරුද්දක් සිටින්නා වූද, පනස් අවුරුද්දක් සිටින්නාවූද හැට අවුරුද්දක් සිටින්නාවූද, හැත්තෑ අවුරුද්දක් සිටින්නාවූද, අසූ අවුරුද්දක් සිටින්නාවූද, අනූ අවුරුද්දක් සිටින්නාවූද, අවුරුදු සීයක් සිටින්නාවූද, ඊට වැඩිය හෝ සිටින්නාවූද, මේ කය දක්නා ලැබේ. (එහෙයිනි.) මහණෙනි, යමකට වනාහි සිත යයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද ඒ සිත රෑද, දවල්ද, අනිකක්ම උපදියි අනිකක්ම නිරුද්ධ වෙයි.

4. "මහණෙනි, මහාවනයෙහි හැසිරෙන වඳුරා යම්සේ අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, මහණෙනි, එසේම මේ යමක් වනාහි සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, ඒ සිත රෑද, දවල්ද, අනිකක් උපදියි, අනිකක් නිරුද්ධවෙයි.

5. "මහණෙනි, එහිදී ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම "පටිච්ච සමුප්පාදයම" මනාකොට නුවණින්

කල්පනා කරයි. (කෙසේද?) මේ හේතුව ඇති කල මේ ඵලය ඇතිවෙයි. මේ හේතුවගේ පහළවීමෙන් මේ ඵලය පහළ වෙයි. මෙය නැති කල මෙය නැතිවේ. මෙය නූපන් කල්හි මෙය නූපදියි, යනුවෙනි. හේ මෙසේයි:-

"අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා, මරණද, ශෝකවීම්, (හැඬීම්) දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

**6.** "අවිජ්ජාව මුළුමණින්ම නැතිකිරීමෙන් සංස්කාර නැති වෙයි. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැති වෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය), නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන්ද මිශ්‍ර දුක් සමූහය නැතිවෙයි. මහණෙනි, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරුනේ නෑලෙයි. නෑලීමෙන් නිවණ ලබයි. රහත් ඵලයට පැමුණුනු කල්හි නිවණ ලැබුවේ යයි නුවණ ඇතිවෙයි. ඉපදීම අවසාන යන වූයේය.

බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලද්දේය. කළයුතු දේ කළේය. මේ ආත්මයෙහි කළයුතු තවත් දෙයක් නැතැයි දැනගනියි.

**(පළමුවන අස්සුතවන්තු සූත්‍රය නිමි.)**

---

## 2. අස්සුතවන්තු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

"මහණෙනි, අශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) පෘථග්ජන තෙම සතර මහා ධාතුවෙන් ඇතිවූ, මේ කයට කලකිරෙන්නේද, නෑලෙන්නේද, එය අත්හරිනු කැමැති වන්නේද වෙයි. ඊට හේතුව කවරේද? මහණෙනි, මේ සතර මහා ධාතුවෙන් හටගත් මේ කයේ වැඩීමද, පිරිහීමද, ඇතිවීමද, නැතිවීමද පෙනෙයි. ඒ නිසා එහිදී අශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් නැති) පෘථග්ජන තෙම කලකිරෙන්නේද, නෑලෙන්නේද, අත්හරිනු කැමැතිවන්නේද වෙයි.

2. "මහණෙනි, යමක් සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, අශ්‍රැතවත් පෘථග්ජන තෙම ඒ සිතෙහි කලකිරීමට සමර්ථ නොවේ. නෑලීමට සමර්ථ නොවේ. අත් හැරීමට සමර්ථ නොවේ. ඊට හේතුව කවරේද? මහණෙනි, අශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූ තැන් නැති) පෘථග්ජනයා විසින් මේ සිත මාගේය, මේ සිත මමය, මේ සිත මාගේ ආත්මයයි බොහෝ කලක් තිස්සේ (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන්) වැළඳ ගන්නා ලදී. (මාන වශයෙන්) මමායනය කරන ලදී. (දෘෂ්ටි වශයෙන්) අල්වා ගන්නා ලදී. ඒ නිසා එහි අශ්‍රැතවත්

(බොහෝ ඇසූපිරූතැන් නැති) කලකිරීමට සමර්ථ නොවේ. නැලීමට සමර්ථ නොවේ. අත්හැරීමට සමර්ථ නොවේ.

3. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන තෙම සිතට වඩා මේ සතර මහා ධාතුවෙන් ඇතිවූ, කයම ආත්මය ලෙස සැලකීම හොඳය. ඊට හේතු කවරේද? මහණෙනි, සතර මහා ධාතුවෙන් හටගත්තාවූද, අවුරුද්දක් සිටින්නාවූද, දෑවුරුද්දක් සිටින්නාවූද, තුන් අවුරුද්දක් සිටින්නාවූද, සතර අවුරුද්දක් සිටින්නාවූද, පස් අවුරුද්දක් සිටින්නාවූද, දස අවුරුද්දක් සිටින්නාවූද, විසි අවුරුද්දක් සිටින්නාවූද, තිස් අවුරුද්දක් සිටින්නාවූද, හතළිස් අවුරුද්දක් සිටින්නාවූද, පනස් අවුරුද්දක් සිටින්නාවූද, හැට අවුරුද්දක් සිටින්නාවූද, හැත්තෑ අවුරුද්දක් සිටින්නාවූද, අසූ අවුරුද්දක් සිටින්නා වූද, අනූ අවුරුද්දක් සිටින්නාවූද, අවුරුදු සීයක් සිටින්නා වූද ඊට වැඩිය හෝ සිටින්නාවූද, මේ කය දක්නා ලැබෙයි. (එහෙයිනි) මහණෙනි, යමක් සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, ඒ සිත රෑද, දවල්ද, අනිකක් අනිකක්ම උපදියි. අනිකක් අනිකක්ම නිරුද්ධ වෙයි.

4. "මහණෙනි, එහිදී ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවක තෙම "පටිච්ච සමුප්පාදයම" මනාකොට නුවණින් කල්පනා කෙරෙයි. (කෙසේද?) මෙය ඇති කල්හි මෙය ඇතිවේ. මෙය උපන් කල්හි මෙය උපදියි. මෙය නැති කල්හි මෙය නැතිවේ. මෙය නිරුද්ධවූ කල්හි මෙය නිරුද්ධ වෙයි.

'මහණෙනි, සැප වේදනාවට හේතුවූ ස්පර්ශය නිසා සැප වේදනා තොමෝ උපදින්නේය. ඒ සැප වේදනාවට හේතුවූ ස්පර්ශය නැසීමෙන්ම එයින් උපන් සැප වේදනාවට හේතුවූ ස්පර්ශය නිසා උපන් (යම්) සැප වේදනාවක් වීද, එය නැතිවේ. එය සංසිඳේ.

5. "මහණෙනි, දුක් වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා දුක් වේදනාව උපදී. ඒ දුක් වේදනාවට හේතුවූ, ස්පර්ශය

නැසීමෙන් එයින් උපන්, යම් දුක් වේදනාවක් වීද, එය නැතිවේ. එය සංසිඳේ. මහණෙනි, නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා නොදුක් නොසැප වේදනා තොමෝ උපදින්නීය. ඒ නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නැසීමෙන්ම එයින් උපන්, ඒ නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා උපන් යම් නොදුක් නොසැප වේදනාවක්වීද, එය නැතිවේ. එය සංසිඳේ.

**6.** "මහණෙනි, යම්සේ දරලී දෙකක් එක්කොට ඇතිල්ලීමෙන් උණුසුමක් ඇතිවෙයිද, රස්නයක් උපදියිද, ඒ දරලී දෙකම වෙන් කිරීමෙන්, දුරස්කොට තැබීමෙන් එයින් උපන් යම් උණුසුමක් වීද, එය නැතිවේ. එය නිවේ. මහණෙනි, එසේම සැප වේදනාවට හේතුවූ ස්පර්ශය නිසා උපන් යම් සැප වේදනාවක් වීද, එය නැතිවේ, එය සංසිඳේ.

"මහණෙනි, දුක් වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා දුක් වේදනාව උපදී. ඒ දුක් වේදනාවට හේතුවූ, ස්පර්ශය නැසීමෙන්ම එයින් උපන්, දුක් වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා උපන් යම් දුක් වේදනාවක්වීද, එය නැතිවේ. එය සංසිඳේ.

**7.** "මහණෙනි, නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා නොදුක් නොසැප වේදනා තොමෝ උපදින්නීය. ඒ නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නැසීමෙන්ම එයින් උපන්, නොදුක් නොසැප වේදනාවට හේතුවූ, ස්පර්ශය නිසා උපන් යම් නොදුක් නොසැප වේදනාවක් වීද, එය නැතිවේ. එය සංසිඳේ.

"මහණෙනි, මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවක තෙම ස්පර්ශයට කලකිරෙයි. වේදනාවට කලකිරෙයි. සංඥාවට කලකිරෙයි. සංස්කාරයන්ට කලකිරෙයි. විඥ්ඥාණයට කලකිරෙයි. කලකිරීමෙන් නෑලෙයි. නෑලීමෙන් නිවණ ලබයි. එවිට නිවණ ලැබුවේයයි නුවණ ඇතිවෙයි. ඉපදීම අවසානය, බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන

ලදී. කළයුතු දේ කළේය, මේ ආත්මයේ කළයුතු තවත් දෙයක් නැතැයි දැනගනියි.”

(දෙවෙනි අස්සුතවන්තු සූත්‍රය නිමි.)

---

## 3. පුත්‍ර මාංශ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’ යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

“මහණෙනි, උපන් සත්වයින්ගේ පැවැත්ම පිණිසද, නූපන් සත්වයින්ට (ඉපදීම බලාපොරොත්තුවන සත්වයින්ට) උපකාර පිණිසද පවත්නාවූ මේ ආහාරයෝ සතරක් වෙත්. කවර සතරක්ද, දළවූ හෝ සියුම්වූ හෝ කබලිංකාරාහාරය (පිඬුකොට කෑයුතු ආහාරය) පළමුවැන්නය, ස්පර්ශාහාරය දෙවැන්නය, චේතනාහාරය තුන්වැන්නය, විඤ්ඤාණාහාරය සිව්වැන්නය. මහණෙනි, මේ සතරාහාරයෝ උපන් සත්වයින්ගේ පැවැත්ම පිණිසද, නූපන් සත්වයින්ට (ඉපදීම බලාපොරොත්තුවෙන සත්වයින්ට) උපකාර පිණිසද වෙත්.

3. “මහණෙනි, කබලිංකාරාහාරය වනාහි කෙසේ දතයුතු වන්නේද? මහණෙනි, යම්සේ අඹුසැමි දෙදෙනෙක් වනාහි සුළු මග වියදමක් ගෙන, කාන්තාර මාර්ගයකට පිළිපන්නාහුය. ඔවුන්ගේ ප්‍රියවූ, මනාපවූ, එකම දරුවෙක්ද වූයේය. මහණෙනි, පසුව කාන්තාර මාර්ගයේ ගමන්ගත් ඒ අඹු සැමි දෙදෙනාගේ යම් සුළු මගවියදමක් වීද, එය ක්ෂයවීමට, අවසන්වීමට යන්නේය. ඔවුන්ට කාන්තාරය තරණය කළ නොහැකිවූයේය, ඉතුරු වූයේද විය. මහණෙනි, ඉක්බිති ඒ අඹු සැමි දෙදෙනාට මේ අදහස ඇතිවූයේය. අපේ යම් සුළු මග වියදමක් වීද, එය වනාහි වියදම්වී

අවසාන විය. මේ කාන්තාරයද අවසන් නොවූයේ, ඉතුරු විය. ඒකාන්තයෙන් අපි මේ ප්‍රිය මනාප එකම දරුවා මරා, ඝන තුනී වශයෙන් (මස්) දෙකොටසක් කොට, පුත්‍රමාංශ කන්නාහු දෙදෙනාම මේ ඉතුරුවූ කාන්තාරය එතර කරන්නෙමු. නැතහොත් තුන්දෙනාම විනාශ වන්නෙමුය කියායි.

**4.** "මහණෙනි, අනතුරුව ඒ අඹු සැමි දෙදෙනා ඒ ප්‍රියවූ, මනාපවූ; එකම දරුවා මරා, ඝන-තුනී වශයෙන් (මස්) දෙකොටසක් කොට, පුත්‍රමාංශ කන්නාහු, මෙසේ ඒ ඉතිරිවූ, කාන්තාරය එතර කරන්නාහුය. ඔවුහු පුත්‍රමාංශයද කමින් (අපේ) එකම පුතා කොහිද! (අපේ) එකම පුතා කොහිදැ!!යි කියමින් (ඔවුන්ගේ) පපුවටද ගසාගන්නාහුය. මහණෙනි, එය කුමකැයි කියා සිතන්නහුද? ඔවුහු සෙල්ලම් පිණිස හෝ ආහාර ගන්නාහුද, මද ඇතිවීම පිණිස හෝ ආහාර ගන්නාහුද, අලංකාරවීම පිණිස හෝ ආහාර ගන්නාහුද, සැරසීම පිණිස හෝ ආහාර ගන්නාහුද?" "ස්වාමීනි, ඒ එසේ නොවේ."

**5.** "මහණෙනි, ඔවුහු යම්තාක් කාන්තාරය එතරකිරීම පිණිසම ආහාර ගන්නෝ නොවෙත්ද?" එසේය ස්වාමීනි."

"මහණෙනි, කබලිංකාරාහාරය (පිඩුකොට කෑයුතු ආහාරය) එසේ දතයුතුයයි මම කියමි.

"මහණෙනි, කබලිංකාරාහාරය (පිඩුකොට කෑයුතු ආහාරය) පිරිසිඳ දත් කල්හි පඤ්චකාමගුණ පිළිබඳවූ රාගය පිරිසිඳ දැනගන්නා ලද්දේ වෙයි. පඤ්චකාම ගුණ පිළිබඳ රාගය පිරිසිඳ දත් කල්හි යම් සංයෝජනයකින් (බැඳුමකින්) බැඳුනු ආර්යශ්‍රාවක තෙම නැවත මේ ලෝකයට එන්නේද, ඒ සංයෝජනය (බැඳුම) නැතිවේ.

**6.** "මහණෙනි, ස්පර්ශාහාරය කෙසේ දතයුතු වන්නේද? මහණෙනි, යම්සේ වනාහි හම නැති එළදෙනක් ඉදින්, බිත්තියක් ඇසුරුකොට සිටින්නේ නම්, (ඒ) බිත්තිය ඇසුරු කොට යම්කිසි සත්තු සිටිත්ද, ඔවුහු ඇය කන්නාහ. ඉදින් ගසක් ඇසුරුකොට

සිටින්නේ නම් (ඒ) ගස ඇසුරුකොට යම්කිසි සත්තු සිටිත්ද, ඔවුහු ඇය කන්නාහ. ඉදින් වතුර ඇසුරුකොට සිටින්නේ නම් (ඒ) වතුර ඇසුරුකොට, යම්කිසි සත්තු සිටිත්ද, ඔවුහු ඇය කන්නාහ. ඉදින් අහස ඇසුරු කොට සිටින්නේ නම්, (ඒ) අහස ඇසුරුකොට යම්කිසි සත්තු සිටිත්ද, ඔවුහු ඇය කන්නාහ. මහණෙනි, යමක් ඇසුරුකොට ඒ හම නැති එළදෙන සිටින්නී නම්, ඒ දේ ඇසුරුකොට යම්කිසි සත්තු සිටිත්ද, ඔවුහු ඇය කන්නාහ. මහණෙනි, ස්පර්ශාහාරය වනාහි එසේ දතයුතුයයි මම කියමි. මහණෙනි, ස්පර්ශාහාරය පිරිසිඳ දත් කල්හි ත්‍රිවිධ වේදනාවෝ පිරිසිඳ දැනගන්නා ලද්දාහුවෙත්. වේදනා තුන පිරිසිඳ දැනගත් කල්හි ආර්යශ්‍රාවකයාට මතු කිසි කළයුත්තක් නැතැයි කියමි.

7. "මහණෙනි, මනොසඤ්චෙතනාහාරය කෙසේ දතයුතු වන්නේද? මහණෙනි, යම්සේ මිනිසෙකුගේ උසටද වැඩිවූ ගිනිදැල් නැති, දුම් නැති, අඟුරින් පිරුණු, ගිනිඅඟුරු වලක් වේද, එවිට ජීවත්වෙනු කැමැති, නොමැරෙනු කැමැති, සැප කැමැති, දුක් පිළිකුල් කරන, පුරුෂයෙක් එන්නේය. ඒ ඔහු බලසම්පන්න පුරුෂයින් දෙදෙනෙක් (ඔහුගේ) දෑත වෙන වෙනම අල්ලාගෙන, ඒ අඟුරු වලට අදින්නාහුය. මහණෙනි, ඉක්බිති ඒ පුරුෂයාගේ අදහස දුරුව යන්නේය. පැතුම දුරුව යන්නේය. ආශාව දුරුව යන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ පුරුෂයාට මේ අදහස ඇතිවේ. "මම මේ අඟුරු වලේ වැටෙන්නේ නම්, ඒ නිසා මරණයට හෝ මරණය සමාන දුකකට පත්වෙමි කියායි. මහණෙනි, මනෝ සඤ්චෙතනාහාරය එසේ දතයුතුයයි මම කියමි. මහණෙනි, මනොසඤ්චෙතනාහාරය පිරිසිඳ දත් කල්හි තෙවැදෑරුම් තණ්හාව පිරිසිඳ දැනගන්නා ලද්දාහු නම් වෙත්. තෙවැදෑරුම් තණ්හාව පිරිසිඳ දත් ආර්ය ශ්‍රාවකයාට මතු කිසි කළයුත්තක් නැතැයි කියමි.

8. "මහණෙනි, විඤ්ඤාණාහාරය කෙසේ දතයුතු වන්නේද? මහණෙනි, යම්සේ වනාහි වැරදි කළ සොරෙකු අල්ලා ගෙන රජුට දක්වන්නාහුය. (කෙසේද?) 'දේවයන් වහන්ස, මේ තෙමේ

ඔබවහන්සේට වැරදි කළ සොරාය. මොහුට යම් දඬුවමක් කිරීමට කැමැත්තෙහි නම් දඬුවම් කිරීමට පණවනු (නියම කරනු) මැනවි, කියායි. එවිට රජතෙම ඔවුන්ට මෙසේ කියන්නේය. 'පින්වත්නි, යව්. මේ පුරුෂයාට පෙරවරු කාලයෙහි සැත් (ආයුධ) සියයකින් හිංසා කරව්යයි' කියායි. පෙරවරු කාලයෙහි සැත් සියයකින් ඔහුට හිංසා කරන්නාහුය. ඉක්බිති රජතෙම මැදියම් කාලයෙහි මෙසේ කියන්නේය. 'පින්වත්නි, ඒ පුරුෂතෙම කෙසේදැයි කියායි. දේවයන්වහන්ස, එසේම ජීවත්වෙයි'. ඔවුන්ට රජතෙමෙ මෙසේ කියන්නේය. 'පින්වත්නි, යව්. ඒ පුරුෂයාට මැදියම් කාලයෙහි ආයුධ සියයකින් හිංසා කරව්යයි' කියායි. මැදියම් කාලයෙහි ආයුධ සියයකින් ඔහුට හිංසා කරන්නාහුය. ඉක්බිති රජතමෙ සවස් කාලයෙහි මෙසේ කියන්නේය. 'පින්වත්නි, ඒ පුරුෂතෙම කෙසේදැයි' කියායි. 'දේවයන් වහන්ස, එසේම ජීවත්වෙයි'. ඔවුන්ට රජතෙම මෙසේ කියන්නේය. 'පින්වත්නි, යව්. ඒ පුරුෂයාට සවස් කාලයෙහි ආයුධ සියයකින් හිංසා කරව්යයි' කියායි. සවස් කාලයෙහි ඔහුට ආයුධ සියයකින් හිංසා කරන්නාහුය.

**9.** "මහණෙනි, ඒ ගැන කෙසේ සිතන්නද? දවසක් තුන්සියයක් ආයුධවලින් හිංසා කරනු ලබන්නාවූ, ඒ පුරුෂ තෙම ඒ හිංසාකිරීමේ හේතුවෙන් දුකක් දොම්නසක් විඳින්නේද"? "ස්වාමීනි, එක් ආයුධයකින් හිංසා කරනු ලබන්නේ ඒ හිංසා කිරීම් හේතුවෙන් දුකක් දොම්නසක් ලබන්නේය. ආයුධ තුන්සියයකින් හිංසා කරනු ලබන්නේ වනාහි කියනුම කවරේද?" "මහණෙනි, විඤ්ඤාණාහාරය වනාහි එසේ දතයුතුයයි මම කියමි. මහණෙනි, විඤ්ඤාණාහාරය පිරිසිඳ දැනගත් කල්හි නාමරූප පිරිසිඳ දැනගන්නා ලද්දේ වෙයි. නාමරූප පිරිසිඳ දත් කල්හි ආර්ය ශ්‍රාවකයාහට මතු කිසි කළ යුත්තක් නැතැයි" කියමි.

**(තෙවෙනි පුත්‍රමාංශ සූත්‍රය නිමි.)**

---

## 4. රාග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ උපන් සත්ත්වයින්ගේ පැවැත්ම පිණිසද, නූපන් සත්ත්වයින්ට (ඉපදීම බලාපොරොත්තුවන සත්ත්වයින්ට) උපකාර පිණිසද පවත්නා මේ ආහාරයෝ සතරක් වෙත්. ඒ සතරාහාරයෝ කවරහුද? දළ හෝ සියුම් හෝ කබලිංකාර ආහාරය (පිඬුකොට කෑයුතු ආහාරය) පළමුවැන්නය. ස්පර්ශාහාරය දෙවැන්නය, මනොසංචෙතනාහාරය තෙවැන්නය, විඥ්ඥාණාහාරය සිව් වැන්නය. මහණෙනි, මේ සතරාහාරය උපන් සත්ත්වයින්ගේ පැවැත්ම පිණිසද, නූපන් සත්ත්වයින්ට (ඉපදීම බලාපොරොත්තුවන සත්ත්වයින්ට) උපකාර පිණිසද වෙත්.

3. "මහණෙනි, ඉදින් කබලිංකාර ආහාරයෙහි (පිඬුකොට කෑයුතු ආහාරයෙහි) රාගය (ඇලෙන ආශාව) ඇත්තේද, නන්දිය (සතුටුවන ආශාව) ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඥ්ඥාණය පිහිටියේද වැඩුණේද වෙයි. යම් තැනක විඥ්ඥාණය පිහිටියේද වැඩුණේද එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයෙහි නැවත ඉපදීම ඇත්තේද, යම් තැනක මතු භවයක නැවත ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි (එතැන) ශෝක සහිතය, රජස් (කෙලෙස්) සහිතය, වැළපීම් සහිතයයි කියමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** "මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඤ්ඤාණය පිහිටියේය, වැඩුණේය. යම්තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාම රූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

**5.** "මහණෙනි, ඉදින් මනෝසඤ්චෙතනාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඤ්ඤාණය පිහිටියේය, වැඩුණේය. යම්තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම්තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම්තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

**6.** "මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඤ්ඤාණය පිහිටියේය, වැඩුණේය. යම් තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද එහි නාම රූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාම රූපයාගේ බැසගැණීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම්තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

**7.** "මහණෙනි, යම්සේ සායම් පොවන්නෙක් හෝ සිතියම් අඳින්නෙක් හෝ සායම් හෝ ලාකිරි හෝ කහ හෝ නිල් හෝ මදට ඇති කල්හි ඔපමට්ටම් කරන ලද්දක හෝ ලෑල්ලක හෝ බිත්තියක හෝ රෙදිපටක හෝ සියලු අඟපසඟින් යුක්තවූ, ස්ත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් හෝ නිමවන්නේද (අඳින්නේද) මහණෙනි, එසේම වනාහි ඉදින් කබලිංකාරාහාරයෙහි (පිඬුකොට කෑයුතු ආහාරයෙහි) රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද එහි විඤ්ඤාණය පිහිටියේය. වැඩුණේය. යම් තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි" කියමි.

**8.** "මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඤ්ඤාණය පිහිටියේය. වැඩුණේය. යම් තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

**9.** "මහණෙනි, ඉදින් මනොසඤ්චෙතනාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි

විඤ්ඤාණය පිහිටියේය. වැඩුණේය. යම් තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම්තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

10. "මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය ඇත්තේද, නන්දිය ඇත්තේද, තණ්හාව ඇත්තේද, එහි විඤ්ඤාණය පිහිටියේය. වැඩුණේය. යම් තැනක විඤ්ඤාණය පිහිටියේද, වැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම ඇත්තේය. යම්තැනක නාමරූපයාගේ බැසගැනීම ඇත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම ඇත්තේද, එහි මතු භවයක ඉපදීම ඇත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම ඇත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය ඇත්තේද, මහණෙනි, (එතැන) ශෝක සහිතය, රජස් සහිතය, වැළපීම් සහිතයයි කියමි.

11. "මහණෙනි, ඉදින් කබලිංකාර (පිඩුකොට කැයුතු) ආහාරයෙහි රාගය (ඇතුළත තණ්හාව) නැත්තේද නන්දිය (සතුටුවන තණ්හාව) නැත්තේද, තණ්හාව නැත්තේද එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද, නොවැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේද, එහි මතු භවයෙහි නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයෙහි නැවත ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේද, මහණෙනි

(එතැන) ශෝක රහිතය, රජස් (කෙලෙස්) රහිතය, වැළපීම් රහිතයයි කියමි.

12. "මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි රාගය නැත්තේවේද, නන්දිය නැත්තේද, තණ්හාව නැත්තේවේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද නොවැඩුණේද එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය යම් තැනක නාමරූපයාගේ බැසගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේවේද, එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම ජරාව සහ මරණය නැත්තේවේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.

13. "මහණෙනි ඉදින් මනෝසඤ්චෙතනාහාරයෙහි රාගය නැත්තේ වේද, නන්දිය නැත්තේ වේද, තණ්හාව නැත්තේ වේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද, නොවැඩුණේද, එහි නාම රූපයාගේ බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේවේද, එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේවේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.

14. "මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය නැත්තේවේද, නන්දිය නැත්තේවේද, තණ්හාව නැත්තේවේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද, නොවැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම

නැත්තේද එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ වේද, එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේ වේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.

**15.** "මහණෙනි, යම්සේ උතුරු දිශාවෙහි හෝ දකුණු දිශාවෙහි හෝ කූටාගාරයක් (තනි කොතක් ඇති ගෙයක් හෝ) කූටාගාර ශාලාවක් (කොත් දෙකක් ඇති ගෙයක්) හෝ වෙයිද හිරු නගින කල්හි එහි නැගෙනහිර කවුළුවෙන් හිරු රැස් ගේ ඇතුළට ඇතුල්ව කොහි පිහිටියේද?"

"ස්වාමීනි, බටහිරදිග බිත්තියෙහිය."

"මහණෙනි, ඉදින් බටහිරදිග බිත්තිය නොවූයේ නම් කොහි පිහිටියේද?"

"ස්වාමීනි, පොළොවෙහිය"

"මහණෙනි, ඉදින් පොළොව නොවූයේ නම් කොහි පිහිටියේද?"

"ස්වාමීනි, ජලයෙහිය"

"මහණෙනි, ඉදින් ජලය නොවූයේ නම් කොහි පිහිටියේද?"

"ස්වාමීනි, (එවිට) නොසිටියේ වෙයි."

**16.** "මහණෙනි, එසේම වනාහි කබලිංකාරාහාරයෙහි (පිඬුකොට කෑයුතු ආහාරයෙහි) රාගය නැත්තේ වේද, නන්දිය නැත්තේ වේද, තණ්හාව නැත්තේවේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද, නොවැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේවේද, එහි මතු භවයක ඉපදීම

නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම ජරාව සහ මරණය නැත්තේ වේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපිම් රහිතයයි කියමි.

17. "මහණෙනි, ඉදින් ස්පර්ශාහාරයෙහි රාගය නැත්තේ වේද, නන්දිය නැත්තේ වේද, තණ්හාව නැත්තේ වේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය. යම්තැනක විඤ්ඤාණය නොපිහිටියේද, නොවැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැස ගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ වේද, එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේ වේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම්තැනක මතු ඉපදීම ජරාව සහ මරණය නැත්තේවේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.

18. "මහණෙනි, මනොසඤ්චෙතනාහාරයෙහි රාගය නැත්තේවේද, නන්දිය නැත්තේවේද, තණ්හාව නැත්තේ වේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය, නොවැඩුණේය යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද නොවැඩුණේද, එහි නාමරූපයාගේ බැසගැනීම නැත්තේය. යම්තැනක නාමරූපයාගේ බැස ගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම්තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේ වේද, එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම්තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේවේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.

19. "මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය නැත්තේ වේද, නන්දිය නැත්තේ වේද තණ්හාව නැත්තේ වේද, එහි විඤ්ඤාණය නොපිහිටියේය. නොවැඩුණේය. යම් තැනක විඤ්ඤාණය නොපිහිටියේද නොවැඩුණේද, එහි නාමරූපයාගේ

බැසගැනීම නැත්තේය. යම් තැනක නාමරූපයාගේ බැසගැනීම නැත්තේද, එහි සංස්කාරයන්ගේ වැඩීම නැත්තේය. යම් තැනක සංස්කාරයන්ගේ වැඩීම නැත්තේවේද එහි මතු භවයක නැවත ඉපදීම නැත්තේය. යම් තැනක මතු භවයක ඉපදීම නැත්තේද, එහි මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේය. යම් තැනක මතු ඉපදීම, ජරාව සහ මරණය නැත්තේවේද, මහණෙනි, (එතැන) ශෝක රහිතය, රජස් රහිතය, වැළපීම් රහිතයයි කියමි.”

**(සිච්චන රාග සූත්‍රය නිමි.)**

---

## 5. නගර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, බුද්ධත්වයට පෙරම බුදුනොවූ බෝසත්වූම මට මේ සිත පහළවිය. ‘මේ සත්ව ලෝකයා දුකට පැමිණියේ, උපදියි, ජරාවට පත්වෙයි. මැරෙයි, චුතවෙයි, පිළිසිඳගනියි. එතකුදුවුවත් ජරාමරණයෙන් යුත් මේ දුක නැතිකිරීම කවර කලක වනාහි ජරාමරණයෙන් යුත් මේ දුක නැතිකිරීම පෙනේද කියා නොදනියි’. මහණෙනි, ඒමට මේ අදහස පහළවිය. ‘කුමක් ඇති කල්හි වනාහි ජරාව සහ මරණය ඇතිවේද, කුමක් නිසා ජරාව සහ මරණය ඇතිවේද’? කියායි.

3. “මහණෙනි, ඒ මට කරුණු අනුව මෙනෙහි කිරීමෙන් ඉපදීම ඇති කල්හි වනාහි ජරාව සහ මරණය ඇතිවෙයි. ඉපදීම නිසා ජරාව සහ මරණය ඇතිවෙයි කියා නුවණින් අවබෝධවිය.

“මහණෙනි ඒ මට මේ අදහස පහළවිය. ‘කුමක් ඇති කල්හි වනාහි ඉපදීම ඇතිවේද, කුමක් නිසා ඉපදීම ඇතිවේද’ කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් භවය ඇති කල්හි වනාහි ඉපදීම (ජාතිය) ඇතිවෙයි භවය නිසා ඉපදීම (ජාතිය) ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය 'කුමක් ඇති කල්හි වනාහි භවය ඇතිවේද, කුමක් නිසා භවය ඇතිවේද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් උපාදානය ඇති කල්හි වනාහි භවය ඇතිවෙයි උපාදානය නිසා භවය ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි උපාදානය ඇතිවේද, කුමක් නිසා උපාදානය ඇතිවෙයිද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව ඇති කල්හි වනාහි උපාදානය ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවේද, කුමක් නිසා තණ්හාව ඇතිවේද' කියයි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව ඇති කල්හි වනාහි තණ්හාව ඇතිවෙයි. වේදනාව නිසා තණ්හාව ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි වේදනාව ඇතිවේද, කුමක් නිසා වේදනාව ඇතිවේද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් ස්පර්ශය ඇති කල්හි වනාහි වේදනාව ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවේද, කුමක් නිසා ස්පර්ශය ඇතිවේද' කියායි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සළායතන ඇති කල්හි වනාහි ස්පර්ශය ඇතිවෙයි. සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි සළායතනයන් ඇතිවේද, කුමක් නිසා සළායතනයන් ඇතිවේද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් නාම රූප ඇති කල්හි වනාහි සළායතන ඇතිවෙයි. නාමරූප නිසා සළායතන ඇතිවෙයි කියා නුවණින් අවබෝධවිය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් ඇති කල්හි වනාහි නාමරූපයන් ඇතිවේද, කුමක් නිසා නාමරූප ඇතිවේද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් විඤ්ඤාණය ඇති කල්හි වනාහි නාමරූප ඇතිවෙයි. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවෙයි කියා නුවණින් අවබෝධවිය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවේද, කුමක් නිසා විඤ්ඤාණය ඇතිවෙයිද' කියායි.

"මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් නාමරූප ඇති කල්හි වනාහි විඤ්ඤාණය ඇතිවෙයි. නාමරූප නිසා විඤ්ඤාණය ඇතිවෙයි කියා නුවණින් අවබෝධ විය.

4. "මහණෙනි, ඒ මට මේ අදහස ඇතිවිය. 'මේ විඤ්ඤාණය වනාහි ආපසු හැරෙයි. නාමරූපයන්ගෙන් ඔබ්බට නොයයි. මෙතෙකින් පිළිසිඳ ගත්තේ හෝ වේ. දිරන්නේ හෝ වේ. මැරෙන්නේ හෝ වේ. චුතවන්නේ හෝ වේ. (වෙන භවයක) උපදින්නේ හෝ වේ. (කෙසේද?) ඒ මේ නාමරූපයන් නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය

ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරාමරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්. දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ පහළවීම වෙයි.

**5.** "මහණෙනි, මට වනාහි සමුදය, සමුදයයි (ඇතිවීම ඇතිවීමයයි) පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළ විය. 'කුමක් නැතිකල්හි වනාහි ජරාමරණය නැතිවේද, කවරක් නැතිවීමෙන් ජරාමරණය නැතිවේද' කියායි. මහණෙනි, ඒ මට කරුණු අනුව මෙනෙහි කිරීමෙන් ඉපදීම නැතිකල්හි වනාහි ජරාමරණය ඇති නොවේ. ඉපදීම නිරුද්ධ කිරීමෙන් ජරාව සහ මරණය නිරුද්ධවේයයි.' නුවණින් අවබෝධ විය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි ඉපදීම නැතිවේද, කවරක් නැතිවීමෙන් ඉපදීම නැතිවේද' කියායි. මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් 'භවය නැති කල්හි වනාහි ඉපදීම ඇති නොවෙයි. භවය නැතිකිරීමෙන් ඉපදීම නැතිවේයයි' නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි භවය නැතිවේද, කවරක් නැතිවීමෙන් භවය නැතිවේද' කියායි.

**6.** "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් උපාදානය නැති කල්හි වනාහි භවය නැතිවෙයි. උපාදානය නැති කිරීමෙන් භවය නැතිවේයයි නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැතිකල්හි වනාහි උපාදානය නැතිවේද, කවරක් නැතිවීමෙන් උපාදානය නැතිවේද' කියායි.

**7.** "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් තණ්හාව නැති කල්හි වනාහි උපාදානය නැතිවෙයි. තණ්හාව නැති කිරීමෙන් උපාදානය නැතිවේයයි නුවණින් අවබෝධ විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි තණ්හාව නැතිවේද, කවරක් නැතිවීමෙන් තණ්හාව නැති වේද' කියායි.

8. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් වේදනාව නැති කල්හි වනාහි තණ්හාව නැතිවෙයි. වේදනාව නැති කිරිමෙන් තණ්හාව නැතිවේයයි නුවණින් අවබෝධ විය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි වේදනාව නැතිවේද, කවරක් නැතිවීමෙන් වේදනාව නැතිවේද' කියායි.

9. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් ස්පර්ශය නැති කල්හි වනාහි වේදනාව නැතිවෙයි. ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිවේයයි නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි ස්පර්ශය නැතිවේද, කවරක් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේද' කියායි.

10. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් සළායතනයන් නැති කල්හි වනාහි ස්පර්ශය නැතිවෙයි. සළායතනයන් නැතිකිරීමෙන් ස්පර්ශය නැතිවේයයි නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි සළායතනයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් සළායතනයන් නැති වේද' කියායි.

11. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් නාමරූපයන් නැති කල්හි වනාහි සළායතනයන් නැතිවෙයි. නාමරූපයන් නැතිකිරීමෙන් සළායතනයන් නැතිවේයයි නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක් නැති කල්හි වනාහි නාමරූපයන් නැතිවේද, කවරක් නැතිවීමෙන් නාමරූපයන් නැතිවේද' කියායි.

12. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් විඤ්ඤාණය නැති කල්හි වනාහි නාමරූප නැතිවෙයි. විඤ්ඤාණය නැතිකිරීමෙන් නාමරූප නැතිවේයයි නුවණින් අවබෝධවිය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'කුමක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නැති කල්හි වනාහි විඤ්ඤාණය නැතිවේද, කවරක් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේද' කියායි.

13. "මහණෙනි, ඒ මට ඇති තතු මෙනෙහි කිරීමෙන් නාමරූප නැති කල්හි වනාහි විඤ්ඤාණය නැතිවෙයි. නාමරූප නැතිකිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි නුවණින් අවබෝධ විය. මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය.

මා විසින් මේ මාර්ගය (ලෝකවාසීන්ට) අවබෝධ කරවීම පිණිස අවබෝධ කරන ලදී. මේ නාමරූප නැති කිරීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවෙයි. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැති වීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය නැතිවෙයි.) ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහය නැතිවේ.

14. "මහණෙනි, මට වනාහි නිරෝධය නිරෝධයයි (නැතිවීම නැතිවීමයයි) පෙර නො ඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඤාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය. මහණෙනි, යම්සේ වනාහි වනයෙහි හැසිරෙන්නාවූ, පුරුෂයෙක්තෙම පෙර මිනිසුන් විසින් ගමන් කරන ලද, පුරාණ පාරක්, පුරාණ මාර්ගයක් දක්නේවේද, හෙතෙම ඒ මාර්ගය අනුව යන්නේ පෙර මිනිසුන් විසින් වාසය කරන ලද, මල් උයන්වලින් වන උයන්වලින් යුක්තවූ, පොකුණුවලින් යුක්තවූ, ප්‍රාකාරවලින් යුක්තවූ, (නානා භාණ්ඩ සම්පත්තියෙන්) රමණීයවූ, පුරාණ නගරයක්, පුරාණ රාජධානියක් දක්නේය.

15. "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂතෙම රජුට හෝ රජුගේ මහ ඇමතියාට හෝ දැනුම් දෙන්නේය. (කෙසේද?) 'ස්වාමීනි,

දැනගනු මැනවි. මම වනයෙහි හැසිරෙන්නේ, පෙර මිනිසුන් විසින් ගමන් කරන ලද, පුරාණ මාර්ගයක්, පුරාණ මාවතක් දැක්කෙමි. මම ඒ මාර්ගයෙහි ගියෙමි. ඒ මාර්ගය අනුව ගියේ පෙර මිනිසුන් විසින් වාසය කරන ලද, මල් උයන් වන උයන්වලින් යුක්තවූ, පොකුණුවලින් යුක්තවූ, ප්‍රාකාරවලින් යුක්තවූ, (නානා භාණ්ඩ සම්පත්තියෙන්) රමණීයවූ, පුරාණ නගරයක්, පුරාණ රාජධානියක් දැක්කෙමි. ස්වාමීනි, ඒ නගරය සකස් කරනු මැනව (කියායි.)

**16.** "මහණෙනි, ඉක්බිති ඒ රජු හෝ රජුගේ මහ ඇමති තෙමේ හෝ ඒ නගරය සකස් කරන්නේය. ඒ නගරය පසු කලකදී සමෘද්ධවූ සියල්ලෙන් සම්පූර්ණවූ බොහෝ මිනිසුන්ගෙන් ගහණවූ, වැඩීමට පැමිණියාවූ, මහත් බවට පැමිණියාවූ, නගරයක් වන්නේය මහණෙනි, මමද පෙර සම්බුදුවරයන් විසින් ගමන් කරන ලද, පුරාණ මාර්ගය පුරාණ මාවත දැක්කෙමි.

"මහණෙනි, පෙර සම්බුදුවරයන් විසින් ගමන් කළාවූ ඒ පුරාණ මාර්ගය, පුරාණ මාවත කවරේද?

"මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැයි.

හේ කවරේද?

"සම්මාදිට්ඨිය, සම්මා සංකප්පය, සම්‍යක් වචනය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මා සතිය සහ සම්මාසමාධියයි.

**17.** මහණෙනි, මෙය වනාහි ඒ පෙර සම්බුදුවරයන් විසින් ගමන් කළාවූ, පුරාණ මාර්ගයයි, පුරාණ මාවතයි. ඒ මම ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම ජරා මරණය දැනගත්තෙමි. ජරා මරණය ඇතිවීමේ හේතුව දැනගත්තෙමි. ජරා මරණ නැතිවීම දැනගත්තෙමි. ජරා මරණය නැති කරන මාර්ගය දැනගත්තෙමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම ජාතිය (ඉපදීම) දැනගතිමි. ජාතිය (ඉපදීමට) හේතුව දැනගතිමි. ඉපදීම නැතිවීම දැනගතිමි. ඉපදීම නැතිකරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව

ගියාවූ මම භවය දැනගතිමි. භවයට හේතුව දැනගතිමි. භවය නැතිවීම දැනගතිමි. භවය නැතිකරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම උපාදානය දැනගතිමි. උපාදානය (තදින් අල්ලා ගැනීමට) හේතුව දැනගතිමි. උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිවීම දැනගතිමි. උපාදානය (තදින් අල්ලාගැනීම) නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම තණ්හාව දැනගතිමි. තණ්හාවට හේතුව දැනගතිමි. තණ්හාව නැතිවීම දැනගතිමි. තණ්හාව නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම වේදනාව දැනගතිමි. වේදනාවට හේතුව දැනගතිමි. වේදනාව නැතිවීම දැනගතිමි. වේදනාව නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම ස්පර්ශය දැනගතිමි. ස්පර්ශයට හේතුව දැන ගතිමි. ස්පර්ශය නැතිවීම දැනගතිමි. ස්පර්ශය නැතිකරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම සළායතන දැනගතිමි. සළායතනයට හේතුව දැනගතිමි. සළායතන නැතිවීම දැනගතිමි. සළායතන නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම නාමරූප දැනගතිමි. නාමරූපයන්ට හේතුව දැනගතිමි. නාම රූප නැතිවීම දැනගතිමි. නාම රූප නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම විඤ්ඤාණය දැනගතිමි. විඤ්ඤාණයට හේතුව දැනගතිමි. විඤ්ඤාණය නැතිවීම දැනගතිමි. විඤ්ඤාණය නැති කරන මාර්ගය දැනගතිමි. ඒ මාර්ගය අනුව ගියෙමි. ඒ මාර්ගය අනුව ගියාවූ මම සංස්කාරයන් දැනගත්තෙමි. සංස්කාර ඇතිවීමේ හේතුව දැනගත්තෙමි. සංස්කාර නැති වීම දැනගත්තෙමි. සංස්කාර නැතිකරන මාර්ගය දැනගත්තෙමි. එය දැන, භික්ෂූන්ට ද භික්ෂුණීන්ටද, උපාසකයන්ටද, උපාසිකාවන්ටද කීවෙමි.

18. "මහණෙනි, ඒ මේ ශාසන බ්‍රහ්මචරියාව ධ්‍යානාස්වාදයෙන් සමෘද්ධය. අභිඥාභරණයෙන් පිරුණේය.

පැතුරුණේය. බොහෝ දෙනා විසින් දැනගත යුතුය. මහත්වූ දෙව් මිනිසුන් අතුරෙහි (තථාගතයන් වහන්සේ විසින්) මනාකොට ප්‍රකාශ කරන ලදී.

**(පස්වන නගර සූත්‍රය නිමි.)**

---

## 6. සම්මසන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ "කම්මාස්සදම්ම" නම්වූ, කුරුරට වාසීන්ගේ නියම්ගම සමීපයෙහි වසනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන්ට කථාකළසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

2. "මහණෙනි, තොපි අභ්‍යන්තර ප්‍රත්‍යයන් විමසා බැලීම කරන්නහුද?" මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මම වනාහි අභ්‍යන්තර ප්‍රත්‍යය විමසා බැලීම කරන්නෙමි"යි කියායි. "මහණ, ඔබ කෙසේ වනාහි අභ්‍යන්තර ප්‍රත්‍යයන් විමසා බැලීම කරන්නෙහිද?" ඉක්බිති ඒ මහණ තෙම (තමා විමසා බලන ක්‍රමය) පැහැදිළි කළේය. යම්සේ ඒ මහණතෙම පැහැදිළි කළේද, ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේගේ සිත සතුටු නොකළේය.

3. "මෙසේ කීකල්හි ඇවැත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භාග්‍යවතුන් වහන්සේ යම් අභ්‍යන්තර ප්‍රත්‍යය විමසා බැලීමක් දේශනා කරනසේක් නම්, භාග්‍යවතුන් වහන්ස, එයට මේ කාලයයි. සුගතයන් වහන්ස, එයට මේ කාලයයි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්යයි" කියායි. "ආනන්දය, එසේවී නම් අසව්, මනාකොට මෙනෙහිකරව්. කියන්නෙමියි" (වදාළ සේක.) "එසේය ස්වාමීනි," කියා, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

**4.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විමසා බැලීම කරන්නේ අභ්‍යන්තර ප්‍රත්‍යය විමසා බලයි. (කෙසේද?) යම් මේ නානාප්‍රකාරවූ, ජරා මරණ දුක් ලෝකයෙහි උපදීද, මේ දුක වනාහි කුමක් නිදාන කොට ඇත්තේද? කුමක් හේතු කොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? කුමක් ඇතිකල්හි ජරා මරණය ඇතිවේද? කුමක් නැතිකල්හි ජරා මරණය ඇති නොවේද? කියායි. ඒ මහණතෙම විමසා බලන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) යම් මේ නානාප්‍රකාරවූ, ජරා මරණ දුක් ලෝකයෙහි උපදීද, මේ දුක වනාහි පඤ්චස්කන්ධය නිදානකොට ඇත්තේය. පඤ්චස්කන්ධය සමුදය කොට ඇත්තේය. පඤ්චස්කන්ධය ජාතිකොට ඇත්තේය. පඤ්චස්කන්ධය ප්‍රභවකොට ඇත්තේය. පඤ්චස්කන්ධය ඇති කල්හි ජරා මරණය ඇතිවේ. පඤ්චස්කන්ධය නැති කල්හි ජරා මරණය ඇති නොවේ, කියායි.

**5.** "ඒ මහණතෙම ජරා මරණයද දැනගනියි. ජරා මරණය ඇතිවීමේ හේතුවද දැනගනියි. ජරා මරණය නැතිවීමද දැන ගනියි. ජරා මරණය නැතිකරන යම් මාර්ගයක් වේද, එයත් දැනගනියි. ධර්මය අනුව හැසිරෙන්නේ, එසේ පිළිපන්නේද වෙයි. මහණෙනි, මේ මහණ තෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස, ජරා මරණය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

**6.** "ඉක්බිති නැවතත් විමසාබැලීම කරන්නේ අභ්‍යන්තර ප්‍රත්‍යය විමසා බලයි. කෙසේද? මේ පඤ්චස්කන්ධය වනාහි කුමක් නිදාන කොට ඇත්තේද, කුමක් හේතුකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභවකොට ඇත්තේද, කුමක් ඇතිකල්හි පඤ්චස්කන්ධය ඇතිවේද? කුමක් නැතිකල්හි පඤ්චස්කන්ධය ඇතිනොවේද? කියායි. හෙතෙම විමසනු ලබන්නේ මෙසේ දැනගනියි. පඤ්චස්කන්ධය තණ්හාව නිදානකොට ඇත්තේය. තණ්හාව හේතුකොට ඇත්තේය. තණ්හාව ජාතිකොට ඇත්තේය. තණ්හාව ප්‍රභවකොට ඇත්තේය. තණ්හාව ඇතිකල්හි පඤ්චස්කන්ධය ඇතිවේ. තණ්හාව

නැතිකල්හි පඤ්චස්කන්ධය ඇති නොවේය කියායි. හෙතෙම පඤ්චස්කන්ධයද දැනගනියි. පඤ්චස්කන්ධය ඇතිවීමේ හේතුවද දැනගනියි. පඤ්චස්කන්ධය නැතිවීමද දැනගනියි. පඤ්චස්කන්ධය නැතිකිරීමට යායුතු සුදුසු මාර්ගයක් වේද, එයත් දැනගනියි. ධර්මය අනුව හැසිරෙන්නේ එසේ පිළිපන්නේද වෙයි. මහණෙනි මේ මහණතෙම සියලු ආකාරයෙන් මනාකොට දුක් නැතිකිරීම පිණිස, පඤ්චස්කන්ධය නැතිකිරීම පිණිස පිළිපන්නේයයි කියනු ලැබේ.

7. "ඉක්බිති නැවතත් විමසා බැලීම කරන්නේ, අභ්‍යන්තර ප්‍රත්‍යය විමසා බලයි. (කෙසේද?) මේ තණ්හාව වනාහි උපදිනු ලබන්නී, කොතැන්හි උපදින්නීද? සිටිනු ලබන්නී, කොතැන්හි සිටින්නීද? කියායි. ඒ මහණතෙම විමසන්නේ මෙසේ දැනගනියි. (කෙසේද?) ලෝකයෙහි වනාහි යම්කිසි ප්‍රිය ස්වභාවයක්, මධුර ස්වභාවයක් ඇත්තේ වේද, මෙතැන්හි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී, උපදින්නීය. සිටිනු ලබන්නී, සිටින්නීය, ලෝකයෙහි ප්‍රිය ස්වභාවය, මධුර ස්වභාවය කවරේද? ලෝකයෙහි ඇස ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලන්නී සිටින්නීය. ලෝකයෙහි කණ ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලබන්නී සිටින්නීය. ලෝකයෙහි නැහැය ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලබන්නී සිටින්නීය. ලෝකයෙහි දිව ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලබන්නී සිටින්නීය. ලෝකයෙහි කය ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලබන්නී සිටින්නීය. ලෝකයෙහි මනස ප්‍රිය ස්වභාවයෙන් සහ මධුර ස්වභාවයෙන් යුක්තය. මෙහි මේ තණ්හා තොමෝ උපදිනු ලබන්නී උපදින්නීය. සිටිනු ලබන්නී සිටින්නීය.

**8.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය ඇත්තේ, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය නිත්‍ය වශයෙන් දැක්කාහුද, සැප වශයෙන් දැක්කාහුද, ආත්ම වශයෙන් දැක්කාහුද, නිරෝගී වශයෙන් දැක්කාහුද, නිර්භය වශයෙන් දැක්කාහුද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වැඩුවාහුය.

"යම් කෙනෙක් තණ්හාව වැඩුවාහුද, ඔවුහු පඤ්චස්කන්ධය වැඩුවාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වැඩුවාහුද, ඔවුහු දුක වැඩුවාහුය. යම් කෙනෙක් දුක වැඩුවාහුද, ඔවුහු ජාති, ජරා, මරණ ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයන්ගෙන් නොමිදුනාහුය. දුකින් නොමිදුනාහු යයිද කියමි.

**9.** "මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය ඇත්තේ, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය නිත්‍ය වශයෙන් දක්නාහුද, සැප වශයෙන් දක්නාහුද, ආත්ම වශයෙන් දකින්නාහුය, නිරෝගි වශයෙන් දකින්නාහුද, නිර්භය වශයෙන් දකින්නාහුද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වඩන්නාහුය.

"යම් කෙනෙක් තණ්හාව වඩන්නාහුද, ඔවුහු පඤ්චස්කන්ධය වඩන්නාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වඩන්නාහුද, ඔවුහු දුක වඩන්නාහුය. යම් කෙනෙක් දුක වඩන්නාහුද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් උපායාසයන්ගෙන් නොමිදෙන්නාහුය. දුකින් නොමිදෙන්නාහුයයිද කියමි.

**10.** "මහණෙනි, වර්තමාන කාලයෙහි වනාහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය ඇත්තේ, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය නිත්‍යවශයෙන් දකිත්ද, සැප වශයෙන් දකිත්ද, ආත්මය වශයෙන් දකිත්ද, නිරෝගී වශයෙන් දකිත්ද, නිර්භය වශයෙන් දකිත්ද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වඩත්.

"යම් කෙනෙක් තණ්හාව වඩත්ද, ඔවුහු පඤ්චස්කන්ධය වඩත්. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වඩත්ද, ඔවුහු දුක වඩත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් කෙනෙක් දුක වඩත්ද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් නොමිදෙත්. දුකින් නොමිදෙත් යයිද කියමි.

11. "මහණෙනි, යම්සේ වනාහි වර්ණයෙන් යුක්තවූ, ගන්ධයෙන් යුක්තවූ, රසයෙන් යුක්තවූ, පියයුතු සුරාවෙන් පිරවූ, භාජනයක් වේද, එයද වනාහි විෂයෙන් මිශ්‍රවූයේය. ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ, ග්‍රීෂ්මයෙන් ස්පර්ශකළාවූ, ක්ලාන්තවූ, තැති ගත්තාවූ, පිපාසිතවූ, පුරුෂයෙක් එන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. පින්වත් පුරුෂය, නුඹගේ මේ පියයුතු සුරාවෙන් පිරවූ භාජනය වර්ණයෙන් යුක්තවූයේය. ගන්ධයෙන් යුක්තවූයේය. රසයෙන් යුක්තවූයේය. එයද වනාහි විෂයෙන් යුක්තවූයේය. ඉදින් කැමැත්තෙහි නම් බොව. බොන්නාහට වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද, කැමැති වන්නේය. පානය කළ කල්හි වනාහි ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙහිය. මරණය සමාන දුකකට හෝ පැමිණෙහිය කියායි.

12. ඒ පුරුෂතෙම ඒ පියයුතු සුරාවෙන් පිරවූ භාජනය නොවිමසා වහා බොන්නේද, අත් නාරින්නේද, හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙයි. මරණය සමාන දුකකට හෝ පැමිණෙයි. මහණෙනි, එසේම වනාහි අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය ඇත්තේ වේද, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය නිත්‍ය වශයෙන් දැක්කාහුද, සැප වශයෙන් දැක්කාහුද, ආත්ම වශයෙන් දැක්කාහුද නිරෝගි වශයෙන් දැක්කාහුද, නිර්භය වශයෙන් දැක්කාහුද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වැඩුවාහුය.

13. "යම් කෙනෙක් තණ්හාව වැඩුවාහුද, ඔවුහු පඤ්චස්කන්ධය වැඩුවාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වැඩුවාහුද, ඔවුහු දුක වැඩුවාහුය. යම් කෙනෙක් දුක වැඩුවාහුද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් නොමිදුනාහුය. දුකින් නොමිදුනාහු යයිද කියමි.

14. "මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය

ඇත්තේ වේද, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය නිත්‍ය වශයෙන් දැක්කාහුද, සැප වශයෙන් දැක්කාහුද, ආත්මය වශයෙන් දැක්කාහුද, නිරෝගි වශයෙන් දැක්කාහුද, නිර්භය වශයෙන් දැක්කාහුද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වඩන්නාහුය.

"යම් කෙනෙක් තණ්හාව වඩන්නාහුද, ඔවුහු පඤ්චස්කන්ධය වඩන්නාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වඩන්නාහුද, ඔවුහු දුක වඩන්නාහුය. යම් කෙනෙක් දුක වඩන්නාහුද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, (හැඬීම්), දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් (වැළපීමෙන්) නොමිදෙන්නාහුය. දුකින් නොමිදෙන්නාහු යයිද කියමි.

15. "මහණෙනි, වර්තමාන කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේ වේද, මධුර ස්වභාවය ඇත්තේවේද, එය නිත්‍ය වශයෙන් දකිත්ද, සැප වශයෙන් දකිත්ද, ආත්ම වශයෙන් දකිත්ද, නිරෝගි වශයෙන් දකිත්ද, නිර්භය වශයෙන් දකිත්ද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව වඩත්.

"යම් කෙනෙක් තණ්හාව වඩත්ද, ඔව්හු පඤ්චස්කන්ධය වඩත්. යම් කෙනෙක් පඤ්චස්කන්ධය වඩත්ද, ඔවුහු දුක වඩත්. යම් කෙනෙක් දුක වඩත්ද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක් දොම්නස් උපායාසයන්ගෙන් (වැළපීමෙන්) නොමිදෙත්. දුකින් නොමිදෙත්යයිද, කියමි."

16. "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාවය ඇත්තේ වේද, මධුර ස්වභාවය ඇත්තේ වේද, එය අනිත්‍ය වශයෙන් දැක්කාහුද, දුක් වශයෙන් දැක්කාහුද, අනාත්මය වශයෙන් දැක්කාහුද, රෝග වශයෙන් දැක්කාහුද භය වශයෙන් දැක්කාහුද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කළාහුය.

"යම් කෙනෙක් තණ්හාව දුරු කළාහුද, ඔවුහු පඤ්චස්කන්ධය දුරු කළාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය

දුරු කළාහුද, ඔවුහු දුක දුරු කළාහුය යම් කෙනෙක් දුක දුරුකළාහුද ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදුනාහුය. දුකින් මිදුනාහුයයිද කියමි.”

17. “මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාවය ඇති, මධුර ස්වභාවය ඇති යමක් වේද, එය අනිත්‍ය වශයෙන් දකින්නාහුද, දුක් වශයෙන් දකින්නාහුද, අනාත්ම වශයෙන් දකින්නාහුද, රෝග වශයෙන් දකින්නාහුද, භය වශයෙන් දකින්නාහුද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කරන්නාහුය. යම් කෙනෙක් තණ්හාව දුරු කරන්නාහුද, ඔවුහු පඤ්චස්කන්ධය දුරු කරන්නාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය දුරු කරන්නාහුද, ඔවුහු දුක දුරු කරන්නාහුය යම් කෙනෙක් දුක දුරු කරන්නාහුද ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදෙන්නාහුය. දුකින් මිදෙන්නාහුයයිද කියමි”

18. “මහණෙනි, වර්තමාන කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇති, මධුර ස්වභාවය ඇති, යමක් වේද, එය අනිත්‍ය වශයෙන් දකිත්ද, දුක් වශයෙන් දකිත්ද, අනාත්ම වශයෙන් දකිත්ද, රෝග වශයෙන් දකිත්ද, භය වශයෙන් දකිත්ද, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කෙරෙත්. යම් කෙනෙක් තණ්හාව දුරු කෙරෙත්ද, ඔවුහු පඤ්චස්කන්ධය දුරු කෙරෙත්. යම් කෙනෙක් පඤ්චස්කන්ධය දුරු කෙරෙත්ද, ඔවුහු දුක දුරු කෙරෙත්. යම් කෙනෙක් දුක දුරු කෙරෙත්ද ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදෙත්. දුකින් මිදෙත්යයි කියමි.

19. “මහණෙනි, යම්සේ වනාහි වර්ණයෙන් යුක්තවූ, ගන්ධයෙන් යුක්තවූ, රසයෙන් යුක්තවූ, පියයුතු සුරාවෙන් පිරවූ භාජනයක් වේද, එයද වනාහි විෂයෙන් මිශ්‍රවූයේය. ඉක්බිති ග්‍රීෂ්මයෙන් තැවුනාවූ, ග්‍රීෂ්මයෙන් ස්පර්ශ කළාවූ, ක්ලාන්තවූ,

තැති ගත්තාවූ, පිපාසිතවූ පුරුෂයෙක් එන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, නුඹේ මේ පියයුතු සුරාවෙන් පිරවූ භාජනය වර්ණයෙන් යුක්තවූයේය, ගන්ධයෙන් යුක්තවූයේය. රසයෙන් යුක්තවූයේය. එයද වනාහි විෂයෙන් යුක්තවූයේය. ඉදින් කැමැත්තෙහි නම් පානය කරව පානය කරන්නාහට වනාහි ඒ පැන් රිසි වන්නේය. පානයකොට වනාහි ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙන්නෙහිය. මරණය සමාන දුකකට හෝ පැමිණෙන්නෙහිය කියායි.

**20.** "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂයාට මේ අදහස ඇති වෙයි. මට මේ සුරා පිපාසය වනාහි ජලයෙන් හෝ සංසිඳවන්නට හැක්කේය. මිදුනු කිරෙහිවූ දියෙන් හෝ සංසිඳවන්නට හැක්කේය. ලුණු සහ අත්සුණු මිශ්‍ර ජලයෙන් හෝ සංසිඳ වන්නට හැක්කේය. ධාන්‍ය වර්ග, ගෙඩි වර්ග, බඩ වර්ග දමා සෑදූ දියෙන් හෝ සංසිඳවන්නට හැක්කේය. යමක් මට බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස වන්නේද මම එය පානය නොකරන්නෙමි කියායි. හෙතෙම ඒ සුරා භාජනය සලකා බැලීමෙන් පානය නොකරන්නේය. අත්හැර දමන්නේය. හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ නොපැමිණෙන්නේය. මරණය හා සමාන දුකකට හෝ නොපැමිණෙන්නේය.

**21.** "මහණෙනි, එසේම අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාවය ඇති, මධුර ස්වභාවය ඇති යමක් වේද, එය අනිත්‍ය වශයෙන් දැක්කාහුද, දුක් වශයෙන් දැක්කාහුද, අනාත්ම වශයෙන් දැක්කාහුද, රෝග වශයෙන් දැක්කාහුද, භය වශයෙන් දැක්කාහුද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කළාහුය. යම් කෙනෙක් තණ්හාව දුරු කළාහුද, ඔවුහු පඤ්චස්කන්ධය දුරු කෙරෙත්. යම් කෙනෙක් පඤ්චස්කන්ධය දුරු කෙරෙත්ද ඔවුහු දුක දුරු කෙරෙත්. යම් කෙනෙක් දුක දුරු කෙරෙත්ද ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස් උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදුනාහුය. දුකින් මිදුනාහුයයිද කියමි.

**22.** "මහණෙනි අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාවය ඇති, මධුර ස්වභාවය ඇති යමක් වේද, එය අනිත්‍ය වශයෙන් දකින්නාහුද, දුක් වශයෙන් දකින්නාහුද, අනාත්ම වශයෙන් දකින්නාහුද, රෝග වශයෙන් දකින්නාහුද, භය වශයෙන් දකින්නාහුද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කරන්නාහුය. යම් කෙනෙක් තණ්හාව දුරු කරන්නාහුද ඔවුහු පඤ්චස්කන්ධය දුරු කරන්නාහුය. යම් කෙනෙක් පඤ්චස්කන්ධය දුරු කරන්නාහුද ඔවුහු දුක දුරු කරන්නාහුය. යම් කෙනෙක් දුක දුරු කරන්නාහුද ඔව්හු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදෙන්නාහුය. දුකෙන් මිදෙන්නාහුයයි කියමි.

**23.** "මහණෙනි, වර්තමාන කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ලෝකයෙහි ප්‍රිය ස්වභාව ඇති, මධුර ස්වභාවය ඇති යමක්වේද, එය අනිත්‍ය වශයෙන් දකිත්ද, දුක් වශයෙන් දකිත්ද, අනාත්ම වශයෙන් දකිත්ද, රෝග වශයෙන් දකිත්ද, භය වශයෙන් දකිත්ද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව දුරු කෙරෙත්. යම් කෙනෙක් තණ්හාව දුරු කෙරෙත්ද, ඔවුහු පඤ්චස්කන්ධය දුරු කෙරෙත්. යම් කෙනෙක් පඤ්චස්කන්ධය දුරු කෙරෙත්ද, ඔවුහු දුක දුරුකෙරෙත්. යම් කෙනෙක් දුක දුරු කෙරෙත්ද, ඔවුහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව (හැඬීම්), දුක්, දොම්නස්, උපායාසයන්ගෙන් (වැළපීමෙන්) මිදෙත්. දුකින් මිදෙත්යයි කියමි."

**(භයවන සම්මසන සූත්‍රය නිමි.)**

---

## 7. නළකලාපිය සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් "මහා කොට්ඨිත" ස්ථවිරයන් වහන්සේද, බරණැස් නුවර ඉසිපතනයෙහිවූ, මිගදායෙහි වාසය කරන සේක. ඉක්බිති ආයුෂ්මත්

"මහාකොට්ඨිත" ස්ථවිරතෙම සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් හා සමග සතුටු වූයේය. සතුටුවිය යුතු වූත් සිහිකටයුතු වූත් කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙම වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, කිමෙක්ද? ජරාමරණය තමා විසින් කරන ලද්දේද? ජරාමරණය අනුන් විසින් කරන ලද්දේද? ජරාමරණය තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් ජරාමරණය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලදුව ඉබේ ඇතිවූයේද"? "ඇවැත් කොට්ඨිතය, ජරාමරණය වනාහි තමන් විසින් නොකරන ලදී. ජරාමරණය අනුන් විසින් නොකරන ලදී. ජරාමරණය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලදී. ජරාමරණය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලදුව, ඉබේ ඇති නොවූයේය. එතකුදුවුවත් ජාතිය (ඉපදීම නිසා) ජරා මරණය ඇතිවේ."

3. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? ජාතිය (ඉපදීම) තමා විසින් කරන ලද්දේද? ඉපදීම අනුන් විසින් කරන ලද්දේද? ඉපදීම තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් ඉපදීම තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ. ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය ඉපදීම වනාහි තමන් විසින් නොකරන ලද්දේය. ඉපදීම අනුන් විසින් නොකරන ලද්දේය. ඉපදීම තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. ඉපදීම තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් භවය නිසා ඉපදීම ඇතිවේ."

4. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? භවය තමා විසින් කරන ලද්දේද? භවය අනුන් විසින් කරන ලද්දේද? භවය තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේ නොහොත් භවය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය භවය වනාහි තමන් විසින්

නොකරන ලද්දේය. භවය අනුන් විසින් නොකරන ලද්දේය. භවය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. භවය තමන් විසින් හෝ අනුන් විසින් නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් උපාදානය නිසා භවය ඇතිවේ."

**5.** "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? උපාදානය තමා විසින් කරන ලද්දේද? උපාදානය අනුන් විසින් කරන ලද්දේද? උපාදනය තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් උපාදානය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය උපාදානය වනාහි තමන් විසින් නොකරන ලද්දේය. උපාදානය අනුන් විසින් නොකරන ලද්දේය. උපාදානය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. උපාදනය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් තණ්හාව නිසා උපාදනය ඇතිවේ."

**6.** "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? තණ්හාව තමා විසින් කරන ලද්දේද? තණ්හාව අනුන් විසින් කරන ලද්දේද? තණ්හාව තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් තණ්හාව තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය තණ්හාව වනාහි තමන් විසින් නොකරන ලද්දේය. තණ්හාව අනුන් විසින් නොකරන ලද්දේය. තණ්හාව තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. තණ්හාව තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් වේදනාව නිසා තණ්හාව ඇතිවේ."

**7.** ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? වේදනාව තමා විසින් කරන ලද්දේද? වේදනාව අනුන් විසින් කරන ලද්දේද? වේදනාව තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් වේදනාව තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය වේදනාව වනාහි තමන් විසින් නොකරන ලද්දේය. වේදනාව අනුන් විසින්

නොකරන ලද්දේය. වේදනාව තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. වේදනාව තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ."

8. ඇවැත් ශාරිපුත්‍රයෙනි කිමෙක්ද? ස්පර්ශය තමා විසින් කරන ලද්දේද? ස්පර්ශය අනුන් විසින් කරන ලද්දේද? ස්පර්ශය තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් ස්පර්ශය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය ස්පර්ශය වනාහි තමන් විසින් නොකරන ලද්දේය. ස්පර්ශය අනුන් විසින් නොකරන ලද්දේය. ස්පර්ශය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. ස්පර්ශය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් සළායතන නිසා ස්පර්ශය ඇතිවේ."

9. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? සළායතන තමා විසින් කරන ලද්දේද? සළායතන අනුන් විසින් කරන ලද්දේද? සළායතන තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් සළායතන තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති වූයේද?" "ඇවැත් කොට්ඨිතය සළායතන වනාහි තමන් විසින් නොකරන ලද්දේය. සළායතන අනුන් විසින් නොකරන ලද්දේය. සළායතන තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. සළායතන තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් නාමරූප නිසා සළායතන ඇතිවේ."

10. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? නාමරූප තමා විසින් කරන ලද්දේද? නාමරූප අනුන් විසින් කරන ලද්දේද? නාමරූප තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් නාමරූප තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය, නාමරූප වනාහි තමන් විසින් නොකරන ලද්දේය. නාමරූප අනුන් විසින්

නොකරන ලද්දේය. නාමරූප තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. නාමරූප තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ."

11. "ඇවැත් ශාරිපුත්‍රයෙනි, කිමෙක්ද? විඤ්ඤාණය තමා විසින් කරනලද්දේද? විඤ්ඤාණය අනුන් විසින් කරන ලද්දේද? විඤ්ඤාණය තමන් විසිනුත් අනුන් විසිනුත් කරන ලද්දේද? නොහොත් විඤ්ඤාණය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇතිවූයේද?" "ඇවැත් කොට්ඨිතය, විඤ්ඤාණය වනාහි තමන් විසින් නොකරන ලද්දේය. විඤ්ඤාණය අනුන් විසින් හෝ නොකරන ලද්දේය. විඤ්ඤාණය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. විඤ්ඤාණය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් නාමරූප නිසා විඤ්ඤාණය ඇතිවේ."

12. "දැන් වනාහි අපි ඇවැත් සැරියුත් තෙරුන්ගේ කීම මෙසේ දැනගතිමු. (කෙසේද?) ඇවැත් කොට්ඨිතය, නාම රූපය වනාහි තමා විසින් නොකරන ලද්දේය. නාමරූපය අනුන් විසින් නොකරන ලද්දේය. නාමරූපය තමන් විසින්ද අනුන් විසින්ද නොකරන ලද්දේය. නාමරූපය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය. එහෙත් විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේය' කියායි. දැන් වනාහි ඇවැත් සැරියුත් තෙරුන්ගේ කීම මෙසේ අපි දැනගතිමු. (කෙසේද?) 'ඇවැත් කොට්ඨිතය, විඤ්ඤාණය වනාහී තමා විසින් නොකරන ලද්දේය. විඤ්ඤාණය අනුන් විසින් නොකරන ලද්දේය. විඤ්ඤාණය තමන් විසින්ද, අනුන් විසින්ද නොකරන ලද්දේය. විඤ්ඤාණය තමන් විසින් හෝ අනුන් විසින් හෝ නොකරන ලද්දේ, ඉබේ ඇති නොවූයේය' කියායි. එහෙත් නාමරූප නිසා විඤ්ඤාණය ඇතිවේ යනුයි.

13. "ඇවැත් සාරිපුත්‍රයෙනි, කෙසේ වනාහි මේ කීමෙහි අර්ථය දතයුතු වන්නේද?" "ඇවැත්නි, එසේවී නම් ඔබට

උපමාවක් කරන්නෙමි. උපමාවෙන්ද මේ ලෝකයෙහි ඇතැම් නැණවත් පුරුෂයෝ කියන ලද්දහුගේ අදහස දැනගනිත්. ඇවැත්නි, යම්සේ බටලී මිටි දෙකක් එකක් අනික නිසා සිටින්නාහුද, එසේම ඇවැත්නි නාමරූප නිසා විඥ්ඥාණය ඇතිවේ. විඥ්ඥාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරාමරණද, ශෝකවීම්, හැඬීම්, දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

14. "ඇවැත්නි, ඉදින් ඒ බටලී මිටි දෙකින් එකක් අදින්නේ නම් එකක් වැටෙන්නේය. ඉදින් අනික අදින්නේ නම් අනික වැටෙන්නේය. එසේම ඇවැත්නි නාමරූප නැතිවීමෙන් (නාමරූප නිරොධයෙන්) විඥ්ඥාණය නැතිවේ. විඥ්ඥාණය නැතිවීමෙන් නාමරූප නැතිවේ. නාමරූප නැතිවීමෙන් සළායතන නැතිවේ. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවේ. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවේ. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේ. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය) නැතිවේ. ජාතිය (උත්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහය නැතිවේ.

15. "ඇවැත් සාරිපුත්‍රයෙනි, ආශ්චර්යයි. ඇවැත් ශාරිපුත්‍රයෙනි, අද්භූතයි. යම් හෙයකින් ඇවැත් සැරියුත් තෙරුන් විසින් මෙය මනාකොට කියනු ලැබීද, (එහෙයින්) අපි වනාහි ඇවැත් සැරියුත් තෙරුන්ගේ මේ කීම මේ ස තිසක් වස්තුවෙන් අනුමෝදන් වෙමු. ඉදින් ඇවැත්නි, මහණතෙම ජරා මරණයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, (ඔහුට) ධර්ම කථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම ජරා මරණයට කලකිරීම

පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, (ඔහුට) ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම ජරා මරණයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන් (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

16. "ඉදින් ඇවැත්නි, මහණතෙම ජාතියට (ඉපදීමට) කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම ඉපදීමට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි මහණතෙම ඉපදීමට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැති කිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන්, මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

17. "ඉදින් ඇවැත්නි, මහණතෙම භවයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම භවයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුව යයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම භවයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන් (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන්, මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

18. "ඉදින් ඇවැත්නි, මහණතෙම උපාදානයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය.

ඉදින් ඇවැත්නි, මහණතෙම උපාදානයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණ තෙම උපාදානයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැති කිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේවෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**19.** "ඉදින් ඇවැත්නි, මහණතෙම තණ්හාවට කලකිරීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්ම කථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, හෙතෙම තණ්හාවට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම තණ්හාවට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැති කිරීමෙන්. (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේවෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**20.** "ඉදින් ඇවැත්නි, මහණතෙම වේදනාවට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම වේදනාවට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම වේදනාවට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**21.** "ඉදින් ඇවැත්නි, මහණතෙම ස්පර්ශයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්ම කථික භික්ෂුවයයි කීමට සුදුසුය.

ඉදින් ඇවැත්නි, මහණතෙම ස්පර්ශයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම ස්පර්ශයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන් (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේවෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

22. "ඉදින් ඇවැත්නි, මහණතෙම සළායතනයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම සළායතනයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම සළායතනයන්ට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන් (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, ඔහුට මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

23. "ඉදින් ඇවැත්නි, මහණතෙම නාමරූපයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම නාමරූපයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි. මහණතෙම නාමරූපයන්ට කලකිරීමෙන්, නොඇලීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේවෙයිද (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

24. "ඉදින් ඇවැත්නි, මහණතෙම විඤ්ඤාණයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය.

ඉදින් ඇවැත්නි, මහණතෙම විඤ්ඤාණයට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම විඤ්ඤාණයට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**25.** "ඉදින් ඇවැත්නි, මහණතෙම සංස්කාරයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම සංස්කාරයන්ට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම සංස්කාරයන්ට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, ඔහුට මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**26.** "ඉදින් ඇවැත්නි, මහණතෙම අවිජ්ජාවට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, ධර්මය දේශනා කෙරෙයිද, ඔහුට ධර්මකථික භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම අවිජ්ජාවට කලකිරීම පිණිස, නොඇලීම පිණිස, (එය) නැතිකිරීම පිණිස, පිළිපන්නේ වෙයිද, ඔහුට ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපන් භික්ෂුවයයි කීමට සුදුසුය. ඉදින් ඇවැත්නි, මහණතෙම අවිජ්ජාවට කලකිරීමෙන්, නොඇලීමෙන්, (එය) නැතිකිරීමෙන්, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයිද, (ඔහුට) මේ ආත්මයෙහි නිවණට පැමිණි භික්ෂුවයයි කීමට සුදුසුය.

**(හත්වන නළකලාපිය සූත්‍රය නිමි.)**

---

## 8. කෝසම්බී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මූසිල තෙමේද ආයුෂ්මත් සවිට්ඨ තෙමේද, ආයුෂ්මත් නාරද තෙමේද, ආයුෂ්මත් ආනන්ද තෙමේද කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වාසය කෙරෙති.

එකල්හි ආයුෂ්මත් "සවිට්ඨ" තෙමේ ආයුෂ්මත් මූසිල තෙරුන්ට මෙය කීය. "ඇවැත් මූසිලය, අනුන් කියන දෙය ඇදහීමෙන් වෙන්වම, අනුන්ගේ කීමට කැමැත්තෙන් වෙන්ව, අනුශ්‍රැතියෙන් (පරම්පරාගත කථාවෙන්) වෙන්ව, ආකාර පරිවිතර්කයෙන් (ආකාර කල්පනා කිරීමෙන්) වෙන්ව, දිට්ඨිනිජ්ජාන ඛන්තියෙන් (තර්කයෙන්) වෙන්ව, ඇවැත් මූසිලහට ජාතිය (ඉපදීම) නිසා ජරාමරණය ඇතිවේයයි තමන්ම උපදවා ගත් ඤාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ජාතිය නිසා ජරාමරණය ඇතිවේය යන මෙය මමම දනිමි. මමම දකිමි."

2. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට භවය නිසා ඉපදීම ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

3. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට උපාදානය නිසා භවය ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, උපාදානය නිසා භවය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.'

**4.** "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට තණ්හාව නිසා උපාදානය ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, තණ්හාව නිසා උපාදානය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**5.** "ඇවැත් මූසිලය ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට වේදනාව නිසා තණ්හාව ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, වේදනාව නිසා තණ්හාව ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**6.** "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට ස්පර්ශය නිසා වේදනාව ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද"?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා

කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ස්පර්ශය නිසා වේදනාව ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

7. “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට සළායතන නිසා ස්පර්ශය ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද”?

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

8. “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට නාමරූප නිසා සළායතන ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, නාමරූප නිසා සළායතන ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

9. “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

10. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත්, මූසිලහට සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේයයි, තමාම උපදවා ගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන්, වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්වම, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි".

11. "ඇවැත් මූසිලය ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

12. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, කැමැත්තෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට ජාති නිරෝධයෙන් (ඉපදීම නැති කිරීමෙන්) ජරා මරණය නැතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඉපදීම නැති කිරීමෙන් (ජාති නිරෝධයෙන්) ජරාමරණ නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

13. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා

කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව ඇවැත් මූසිලහට භවය නැතිකිරීමෙන් ඉපදීම නැතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ශ්‍රද්ධාවෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, භවය නැතිවීමෙන් ජාතිය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

14. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව ඇවැත් මූසිලහට උපාදානය නැතිකිරීමෙන් භවය නැති වේයයි තමාම උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව උපාදානය නැති වීමෙන් භවය නැතිවේයයි යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

15. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට තණ්හාව නැති කිරීමෙන් උපාදානය නැතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්වම, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව තණ්හාව නැතිකිරීමෙන් උපාදානය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

16. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්ව, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට වේදනාව නැති කිරීමෙන් තණ්හාව නැතිවේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

17. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිවේයයි තමාම උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

18. "ඇවැත් මූසිලය ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට සළායතන නැති කිරීමෙන් ස්පර්ශය නැතිවේයයි තමා උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සළායතනයන් නැති වීමෙන් ස්පර්ශය නැතිවේයයි යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

19. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට නාමරූප නැතිකිරීමෙන් සළායතන නැතිවේයයි තමා උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන්

වෙන්ව, තර්කයෙන් වෙන්ව, නාමරූපයන් නැතිවීමෙන් සළායතනයන් නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

**20.** “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිල හට විඤ්ඤාණය නැතිකිරීමෙන් නාම රූප නැතිවේයයි තමා උපදවාගත් ඤාණය ඇත්තේද?

“ඇවැත් සවිට්ටය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූපයන් නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

**21.** “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට සංස්කාර නැතිකිරීමෙන් විඤ්ඤාණය නැතිවේයයි තමා උපදවාගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

**22.** “ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව ඇවැත් මූසිලහට අවිජ්ජාව නැතිකිරීමෙන් සංස්කාර නැතිවේයයි තමා උපදවා ගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, අවිජ්ජාව නැතිවීමෙන් සංස්කාර නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

23. "ඇවැත් මූසිලය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් මූසිලහට භවය නැතිවීම නිර්වාණයයි කියා තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්ව, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, භවය නැතිවීම නිර්වාණයයි කියා මෙය මමම දනිමි. මෙය මමම දකිමි." "එසේවී නම් ඇවැත් මූසිලතෙම ආශ්‍රවයෙන් ක්ෂය කළ රහත් කෙනෙකැයි කියමි." මෙසේ කී කල්හි ඇවැත් මූසිලතෙම නිශ්ශබ්ද විය.

24. "ඉක්බිති ආයුෂ්මත් නාරදතෙම ඇවැත් සවිට්ඨ තෙරුන්හට මෙය කීයේය. "ඇවැත් සවිට්ඨය, මම මේ ප්‍රශ්නය ලබන්නෙම් නම් මැනවි. මාගෙන් මේ ප්‍රශ්නය අසනු මැනවි. මම ඔබට මේ ප්‍රශ්නය පැහැදිලි කරන්නෙමියි" කියායි. "ඇවැත් නාරදතෙම මේ ප්‍රශ්නය ලබයිනම් මම ඇවැත් නාරද තෙරුන්ගෙන් මේ ප්‍රශ්නය අසන්නෙමි. මේ ප්‍රශ්නය ඇවැත් නාරදතෙම මට පැහැදිළි කෙරේවා!"

25. "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට ඉපදීම (ජාතිය) නිසා ජරාමරණය ඇතිවේයයි තමාම උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ජාතිය නිසා ජරා මරණය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

26. "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා

කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට භවය නිසා ඉපදීම ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව භවය නිසා ජාතිය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**27.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට උපාදානය (තදින් අල්ලාගැනීම) නිසා භවය ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, උපාදානය නිසා භවය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**28.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට තණ්හාව නිසා උපාදානය ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, තණ්හාව නිසා උපාදානය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**29.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට වේදනාව නිසා තණ්හාව ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, වේදනාව නිසා තණ්හාව ඇතිවේයයි යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**30.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට ස්පර්ශය නිසා වේදනාව ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව ස්පර්ශය නිසා වේදනාව ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**31.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**32.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට නාමරූප නිසා සළායතනයන් ඇතිවේයයි තමාම උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා

කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව නාමරූප නිසා සළායතනයන් ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

33. “ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව ඇවැත් නාරදහට විඤ්ඤාණය නිසා නාමරූපයන් ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව විඤ්ඤාණය නිසා නාමරූපයන් ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

34. “ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේද?”

“ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

35. “ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේයයි තමාම උපදවාගත් ඤාණය ඇත්තේ වේද?”

“ඇවැත් සවිට්ඨය ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි.”

**36.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට ඉපදීම (ජාතිය) නැතිකිරීමෙන් ජරාමරණය නැතිවේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව තර්කයෙන් වෙන්ව, ඉපදීම (ජාතිය) නැති වීමෙන් ජරාමරණය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**37.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට භවය නැතිකිරීමෙන් ඉපදීම නැතිවේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, භවය නැතිවීමෙන් ඉපදීම නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**38.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිකිරීමෙන් භවය නැති වේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, උපාදානය නැතිකිරීමෙන් භවය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**39.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට තණ්හාව නැතිකිරීමෙන් උපාදානය නැතිවේයයි තමා උපදවා ගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**40.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවේයයි තමා උපදවා ගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, වේදනාව නැතිකිරීමෙන් තණ්හාව නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**41.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට ස්පර්ශය නැතිකිරීමෙන් වේදනාව නැතිවේයයි තමා උපදවා ගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්වම, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**42.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට සළායතනයන් නැතිකිරීමෙන් ස්පර්ශය නැතිවේයයි තමා උපදවාගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සළායතනයන් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේයයි යන මෙය මම දනිමි. මෙය මම දකිමි.

43. "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට, නාමරූපයන් නැතිකිරීමෙන් සළායතනයන් නැතිවේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, නාමරූපයන් නැති කිරීමෙන් සළායතනයන් නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

44. "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට විඥ්ඥාණය නැතිවීමෙන් නාමරූප නැතිවේයයි තමා උපදවා ගත් ඥාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, විඥ්ඥාණය නැති වීමෙන් නාමරූප නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

45. "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට සංස්කාරයන් නැතිකිරීමෙන් විඥ්ඥාණය නැතිවේයයි තමා උපදවාගත් ඥාණය ඇත්තේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, සංස්කාරයන් නැති වීමෙන් විඤ්ඤාණය නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**46.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට අවිජ්ජාව නැතිකිරීමෙන් සංස්කාර නැතිවේයයි තමා උපදවා ගත් ඤාණය ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, අවිජ්ජාව නැතිවීමෙන් සංස්කාර නැතිවේය යන මෙය මම දනිමි. මෙය මම දකිමි."

**47.** "ඇවැත් නාරදය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්වම, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, ඇවැත් නාරදහට භවය නැතිවීම නිර්වාණයයි කියා තමාම උපදවාගත් නුවණ ඇත්තේද?"

"ඇවැත් සවිට්ඨය, ඇදහීමෙන් වෙන්වම, රුචියෙන් වෙන්ව, පරම්පරාගත කථාවෙන් වෙන්ව, ආකාර කල්පනා කිරීමෙන් වෙන්ව, තර්කයෙන් වෙන්ව, භවය නැතිවීම නිර්වාණයයි කියා මෙය මම දනිමි. මෙය මම දකිමි." "එසේවී නම් ඇවැත් නාරදතෙම ආශ්‍රවයන් නැතිකළ, රහත් කෙනෙකැයි" කියමි. "ඇවැත්නි, මා විසින් භවය නැතිවීම නිර්වාණයයි කියා ඇතිසේ යහපත් නුවණින් මනාකොට දක්නාලදී. එහෙත් (මම) ආශ්‍රවයන් ක්ෂයකළ, රහත් කෙනෙක් නොවෙමි" කීය.

**48.** "ඇවැත්නි, යම්සේ කාන්තාර මාර්ගයෙහි ළිඳක් වේද, එහි ඒ ළිඳට කඹයක් නොවූයේය, කලයක් නොවූයේය. ඉක්බිති, ග්‍රීෂ්මයෙන් තැවුනු, ග්‍රීෂ්මයෙන් පෙලුනු, ක්ලාන්තවූ, තැතිගත්තාවූ,

පටුන



පිපාසිතවූ, පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ ලිඳ බලන්නේය. ඔහුට දියයයි නුවණ ඇතිවෙන්නේය. (එහෙත්) කයින් ස්පර්ශකොට වාසය නොකරන්නේය. ඇවැත්නි, එසේම වනාහි භවනිරෝධය (භවය නැතිකිරීම) නිර්වාණයයි කියා මා විසින් ඇතිසේ යහපත් නුවණින් මනා කොට දක්නාලදී. (එහෙත් මම) ආශ්‍රවයන් ක්ෂය කළාවූ, රහත් කෙනෙක් නෙවෙමියි" කීය.

මෙසේ කී කල්හි, ඇවැත් ආනන්දතෙම, ඇවැත් සවිට්ඨ තෙරුන්ට මෙය කීයේය.

**49.** "ඇවැත් සවිට්ඨය, මෙසේ කියන්නාවූ ඔබ ඇවැත් නාරද තෙරුන්ට කුමක් කියන්නෙහිද?" "ඇවැත් ආනන්දය, මෙසේ කියන්නාවූ මම ඇවැත් නාරද තෙරුන්ට යහපතින් තොරවූ, කුසලින් තොරවූ, කිසිවක් නොකියමියි" කීයේය.

**(අටවන කෝසම්බි සූත්‍රය නිමි.)**

---

## 9. උපයන්ති සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, මහමුහුද (වඩදිය ගලන්නේ) මහා ගංගාවන් පුරවයි. මහා ගංගාවෝ පිරීයන්නාහු කුඩා ගංගාවන් පුරවත්. කුඩා ගංගාවෝ පිරීයන්නාහු මහ පතස් පුරවත්. මහ පතස් පිරීයන්නාහු කුඩා වළවල් පුරවත්. මහණෙනි, එසේම වනාහි අවිජ්ජා තොමෝ වැඩෙන්නී සංස්කාරයන් වඩන්නීය. සංස්කාරයෝ වැඩෙන්නාහු විඥ්ඥාණය වඩත්. විඥ්ඥාණය වැඩෙන්නේ නාමරූපය වඩයි. නාමරූපය වැඩෙන්නේ සළායතන වඩයි. සළායතන වැඩෙන්නේ ස්පර්ශය වඩයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්පර්ශය වැඩෙන්නේ වේදනාව වඩයි. වේදනාව වැඩෙන්නී තණ්හාව වඩන්නීය. තණ්හාව වැඩෙන්නී උපාදානය වඩන්නීය. උපාදානය වැඩෙන්නේ භවය වඩයි. භවය වැඩෙන්නේ ජාතිය වඩයි. ජාතිය වැඩෙන්නේ ජරාමරණය වඩයි.

3. "මහණෙනි, මහ මුහුද (වඩදිය බැසයන්නේ) මහා ගංගාවන් නොපුරවයි. මහා ගංගාවෝ නොපිරුණාහු කුඩා ගංගාවන් නොපුරවත්. කුඩා ගංගාවෝ නොපිරෙන්නාහු මහ පතස් නොපුරවත්. මහ පතස් නොපිරෙන්නේ කුඩා වළවල් නොපුරවත්. මහණෙනි, එසේම වනාහි අවිජ්ජාව නොවැඩෙන්නී සංස්කාරයන් නොවඩන්නීය. සංස්කාරයෝ නොවැඩෙන්නාහු විඤ්ඤාණය නොවඩත්. විඤ්ඤාණය නොවැඩෙන්නේ නාමරූපය නොවඩයි. නාමරූපය නොවැඩෙන්නේ සළායතන නොවඩයි. සළායතන නොවැඩෙන්නේ ස්පර්ශය නොවඩයි. ස්පර්ශය නොවැඩෙන්නේ වේදනාව නොවඩයි. වේදනාව නොවැඩෙන්නී තණ්හාව නොවඩන්නීය. තණ්හාව නොවැඩෙන්නී උපාදානය නොවඩන්නීය. උපාදානය නොවැඩෙන්නේ භවය නොවඩන්නීය. භවය නොවැඩෙන්නේ ජාතිය නොවඩයි. ජාතිය නොවැඩෙන්නී ජරා මරණය නොවඩයි.

**(නවවන උපයන්ති සූත්‍රය නිමි.)**

---

## 10. සුසීම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි, "කලන්දක නිවාප"යෙහිවූ වේළුවනයෙහි (හුණ වනයෙහි) වාසය කරනසේක.

2. "එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ (මිනිසුන් විසින්) සත්කාර කරන ලද්දේ, ගරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ, පුදන ලද්දේ වඳින ලද්දේ, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර බොහෝ කොට ලබන්නේ වෙයි.

භික්ෂු සංඝ තෙමේද (මිනිසුන් විසින්) සත්කාර කරන ලද්දේ, ගරුකාර කරන ලද්දේ, බුහුමන් කරන ලද්දේ, පුදන ලද්දේ, වඳින ලද්දේ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර බොහෝ කොට ලබන්නේ වෙයි. අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ වනාහි (මිනිසුන් විසින්) සත්කාර නොකරන ලද්දාහු. ගරුකාර නොකරන ලද්දාහු බුහුමන් නොකරන ලද්දාහු, නොපුදන ලද්දාහු, නොවඳින ලද්දාහු, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර නොලබන්නෝ වෙත්.

3. "එකල්හි වනාහි සුසීම නම් පරිබ්‍රාජක තෙම මහත්වූ පරිබ්‍රාජක පිරිස සමග රජගහනුවර වාසය කෙරෙයි. ඉක්බිති සුසීම පරිබ්‍රාජකයාගේ පිරිස සුසීම පරිබ්‍රාජකයාට මෙය කීවාහුය. "ඇවැත් සුසීමය යනු මැනවි. ඔබ ශ්‍රමණ ගෞතමයන් සමීපයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරෙනු මැනවි. ඔබ ධර්මය උගෙන අපට කියවනු මැනවි. ඒ ධර්මය අපි උගෙන, ගිහියන්ට කියන්නෙමු. මෙසේ අපිද, (මිනිසුන් විසින්) සත්කාර කරන ලද්දෝ, ගරුකාර කරන ලද්දෝ, බුහුමන් කරන ලද්දෝ, පුදන ලද්දෝ, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර ලබන ලද්දෝ වෙමුයි" කියායි. "ඇවැත්නි, හොඳයයි" කියා සුසීම පරිබ්‍රාජකතෙම සිය පිරිසට උත්තරදී, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත්, සිහිකටයුතුවූත්, කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ සුසීම පරිබ්‍රාජක තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කීයේය. "ඇවැත් ආනන්දය, මම මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරීමට කැමැත්තෙමියි" කියායි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම සුසීම නම් පරිබ්‍රාජකයා රැගෙන භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තෙක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට

මෙය කීයේය. "ස්වාමීනි, මේ සුසීම පරිබ්‍රාජකතෙම මෙසේ කීයේය.

"ඇවැත් ආනන්දය, මම මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරීමට කැමැත්තෙමි" කියායි.

"ආනන්දය, එසේවීනම් සුසීම පැවිදි කරවියයි" (වදාළ සේක.) සුසීම පරිබ්‍රාජකතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබීය. උපසම්පදාව ලැබීය.

**4.** "එකල්හි වනාහි බොහෝ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි රහත් ඵලය ප්‍රකාශ කරන ලදී. (කෙසේද?) 'ජාතිය (ඉපදීම) ක්ෂය වූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මයෙහි කළයුතු අනිකක් නැතැයි දනිමු' කියායි. ඇවැත් සුසීම තෙම වනාහි බොහෝ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි 'ජාතිය (ඉපදීම) ක්ෂය වූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මයෙහි කළයුතු අනිකක් නැතැයි දනිමු'යි අර්හත්ඵලය ප්‍රකාශකරන ලදැයි ඇසීය. ඉක්බිති සුසීම තෙම ඒ භික්ෂූන් යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ භික්ෂූන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත්, සිහිකටයුතුවූත් කථාවකොට නිමවා, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ඇවැත් සුසීම තෙම වනාහි ඒ භික්ෂූන්ට මෙය කීයේය.

**5.** "ආයුෂ්මතුන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි, 'ජාතිය (ඉපදීම) ක්ෂයවූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මේ ආත්මයෙහි කළයුතු අනිකක් නැති බව දනිමුයි' කියා රහත්ඵලය ප්‍රකාශ කරන ලද්දේය යනු සැබෑද?" "ඇවැත, එසේය. ආයුෂ්මත්නි, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, ඔබලා නානාප්‍රකාරවූ ඍද්ධිවිධි විශේෂයෙන් විඳින්නහුද? (කෙසේද?) එක් කෙනෙක්වී බොහෝ දෙනෙක් වන්නහුද? බොහෝ දෙනෙක්වී, එක්කෙනෙක් වන්නහුද? ප්‍රකට බවටත් අප්‍රකට බවටත් පැමිණෙන්නහුද? බිත්ති

සරසද, ප්‍රාකාර සරසද, අහසේ යම්සේද, එසේ නොගැටෙමින් ගමන්කරහුද? දියෙහි මෙන් පොළොවෙහිද, කිමිදීම් මතුවීම් කරන්නහුද? පොළොවෙහි මෙන් දියෙහිද නොකිමිදෙමින් යන්නහුද? පක්ෂියෙකු මෙන් අහසෙහි අරම්ණිය ගොතාගෙන (හිඳගෙන) යන්නහුද? මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් අනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙන අතින් අල්ලන්නහුද? අතගාන්නහුද? බ්‍රහ්මලෝකය දක්වා කයින් තමන් වසඟ කරන්නහුද?" "ඇවැත, මෙය නොවේමය"

**6.** "ඇවැත්නි තවද මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ ඔබලා මිනිස් කණ ඉක්ම සිටින්නාවූ, පිරිසිදුවූ, දිවකණින් දෙවියන් පිළිබඳවූද, මිනිසුන් පිළිබඳවූද, දුරවූද, සමීපයෙහි වූද, දෙයාකාරවූ ශබ්දයන් අසන්නහුද?" "ඇවත, මෙය නොවේමය" "ඇවැත්නි, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, ඔබලා වනාහි අන්‍ය සත්වයින්ගේද, අන්‍ය පුද්ගලයින්ගේද සිත තමාගේ සිතින් පිරිසිඳ දන්නහුද? (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දන්නහුද? රාග රහිත සිත රාග රහිත සිතයයි දන්නහුද? ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දන්නහුද? ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතයයි දන්නහුද? මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දන්නහුද? මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දන්නහුද? හැකුළුනු සිත හැකුළුනු සිතයයි දන්නහුද? විසුරුණු සිත විසුරුණු සිතයයි දන්නහුද? මහත් බවට පැමිණි සිත මහත් බවට පැමිණි සිතයයි දන්නහුද? මහත් බවට නොපැමිණි සිත මහත් බවට නොපැමිණි සිතයයි දන්නහුද? උසස් බවට පැමිණි සිත උසස් බවට පැමිණි සිතයයි දන්නහුද? උසස් බවට නොපැමිණි සිත උසස් බවට නොපැමිණි සිතයයි දන්නහුද? සංසිඳුනු සිත සංසිඳුනු සිතයයි දන්නහුද? නොසංසිඳුනු සිත නොසංසිඳුනු සිතයයි දන්නහුද? මිදුනු සිත මිදුනු සිතයයි දන්නහුද? නොමිදුනු සිත නොමිදුනු සිතයයි දන්නහුද?" "ඇවත, මෙය නොවේමය". "ඇවැත්නි, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, ඔබලා නානාප්‍රකාරවූ, පෙර විසූ තැන් සිහි කරන්නහුද? හේ කවරේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද,

ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතලිහක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසවල් තැන උපන්නෙමි. (එහි) මෙනම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ, අසවල්තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැප දුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි, ඒ මම එතැනින් චුතවී මේ මනුෂ්‍යලෝකයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නන්වැදෑරුම්වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරන්නහුද?" "ඇවැත, මෙය නොවේමය". "ඇවැත්නි, තවද, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ, ඔබලා පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් සත්වයන් දක්නහුද? (කෙබඳු සත්වයින්ද?) චුතවන්නාවූද, උපදින්නා වූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනාවර්ණ ඇත්තාවූද, මනාවර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තා වූද, කර්මය පරිදි මියයන්නාවූ, සත්වයන් දන්නහුද? (කෙසේද) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්ට දොස්කීවාහු, මිසදිටු ගත්තාහු, මිසදිටු ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නිරයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝසුචරිතයෙන් යුක්තවූවාහු ආර්යයන්ට දොස් නොකීවාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන්වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලෝකයෙහි උපන්නාහුය මෙසේ පිරිසිදුවූ,

මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනාවර්ණ ඇත්තාවූද, මනාවර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මියගියාවූ සත්වයන් දන්නහුද?" "ඇවැත, මෙය නොවේමය" "ඇවැත්නි, තවද, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඔබලා යම් ඒ ශාන්තවූ විමොක්ෂවූ රූපයන් ඉක්මවූ අරූප සම්පත්තීන් කයින් ස්පර්ශකොට, වාසය කරන්නහුද?"

"ඇවැත, මෙය නොවේමය."

"ආයුෂ්මත්වරුනි, මෙහිදී මේ ධර්මයන්ට නොපැමිණීම ප්‍රකාශකිරීම සුදුසුය. ඇවැත්නි මෙය කෙසේ වන්නේද?"

7. "ඇවැත් සුසීමය අපි වනාහි ප්‍රඥාවෙන් මිදුනෝ වෙමු. (ශුෂ්කවිදර්ශකයෝ වෙමු) මම මේ ආයුෂ්මතුන් විසින් කෙටියෙන් කියන ලද්දාහුගේ අදහස විස්තර වශයෙන් නොදනිමි. යම්සේ මම මේ ආයුෂ්මතුන් කෙටියෙන් කියනලද කීමේ අදහස විස්තර වශයෙන් දැනගන්නෙම්ද එසේ මට ආයුෂ්මත්හු කියාදෙත්වා ඇවැත් සුසීමය නුඹ දැනගත්තෙහි හෝ වේවා. නුඹ දැන නොගත්තෙහි හෝ වේවා. එතකුදු වුවත් ප්‍රඥාවෙන් මිදුනෝ වෙමු (ශුෂ්කවිදර්ශකයෝ වෙමු)යි කීහ.

8. "ඉක්බිති ඇවැත් සුසීමතෙම හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි ගියේය. ගොස්, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ඇවැත් සුසීමතෙම වනාහි යම්තාක් ඒ භික්ෂූන් හා සමග කථා සල්ලාපයක් වූයේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට කීයේය.

"සුසීමය, මුලින් වනාහි ධම්මට්ඨිති ඥාණය (විදර්ශනා ඥාණය) ඇතිවේ. පසුව නිර්වාණයෙහි ඥාණය (මාර්ග ඥානය) ඇතිවේයයි" වදාළ සේක.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ කොටින් දේශනා කරනලද දේශනාවේ අදහස මම විස්තර වශයෙන් නොදනිමි.

ස්වාමීනි, යම්සේ මම මේ භාග්‍යවතුන් වහන්සේ කොටින් දේශනා කරනලද දේශනාවේ අදහස විස්තර වශයෙන් දැනගත්තෙම්ද එසේ මට භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනසේක්වා" "සුසීමය, නුඹ දැනගත්තෙහි හෝ වේවා, නුඹ දැන නොගත්තෙහි හෝ වේවා. එතකුදු වුවත් මුලින් වනාහි ධම්මට්ඨිති ඤාණය (විදර්ශනා ඥානය) ඇතිවේ. පසුව නිර්වාණයෙහි ඥානය (මාර්ගඥානය) ඇතිවේයයි වදාළ සේක. සුසීමය, ඒ කිමැයි සිතන්නෙහිද?

"රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?"

"ස්වාමීනි, අනිත්‍ය වේ."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය නම් දුක් නම් වෙනස්වෙන ස්වභාව ඇත්තේ නම් 'එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි' දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි"

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?"

"ස්වාමීනි, අනිත්‍ය වේ."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වෙන ස්වභාව ඇත්තේ නම්, 'එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි' දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?"

"ස්වාමීනි, අනිත්‍ය වේ."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වෙන ස්වභාව ඇත්තේ නම්, 'එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි' දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"සංස්කාර නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?"

"ස්වාමීනි, අනිත්‍ය වේ."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වෙන ස්වභාව ඇත්තේ නම්, 'එය මගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි' දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙයිද?"

"ස්වාමීනි, අනිත්‍ය වේ."

"යමක් වනාහි අනිත්‍යනම්, එය දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක් වේ."

"යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, වෙනස්වෙන ස්වභාව ඇත්තේ නම්, 'එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි' දැක්මට සුදුසුද?"

"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

**9.** "සුසීමය, මෙහිදී එනිසා අතීතවූද, අනාගතවූද, වර්තමාන වූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕළාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ යම් කිසි දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි රූපයක් වේද, මේ සියලු රූපය මාගේ නොවේ. මේ රූපය මම නොවෙමි. මේ රූපය මාගේ ආත්මය නොවේ යයි මෙසේ මේ ඇතිසේ සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕළාරිකවූ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ යම්කිසි දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි වේදනාවක් වේද, මේ සියලු වේදනාව මාගේ නොවේ. මේ වේදනාව මම නොවෙමි. මේ වේදනාව මාගේ ආත්මය නොවේයයි, මෙසේ මෙය ඇතිසේ සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ ඕළාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ යම්කිසි දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි සංඥාවක් වේද, මේ සියලු සංඥාව මාගේ නොවේ. මේ සංඥාව මම නොවෙමි. මේ සංඥාව මාගේ ආත්මය නොවේයයි, මෙසේ මෙය ඇතිසේ සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕළාරිකවූ හෝ සුඛමවූ හෝ යම්කිසි දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි සංඛාර වේද, මේ සියලු සංඛාර මාගේ නොවේ. මේ සංඛාර මම නොවෙමි, මේ සංඛාර මාගේ ආත්මය නොවේයයි, මෙසේ මෙය ඇතිසේ සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕළාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ යම්කිසි දුරවූ ළඟවූ හෝ යම්කිසි විඤ්ඤාණය වේද, මේ සියලු විඤ්ඤාණය මාගේ නොවේ. මේ විඤ්ඤාණය මම නොවෙමි. මේ විඤ්ඤාණය මාගේ ආත්මය නොවේයයි, මෙසේ මෙය ඇතිසේ සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය.

**10.** "සුසීමය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්යශ්‍රාවකතෙම රූපයන්හිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයන්හිද කලකිරෙයි. කලකිරුනේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ ඇතිවෙයි. ජාතිය (ඉපදීම) ක්‍ෂයවූයේය.

බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුතු දේ කරන ලද්දේය. මේ ආත්මයෙහි කළයුතු අනිකක් නැත්තේ යයි දැන ගනියි.

11. "සුසීමය, ජාතිය (ඉපදීම) නිසා ජරාමරණය ඇතිවේයයි (නුඹ) දන්නෙහිද?" "එසේයි ස්වාමීනි," "සුසීමය, භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවේයයි දන්නෙහිද?" "එසේය ස්වාමීනි," "සුසීමය, උපාදානය නිසා භවය ඇතිවේයයි දන්නෙහිද?" "එසේය ස්වාමීනි" "සුසීමය, තණ්හාව නිසා උපාදානය ඇති වේයයි දන්නෙහිද"? "එසේය ස්වාමීනි" "සුසීමය, වේදනාව නිසා තණ්හාව ඇතිවේයයි දන්නෙහිද?" "එසේය ස්වාමීනි" "සුසීමය, ස්පර්ශය නිසා වේදනාව ඇතිවේයයි දන්නෙහිද?" "සුසීමය, සළායතනයන් නිසා ස්පර්ශය ඇතිවේයයි දන්නෙහිද?" "සුසීමය, නාමරූපය නිසා සළායතනයන් ඇතිවේයයි දන්නෙහිද?" සුසීමය, විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේයයි දන්නෙහිද?" සුසීමය, සංස්කාරයන් නිසා විඤ්ඤාණය ඇතිවේයයි දන්නෙහිද? සුසීමය, අවිජ්ජාව නිසා සංස්කාරයන් ඇතිවේයයි දන්නෙහිද?" "එසේය ස්වාමීනි"

12. "සුසීමය, ජාතිය (ඉපදීම) නැතිවීමෙන් (නිරෝධයෙන්) ජරාමරණය නැතිවේයයි (නුඹ) දන්නෙහිද?" "එසේය ස්වාමීනි" "සුසීමය, භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේයයි දන්නෙහිද? සුසීමය උපාදානය නැතිවීමෙන් භවය නැතිවේයයි දන්නෙහිද? සුසීමය, තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවේයයි දන්නෙහිද? සුසීමය, වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවේයයි දන්නෙහිද? සුසීමය, ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවේයයි දන්නෙහිද? සුසීමය, සළායතනයන් නැතිවීමෙන් ස්පර්ශය නැතිවේයයි දන්නෙහිද? සුසීමය, නාමරූපය නැතිවීමෙන් සළායතනයන් නැතිවේයයි දන්නෙහිද? සුසීමය, විඤ්ඤාණය නැතිවීමෙන් නාමරූප නැතිවේයයි දන්නෙහිද? සුසීමය, සංස්කාරයන් නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේයයි දන්නෙහිද? සුසීමය, අවිජ්ජාව නැතිවීමෙන් සංස්කාර නැතිවේයයි දන්නෙහිද?" "එසේය ස්වාමීනි"

13. "තවද, සුසීමය, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, නුඹ නානාප්‍රකාරවූ ඍද්ධිවිධි විශේෂයෙන් විඳින්නෙහිද? (කෙසේද) එක් කෙනෙක්වී, බොහෝ දෙනෙක් වෙන්නෙහිද? බොහෝ දෙනෙක්වී එක් කෙනෙක් වෙන්නෙහිද? ප්‍රකට බවටත් අප්‍රකට බවටත් පැමිණෙන්නෙහිද? බිත්ති සරසද, ප්‍රාකාර සරසද, අහසේ යම්සේද එසේ නොගැටෙමින් ගමන් කරහිද? දියෙහි මෙන් පොළොවෙහිද, කිමිදීම්, මතුවීම් කරහිද? පොළොවෙහි මෙන් දියෙහිද, නොකිඳෙමින්යෙහිද? පක්ෂියෙකුමෙන් අහසෙහි අරමිණිය ගොතාගෙන (හිඳගෙන) යන්නෙහිද? මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් අනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙන අතින් අල්ලන්නෙහිද? අතගාන්නෙහිද? බ්‍රහ්මලෝකය දක්වා කයින් තමන් වසඟ කෙරෙහිද?" "ස්වාමීනි, මෙය නොවේමය."

14. "සුසීමය, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, නුඹ මිනිස් කණ ඉක්ම සිටින්නාවූ පිරිසිදුවූ, දිව කණින් දෙවියන් පිළිබඳවූද, මිනිසුන් පිළිබඳවූද, දුරවූද, ළඟවූද, දෙයාකාරවූ ශබ්දයන් අසහිද?" "ස්වාමීනි, මෙය නොවේමය" "සුසීමය, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ නුඹ අන්‍ය සත්වයින්ගේද, අන්‍යපුද්ගලයන්ගේද, සිත තමාගේ සිතින් පිරිසිඳ දන්නෙහිද? (කෙසේද?) රාගසහිත සිත රාග සහිත සිතයයි දන්නෙහිද? රාග රහිත සිත රාග රහිත සිතයයි දන්නෙහිද? ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දන්නෙහිද? ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතයයි දන්නෙහිද? මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දන්නෙහිද? මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දන්නෙහිද? හැකුළුණු සිත හැකුළුණු සිතයයි දන්නෙහිද? විසුරුණු සිත විසුරුණු සිතයයි දන්නෙහිද? මහත් බවට පැමිණි සිත මහත් බවට පැමිණි සිතයයි දන්නෙහිද? මහත් බවට නොපැමිණි සිත මහත් බවට නොපැමිණි සිතයයි දන්නෙහිද? උසස් බවට පැමිණි සිත උසස් බවට පැමිණි සිතයයි දන්නෙහිද? උසස් බවට නොපැමිණි සිත උසස් බවට නොපැමිණි සිතයයි දන්නෙහිද? එකඟවූ සිත එකඟවූ සිතයයි දන්නෙහිද? එකඟ නොවූ සිත එකඟ නොවූ සිතයයි දන්නෙහිද? (කෙලෙසුන්ගෙන්) මිදුණු

සිත (කෙලෙසුන්ගෙන්) මිදුනු සිතයයි දන්නෙහිද? (කෙලෙසුන්ගෙන්) නොමිදුනු සිත (කෙලෙසුන්ගෙන්) නොමිදුනු සිතයයි දන්නෙහිද?" "ස්වාමීනි, මෙය නොවේමය."

**15.** "සුසීමය, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ නුඹ නානාප්‍රකාරවූ, පෙර විසූ තැන් සිහි කෙරෙහිද? හේ කවරේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දෙමි. ඒ මම එයින් චුතව, අසවල් තැන උපන්නෙමි. එතැන්හිද, මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැප දුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍ය භවයෙහි උපන්නෙමියි. මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නොයෙක් ආකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරහිද?" "ස්වාමීනි මෙය නොවේමය."

**16.** "සුසීමය, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, නුඹ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් සත්වයින් දක්නෙහිද? (කෙබඳු සත්වයින්ද?) චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය ගියාවූ සත්වයන් දකිමි. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන්හට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන

නරකයෙහි උපන්නාහු යයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක්සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, ආර්යයන් හට දොස් නොකීවාහු, සම්‍යක් දෘෂ්ටි (හරිදැකීම්) ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ගලෝකයෙහි උපදින්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස් ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මියගියාවූ සත්වයන් දන්නෙහිද?" "ස්වාමිනි, මෙය නොවේමය."

17. "සුසීමය, තවද, මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ, නුඹ යම් ඒ ශාන්තවූ, අරූපාවචර ද්ධ්‍යාන විමොක්ෂයෙන් රූපයන් ඉක්මවා, ඔවුන් කයින් ස්පර්ශකොට, වාසය කරන්නෙහිද?' "ස්වාමීනි, මෙය නොවේමය" "සුසීමය, මෙහිදී මෙය කෙසේ දැයි මේ ධර්මයන්ට නොපැමිණීම ප්‍රකාශ කිරීමයි."

18. "ඉක්බිති ඇවැත් සුසීමතෙම භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා දෙක ළඟ හිසින් වැටී, භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. 'ස්වාමීනි, බාලයකුසේ, මුළාවූවෙකුසේ, අදක්ෂයකුසේ, වැරැද්ද මා ඉක්මවා ගියේය. ඒ මම මෙසේ මනාකොට දේශනා කරන ලද, ශාසනයෙහි දහම් හොරෙක්ව පැවිදිවූයේ වෙමි. ස්වාමීනි, ආයති සංවරය පිණිස (මත්තෙහි සංවරවීම පිණිස) භාග්‍යවතුන් වහන්සේ ඒ මාගේ වරද, වරද වශයෙන් පිළිගන්නා සේක්වා". "සුසීමය, එසේනම් බාලයකුසේ මුළාවූවෙකුසේ, අදක්ෂයකුසේ වරද, නුඹ ඉක්මවා ගියේය. ඒ නුඹ මෙසේ මනාකොට දේශනා කරන ලද, ශාසනයෙහි දහම් හොරෙක්ව පැවිදිවූයෙහිය.

19. "සුසීමය, යම්සේ වනාහි අපරාධකාරී සොරෙකු අල්ලා ගෙනවුත් රජහට දක්වන්නාහුය. (කෙසේද?) 'දේවයන්වහන්ස, මේ අපරාධකාරී සොරාය. මොහුට යම් දඬුවමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම පණවනු මැනව,' කියායි. ඒ මොවුන්ට රජතෙම මෙසේ කියන්නේය. පින්වත්නි, යව්, මේ පුරුෂයා දැඩි ලනුවකින් පිටිතලහයා (දෑත් පිටුපසට කොට) දැඩිකොට බැඳ, හිස

මුඩුකොට, දැඩි හඬින් යුත් පණාබෙරින් යුක්තව වීදියෙන් වීදියට, සතරමං සංදියෙන් සතරමංසන්දියට පමුණුවා, දකුණු දොරින් නික්මවා, නගරයේ දකුණු පැත්තෙහිදී හිස සිඳිව්" යයි කියායි. ඒ මේ රාජ පුරුෂයෝ දැඩි ලනුවෙන් පිටිතලහයා (දෑත් පිටුපසට කොට) දැඩිකොට බැඳ, හිස මුඩුකොට, දැඩිහඬින් යුත් පණා බෙරින් යුක්තව' වීදියෙන් වීදියට, සතරමංසන්දියෙන් සතරමංසන්දියට පමුණුවා, දකුණු දොරින් නික්මවා, නගරයේ, දකුණු පැත්තෙහිදී, හිස සිඳින්නාහුය.

**20.** "සුසීමය, ඒ ගැන කෙසේ සිතන්නෙහිද? තවද, ඒ පුරුෂතෙම ඒ හේතුවෙන් දුක් දොම්නසක් විඳින්නෙහිද?" "එසේය, ස්වාමීනි" "සුසීමය, ඒ පුරුෂතෙම වනාහි ඒ හේතුවෙන් යම් දුක් දොම්නසක් විඳියිද, මෙසේ මනාකොට දේශනා කරන ලද, ශාසනයෙහි දහම් හොරෙකුගේ යම් පැවිද්දක් වේද, මෙය ඊට වඩා අධික දුක් විපාක ඇත්තේද කටුක විපාක ඇත්තේද වේ. තවද, දුගතියෙහි ඉපදීම පිණිසද හේතුවෙයි.

"සුසීමය, යම් හෙයකින් වනාහි නුඹ වරද, වරද වශයෙන් දැන, ධර්මය සේ පිළියම් කෙරෙහිද, නුඹගේ ඒ වරද අපි පිළිගනිමු. සුසීමය, යමෙක් වරද, වරද වශයෙන් දැක, ධර්මයට අනුව පිළියම් කෙරෙයිද, ආයති සංවරයටත් (මත්තෙහි සංවරවීමටත්) පැමිණෙයිද, මෙය ආර්ය විනයෙහි වැඩීම වන්නේය."

**(දසවන සුසීම සූත්‍රය නිමි.)**

---

**(සත්වන මහා වර්ගයයි.)**

අස්සුතවන්තු සූත්‍ර දෙකක් වදාරන ලදී. පුත්‍ර මාංශ සූත්‍රයයි තවෙකක් වදාරන ලදී. රාග සූත්‍රයද නගර සූත්‍රයද, සම්මසන සූත්‍රයද, නළකලාපිය සූත්‍රයද, කොසම්බි සූත්‍රයද, උපයන්ති සූත්‍රයද, සුසීම සූත්‍රය දැයි මේ වර්ගයෙහි සූත්‍ර දහයක් ඇත්තේය.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 8. ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගය.

## 1. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනී" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරාමරණය නොදනිත්ද, ජරාමරණයට හේතුව නොදනිත්ද, ජරාමරණයන්ගේ නැතිවීම නොදනිත්ද, ජරාමරණය නැති කරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජරාමරණය දනිත්ද ජරාමරණයට හේතුව දනිත්ද ජරා මරණය නැතිවීම දනිත්ද ජරාමරණය නැතිකරන මාර්ගය දනිත්ද, මහණෙනි ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරෙති."

**(පළමුවැනි පච්චය සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 2. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ඉපදීම (ජාතිය) නොදනිත්ද, ඉපදීමට හේතුව නොදනිත්ද, ඉපදීම නැතිවීම නොදනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ඉපදීම දනිත්ද, ඉපදීමට හේතුව දනිත්ද, ඉපදීම නැතිවීම දනිත්ද, ඉපදීම නැතිකරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙති.

**(දෙවෙනි පච්චය සූත්‍රය නිමි.)**

---

## 3. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි, වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ භවය නොදනිත්ද, භවයට හේතුව නොදනිත්ද, භවය නැතිවීම නොදනිත්ද, භවය නැති කරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණභාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය නොකරත්.

3. “මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ භවය දනිත්ද, භවයට හේතුව දනිත්ද භවය නැතිවීම දනිත්ද, භවය නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙති.”

**(තෙවෙනි පච්චය සූත්‍රය නිමි.)**

---

## 4. පච්චය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි, කියා භික්ෂූන් ඇමතූහ.

ස්වාමීනියි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපාදානය (තදින් අල්ලාගැනීම) නොදනිත්ද, උපාදානයට හේතුව නොදනිත්ද, උපාදානය නැතිවීම නොදනිත්ද, උපාදානය නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපාදානය දනිත්ද, උපාදානයට හේතුව දනිත්ද, උපාදානය නැතිවීම දනිත්ද, උපදානය නැතිකරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙති."

**(සිව්වැනි පච්චය සූත්‍රය නිමි.)**

---

## 5. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තණ්හාව නොදනිත්ද, තණ්හාවට හේතුව නොදනිත්ද, තණ්හාව නැතිවීම නොදනිත්ද, තණ්හාව නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තණ්හාව දනිත්ද, තණ්හාවට හේතුව දනිත්ද, තණ්හාව නැතිවීම දනිත්ද, තණ්හාව නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(පස්වන පච්චය සූත්‍රය නිමි.)**

---

## 6. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි කියා භික්ෂූන් ඇමතූහ. ස්වාමීනියි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ වේදනාව නොදනිත්ද, වේදනාවට හේතුව නොදනිත්ද, වේදනාව

නැතිවීම නොදනිත්ද, වේදනාව නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ වේදනාව දනිත්ද, වේදනාවට හේතුව දනිත්ද, වේදනාව නැතිවීම දනිත්ද, වේදනාව නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(සයවන පච්චය සූත්‍රය නිමි.)**

---

## 7. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ස්පර්ශය නොදනිත්ද, ස්පර්ශයට හේතුව නොදනිත්ද, ස්පර්ශය නැතිවීම නොදනිත්ද, ස්පර්ශය නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන්

කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ස්පර්ශය දනිත්ද, ස්පර්ශයට හේතුව දනිත්ද, ස්පර්ශය නැතිවීම දනිත්ද, ස්පර්ශය නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(හත්වන පච්චය සූත්‍රය නිමි.)**

---

## 8. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සළායතන නොදනිත්ද, සළායතනයන්ට හේතුව නොදනිත්ද, සළායතන නැතිවීම නොදනිත්ද, සළායතන නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි

ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්ම භාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සළායතන දනිත්ද, සළායතනයන්ට හේතුව දනිත්ද, සළායතන නැතිවීම දනිත්ද, සළායතන නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(අටවන පච්චය සූත්‍රය නිමි.)**

---

## 9. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නාමරූප නොදනිත්ද, නාමරූපයන්ට හේතුව නොදනිත්ද, නාමරූප නැතිවීම නොදනිත්ද, නාමරූප නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නාමරූප දනිත්ද, නාමරූපයන්ට හේතුව දනිත්ද, නාමරූප නැතිවීම දනිත්ද, නාමරූප නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසයකෙරෙති."

**(නවවැනි පච්චය සූත්‍රය නිමි.)**

---

## 10. පච්චය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ විඤ්ඤාණය නොදනිත්ද, විඤ්ඤාණයන්ට හේතුව නොදනිත්ද, විඤ්ඤාණය නැතිවීම නොදනිත්ද, විඤ්ඤාණය නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ විඤ්ඤාණය දනිත්ද, විඤ්ඤාණයට හේතුව දනිත්ද, විඤ්ඤාණය

නැතිවීම දනිත්ද, විඤ්ඤාණය නැති කරන මාර්ගය දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(දසවන පච්චය සූත්‍රය නිමි.)**

---

## 11. පච්චය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සංස්කාරයන් නොදනිත්ද, සංස්කාරන්ට හේතුව නොදනිත්ද, සංස්කාරයන් නැතිවීම නොදනිත්ද, සංස්කාරයන් නැතිකරන මාර්ගය නොදනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සංස්කාරයන් දනිත්ද, සංස්කාරයන්ට හේතුව දනිත්ද, සංස්කාරයන් නැතිවීම දනිත්ද, සංස්කාරයන් නැති කරන මාර්ගය

දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය (ශ්‍රමණ භාවයේ ඵලය) හෝ බ්‍රාහ්මණාර්ථය (බ්‍රාහ්මණ භාවයේ ඵලය) හෝ මේ ආත්මභාවයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙති.”

**(එකොළොස් වැනි පච්චය සූත්‍රය නිමි.)**

---

## අටවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගයයි.

චතුරාර්ය සත්‍යය බෙදා දේශනා කරන්නාවූ බුදුරජාණන් වහන්සේ විසින් පච්චය සූත්‍ර එකොළොසක් වදාරණ ලදී ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගය නිදාන වර්ගයෙහි අටවැනි වර්ගය වෙයි.

## මේ වර්ග පිළිවෙළයි.

බුද්ධ වර්ගය, ආහාර වර්ගය, දසබල වර්ගය, කළාරඛත්තිය වර්ගය, පස්වැනිවූ ගහපති වර්ගය, දුක්ඛ වර්ගය, මහා වර්ගය සහ අට වැනිවූ ශ්‍රමණ බ්‍රාහ්මණ වර්ගයයි කියා වර්ග අටකි.

---

# 9. අන්තර පෙය්‍යාලය

## 1. සත්ථු වර්ගය.

### "1. සත්ථු සූත්‍රය"

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තත්වූ පරිදි ජරාමරණය නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. ජරාමරණය නැතිවීම තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණ නිරොධයෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූපරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(පළමුවන සත්ථු සූත්‍රය නිමි.)**

---

### "2. සත්ථු සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඉපදීම තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. ඉපදීමට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ඉපදීමට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි ඉපදීම නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම නැතිවීමෙහි, තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි ඉපදීම නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ඉපදීම නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(දෙවෙනි සත්ථු සූත්‍රය නිමි.)**

---

## "3. සත්ථු සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භවය නැතිවීමෙහි, තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූපරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

(තෙවෙනි සත්පු සූත්‍රය නිමි.)

---

## 4. සත්පු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිවීමෙහි, තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි උපාදානය (දැඩිව අල්ලා ගැනීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය (දැඩිව අල්ලා ගැනීම)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

(සිව්වන සත්පු සූත්‍රය නිමි.)

---

## 5. සත්පු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි, තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

(පස්වන සත්පු සූත්‍රය නිමි.)

---

## 6. සත්පු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි, තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූපරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(හයවන සත්ථු සූත්‍රය නිමි.)**

---

## 7. සත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයට

හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූපරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(හත්වන සත්ථු සූත්‍රය නිමි.)**

---

## 8. සත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතනය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(අටවන සත්ථු සූත්‍රය නිමි.)**

---

## 9. සත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෲවරයෙක් සෙවිය යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෲවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෲවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෲවරයෙක් සෙවිය යුත්තේය.

**(නවවන සත්ථු සූත්‍රය නිමි.)**

---

## 10. සත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(දසවන සත්ථු සූත්‍රය නිමි.)**

---

## 11. සත්ථු සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි, තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ශාස්තෘවරයෙක් සෙවිය යුත්තේය.

**(එකොළොස්වන සත්ථු සූත්‍රය නිමි.)**

---

**පළමුවන සත්ථු වර්ගයයි.**

**(මේ වර්ගයෙහි සත්ථු සූත්‍ර එකොළොසක් වේ.)**

---

# 10. සික්ඛා වර්ගය.

## "1. සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ජරා මරණය, තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. ජරාමරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ජරාමරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස

හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. කළයුතු වන්නේය."

**(පළමුවන සික්ඛා සූත්‍රය නිමි.)**

---

## "2. සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. ජාතිය (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. කළයුතු වන්නේය."

**(දෙවෙනි සික්ඛා සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## "3 සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි භවය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය."

**(තෙවෙනි සික්ඛා සූත්‍රය නිමි.)**

---

## "4. සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය (දැඩිව

අල්ලා ගැනීමට) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි උපාදානය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය."

**(හතරවන සික්ඛා සූත්‍රය නිමි.)**

---

## "5. සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව

නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය.”

(පස්වන සික්ඛා සූත්‍රය නිමි.)

---

## “6. සික්ඛා සූත්‍රය”

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය.”

(හයවන සික්ඛා සූත්‍රය නිමි.)

---

## 7. සික්ඛා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය."

(හත්වන සික්ඛා සූත්‍රය නිමි.)

---

## 8. සික්ඛා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය.”

**(අටවන සික්ඛා සූත්‍රය නිමි.)**

---

## 9. සික්ඛා සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය. කළයුතු වන්නේය.”

**(නවවන සික්ඛා සූත්‍රය නිමි.)**

---

## 10. සික්ඛා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය."

**(දසවන සික්ඛා සූත්‍රය නිමි.)**

## "11. සික්ඛා සූත්‍රය"

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස හික්මීම කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාර නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස හික්මීම කළයුත්තේය, කළයුතු වන්නේය.”

(එකොළොස්වෙනි සික්ඛා සූත්‍රය නිමි)

---

දෙවෙනි සික්ඛා වර්ගයයි
(මේ වර්ගයෙහි සික්ඛා සූත්‍ර එකොළොසකි)

---

## 3. යෝග වර්ගය.

### 1. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ජරාමරණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ජරාමරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රයෝග (උත්සාහ) කළ යුතුය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රයෝග

(උත්සාහ) කළ යුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රයෝග (උත්සාහ) කළ යුතුය. තත්වූ පරිදි ජරාමරණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රයෝග (උත්සාහ) කළයුත්තේය.

**(පළමුවෙනි යෝගසූත්‍රය නිමි.)**

---

## 2. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඉපදීම (ජාතිය) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි (ජාතියෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රයෝග (උත්සාහ) කළ යුතුය. ඉපදීමට (ජාතියට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමට (ජාතියට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රයෝග (උත්සාහ) කළ යුත්තේය. තත්වූ පරිදි ඉපදීම (ජාතිය) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය.

**(දෙවෙනි යෝග සූත්‍රය නිමි.)**

---

## 3. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි භවය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි භවය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය.

**(තුන්වෙනි යෝග සූත්‍රය නිමි.)**

---

## 4. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය."

**(හතරවෙනි යෝග සූත්‍රය නිමි.)**

---

## 5. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය."

**(පස්වෙනි යෝග සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 6. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලදද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය.”

**(හයවෙනි යෝග සූත්‍රය නිමි.)**

---

## 7. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලදද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස උත්සාහ කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය."

**(හත්වෙනි යෝග සූත්‍රය නිමි.)**

---

## 8. යෝග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය.

**(අටවෙනි යෝග සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. යෝග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය."

(නවවෙනි යෝග සූත්‍රය නිමි.)

---

## 10. යෝග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය."

(දසවෙනි යෝග සූත්‍රය නිමි.)

---

## 11. යෝග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා

විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස උත්සාහ කළ යුත්තේය.

**(එකොළොස්වෙනි යෝග සූත්‍රය නිමි.)**

---

**තුන්වෙනි යෝග වර්ගයයි.**
**(මේ වර්ගයෙහි යෝග සූත්‍ර එකොළොසක්වේ.)**

---

# 4. ඡන්ද වර්ගය.

## 1. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ජරා මරණය, තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. ජරා මරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ජරා මරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ජරා මරණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ජරා මරණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය.”

**(පළමුවෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 2. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියෙහි (ඉපදීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. ජාතියට (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම (ජාතිය) නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය."

**(දෙවෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 3. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. භවයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය.

(තුන්වෙනි ඡන්ද සූත්‍රය නිමි.)

---

## 4. ඡන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය

ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය."

**(හතරවෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 5. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුසලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය."

**(පස්වෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 6. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය.

**(හයවෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 7. ඡන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය.

**(හත්වෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 8. ඡන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතනය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතනය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතනය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ

පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය.”

(අටවන ඡන්ද සූත්‍රය නිමි.)

---

## 9. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය.”

(නවවන ඡන්ද සූත්‍රය නිමි.)

---

## 10. ඡන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය."

**(දසවන ඡන්ද සූත්‍රය නිමි.)**

---

## 11. ඡන්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින්

සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැති වීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස කුශලට කැමති බව ඇති කළ යුත්තේය.

**(එකොළොස් වෙනි ඡන්ද සූත්‍රය නිමි.)**

---

**හතරවෙනි ඡන්ද වර්ගයයි.**

**(මේ වර්ගයෙහි ඡන්ද සූත්‍ර එකොළොසක් වේ.)**

---

## 5. උස්සොළ්හී වර්ගය.

### 1. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්ය කළයුතුය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස අධික වීර්යය කළයුතුය.

තත්වූ පරිදි ජරාමරණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැති වීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළ යුත්තේය."

**(පළමුවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 2. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ඉපදීම (ජාතිය) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි (ජාතියෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළයුතුය. ඉපදීමට (ජාතියට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමට (ජාතියට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළයුතුය. තත්වූ පරිදි ඉපදීම (ජාතිය) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය."

**(දෙවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 3. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය.

**(තුන්වෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 4. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනි”යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව

අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළ යුත්තේය.”

**(හතරවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 5. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු

මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළයුත්තේය.”

**(පස්වෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 6. උස්සොළ්හී සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලදද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළයුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළයුත්තේය.”

**(හයවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 7. උස්සොළ්හී සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී,

භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළයුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්ය කළයුත්තේය.”

**(හත්වෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 8. උස්සොළ්හී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි

ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය.”

**(අටවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 9. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය.”

**(නවවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 10. උස්සොළ්හී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය."

**(දසවෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

## 11. උස්සොළ්හී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය."

**(එකොළොස්වෙනි උස්සොළ්හී සූත්‍රය නිමි.)**

---

**තුන්වෙනි උස්සොළ්හී වර්ගයයි.**

**(මේ වර්ගයෙහි උස්සොළ්හී සූත්‍ර එකොළොසක්වේ.)**

---

# 6. අප්පටිවානි වර්ගය.

## 1. අප්පටිවානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** "මහණෙනි, ජරා මරණය, තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. ජරා මරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි ජරා මරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි ජරා මරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරා මරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය."

**(පළමුවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 2. අප්පටිවානි සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියෙහි (ඉපදීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. ජාතියට (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම (ජාතිය) නැතිවීමෙහි තත්වූ පරිදි

ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්ය කළ යුත්තේය.”

**(දෙවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 3. අප්පටිවානි සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. භවයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය ඇති කළයුත්තේය. තත්වූ පරිදි භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය.”

**(තුන්වෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 4. අප්පටිවානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස අධික වීර්යය කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය.”

**(හතරවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 5. අප්පටිවානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය."

**(පස්වෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 6. අප්පටිවානි සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසු බස්නා

වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය."

**(හයවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 7. අප්පටිවානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළයුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින් නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසු බස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්ය කළයුත්තේය."

**(හත්වෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 8. අප්පටිවානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය."

(අටවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)

---

## 9. අප්පටිවානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය."

**(නවවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)**

---

## 10. අප්පටිවානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඥ්ඥාණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. විඥ්ඥාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්ය කළ යුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිකිරීමට ගමන්

කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසුබස්නා වීර්යය කළ යුත්තේය.”

(දසවෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)

---

## 11. අප්පටිවානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොපසු බස්නා වීර්යය කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසු බස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසු බස්නා වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොපසු බස්නා වීර්යය කළ යුත්තේය.”

(එකොළොස් වෙනි අප්පටිවානි සූත්‍රය නිමි.)

---

හතරවෙනි අප්පටිවානි වර්ගයයි

(මේ වර්ගයෙහි අප්පටිවානි සූත්‍ර එකොළොසක් වේ.)

---

# 7. ආතප්ප වර්ගය.

## 1. ආතප්ප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්ය කළයුතුය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්ය කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්ය කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්ය කළ යුත්තේය."

**(පළමුවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 2. ආතප්ප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ඉපදීම (ජාතිය) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි (ජාතියෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුතුය. ඉපදීමට (ජාතියට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමට (ජාතියට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුතුය. තත්වූ පරිදි ඉපදීම (ජාතිය) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්ය කළ යුත්තේය."

**(දෙවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 3. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය.”

**(තුන්වෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 4. ආතප්ප සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනි”යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙලෙස්තවන වීර්යය කළ යුත්තේය. උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති වීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය.”

**(හතරවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 5. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය."

**(පස්වෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 6. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්ය කළයුත්තේය."

**(හයවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 7. ආතප්ප සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙලෙස් තවන වීර්යය කළ යුත්තේය.

තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය.”

**(හත්වෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 8. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය.”

**(අටවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 9. ආතප්ප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය."

**(නවවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 10. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඥ්ඥාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඥ්ඥාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය.”

**(දසවෙනි ආතප්ප සූත්‍රය නිමි.)**

---

## 11. ආතප්ප සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ

පරිදි ඥාණය ඇතිවීම පිණිස කෙළෙස් තවන වීර්යය කළ යුත්තේය.”

(එකොළොස්වෙනි ආතප්ප සූත්‍රය නිමි.)

---

තුන්වෙනි ආතප්ප වර්ගයයි.

(මේ වර්ගයෙහි ආතප්ප සූත්‍ර එකොළොසක්වේ.)

---

## 8. විරිය වර්ගය.

### 1. විරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය, තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. ජරාමරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.”

(පළමුවෙනි විරිය සූත්‍රය නිමි.)

---

## 2. විරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියෙහි (ඉපදීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. ජාතියට (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම (ජාතිය) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය."

**(දෙවෙනි විරිය සූත්‍රය නිමි.)**

## 3. විරිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස යුද්ධ වීර්යය කළ යුත්තේය. භවයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.”

**(තුන්වෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 4. විරිය සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිකිරීමට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.”

**(හතරවෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 5. විරිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.”

**(පස්වෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 6. විරිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින්

කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.

**(හයවෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 7. විරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා

විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.

**(හත්වෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 8. විරිය සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය."

**(අටවෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 9. විරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය ඇති කළ යුත්තේය."

**(නවවෙනි විරිය සූත්‍රය නිමි.)**

---

## 10. විරිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය."

(දසවෙනි විරිය සූත්‍රය නිමි.)

---

## 11. විරිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය

නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස සුද්ධ වීර්යය කළ යුත්තේය.

(එකොළොස්වෙනි විරිය සූත්‍රය නිමි.)

---

අටවෙනි විරිය වර්ගයයි.

(මේ වර්ගයෙහි විරිය සූත්‍ර එකොළොසක් වේ.)

---

## 9. සාතච්ච වර්ගය.

### 1. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුතුය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය.”

(පළමුවෙනි සාතච්ච සූත්‍රය නිමි.)

---

## 2. සාතච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි (ජාතියෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුතුය. ඉපදීමට (ජාතියට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමට (ජාතියට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුතුය. තත්වූ පරිදි ඉපදීම (ජාතිය) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය."

**(දෙවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 3. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට, හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය.

**(තුන්වෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 4. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. උපාදානය (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥානය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥානය

ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය."

**(හතරවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 5. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය."

**(පස්වෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 6. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය."

**(හයවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 7. සාතච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය."

**(හත්වෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 8. සාතච්ච සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, සළායතන තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින්

සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය.”

**(අටවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 9. සාතච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය.”

**(නවවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 10. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඥ්ඥාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඥ්ඥාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. විඥ්ඥාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය."

**(දසවෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

## 11. සාතච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළයුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන්

නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස නොනවත්වා ක්‍රියාකිරීම කළ යුත්තේය."

**(එකොළොස්වෙනි සාතච්ච සූත්‍රය නිමි.)**

---

**නවවෙනි සාතච්ච වර්ගයයි.**

**(මේ වර්ගයෙහි සාතච්ච සූත්‍ර එකොළොසක්වේ.)**

---

## 10. සති වර්ගය.

### 1. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලදද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය, තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. ජරාමරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා

විසින් නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය.”

**(පළමුවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 2. සති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියෙහි (ඉපදීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. ජාතියට (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම (ජාතිය) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇතිකළ යුත්තේය.”

**(දෙවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 3. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළයුත්තේය. භවයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(තුන්වෙනි සති සූත්‍රය නිමි.)**

---

## 4. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි

ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(හතරවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 5. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(පස්වෙනි සති සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 6. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළයුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(හයවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 7. සති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

විමසන සිහිය ඇති කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(හත්වෙනි සති සූත්‍රය නිමි.)**

---

## 8. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතනය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට

ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය.”

**(අටවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 9. සති සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළ යුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය.”

**(නවවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 10. සති සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින්

කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය."

**(දසවෙනි සති සූත්‍රය නිමි.)**

---

## 11. සති සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන සිහිය

ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන සිහිය ඇති කළ යුත්තේය.”

**(එකොළොස්වෙනි සති සූත්‍රය නිමි.)**

---

**දහවෙනි සති වර්ගයයි.**
**(මේ වර්ගයෙහි සති සූත්‍ර එකොළොසක් වේ.)**

---

## 11. සම්පජඤ්ඤ වර්ගය.

### 1. සම්පජඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළයුතුය. ජරාමරණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළයුතුය. තත්වූ පරිදි ජරාමරණය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැති වීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුතුය. තත්වූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය.”

**(පළමුවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 2. සම්පජඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ඉපදීම (ජාතිය) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමෙහි (ජාතියෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළයුතුය. ඉපදීමට (ජාතියට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීමට (ජාතියට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළයුතුය. තත්වූ පරිදි ඉපදීම (ජාතිය) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය.”

**(දෙවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 3. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. භවයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැති වීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් භවය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය."

**(තුන්වෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 4. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන

නුවණ ඇති කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලාගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානය නැති කිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය.”

**(හතරවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 5. සම්පජඤ්ඤ සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළයුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට

ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය."

**(පස්වෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 6. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇති කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(හයවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 7. සම්පජඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩුසිටාණන් විසින්

කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(හත්වෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 8. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතනය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ

ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(අටවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 9. සම්පජඤ්ඤ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(නවවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 10. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඤ්ඤාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඤ්ඤාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. විඤ්ඤාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් විඤ්ඤාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(දසවෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

## 11. සම්පජඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස විමසන නුවණ ඇතිකළ යුත්තේය."

**(එකොළොස්වෙනි සම්පජඤ්ඤ සූත්‍රය නිමි.)**

---

**එකොළොස්වෙනි සම්පජඤ්ඤ වර්ගයයි.**
**(මේ වර්ගයෙහි සම්පජඤ්ඤ සූත්‍ර එකොළොසක් වේ.)**

---

# 12. අප්පමාද වර්ගය.

## 1. අප්පමාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, ජරාමරණය, තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයෙහි, තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. ජරාමරණයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණයට, හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය, නැතිවීම නොදන්නා

විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජරාමරණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය."

**(පළමුවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 2. අප්පමාද සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** මහණෙනි, ජාතිය (ඉපදීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියෙහි (ඉපදීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. ජාතියට (ඉපදීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතියට (ඉපදීමට) හේතුවෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ඉපදීම (ජාතිය) නැතිවීමෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් ජාතිය (ඉපදීම) නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඤාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය."

**(දෙවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 3. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. මහණෙනි, භවය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් භවයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. භවයට, හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් භවයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි භවය, නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් භවය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(තුන්වෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 4. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, උපාදානය (දැඩිව අල්ලා ගැනීම) තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානයෙහි (දැඩිව

අල්ලා ගැනීමෙහි) තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් උපාදානයට (දැඩිව අල්ලා ගැනීමට) හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි උපාදානය, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් උපාදානය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය.”

**(හතරවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 5. අප්පමාද සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, තණ්හාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් තණ්හාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තණ්හාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි තණ්හාව, නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොදන්නා විසින්, නොදක්නා විසින් තණ්හාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(පස්වෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 6. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, වේදනාව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. වේදනාවට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාවට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් වේදනාව නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් වේදනාව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(හයවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 7. අප්පමාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින්

කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ස්පර්ශය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. ස්පර්ශයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් ස්පර්ශය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් ස්පර්ශය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(හත්වෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 8. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සළායතනය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සළායතනයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. සළායතනයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතනයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් සළායතන නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් සළායතන නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය.”

**(අටවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 9. අප්පමාද සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** “මහණෙනි, නාමරූප තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. නාමරූපයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූපයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් නාමරූප නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇතිකළ යුත්තේය. තත්වූ පරිදි නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් නාමරූප නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය.”

**(නවවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 10. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, විඥ්ඥාණය තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් විඥ්ඥාණයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. විඥ්ඥාණයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිවීම නොදන්නා විසින්, නොදක්නා විසින් විඥ්ඥාණය නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි විඥ්ඥාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින් නොදක්නා විසින් විඥ්ඥාණය නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(දහවෙනි අප්පමාද සූත්‍රය නිමි.)**

---

## 11. අප්පමාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සංස්කාරයන් තත්වූ පරිදි නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයෙහි තත්වූ පරිදි නුවණ ඇතිවීම

පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. සංස්කාරයට හේතුව තත්වූ පරිදි නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයට හේතුවෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිවීම නොදන්නා විසින් නොදක්නා විසින් සංස්කාරයන් නැතිවීමෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය. තත්වූ පරිදි සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය නොදන්නා විසින්, නොදක්නා විසින් සංස්කාරයන් නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගයෙහි තත්වූ පරිදි ඥාණය ඇතිවීම පිණිස ප්‍රමාද නොවීම ඇති කළ යුත්තේය."

**(එකොළොස්වෙනි අප්පමාද සූත්‍රය නිමි)**

---

**දොළොස්වෙනි අප්පමාද වර්ගයයි.**

**(මේ වර්ගයෙහි අප්පමාද සූත්‍ර එකොළොසක් වේ.)**

---

## 13. අභිසමය වර්ගය.

### 1. නඛසිඛා සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිය පිට පස් ස්වල්පයක් තබාගෙන භික්ෂූන් ඇමතූසේක.

2. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මා විසින් යම් මේ නිය පිට තබන ලද පස් ස්වල්පයද, මේ මහ පොළොවද යන දෙකින් කුමක් වනාහි වඩා ලොකු වෙයිද" "ස්වාමීනි, යම් මේ මහ පොළොවක් වේද, එයම වඩා ලොකුවෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් නිය පිටට ගන්නා ලද, මේ පස් ස්වල්පය ඉතා

සුළුය. භාග්‍යවතුන් වහන්සේ විසින් නිය පිටට ගන්නා ලද, පස් ස්වල්පය මහ පොළොව හා සමග සසඳා බලන කල්හි, සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි.'

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවරවූයේද ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, ධර්මාවබෝධය වනාහි මෙසා මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම මෙසා මහත්වූ අර්ථ ඇත්තේය."

**(පළමුවෙනි නඛසිඛා සූත්‍රය නිමි.)**

---

## 2. පොක්ඛරණී සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි දිගින් පනස් යොදුන්වූ, පුළුලින් පනස් යොදුන්වූ, ගැඹුරින් පනස් යොදුන්වූ, කපුටන්ට පානය කරනු හැකිවනසේ කට ළඟට පිරුණාවූ, පොකුණක් වේද, එයින් පුරුෂයෙක් කුසතණ පතක අගින් දිය බිඳක් ගන්නේය. මහණෙනි, ඒ කිමෙකැයි සිතන්නහුද කුසතණපත්

අගින් ගන්නා ලද යම් දිය බිඳක් වේද, පොකුණෙහි ඉතිරිවූ යම් දියක් වේද, මේ දෙකින් කවරක් වනාහි අධිකතර වේද?" "ස්වාමීනි, යම් මේ පොකුණු දියක් වේද, එයම අධිකතරවේ. කුසතණ අගින් ගන්නා ලද දිය ඉතා ස්වල්පවේ. කුසතණ අගින් ගත් දිය, පොකුණු දිය හා සසඳන කල්හි, සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකට ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය, ක්ෂයවූ, කෙළවරවූ, දුක්ගොඩ හා සැසඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(දෙවෙනි පොක්ඛරණී සූත්‍රය නිමි.)**

---

## 3. සම්භෙජ්ජ උදක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි යම් තැනෙක්හිදී මේ පඤ්චමහා ගංගාව එක්ව ගලා බසිත්ද, එක්වෙත්ද:- ඒ කවර ගංගාවෝද? ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී යන මොහුය.

එතැනින් පුරුෂයෙක් දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ ගන්නේය. මහණෙනි, ඒ කිමෙකැයි සිතන්නහුද? ගන්නා ලද, යම් දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ වේද, යම් ගංගා එක්වූ දියක් වේද, මේ දෙකින් කුමක් වනාහි අධිකතර වේද?" "ස්වාමීනි, යම් මේ ගංගා එක්වූ ජලයක්වේද, එයම ඉතා අධික වේ. ගන්නා ලද දිය බිඳු දෙක හෝ තුන හෝ ගංගා එක්වූ ජලය හා සසඳන කල්හි, සියයකින් කොටසකටද නොපැමිණෙයි. දහසකින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයකින් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්‍යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ, කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේදුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(තුන්වෙනි සම්භෙජ්ජ උදක සූත්‍රය නිමි.)**

---

## 4. සම්භෙජ්ජ උදක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි යම් තැනෙක්හිදී, මේ ගංගාවෝ එක්ව ගලායත්ද, එක්වෙත්ද, ඒ කවර ගංගාවෝද?

ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී යන මොහුය. දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ හැර, ඒ ජලය ක්ෂයවීමට විනාශවීමට යන්නේය. මහණෙනි, ඒ කිමෙකැයි සිතන්නහුද? ක්ෂයවූ විනාශවූ යම් ගංගා එක්වූ, යම් ජලයක් වේද, ඉතිරිවූ යම් දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ වේද, මේ දෙකින් කුමක් වනාහි ඉතා අධික වේද?" "ස්වාමීනි, ක්ෂයවූ, විනාශවූ යම් මේ ගංගා එක්වූ ජලයක් වේද, එයම ඉතා අධිකවේ. ඉතිරිවූ දිය බිඳු දෙක හෝ තුන හෝ ඉතා ස්වල්පය ඉතිරිවූ දිය බිඳු දෙක හෝ තුන ක්ෂයවූ, විනාශවූ, ගංගා එක්වූ ජලය හා සසඳන කල්හි සියයකින් කොටසකටද නොපැමිණෙයි. දහසකින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයකින් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ නුවණින් ආර්‍යසත්‍යය අවබෝධ කළාවූ, ආර්‍යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවරවූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසැඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(හතරවෙනි සම්භෙජ්ජ උදක සූත්‍රය නිමි.)**

---

## 5. පඨවි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් මහ පොළොවෙන් ඩෙබර ඇට හතක් පමණවූ, මැටිගුළියක් ගෙන, එක් තැනක තබන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ඩෙබර ඇට හතක් පමණවූ, යම් මැටි ගුළියක් ගෙන එක් තැනක තබන ලද්දේ වේද, යම් මේ මහ පොළොවක් වේද, මේ දෙකින් කවරක් වනාහි ඉතා අධිකවේද?" "ස්වාමීනි, යම් මේ මහ පොළොවක් වෙයිද, එයම ඉතා අධිකවේ. එක් පැත්තක තබන ලද, ඩෙබර ඇට හතක් පමණවූ මැටි ගුළිය ඉතා ස්වල්පවේ. එක් පැත්තක තබනලද, ඩෙබර ඇට හතක් පමණවූ, මැටි ගුළිය, මහපොළොව හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවරවූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසැඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ආර්යශ්‍රාවකයාගේ ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(පස්වෙනි පඨවි සූත්‍රය නිමි.)**

---

## 6. පඨවි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, යම්සේ වනාහි ඩෙබර ඇට හතක් පමණවූ මැටි ගුළිය හැර මේ මහ පොළොව ක්ෂයවීමට නැතිවීමට යන්නේවේද, මහණෙනි, ඒ ගැන කෙසේ සිතන්නහුද? ක්ෂයවූ විනාශවූ, යම් මහ පොළොවෙක් වේද, ඉතිරිවූ, ඩෙබර ඇට හතක් පමණවූ, යම් මැටි ගුළියක් වේද, මේ දෙකින් කවරක් වනාහි ඉතා අධික වේද?" "ස්වාමීනි, ක්ෂයවූ, විනාශවූ, යම් මහ පොළොවක් වේද, එයම ඉතා අධිකවේ. ඉතිරිවූ ඩෙබර ඇට හතක් පමණවූ, මැටි ගුළිය ඉතා ස්වල්පවේ. ඉතිරිවූ, ඩෙබර ඇට හත පමණවූ, මැටි ගුළිය ක්ෂයවූ, විනාශවූ, මහ පොළොව හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි.

**3.** "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවරවූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසැඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක් සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ආර්ය ශ්‍රාවකයාගේ ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත් අර්ථ ඇත්තේය."

**(හයවෙනි පඨවි සූත්‍රය නිමි.)**

---

## 7. සමුද්ද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් මහ මුහුදින් දියබිඳු දෙකක් හෝ තුනක් හෝ ගන්නේවේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නෙහිද? මහ මුහුදින් ගන්නා ලද යම් දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ වේද, මහ මුහුදෙහිවූ යම් දියක් වේද, මේ දෙකින් කවරක් වනාහි ඉතා අධික වේද?"

3. "ස්වාමීනි, මහ මුහුදෙහිවූ යම් මේ දියක් වේද, එයම ඉතා අධික වේ. ගන්නාලද දියබිඳු දෙක හෝ තුන හෝ ඉතා ස්වල්ප වේ. ගන්නාලද, දියබිඳු දෙක හෝ තුන හෝ මහ මුහුදෙහිවූ දිය හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙක් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ ආර්ය ශ්‍රාවකයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය, ක්ෂයවූ, කෙළවරවූ, දුක් ගොඩ හා සමග සැසඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි."

"මහණෙනි, එසේම ආර්ය ශ්‍රාවකයාගේ ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(හත්වෙනි සමුද්ද සූත්‍රය නිමි)**

---

## 8. සමුද්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී, එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි දියබිඳු දෙකක් හෝ තුනක් හෝ හැර මහ මුහුද ක්ෂයවීමට, විනාශවීමට යන්නේවේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නෙහිද? ක්ෂයවූ, විනාශවූ, මහ මුහුදෙහිවූ, යම් ජලයක් වේද ඉතිරිවූ, දිය බිඳු දෙකක් හෝ තුනක් හෝ වේද, මේ දෙකින් කුමක්වනාහි ඉතා අධිකවේද?"

3. "ස්වාමීනි. ක්ෂයවූ, විනාශවූ, මහ මුහුදෙහිවූ, යම් ජලයක් වේද, එයම ඉතා අධික වේ. ඉතිරිවූ, දියබිඳු දෙක හෝ තුන හෝ ඉතා ස්වල්ප වේ. ඉතිරිවූ, දියබිඳු දෙක හෝ තුන හෝ, ක්ෂයවූ, විනාශවූ, මහ මුහුදෙහිවූ, දිය හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි."

4. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ, කෙළවරවූ, දුක් ගොඩ හා සමග සැසැඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ආර්ය ශ්‍රාවකයාගේ ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(අටවෙනි සමුද්ද සූත්‍රය නිමි.)**

---

## 9. පබ්බතූපමා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක්තෙම හිමාලය පර්වතරාජයාගේ සමීපයෙහි අබඇට හතක් පමණවූ, ගල්කැට එක් තැනෙක්හි තබන්නේ වේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? අබඇට හතක් පමණවූ, එක් තැනක තබන ලද්දාවූ, යම් ගල්කැට වේද, යම් හිමාලය පර්වත රාජයෙක් වේද, මේ දෙකින් කුමක් වනාහි ඉතා විශාලවේද?”

“ස්වාමීනි, යම් මේ හිමාලය පර්වත රාජයෙක් වේද, එයම ඉතා විශාල වේ. එක් තැනෙක්හි තබන ලද්දාවූ, අබඇට හතක් පමණවූ, ගල්කැට ඉතා කුඩා වේ. එක් තැනෙක්හි තබන ලද්දාවූ, අබඇට හතක් පමණවූ ගල්කැට හිමවත් පර්වත රාජයා හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි.”

3. “මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ, නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ, කෙළවරවූ, දුක් ගොඩ හා සමග සැසැඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ දුක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ආර්ය ශ්‍රාවකයාගේ ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(නවවෙනි පබ්බතූපමා සූත්‍රය නිමි.)**

---

## 10. පබ්බතූපමා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී, එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි අබඇට හතක් පමණවූ, ගල්කැට හැර, හිමවත් පර්වතරාජයා ක්ෂයවීමට, නැසීමට යන්නේ වේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නෙහිද? ක්ෂයවූ, විනාශවූ, යම් හිමාලය පර්වතරාජයෙක් වේද, ඉතිරිවූ, අබඇට හතක් පමණවූ, යම් ගල්කැට වේද, මේ දෙකින් කවරක් වනාහි ඉතා විශාල වේද?"

3. "ස්වාමීනි, ක්ෂයවූ, විනාශවූ, යම් මේ හිමාලය පර්වත රාජයෙක් වෙයිද, එයම ඉතා විශාල වේ. ඉතිරිවූ, අබඇට හතක් පමණවූ, ගල්කැට ඉතා කුඩා වේ. ඉතිරිවූ අබඇට හත පමණවූ ගල්කැට, ක්ෂයවූ, විනාශවූ, හිමවත් පර්වතරාජයා හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි සෝවාන් මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූ නුවණින් ආර්යසත්‍යය අවබෝධ කළාවූ, ආර්යශ්‍රාවක පුද්ගලයාගේ යම් මේ දුකක් ක්ෂයවූයේද, කෙළවර වූයේද, ඒ ක්ෂයවූ කෙළවරවූ දුකම ඉතා වැඩිය. ඉතිරිවූ දුක ඉතා ස්වල්පය. ක්ෂයවූ, කෙළවරවූ, දුක්ගොඩ හා සමග සැසඳීමේදී යම් මේ සත්වරක් (ඉපදීම) පරමකොට ඇති, මේ

දූක සියයෙන් කොටසටද නොපැමිණෙයි. දහසින් කොටසටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසටද නොපැමිණෙයි.

"මහණෙනි, එසේම ධර්මාවබෝධය වනාහි මහත්වූ අර්ථ ඇත්තේය. දහම් ඇස ලැබීම එසේ මහත්වූ අර්ථ ඇත්තේය."

**(දසවෙනි පබ්බතූපාම සූත්‍රය නිමි.)**

---

## 11. පබ්බතූපමා සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් මහාමේරු පර්වත රාජයාගේ සමීපයෙහි මුංඇට හතක් පමණවූ, ගල්කැට එක් තැනක තබන්නේවේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නෙහිද? එක් තැනක තබන ලද්දාවූ, මුංඇට හතක් පමණවූ, යම් ගල්කැට වේද, යම් මහාමේරු පර්වතරාජයෙක් වේද, මේ දෙකින් කවරක් වනාහි ඉතා විශාල වේද?"

"ස්වාමීනි, යම් මේ මහාමේරු පර්වත රාජයෙක් වේද, එයම ඉතා විශාල වේ. එක් තැනක තබන ලද්දාවූ, මුංඇට හතක් පමණවූ, ගල්කැට ඉතා ස්වල්ප බවට පැමිණෙයි. එක් තැනක තබන ලද්දාවූ, මුංඇට හත පමණවූ ගල්කැට, මහාමේරු පර්වතරාජයා හා සසඳන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්‍ෂයෙන් කොටසකටද නොපැමිණෙයි."

**3.** "මහණෙනි, එසේම වනාහි සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ, ආර්ය ශ්‍රාවක පුද්ගලයාගේ ධර්මාවබෝධය හා සමග සැසැඳීමේදී

(බුද්ධශාසනයෙන්) අන්‍යවූ, තීර්ථක, ශ්‍රමණ, බ්‍රහ්මණ, පරිබ්‍රාජකයින්ගේ ධර්මාවබෝධය සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි. ලක්ෂයෙන් කොටසකටද නොපැමිණෙයි.”

“මහණෙනි, එසේම මාර්ග සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ පුද්ගලතෙම මහත්වූ නුවණ ඇත්තේය.”

**(එකොළොස්වෙනි පබ්බතූපමා සූත්‍රය නිමි.)**

---

(නඛසිඛා සූත්‍රයද, පොක්ඛරණී සූත්‍රය සහ සම්භෙජ්ජ උදක සූත්‍ර දෙකද, පඨවි සූත්‍ර දෙකද, සමුද්ද සූත්‍ර දෙකද, පබ්බතූපමා සූත්‍ර තුනදැයි මේ අභිසමය සංයුක්තයෙහි සූත්‍ර එකොළොසකි.)

**දහතුන්වෙනි අභිසමය වර්ගය නිමි.**

**(පළමුවෙනි අභිසමය සංයුත්තය නිමි.)**

---

# 2. ධාතු සංයුත්තය.

## 1. නානත්ත වර්ගය.

### 1. ධාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මම තොපට ධාතුන්ගේ නානත්වය දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළ සේක. "එසේය ස්වාමීනි," කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

3. "මහණෙනි, ධාතුන්ගේ නානත්වය (නොයෙක් බව) නම් කවරේද? චක්ඛුධාතුව, රූප ධාතුව, චක්ඛුවිඤ්ඤාණ ධාතුව, සොත ධාතුව, සද්දධාතුව, සොත විඤ්ඤාණ ධාතුව, ඝාන ධාතුව, ගන්ධධාතුව, ඝාන විඤ්ඤාණ ධාතුව, ජිව්හා ධාතුව, රස ධාතුව, ජිව්හා විඤ්ඤාණ ධාතුව, කාය ධාතුව, ඵොට්ඨබ්බ ධාතුව, කාය විඤ්ඤාණ ධාතුව, මනොධාතුව, ධම්මධාතුව සහ මනොවිඤ්ඤාණ ධාතුවයි. මහණෙනි, මෙය ධාතුන්ගේ නානත්වයයි කියනු ලැබේ."

**(පළමුවෙනි ධාතු සූත්‍රය නිමි.)**

---

## 2. සම්ඵස්ස සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය (නොඑක් බව) ඇතිවේ. මහණෙනි, ධාතුන්ගේ නානත්වය නම් කවරේද? චක්ඛුධාතුව, සොතධාතුව, ඝාන ධාතුව, ජිව්හාධාතුව, කායධාතුව සහ මනොධාතුවයි. මහණෙනි, මෙය ධාතුන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය ඇතිවේද?

"මහණෙනි, චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය ඇතිවේ. සොතධාතුව නිසා සොතසම්ඵස්සය ඇතිවේ. ඝානධාතුව නිසා ඝානසම්ඵස්සය ඇතිවේ. ජිව්හාධාතුව නිසා ජිව්හා සම්ඵස්සය ඇතිවේ. කායධාතුව නිසා කායසම්ඵස්සය ඇතිවේ. මනොධාතුව නිසා මනොසම්ඵස්සය ඇතිවේ. මහණෙනි, මෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය ඇතිවේ."

**(දෙවෙනි සම්ඵස්ස සූත්‍රය නිමි.)**

---

## 3. නෝසම්ඵස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවෙයි.

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය කවරේද?

"චක්ඛුධාතුව, සොතධාතුව, ඝානධාතුව, ජිව්හාධාතුව, කායධාතුව සහ මනොධාතුවයි. මහණෙනි, මෙය ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේද? ස්පර්ශයින්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇතිනොවේද?

"මහණෙනි චක්ඛුධාතුව නිසා චක්ඛුසම්ඵස්සය ඇතිවේ. චක්ඛු සම්ඵස්සය නිසා චක්ඛුධාතුව ඇති නොවේ.

"මහණෙනි, සෝතධාතුව නිසා සෝතසම්ඵස්සය ඇතිවේ. සෝත සම්ඵස්සය නිසා සෝත ධාතුව ඇති නොවේ. මහණෙනි, ඝාන ධාතුව නිසා ඝාන සම්ඵස්සය ඇතිවේ. ඝාන සම්ඵස්සය නිසා ඝාන ධාතුව ඇති නොවේ. මහණෙනි, ජිව්හා ධාතුව නිසා ජිව්හාසම්ඵස්සය ඇතිවේ. ජිව්හාසම්ඵස්සය නිසා ජිව්හා ධාතුව ඇති නොවේ. මහණෙනි, කාය ධාතුව නිසා කාය සම්ඵස්සය ඇතිවේ. කාය සම්ඵස්සය නිසා කාය ධාතුව ඇති නොවේ. මහණෙනි, මනෝධාතුව නිසා මනෝසම්ඵස්සය ඇතිවේ. මනෝ සම්ඵස්සය නිසා මනෝධාතුව ඇති නොවේ.

4. "මහණෙනි, මෙසේ වනාහි ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයින්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේ."

**(තුන්වෙනි නෝසම්ඵස්ස සූත්‍රය නිමි.)**

## 4. වේදනා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයින්ගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේ.

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය කවරේද?"

චක්ඛු ධාතුව, සෝත ධාතුව, ඝාන ධාතුව, ජිව්හා ධාතුව කාය ධාතුව සහ මනෝ ධාතුවයි. මහණෙනි, මෙය ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේද? ස්පර්ශයින්ගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේද?

"මහණෙනි, චක්ඛු ධාතුව නිසා චක්ඛු සම්ඵස්සය ඇතිවේ. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුසම්ඵස්සයෙන් උපදින වේදනා තොමෝ ඇති වන්නීය.

"මහණෙනි, සෝත ධාතුව නිසා සෝතසම්ඵස්සය ඇතිවේ. සෝතසම්ඵස්සය නිසා සෝතසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇති වන්නීය.

"මහණෙනි ඝාන ධාතුව නිසා ඝානසම්ඵස්සය ඇතිවේ. ඝානසම්ඵස්සය නිසා ඝානසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇති වන්නීය.

"මහණෙනි, ජිව්හා ධාතුව නිසා ජිව්හා සම්ඵස්සය ඇතිවේ. ජිව්හා සම්ඵස්සය නිසා ජිව්හා සම්ඵස්සයෙන් උපදින වේදනාව ඇති වන්නීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, කාය ධාතුව නිසා කාය සම්ඵස්සය ඇතිවේ. කාය සම්ඵස්සය නිසා කාය සම්ඵස්සයෙන් උපදින වේදනාව ඇති වන්නීය.

"මහණෙනි, මනෝ ධාතුව නිසා මනෝ සම්ඵස්සය ඇතිවේ. මනෝ සම්ඵස්සය නිසා මනෝ සම්ඵස්සයෙන් උපදින වේදනාව ඇති වන්නීය.

4. "මහණෙනි, මෙසේ වනාහි ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයින්ගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේ."

**(සතරවෙනි වේදනා සූත්‍රය නිමි.)**

---

## 5. නෝවේදනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයින්ගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇති නොවේ. ස්පර්ශයින්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේ.

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය නම් කවරේද?"

චක්ඛුධාතුව, සෝතධාතුව, ඝානධාතුව, ජිව්හාධාතුව, කායධාතුව සහ මනෝධාතුවයි. මහණෙනි, මෙය ධාතු නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇතිවේද? ස්පර්ශයින්ගේ නානත්වය

නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේද? වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයින්ගේ නානත්වය ඇති නොවේද? ස්පර්ශයින්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේද? මහණෙනි, චක්ඛු ධාතුව නිසා චක්ඛුසම්ඵපස්සය ඇතිවේ. චක්ඛු සම්ඵස්සය නිසා චක්ඛුසම්ඵස්සයෙන් උපදින වේදනා තොමෝ ඇති වන්නීය. චක්ඛුසම්ඵස්සයෙන් උපදින වේදනාව නිසා චක්ඛුසම්ඵස්සය ඇති නොවෙයි. චක්ඛුසම්ඵස්සය නිසා චක්ඛුධාතු තොමෝ ඇති නොවන්නීය.

4. "මහණෙනි, සෝතධාතුව නිසා සෝත සම්ඵස්සය ඇතිවේ. සෝතසම්ඵස්සය නිසා සෝතසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇතිවන්නීය. සෝතසම්ඵස්සයෙන් උපදින වේදනාව නිසා සෝතසම්ඵස්සය ඇති නොවේ. සෝත සම්ඵස්සය නිසා සෝතධාතුව ඇති නොවන්නීය.

5. "මහණෙනි, ඝානධාතුව නිසා ඝාන සම්ඵස්සය ඇතිවේ. ඝානසම්ඵස්සය නිසා ඝානසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇතිවන්නීය. ඝානසම්ඵස්සයෙන් උපදින වේදනාව නිසා ඝානසම්ඵස්සය ඇති නොවේ. ඝානසම්ඵස්සය නිසා ඝානධාතුව ඇති නොවන්නීය.

6. "මහණෙනි, ජිව්හාධාතුව නිසා ජිව්හාසම්ඵස්සය ඇතිවේ. ජිව්හා සම්ඵස්සය නිසා ජිව්හාසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇතිවන්නීය. ජිව්හාසම්ඵස්සයෙන් උපදින වේදනාව නිසා ජිව්හාසම්ඵස්සය ඇති නොවෙයි. ජිව්හාසම්ඵස්සය නිසා ජිව්හා ධාතුව ඇති නොවන්නීය.

7. "මහණෙනි, කායධාතුව නිසා කායසම්ඵස්සය ඇතිවේ. කාය සම්ඵස්සය නිසා කායසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇතිවන්නීය. කායසම්ඵස්සයෙන් උපදින වේදනාව නිසා කායසම්ඵස්සය ඇති නොවේ. කායසම්ඵස්සය නිසා කායධාතුව ඇති නොවන්නීය.

8. "මහණෙනි, මනෝධාතුව නිසා මනෝසම්ඵස්සය ඇතිවේ. මනෝසම්ඵස්සය නිසා මනෝසම්ඵස්සයෙන් උපදින වේදනාව ඇතිවන්නීය. මනෝසම්ඵස්සයෙන් උපදින වේදනාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නිසා මනෝසම්ඵස්සය ඇති නොවෙයි. මනෝසම්ඵස්සය නිසා මනෝධාතු තොමෝ ඇති නොවන්නීය.

**9.** "මහණෙනි, මෙසේ වනාහි ධාතූන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයන්ගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේ. වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය ඇති නොවේ. ස්පර්ශයන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේ."

**(පස්වෙනි නෝ වේදනා සූත්‍රය නිමි.)**

---

## 6. ධාතු සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, තොපට ධාතූන්ගේ නානත්වය දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළ සේක. "එසේය. ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

**3.** "මහණෙනි, ධාතූන්ගේ නානත්වය කවරේද? රූප ධාතුව, සද්දධාතුව, ගන්ධ ධාතුව, රසධාතුව, ඵොට්ඨබ්බධාතුව සහ ධම්මධාතුවයි. මහණෙනි, මෙය වනාහි ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ."

**(හයවෙනි ධාතු සූත්‍රය නිමි.)**

---

## 7. සඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතුන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේ. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයන්ගේ (තෘෂ්ණාවන්ගේ) නානත්වය ඇතිවේ. ඡන්දයන්ගේ නානත්වය නිසා පරිදාහයන්ගේ (ආශාවෙන් දැවෙන ස්වභාවයන්ගේ) නානත්වය ඇතිවේ. පරිදාහයන්ගේ නානත්වය නිසා පරියේසනයන්ගේ (සෙවීම්වල) නානත්වය ඇතිවේ.

3. "මහණෙනි, ධාතුන්ගේ නානත්වය කවරේද?"

රූප ධාතුව, ශබ්ද ධාතුව, ගන්ධ ධාතුව, රස ධාතුව, ස්පර්ශ ධාතුව සහ ධම්ම ධාතුවයි. මහණෙනි, මෙය ධාතුන්ගේ නානත්වයයි කියනු ලැබේ.

4. "මහණෙනි, කෙසේ නම් ධාතුන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයිද? සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවෙයිද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයන්ගේ (ආශාවන්ගේ) නානත්වය ඇතිවෙයිද? ඡන්දයන්ගේ නානත්වය නිසා පරිදාහයන්ගේ නානත්වය ඇතිවේද? පරිදාහයන්ගේ නානත්වය නිසා පරියේසනයන්ගේ නානත්වය ඇතිවේද?

5. "මහණෙනි, රූප ධාතුව නිසා රූප සංඥාව (චක්ඛු විඤ්ඤාණය සමග පවත්නා සංඥාව) උපදින්නීය. රූපසංඥාව නිසා රූප සංකල්පනාව (සම්පටිච්ඡනාදි සිත් තුන සමග පවත්නා

සංඥාව) උපදියි. රූප සංකල්පනාව නිසා රූපච්ඡන්දය රූපයෙහි ආශාව උපදියි. රූපච්ඡන්දය නිසා රූප පරිදාහය (රූප ආශාවෙන් දැවීම) උපදියි. රූප පරිදාහය නිසා රූප පරියේසනය (රූපයන් සෙවීම) ඇතිවේ.

**6.** "ශබ්ද ධාතුව නිසා ශබ්ද සංඥාව ඇති වන්නීය. ශබ්ද සංඥාව නිසා ශබ්ද සංකල්පනාව ඇතිවෙයි. ශබ්ද සංකල්පනාව නිසා ශබ්දච්ඡන්දය ඇතිවෙයි. ශබ්දච්ඡන්දය නිසා ශබ්දපරිදාහය ඇතිවෙයි. ශබ්දපරිදාහය නිසා ශබ්ද පරියේසනය ඇතිවේ.

**7.** "ගන්ධ ධාතුව නිසා ගන්ධ සංඥාව ඇතිවන්නීය. ගන්ධ සංඥාව නිසා ගන්ධ සංකල්පනාව ඇතිවෙයි. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධච්ඡන්දය ඇතිවෙයි. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ පරිදාහය ඇතිවෙයි. ගන්ධ පරිදාහය නිසා ගන්ධ පරියේසනය ඇතිවෙයි.

**8.** "රස ධාතුව නිසා රස සංඥාව ඇතිවන්නීය. රස සංඥාව නිසා රස සංකල්පනාව ඇතිවෙයි. රස සංකල්පනාව නිසා රසච්ඡන්දය ඇතිවෙයි. රසච්ඡන්දය නිසා රස පරිදාහය ඇතිවෙයි. රස පරිදාහය නිසා රස පරියේසනය ඇතිවේ.

**9.** "ස්පර්ශය ධාතුව නිසා ස්පර්ශ සංඥාව ඇතිවන්නීය. ස්පර්ශය සංඥාව නිසා ස්පර්ශ සංකල්පනාව ඇතිවෙයි. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශච්ඡන්දය ඇතිවෙයි. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ පරිදාහය ඇතිවෙයි. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශපරියේසනය ඇතිවේ.

**10.** "ධර්මධාතුව නිසා ධර්මසංඥාව ඇතිවන්නීය. ධර්මසංඥාව නිසා ධර්ම සංකල්පනාව ඇතිවෙයි. ධර්ම සංකල්පනාව නිසා ධර්මච්ඡන්දය ඇතිවෙයි. ධර්මච්ඡන්දය නිසා ධර්ම පරිදාහය ඇති වෙයි. ධර්ම පරිදාහය නිසා ධර්ම පරියේසනය ඇතිවේ.

**11.** "මහණෙනි, මෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේ. සංඥාවන්ගේ නානත්වය

නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේ. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයන්ගේ නානත්වය ඇතිවේ. ඡන්දයන්ගේ නානත්වය නිසා පරිදාහයන්ගේ නානත්වය ඇතිවේ. පරිදාහයන්ගේ නානත්වය නිසා පරියේසනයන්ගේ නානත්වය ඇතිවේ.

**(හත්වෙනි සඤ්ඤා සූත්‍රය නිමි.)**

---

## 8. නෝසඤ්ඤා සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේ. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේ. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවේ. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයන්ගේ නානත්වය ඇතිවේ. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවේ. පරියේසනයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති නොවේ. පරිදාහයාගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇති නොවේ. ඡන්දයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවේ. සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේ. සංඥාවන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේ.

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය නම් කවරේද? රූපධාතුව, ශබ්දධාතුව, ගන්ධධාතුව, රසධාතුව, ස්පර්ශධාතුව

සහ ධම්මධාතුවයි. මහණෙනි, මෙය ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේද? සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවේද? ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති වේද? පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවේද? පරියේසනයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති නොවේද? පරිදාහයාගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්ව ඇති නොවේද? ඡන්දයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවේද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේද? සංඥාවන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේද?

"මහණෙනි, රූපධාතුව නිසා රූපසංඥාව ඇතිවන්නීය, රූපසංඥාව නිසා රූපසංකල්පනාව ඇතිවෙයි. රූපසංකල්පනාව නිසා රූපච්ඡන්දය ඇතිවෙයි. රූපච්ඡන්දය නිසා රූපපරිදාහය ඇතිවෙයි. රූපපරිදාහය නිසා රූපපරියේසනය ඇතිවෙයි. රූපපරියේසනය නිසා රූපපරිදාහය ඇති නොවෙයි. රූප පරිදාහය නිසා රූපච්ඡන්දය ඇති නොවෙයි. රූපච්ඡන්දය නිසා රූපසංකල්පනාව ඇති නොවෙයි. රූපසංකල්පනාව නිසා රූපසංඥාව ඇති නොවෙයි. රූපසංඥාව නිසා රූප ධාතුව ඇති නොවෙයි.

4. "ශබ්දධාතුව නිසා ශබ්දසංඥාව ඇතිවන්නීය. ශබ්දසංඥාව නිසා ශබ්ද සංකල්පනාව ඇතිවෙයි. ශබ්ද සංකල්පනාව නිසා ශබ්දච්ඡන්දය ඇතිවෙයි. ශබ්දච්ඡන්දය නිසා ශබ්දපරිදාහය ඇතිවෙයි. ශබ්දපරිදාහය නිසා ශබ්ද පරියේසනය ඇතිවේ. ශබ්ද පරියේසනය නිසා ශබ්ද පරිදාහය ඇති නොවෙයි. ශබ්දපරිදාහය නිසා ශබ්දච්ඡන්දය ඇති නොවෙයි. ශබ්දච්ඡන්දය

නිසා ශබ්ද සංකල්පනාව ඇති නොවෙයි. ශබ්ද සංකල්පනාව නිසා ශබ්ද සංඥාව ඇති නොවෙයි. ශබ්ද සංඥාව නිසා ශබ්ද ධාතුව ඇති නොවෙයි.

**5.** "ගන්ධධාතුව නිසා ගන්ධසංඥාව ඇතිවන්නීය. ගන්ධ සංඥාව නිසා ගන්ධ සංකල්පනාව ඇතිවෙයි. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධච්ඡන්දය ඇතිවෙයි. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ පරිදාහය ඇතිවෙයි. ගන්ධපරිදාහය නිසා ගන්ධ පරියේසනය ඇතිවේ. ගන්ධ පරියේසනය නිසා ගන්ධපරිදාහය ඇති නොවෙයි. ගන්ධපරිදාහය නිසා ගන්ධච්ඡන්දය ඇති නොවෙයි. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ සංකල්පනාව ඇති නොවෙයි. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධසංඥාව ඇති නොවෙයි. ගන්ධසංඥාව නිසා ගන්ධධාතුව ඇති නොවෙයි.

**6.** "රසධාතුව නිසා රසසංඥාව ඇතිවන්නීය. රසසංඥාව නිසා රස සංකල්පනාව ඇතිවෙයි. රස සංකල්පනාව නිසා රසච්ඡන්දය ඇතිවෙයි. රසච්ඡන්දය නිසා රසපරිදාහය ඇති වෙයි. රස පරිදාහය නිසා රස පරියේසනය ඇතිවේ. රස පරියේසනය නිසා රස පරිදාහය ඇති නොවෙයි. රසපරිදාහය නිසා රසච්ඡන්දය ඇති නොවෙයි. රසච්ඡන්දය නිසා රස සංකල්පනාව ඇති නොවෙයි. රස සංකල්පනාව නිසා රස සංඥාව ඇති නොවෙයි. රස සංඥාව නිසා රසධාතුව ඇති නොවෙයි.

**7.** "ඵොට්ඨබ්බ ධාතුව නිසා ස්පර්ශ සංඥාව ඇති වන්නීය. ස්පර්ශ සංඥාව නිසා ස්පර්ශ සංකල්පනාව ඇතිවෙයි. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශච්ඡන්දය ඇතිවෙයි. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ පරිදාහය ඇතිවෙයි. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශ පරියේසනය ඇතිවේ. ස්පර්ශ පරියේසනය නිසා ස්පර්ශ පරිදාහය ඇති නොවෙයි. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශච්ඡන්දය ඇති නොවෙයි. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ සංකල්පනාව ඇති නොවෙයි. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශ සංඥාව ඇති නොවෙයි. ස්පර්ශ සංඥාව නිසා ස්පර්ශ ධාතුව ඇති නොවෙයි.

8. "ධම්මධාතුව නිසා ධර්ම සංඥාව ඇතිවන්නීය. ධර්ම සංඥාව නිසා ධර්ම සංකල්පනාව ඇතිවෙයි. ධර්ම සංකල්පනාව නිසා ධර්මච්ඡන්දය ඇතිවෙයි. ධර්මච්ඡන්දය නිසා ධර්ම පරිදාහය ඇති වෙයි. ධර්ම පරිදාහය නිසා ධර්ම පරියේසනය ඇතිවේ. ධර්ම පරියේසනය නිසා ධර්ම පරිදාහය ඇති නොවෙයි. ධර්ම පරිදාහය නිසා ධර්මච්ඡන්දය ඇති නොවෙයි. ධර්මච්ඡන්දය නිසා ධර්මසංකල්පනාව ඇති නොවෙයි. ධර්ම සංකල්පනාව නිසා ධර්මසංඥාව ඇති නොවෙයි. ධර්ම සංඥාව නිසා ධර්ම ධාතුව ඇති නොවෙයි.

9. "මහණෙනි, මෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවෙයි. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවෙයි. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවෙයි. පරියේසනයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති නොවෙයි. පරිදාහයාගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇති නොවෙයි. ඡන්දයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේ. සංඥාවන්ගේ නානත්වය නිසා ධාතුන්ගේ නානත්වය ඇති නොවේ."

**(අටවෙනි නෝසඤ්ඤා සූත්‍රය නිමි.)**

---

## 9. ඵස්ස සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි" යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේ. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේ. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවේ. ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේ. වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවේ. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවේ. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවේ. පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ (ලැබීමේ) නානත්වය ඇතිවේ."

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය නම් කවරේද? රූප ධාතුව, ශබ්ද ධාතුව, ගන්ධ ධාතුව, රස ධාතුව, ස්පර්ශ ධාතුව සහ ධම්ම ධාතුවයි. මහණෙනි, මෙය ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේද? සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවේද? ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවේද, වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවේද? ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවේද? පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයන්ගේ නානත්වය ඇතිවේද? පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ නානත්වය ඇතිවේද?

4. "මහණෙනි, රූප ධාතුව නිසා රූප සංඥාව ඇතිවේ. රූප සංඥාව නිසා රූප සංකල්පනාව ඇතිවේ. රූප සංකල්පනාව නිසා රූපසම්ඵස්සය ඇතිවේ. රූප සම්ඵස්සය නිසා රූප සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. රූපසම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා රූපච්ඡන්දය

ඇතිවේ. රූපච්ඡන්දය නිසා රූප පරිදාහය ඇතිවෙයි. රූප පරිදාහය නිසා රූප පරියේසනය ඇතිවෙයි. රූප පරියේසනය නිසා රූප ලාභය (රූපයන්ගේ ලැබීම) ඇතිවෙයි.

**5.** ශබ්ද ධාතුව නිසා ශබ්ද සංඥාව ඇතිවේ. ශබ්ද සංඥාව නිසා ශබ්ද සංකල්පනාව ඇතිවේ. ශබ්ද සංකල්පනාව නිසා ශබ්ද සම්ඵස්සය ඇතිවේ. ශබ්ද සම්ඵස්සය නිසා ශබ්ද සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ශබ්ද සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා ශබ්දච්ඡන්දය ඇතිවේ. ශබ්දච්ඡන්දය නිසා ශබ්ද පරිදාහය ඇතිවේ. ශබ්ද පරිදාහය නිසා ශබ්ද පරියේසනය ඇතිවේ. ශබ්ද පරියේසනය නිසා ශබ්ද ලාභය ඇතිවේ.

**6.** ගන්ධ ධාතුව නිසා ගන්ධ සංඥාව ඇතිවේ. ගන්ධ සංඥාව නිසා ගන්ධ සංකල්පනාව ඇතිවේ. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධ සම්ඵස්සය ඇතිවේ. ගන්ධ සම්ඵස්සය නිසා ගන්ධ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ගන්ධ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා ගන්ධච්ඡන්දය ඇතිවේ. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ පරිදාහය ඇතිවේ. ගන්ධ පරිදාහය නිසා ගන්ධ පරියේසනය ඇතිවේ. ගන්ධ පරියේසනය නිසා ගන්ධ ලාභය ඇතිවේ.

**7.** රස ධාතුව නිසා රස සංඥාව ඇතිවේ. රස සංඥාව නිසා රස සංකල්පනාව ඇතිවේ. රස සංකල්පනාව නිසා රස සම්ඵස්සය ඇතිවේ. රස සම්ඵස්සය නිසා රස සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. රස සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා රසච්ඡන්දය ඇතිවේ. රසච්ඡන්දය නිසා රස පරිදාහය ඇතිවේ. රස පරිදාහය නිසා රස පරියේසනය ඇතිවේ. රස පරියේසනය නිසා රස ලාභය ඇතිවේ.

**8.** ස්පර්ශ ධාතුව නිසා ස්පර්ශ සංඥාව ඇතිවේ. ස්පර්ශ සංඥාව නිසා ස්පර්ශ සංකල්පනාව ඇතිවේ. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශ සම්ඵස්සය ඇතිවේ. ස්පර්ශ සම්ඵස්සය නිසා ස්පර්ශ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව

උපදියි. ස්පර්ශ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා ස්පර්ශච්ඡන්දය ඇතිවේ. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ පරිදාහය ඇතිවේ. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශ පරියේසනය ඇතිවේ. ස්පර්ශ පරියේසනය නිසා ස්පර්ශ ලාභය ඇතිවේ.

**9.** ධර්මධාතුව නිසා ධර්ම සංඥාව ඇතිවේ. ධර්ම සංඥාව නිසා ධර්ම සංකල්පනාව ඇතිවේ. ධර්ම සංකල්පනාව නිසා ධර්ම සම්ඵස්සය ඇතිවේ. ධර්ම සම්ඵස්සය නිසා ධර්ම සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ධර්ම සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා ධර්මච්ඡන්දය ඇතිවේ. ධර්මච්ඡන්දය නිසා ධර්ම පරිදාහය ඇතිවේ. ධර්ම පරිදාහය නිසා ධර්ම පරියේසනය ඇතිවේ. ධර්ම පරියේසනය නිසා ධර්ම ලාභය ඇතිවේ.

**10.** "මහණෙනි, මෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවෙයි. ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවෙයි. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවෙයි. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවෙයි. පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ නානත්වය ඇතිවේ."

**(නවවෙනි ඵස්ස සූත්‍රය නිමි.)**

---

## 10. නෝඵස්ස සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "මහණෙනි, ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවෙයි. ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවේ. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවෙයි. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවේ. පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ නානත්වය ඇතිවෙයි. ලාභයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇති නොවේ. පරියේසනයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති නොවේ. පරිදාහයාගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇති නොවේ. ඡන්දයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇති නොවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇති නොවෙයි. ස්පර්ශයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේ. සංඥාවන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවෙයි.

"මහණෙනි, ධාතූන්ගේ නානත්වය නම් කවරේද? රූප ධාතුව, ශබ්ද ධාතුව, ගන්ධ ධාතුව, රස ධාතුව, ස්පර්ශ ධාතුව සහ ධම්ම ධාතුවයි. මහණෙනි, මෙය ධාතූන්ගේ නානත්වයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවේද? සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවේද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවේද? ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ

නානත්වය ඇතිවේද? වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවෙයිද? ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවෙයිද? පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවෙයිද? පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ නානත්වය ඇතිවෙයිද? ලාභයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇති නොවෙයිද? පරියේසනයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇති නොවේද? පරිදාහයාගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇති නොවේද? ඡන්දයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇති නොවේද? වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇති නොවේද? ස්පර්ශයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවේද? සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේද? සංඥාවන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවේද?"

**4.** "මහණෙනි, රූප ධාතුව නිසා රූප සංඥාව ඇතිවෙයි. රූප සංඥාව නිසා රූප සංකල්පනාව ඇතිවෙයි. රූපසංකල්පනාව නිසා රූප සම්ඵස්සය ඇතිවෙයි. රූප සම්ඵස්සය නිසා රූප සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇතිවන්නීය. රූප සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා රූපච්ඡන්දය ඇතිවෙයි. රූපච්ඡන්දය නිසා රූප පරිදාහය ඇතිවෙයි. රූප පරිදාහය නිසා රූප පරියේසනය ඇතිවෙයි. රූප පරියේසනය නිසා රූප ලාභය ඇතිවෙයි. රූපලාභය නිසා රූප පරියේසනය ඇති නොවෙයි. රූප පරියේසනය නිසා රූප පරිදාහය ඇති නොවේ. රූප පරිදාහය නිසා රූපච්ඡන්දය ඇති නොවේ. රූපච්ඡන්දය නිසා රූප සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය. රූප සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා රූප සම්ඵස්සය ඇති නොවෙයි. රූප සම්ඵස්සය නිසා රූප සංකල්පනාව ඇති නොවෙයි. රූප සංකල්පනාව නිසා රූප සංඥාව ඇති නොවෙයි. රූප සංඥාව නිසා රූපධාතු තොමෝ ඇති නොවන්නීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "ශබ්දධාතුව නිසා ශබ්දසංඥාව ඇතිවේ ශබ්දසංඥාව නිසා ශබ්ද සංකල්පනාව ඇතිවේ. ශබ්ද සංකල්පනාව නිසා ශබ්ද සම්ඵස්සය ඇතිවේ. ශබ්ද සම්ඵස්සය නිසා ශබ්ද සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ශබ්ද සම්ඵස්සයෙන් ඇති වෙන වේදනාව නිසා ශබ්දච්ඡන්දය ඇතිවේ. ශබ්දච්ඡන්දය නිසා ශබ්ද පරිදාහය ඇතිවේ. ශබ්දපරිදාහය නිසා ශබ්ද පරියේසනය ඇතිවේ. ශබ්ද පරියේසනය නිසා ශබ්ද ලාභය ඇතිවේ.

"ශබ්ද ලාභය නිසා ශබ්ද පරියේසනය ඇති නොවේ. ශබ්ද පරියේසනය නිසා ශබ්ද පරිදාහය ඇති නොවේ. ශබ්ද පරිදාහය නිසා ශබ්දච්ඡන්දය ඇති නොවේ. ශබ්දච්ඡන්දය නිසා ශබ්ද සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය. ශබ්ද සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා ශබ්ද සම්ඵස්සය ඇති නොවෙයි. ශබ්ද සම්ඵස්සය නිසා ශබ්ද සංකල්පනාව ඇති නොවෙයි. ශබ්ද සංකල්පනාව නිසා ශබ්ද සංඥාව ඇති නොවෙයි. ශබ්ද සංඥාව නිසා ශබ්ද ධාතු තොමෝ ඇති නොවන්නීය.

**6.** "ගන්ධ ධාතුව නිසා ගන්ධ සංඥාව ඇතිවේ. ගන්ධ සංඥාව නිසා ගන්ධ සංකල්පනාව ඇතිවේ. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධ සම්ඵස්සය ඇතිවේ. ගන්ධ සම්ඵස්සය නිසා ගන්ධ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ගන්ධ සම්ඵස්සයෙන් ඇති වෙන වේදනාව නිසා ගන්ධච්ඡන්දය ඇතිවේ. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ පරිදාහය ඇතිවේ. ගන්ධ පරිදාහය නිසා ගන්ධ පරියේසනය ඇතිවේ. ගන්ධ පරියේසනය නිසා ගන්ධ ලාභය ඇතිවේ.

"ගන්ධ ලාභය නිසා ගන්ධ පරියේසනය ඇති නොවේ. ගන්ධ පරියේසනය නිසා ගන්ධ පරිදාහය ඇති නොවේ. ගන්ධ පරිදාහය නිසා ගන්ධච්ඡන්දය ඇති නොවේ. ගන්ධච්ඡන්දය නිසා ගන්ධ සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය. ගන්ධ සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා ගන්ධ සම්ඵස්සය ඇති නොවෙයි. ගන්ධ සම්ඵස්සය නිසා ගන්ධ සංකල්පනාව

ඇති නොවෙයි. ගන්ධ සංකල්පනාව නිසා ගන්ධ සංඥාව ඇති නොවෙයි. ගන්ධ සංඥාව නිසා ගන්ධ ධාතු තොමෝ ඇති නොවන්නීය.

7. "රස ධාතුව නිසා රසසංඥාව ඇතිවේ. රසසංඥාව නිසා රස සංකල්පනාව ඇතිවේ. රස සංකල්පනාව නිසා රස සම්ඵස්සය ඇතිවේ. රස සම්ඵස්සය නිසා රස සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. රස සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා රසච්ඡන්දය ඇතිවේ. රසච්ඡන්දය නිසා රස පරිදාහය ඇතිවේ. රසපරිදාහය නිසා රස පරියේසනය ඇතිවේ. රස පරියේසනය නිසා ශබ්දලාභය ඇතිවේ.

"රසලාභය නිසා රසපරියේසනය ඇති නොවේ. රසපරියේසනය නිසා රස පරිදාහය ඇති නොවේ. රස පරිදාහය නිසා රසච්ඡන්දය ඇතිනොවේ. රසච්ඡන්දය නිසා රස සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය, රස සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා රසසම්ඵස්සය ඇතිනොවෙයි. රසසම්ඵස්සය නිසා රස සංකල්පනාව ඇති නොවෙයි. රස සංකල්පනාව නිසා රස සංඥාව ඇති නොවෙයි. රස සංඥාව නිසා රස ධාතු තොමෝ ඇති නොවන්නීය.

8. "ස්පර්ශ ධාතුව නිසා ස්පර්ශසංඥාව ඇතිවේ. ස්පර්ශසංඥාව නිසා ස්පර්ශ සංකල්පනාව ඇතිවේ. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශ සම්ඵස්සය ඇතිවේ. ස්පර්ශ සම්ඵස්සය නිසා ස්පර්ශ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ස්පර්ශ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිසා ස්පර්ශච්ඡන්දය ඇතිවේ. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ පරිදාහය ඇතිවේ. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශ පරියේසනය ඇතිවේ. ස්පර්ශ පරියේසනය නිසා ස්පර්ශ ලාභය ඇතිවේ.

"ස්පර්ශ ලාභය නිසා ස්පර්ශ පරියේසනය ඇතිනොවේ. ස්පර්ශ පරියේසනය නිසා ස්පර්ශ පරිදාහය ඇතිනොවේ. ස්පර්ශ පරිදාහය නිසා ස්පර්ශච්ඡන්දය ඇති නොවේ. ස්පර්ශච්ඡන්දය නිසා ස්පර්ශ සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය.

ස්පර්ශ සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා ස්පර්ශ සම්ඵස්සය ඇති නොවෙයි. ස්පර්ශ සම්ඵස්සය නිසා ස්පර්ශ සංකල්පනාව ඇති නොවෙයි. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශ සංඥාව ඇති නොවෙයි. ස්පර්ශ සංකල්පනාව නිසා ස්පර්ශ ධාතු තොමෝ ඇති නොවන්නීය.

**9.** "ධර්මධාතුව නිසා ධර්ම සංඥාව ඇතිවේ. ධර්ම සංඥාව නිසා ධර්ම සංකල්පනාව ඇතිවේ. ධර්ම සංකල්පනාව නිසා ධර්ම සම්ඵස්සය ඇතිවේ. ධර්ම සම්ඵස්සය නිසා ධර්ම සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව උපදියි. ධර්ම සම්ඵස්සයෙන් ඇති වෙන වේදනාව නිසා ධර්මච්ඡන්දය ඇතිවේ. ධර්මච්ඡන්දය නිසා ධර්මපරිදාහය ඇතිවේ. ධර්මපරිදාහය නිසා ධර්ම පරියේසනය ඇතිවේ. ධර්ම පරියේසනය නිසා ධර්මලාභය ඇතිවේ.

"ධර්ම ලාභය නිසා ධර්ම පරියේසනය ඇති නොවේ. ධර්ම පරියේසනය නිසා ධර්ම පරිදාහය ඇති නොවේ. ධර්ම පරිදාහය නිසා ධර්මච්ඡන්දය ඇති නොවේ. ධර්මච්ඡන්දය නිසා ධර්ම සම්ඵස්සයෙන් උපන් වේදනාව ඇති නොවන්නීය. ධර්ම සම්ඵස්සයෙන් උපන් වේදනාව නිසා ධර්ම සම්ඵස්සය ඇති නොවෙයි. ධර්ම සම්ඵස්සය නිසා ධර්ම සංකල්පනාව ඇති නොවෙයි. ධර්ම සංකල්පනාව නිසා ධර්ම සංඥාව ඇති නොවෙයි. ධර්ම සංඥාව නිසා ධර්ම ධාතු තොමෝ ඇති නොවන්නීය.

**10.** "මහණෙනි, මෙසේ වනාහි ධාතූන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංඥාවන්ගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇතිවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇතිවෙයි. ස්පර්ශයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇතිවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ඡන්දයාගේ නානත්වය ඇතිවෙයි. ඡන්දයාගේ නානත්වය නිසා පරිදාහයාගේ නානත්වය ඇතිවෙයි. පරිදාහයාගේ නානත්වය නිසා පරියේසනයාගේ නානත්වය ඇතිවෙයි. පරියේසනයාගේ නානත්වය නිසා ලාභයාගේ නානත්වය ඇති වෙයි.

"ලාභ නානත්වය නිසා පරියේසන නානත්වය ඇති නොවෙයි. පරියේසන නානත්වය නිසා පරිළාභ නානත්වය ඇති නොවෙයි. පරිළාභ නානත්වය නිසා ඡන්ද නානත්වය ඇතිනොවෙයි. ඡන්දයාගේ නානත්වය නිසා වේදනාවන්ගේ නානත්වය ඇති නොවෙයි. වේදනාවන්ගේ නානත්වය නිසා ස්පර්ශයාගේ නානත්වය ඇති නොවෙයි. ස්පර්ශයාගේ නානත්වය නිසා සංකල්පනාවන්ගේ නානත්වය ඇති නොවෙයි. සංකල්පනාවන්ගේ නානත්වය නිසා සංඥාවන්ගේ නානත්වය ඇති නොවේ. සංඥාවන්ගේ නානත්වය නිසා ධාතූන්ගේ නානත්වය ඇති නොවෙයි."

**(දසවන නෝඵස්ස සූත්‍රය නිමි.)**

---

**පළමුවන නානත්ත වර්ගය නිමි.**

---

(ධාතු සූත්‍රයද, සම්ඵස්ස සූත්‍රයද, මෙය නො සමග ගෙන, නොඵස්ස සූත්‍රයද, අන්‍යවූ වේදනා සූත්‍රය සහ නො වේදනා සූත්‍රය යන දෙකද සමග මේ පස අද්ධ්‍යාත්මික පඤ්චකයයි (දත යුතුයි.)

එසේම ධාතු සූත්‍රයද, සඤ්ඤා සූත්‍රයද මෙය නො සමග ගෙන, නොසඤ්ඤා සූත්‍රයද, අන්‍යවූ, ඵස්ස සූත්‍රය සහ නොඵස්ස සූත්‍රයයන් දෙකද සමග මේ පස බාහිර පඤ්චකයයි (දත යුතුයි.)

---

## 2. සත්තධාතු වර්ගය.

### 1. සත්තිම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

"ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ ධාතූහු සත්දෙනෙක් වෙති. ඒ ධාතු තුමූ කවරේද? ආභාධාතුව (ආලෝක කසිණයෙන් උපදවා ගත් ධ්‍යානය) සුභා ධාතුව, (සුභකසිණයන් ගෙන් උපදවාගත් ධ්‍යානය) ආකාසානඤ්චායතන ධාතුව, විඤ්ඤාණඤ්චායතන ධාතුව, ආකිඤ්චඤ්ඤායතන ධාතුව, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන ධාතුව සහ සඤ්ඤාවෙදයිත නිරෝධ ධාතුවයි. මහණෙනි, මොවුහු වනාහි සත්ත ධාතූහු නම් වෙත්.

3. මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, යම් මේ ආභාධාතුවක් වේද, යම් සුභාධාතුවක් වේද, යම් ආකාසානඤ්චායතන ධාතුවක් වේද, මේ යම් විඤ්ඤාණඤ්චායතන ධාතුවක් වේද, යම් මේ ආකිඤ්චඤ්ඤායතන ධාතුවක් වේද, යම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුවක් වේද, යම් සඤ්ඤාවේදයිත නිරෝධ ධාතුවක් වේද, ස්වාමීනි, මේ ධාතූහු වනාහි කුමක් නිසා ප්‍රකට වෙත්ද"?

4. "මහණ, යම් මේ ආභාධාතුවක් වේද, මේ ධාතුව අන්ධකාරය නිසා ප්‍රකට වෙයි. මහණ, යම් මේ සුභාධාතුවක් වේද, මේ ධාතුව අසුභය නිසා ප්‍රකට වෙයි. මහණ, යම් මේ ආකාසානඤ්ඤායතන ධාතුවක් වේද, මේ ධාතුව රූපය නිසා ප්‍රකට වෙයි."

"මහණ, යම් මේ විඤ්ඤාණඤ්චායතන ධාතුවක් වේද, මේ ධාතුව ආකාසානඤ්චායතනය නිසා ප්‍රකට වෙයි. මහණ, යම් මේ ආකිඤ්චඤ්ඤායතන ධාතුවක් වේද, මේ ධාතුව විඤ්ඤාණඤ්චායතනය නිසා ප්‍රකට වෙයි.

"මහණ, යම් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුවක් වේද, මේ ධාතුව ආකිඤ්චඤ්ඤායතනය නිසා ප්‍රකට වෙයි. මහණ, යම් මේ සඤ්ඤාවේදයිත නිරෝධ ධාතුවක් වේද, මේ ධාතුව නිරෝධය (නොපැවැත්ම) නිසා ප්‍රකට වෙයි.

**5.** "ස්වාමීනි, යම් මේ ආභාධාතුවක් වේද, යම් සුභා ධාතුවක් වේද, යම් ආකාසානඤ්චායතන ධාතුවක් වේද, යම් විඤ්ඤාණඤ්චායතන ධාතුවක් වේද, යම් ආකිඤ්චඤ්ඤායතන ධාතුවක් වේද, යම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුවක් වේද, යම් සඤ්ඤාවේදයිත නිරෝධ ධාතුවක් වේද, ස්වාමීනි, මේ ධාතූන්ට වනාහි කවර සමාපත්තියක් වශයෙන් පැමිණිය යුත්තේද"?

"මහණ, යම් මේ ආභාධාතුවක් වේද, යම් සුභාධාතුවක් වේද, යම් ආකාසානඤ්චායතන ධාතුවක් වේද, යම් විඤ්ඤාණඤ්චායතන ධාතුවක් වේද, යම් ආකිඤ්චඤ්ඤායතන ධාතුවක් වේද, මේ ධාතූන්ට සඤ්ඤාසමාපත්ති වශයෙන් පැමිණිය යුත්තේය.

"මහණ, යම් මේ නේවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුවක් වේද, මේ ධාතුවට සංඛාරාවසේස සමාපත්ති වශයෙන් පැමිණිය යුත්තේය.

"මහණ, යම් මේ සඤ්ඤාවේදයිත නිරෝධ ධාතුවක් වේද, මේ ධාතුවට නිරෝධ සමාපත්ති වශයෙන් පැමිණිය යුත්තේය.

**(පළමුවෙනි සත්තිම සූත්‍රය නිමි.)**

---

## 2. සනිදාන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** මහණෙනි, කාම විතර්කය හේතු සහිතව උපදී, හේතු රහිතව නූපදී. ව්‍යාපාද විතර්කය හේතු සහිතව උපදී. හේතු

රහිතව නූපදී. විහිංසා විතර්කය හේතු සහිතව උපදී. හේතු රහිතව නූපදී.

3. "මහණෙනි, කෙසේ නම් කාම විතර්කය හේතු සහිතව උපදීද? හේතු රහිතව නූපදීද? ව්‍යාපාද විතර්කය හේතු සහිතව උපදීද? හේතු රහිතව නූපදීද? විහිංසා විතර්කය හේතු සහිතව උපදීද? හේතු රහිතව නූපදීද"?

"මහණෙනි, කාම ධාතුන් නිසා කාම සංඥාව උපදී. කාම සංඥාව නිසා කාම සංකල්පනාව උපදී. කාම සංකල්පනාව නිසා කාමච්ඡන්දය උපදී, කාමච්ඡන්දය නිසා කාම පරිදාහය (කාම දැවිල්ල) උපදී, කාමපරිදාහය නිසා කාම පරියේසනය (කම්සැප සෙවීම) උපදී. මහණෙනි, කාම පරියේසනය (කම්සැප සෙවීම) කරන්නාවූ, අශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් නැති) පෘථග්ජන තෙම, කයින්, වචනයෙන් සහ මනසින් යන තුන් තැනින්, වරදවා පිළිපදියි.

4. "මහණෙනි, ව්‍යාපාද ධාතුව නිසා ව්‍යාපාද සංඥාව උපදී, ව්‍යාපාද සංඥාව නිසා ව්‍යාපාද සංකල්පනාව උපදියි. ව්‍යාපාද සංකල්පනාව නිසා ව්‍යාපාදච්ඡන්දය උපදියි. ව්‍යාපාදච්ඡන්දය නිසා ව්‍යාපාද පරිදාහය උපදියි. ව්‍යාපාද පරිදාහය නිසා ව්‍යාපාද පරියේසනය උපදී. මහණෙනි, ව්‍යාපාද පරියේසනය කරන්නාවූ, අශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් නැති) පෘථග්ජන තෙම කයින්, වචනයෙන් සහ මනසින් යන තුන් තැනින් වරදවා පිළිපදියි.

5. "මහණෙනි, විහිංසා ධාතුව නිසා විහිංසා සංඥාව උපදී. විහිංසා සංඥාව නිසා විහිංසා සංකල්පනාව උපදියි. විහිංසා සංකල්පනාව නිසා විංහිසාච්ඡන්දය උපදියි. විහිංසාච්ඡන්දය නිසා විහිංසා පරිදාහය උපදියි. විහිංසා පරිදාහය නිසා විහිංසා පරියේසනය උපදියි. මහණෙනි, විහිංසා පරියේසනය කරන්නාවූ, අශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් නැති) පෘථග්ජන තෙම කයින් වචනයෙන් සහ මනසින් යන තුන් තැනින් වරදවා පිළිපදියි.

**6.** "මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් ඇවුළුනු තණකුලක් වියලුනු තණ ගොඩක දමන්නේද, ඉදින් අතින් හෝ පයින් හෝ වහාම නොනිවන්නේ නම් මහණෙනි, එකල්හි වනාහි තෘණ කෘෂ්ටයන් (තණකොළ සහ ලීදඬු) ඇසුරු කළාවූ යම් ප්‍රාණීහු වෙත්ද, ඔවුහු විනාශයට පැමිණෙන්නාහුය.

**7.** "මහණෙනි, එසේම වනාහි යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ උපන්නාවූ, රාගාදියෙන් විෂමවූ අකුසල සංඥාව වහාම අත් නොහරියිද, දුරු නොකෙරෙයිද, නැති නො කෙරෙයිද, අභාවයට පත් නොකෙරෙයිද? හෙතෙම මේ ආත්මයෙහිම දුක් සහිතව විනාශ සහිතව, වෙහෙස සහිතව, දැවීම් සහිතව වාසය කෙරෙයි. කය බිඳීමෙන් මරණින් මතු දුර්ගතිය කැමැති විය යුතුයි.

**8.** "මහණෙනි, නෛෂ්ක්‍රම්‍ය විතර්කය හේතු සහිතව උපදියි. හේතු රහිතව නූපදියි. අව්‍යාපාද විතර්කය හේතු සහිතව උපදියි. හේතු රහිතව නූපදියි. අවිහිංසා විතර්කය හේතු සහිතව උපදියි. හේතු රහිතව නූපදියි.

"මහණෙනි, කෙසේ නම් හේතු සහිතව නෙක්ඛම්ම විතර්කය උපදීද? හේතු රහිතව නූපදීද? අව්‍යාපාද විතර්කය හේතු සහිතව උපදීද? හේතු රහිතව නූපදීද? අවිහිංසා විතර්කය හේතු සහිතව උපදීද? හේතු රහිතව නූපදීද?

"මහණෙනි, නෙක්ඛම්ම ධාතුව නිසා නෙක්ඛම්ම සංඥාව උපදියි. නෙක්ඛම්ම සංඥාව නිසා නෙක්ඛම්ම සංකල්පනාව උපදියි. නෙක්ඛම්ම සංකල්පනාව නිසා නෙක්ඛම්ම ඡන්දය (කාමයෙන් වෙන්වීමේ කැමැත්ත) උපදී. නෙක්ඛම්ම ඡන්දය නිසා නෙක්ඛම්මපරිදාහය උපදී. නෙක්ඛම්ම පරිදාහය නිසා නෙක්ඛම්ම පරියේසනය උපදී. මහණෙනි, නෙක්ඛම්ම පරියේසනය කරනු ලබන්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම කයින් වචනයෙන් සහ සිතින් යන තුන් තැනින් මනාකොට පිළිපදියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "මහණෙනි, අව්‍යාපාද ධාතුව නිසා අව්‍යාපාද සංඥාව උපදී. අව්‍යාපාද සංඥාව නිසා අව්‍යාපාද සංකල්පනාව උපදියි. අව්‍යාපාද සංකල්පනාව නිසා අව්‍යාපාදච්ඡන්දය උපදියි. අව්‍යාපාදච්ඡන්දය නිසා අව්‍යාපාද පරිදාහය උපදියි. අව්‍යාපාද පරිදාහය නිසා අව්‍යාපාද පරියේසනය උපදී. මහණෙනි, අව්‍යාපාද පරියේසනය කරන්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම කයින්, වචනයෙන් සහ සිතින් යන තුන් තැනින් මනාකොට පිළිපදියි.

**10.** මහණෙනි, අවිහිංසා ධාතුව නිසා අවිහිංසා සංඥාව උපදී. අවිහිංසා සංඥාව නිසා අවිහිංසා සංකල්පනාව උපදියි. අවිහිංසා සංකල්පනාව නිසා අවිහිංසාච්ඡන්දය උපදියි. අවිහිංසාච්ඡන්දය නිසා අවිහිංසා පරිදාහය උපදියි. අවිහිංසා පරිදාහය නිසා අවිහිංසා පරියේසනය උපදී. මහණෙනි, අවිහිංසා පරියේසනය කරන්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම කයින්, වචනයෙන් සහ සිතින් යන තුන් තැනින් මනාකොට පිළිපදියි.

**11.** මහණෙනි, යම්සේ පුරුෂයෙක් වනාහි ඇවිලගත් තණහුලක් වියලුනු තණ ගොඩක දමන්නේද, ඒ මේ තණහුල අතින්ද, පයින්ද නිවන්නේ නම්, මහණෙනි, එකල්හි වනාහි තණකොළ ලී දඬු ඇසුරු කළාවූ යම් ප්‍රාණීහුවෙත්ද, ඔවුහු විනාශයට පත් නොවෙන්නාහුය.

**12.** මහණෙනි, එසේම වනාහි යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ උපන්නාවූ, රාගාදියෙන් විෂමවූ, අකුශල සංඥාව වහාම අත්හරියිද, දුරුකෙරෙයිද, නැති කෙරෙයිද, අභාවයට පමුණුවයිද, හෙතෙම මේ ආත්ම භාවයෙහිදීම සැපසේ වාසය කෙරෙයි. විනාශ නැතිව, වෙහෙස නැතිව, දැවීම් නැතිව වාසය කෙරෙයි. කය බිඳීමෙන් මරණින් පසු සුගතිය කැමැතිවිය යුතුයි.

**(දෙවෙනි සනිදාන සූත්‍රය නිමි.)**

---

## 3. ගිඤ්ජකාවසථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නෑයන් වාසය කරන කපිලවස්තු නගරයෙහි ගිඤ්ජකාවසථ නම් ස්ථානයෙහි වාසය කරන සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

2. "මහණෙනි, අධ්‍යාශය ධාතුව (අදහස) නිසා සංඥාව උපදියි. දෘෂ්ටිය උපදියි. විතර්කය උපදියි". මෙසේ දේශනා කළ කල්හි ආයුෂ්මත් සන්ධ කච්චායන තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, සම්මා සම්බුදු නොවූවන් කෙරෙහි සම්මා සම්බුදුන්ය යන යම් මේ දෘෂ්ටියක් වේද, ස්වාමීනි, මේ දෘෂ්ටිය වනාහි කුමක් නිසා ප්‍රකට වෙයිද?" "කච්චායනය, මේ අවිද්‍යා ධාතුව (මෝඩ අදහස) වනාහි මහත් වන්නීය. කච්චායනය, හීන අදහස නිසා හීනවූ, සංඥාව උපදියි. හීනවූ දෘෂ්ටිය, හීනවූ විතර්කය, හීනවූ චේතනාව, හීනවූ ප්‍රාර්ථනාව, හීනවූ කැමැත්ත, හීනවූ පුද්ගලයා, හීනවූ වචනය උපදියි. හීනවූ දෙයක් කියයි. දෙසයි. පණවයි. පිහිටුවයි. විවරණ කරයි. බෙදයි. නොගැඹුරු කෙරෙයි ඔහුගේ උත්පත්තිය හීනයයි, (පහත්යයි) කියමි.

3. "කච්චායනය, මද්ධ්‍යම අදහස නිසා මද්ධ්‍යමවූ සංඥාව උපදියි. මද්ධ්‍යමවූ දෘෂ්ටිය, මද්ධ්‍යමවූ විතර්කය, මද්ධ්‍යමවූ චේතනාව, මද්ධ්‍යමවූ ප්‍රාර්ථනාව, මද්ධ්‍යමවූ කැමැත්ත, මද්ධ්‍යමවූ පුද්ගලයා, මද්ධ්‍යමවූ වචනය උපදියි. මද්ධ්‍යමවූ දෙයක් කියයි. දේශනා කෙරෙයි. පණවයි. පිහිටුවයි. විවරණ කෙරෙයි බෙදයි. නොගැඹුරු කෙරෙයි. ඔහුගේ උත්පත්තිය මද්ධ්‍යමයයි කියමි.

4. "කච්චායනය, ප්‍රණීතවූ අදහස නිසා ප්‍රණීත (උසස්) සංඥාව උපදියි. ප්‍රණීත (උසස්) දෘෂ්ටිය, ප්‍රණීත (උසස්) විතර්කය, ප්‍රණීත (උසස්) චේතනාව, ප්‍රණීත (උසස්) ප්‍රාර්ථනාව, ප්‍රණීත (උසස්) කැමැත්ත, ප්‍රණීතවූ (උසස්) පුද්ගලයා, ප්‍රණීතවූ (උසස්)

වචනය උපදියි. ප්‍රණීතවූ (උසස්) දෙයක් කියයි. දේශනා කෙරෙයි. පණවයි පිහිටුවයි. විවරණ කෙරෙයි. බෙදයි. නොගැඹුරු කෙරෙයි. ඔහුගේ උත්පත්තිය ප්‍රණීතයයි කියමි.”

**(තුන්වෙනි ගිඤ්ජකාවසථ සූත්‍රය නිමි.)**

---

## 4. හීනාධිමුත්තික සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ධාතු (අදහස්) වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. හීන අදහස් ඇත්තාවූ සත්වයෝ හීන අදහස් ඇත්තාවූ, සත්වයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. “මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) හීන අදහස් ඇති සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගිවූහ. යහපත් අදහස් ඇති සත්වයෝ යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. “මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ, අදහස් වශයෙන්ම එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) හීන අදහස් ඇති සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. යහපත් අදහස් ඇති සත්වයෝ, යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

**5.** "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත් සමගි වෙත්. (කෙසේද?) හීන අදහස් ඇති සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්. යහපත් අදහස් ඇති සත්වයෝ, යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්."

**(සිව්වන හීනාධිමුත්තික සූත්‍රය නිමි.)**

---

## 5. චංකම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරවූ, ගිජ්ජකූට පර්වතයෙහි වැඩවසන සේක.

එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් මහා කස්සප ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් මන්තානිපුත්ත පුණ්ණ ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් උපාලි ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි. දේවදත්ත ස්ථවිර තෙමේද බොහෝ භික්ෂූන් හා සමග භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි සක්මන් කරයි.

**2.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ, ශාරිපුත්‍රයන් දක්නහුද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු මහත් ප්‍රඥා ඇත්තෝ වෙත්.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ, මහා මෞද්ගල්‍යායනයන් දක්නහුද?"

"එසේය. ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු මහත් ඍද්ධි ඇත්තෝ වෙත්.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ, මහා කාශ්‍යපයන් දක්නාහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු ධූතාංග ඇත්තෝ වෙත්.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ, අනුරුද්ධයන් දක්නහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු දිවැස් ඇත්තෝ වෙත්."

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ, මන්තානිපුත්ත පුණ්ණයන් දක්නහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු ධර්මකථිකයෝ වෙති.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ උපාලි දක්නහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු විනයධරයෝ වෙති."

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ ආනන්දයන් දක්නහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු බහුශ්‍රැතයෝ වෙති.

"මහණෙනි, තොපි බොහෝ භික්ෂූන් හා සමග සක්මන් කරන්නාවූ දේවදත්තයන් දක්නහුද?"

"එසේය ස්වාමීනි."

"මහණෙනි, මේ සියලු භික්ෂූහු පාප අදහස් ඇත්තෝ වෙත්."

**3.** "මහණෙනි, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්. යහපත් අදහස් ඇති සත්වයෝ යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්."

**4.** "මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන්ම සත්වයෝ එක් වූහ. සමගි වූහ. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගි වූහ. යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වූහ. සමගි වූහ.

**5.** "මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක් වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

**6.** "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක් වෙත්. සමගි වෙත්. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්. යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්.

**(පස්වන චංකම සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 6. සගාථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ හීන අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

"මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගි වූහ.

"මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

"මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක් වෙත්. සමගි වෙත්. හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

3. "මහණෙනි, යම්සේ වනාහි අසූචි අසූචි සමග එක්වේද, සමවේද, මූත්‍ර, මූත්‍ර සමග එක්වේද, සමවේද, කෙළ, කෙළ සමග එක්වේද, සමවේද, සැරව, සැරව සමග එක්වේද, සමවේද, ලේ, ලේ සමග එක්වේද, සමවේද, මහණෙනි, එසේම වනාහි අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත්. සමගි වෙත් හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්.

"මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගි වූහ. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගි වූහ.

"මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

"මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) හීන අදහස් ඇත්තාවූ සත්වයෝ, හීන අදහස් ඇති සත්වයන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

**4.** "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

"මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගි වූහ.

"මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක් වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

"මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත් සමගි වෙත්. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්.

**5.** මහණෙනි, යම්සේ වනාහි කිරි, කිරි සමග එක්වේද, සමවේද; තෙල්, තෙල් සමග එක්වේද, සමවේද, ගිතෙල්, ගිතෙල් සමග එක්වේද, සමවේද; මී, මී සමග එක්වේද, සමවේද; පැණි,

පැණි සමග එක්වේද, සමවේද; මහණෙනි, එසේම වනාහි අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

"මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක්වූහ. සමගිවූහ.

"මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇත්තාවූ සත්වයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

"මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) යහපත් අදහස් ඇත්තාවූ සත්වයෝ, යහපත් අදහස් ඇති සත්වයන් හා සමග එක් වෙත්. සමගි වෙත්. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. මෙය සුගතයන් වහන්සේ දේශනා කොට නැවතද, ශාස්තෘන් වහන්සේ ගාථාවන් දේශනා කළ සේක.

1. 'එක්ව වාසය කිරීමෙන් කෙලෙස් වනය උපදියි. තනිව විසීමෙන් කෙළෙස් වනය සිඳෙයි. කුඩා දැවයකට (ලී කඩකට) නැගී, යම්සේ මහ මුහුදෙහි කිඳාබසීද,

2. "එසේම පිරිසිදු ජීවිතයක් ගතකරන තැනැත්තේද, කුසීත පුද්ගලයා වෙතට පැමිණීම නිසා කිඳාබසී. එනිසා ඒ කුසීතවූ, හීන වීර්යය ඇති පුද්ගලයා දුරු කරන්නේය.

3. විවේකයෙන් යුක්තවූ, ආර්යවූ, නිවණ කරා යැවූ සිත් ඇත්තාවූ, ධ්‍යාන වඩන්නාවූ, නිතර පටන් ගන්නා ලද උත්සාහයෙන් යුක්තවූ, පණ්ඩිතයන් හා සමග වාසය කරන්නේය."

**(හයවෙනි සගාථ සූත්‍රය නිමි.)**

## 7. අස්සද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි, වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක් වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ, ශ්‍රද්ධා නැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් සමග එක්වෙත්. සමගිවෙත්. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූතැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් (බොහෝ ඇසූපිරූතැන් නැත්තන්) සමග එක්වෙත්. සමගි වෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. “මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වූහ. සමගි වූහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් (බොහෝ ඇසූපිරූතැන් නැත්තන්) හා සමග එක්වූහ. සමගිවූහ. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වූහ. සමගිවූහ. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. “මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව

නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. කුසිතයෝ කුසීතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය.

**5.** "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන්ම සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් සමග එක්වෙත්. සමගිවෙත් අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූතැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් සමග එක්වෙත්. සමගිවෙත්. කුසිතයෝ කුසිතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්.

**6.** "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක් වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද) ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පටන්ගත් වීර්ය ඇත්තෝ පටන්ගත් වීර්ය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

7. "මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ, සමගිවූහ. (කෙසේද?) ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජාව ඇත්තෝ ලජ්ජාව ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වූහ, සමගිවූහ. පටන්ගත් වීර්ය ඇත්තෝ පටන්ගත් වීර්යය ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වූහ, සමගිවූහ.

8. "මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද) ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පටන්ගත් වීර්ය ඇත්තෝ පටන්ගත් වීර්ය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

9. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. පටන්ගත් වීර්ය ඇත්තෝ පටන්ගත් වීර්ය ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගි

වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වෙත්, සමගි වෙත්.

(හත්වන අස්සද්ධා සූත්‍රය නිමි.)

---

## 8. අස්සද්ධමූලක 1 සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමග එක්වෙත්, සමගිවෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් සමග එක්වෙත්, සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගි වූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව

නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

**(8. අස්සද්ධමූලක 1 සූත්‍රය නිමි.)**

---

## 8. අස්සද්ධ මූලක සූත්‍රය 2.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් එක්වෙත්, සමගිවෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්,

සමගිවෙත්. පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමග එක්වෙත්, සමගිවෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් සමග එක්වෙත්, සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගි වූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වූහ. සමගිවූහ. බවට බිය ඇත්තෝ බවට බිය ඇත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පවට බිය ඇත්තන් පවට බිය ඇත්තන් සමග එක් වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග

එක්වෙත්. සමගිවෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වෙත් සමගි වෙත්.”

(8. අස්සද්ධ මූලක 2 සූත්‍රය නිමි.)

---

## 8. අස්සද්ධමූලක 3 සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්, සමගිවෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූතැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් සමග එක්වෙත්, සමගි වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමග එක්වෙත්, සමගි වෙත්. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් සමග එක් වෙත්, සමගි වෙත්.

3. “මහණෙනි, අතීත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ, සමගි වූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වූහ, සමගි වූහ, බහුශ්‍රැතයෝ, බහුශ්‍රැතයන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වූහ, සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත් අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක් වෙත්. සමගි වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් හා සමග එක්වෙත්. සමගි වෙත්."

**(8. අස්සද්ධමූලක 3 සූත්‍රය නිමි.)**

---

## 8. අස්සද්ධමූලක 4 සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් සමග එක් වෙත්. සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් සමග සමගිවෙත්, එක්වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමග එක්වෙත්. සමගිවෙත්. පටන්ගන්නාලද වීර්ය ඇත්තෝ පටන් ගන්නාලද වීර්ය ඇත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් සමග එක්වෙත්, සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ. පටන් ගන්නාලද වීර්ය ඇත්තෝ පටන් ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. කුසිතයෝ කුසීතයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පටන් ගන්නාලද වීර්ය ඇත්තෝ පටන් ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. කුසීතයෝ

කුසීතයින් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්. පටන් ගන්නාලද වීර්යය ඇත්තෝ පටන්ගන්නාලද වීර්යය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්.”

(8 අස්සද්ධමූලක සූත්‍රය 4 නිමි.)

---

## (8 අස්සද්ධමූලක 5 සූත්‍රය)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, අදහස් වශයෙන්, සත්වයෝ එක්වෙත්, සමගි වෙත්. ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් සමග එක්වෙත්, සමගි වෙත්. මුළා සිහි ඇත්තෝ, මුළා සිහි ඇත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් සමග එක්වෙත්, සමගි වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමග එක්වෙත්, සමගි වෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් සමග එක්වෙත්, සමගිවෙත්, ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් සමග එක්වෙත්, සමගිවෙත්.

3. “මහණෙනි, අතීත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ, සමගිවූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. මුළාසිහි

ඇත්තෝ මුළාසිහි ඇත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වූහ, සමගිවූහ. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ, සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තන් සමගි වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් හා සමග එක්වෙත්, සමගි වෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත් ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්, සමගිවෙත්.

**(8 අස්සද්ධමූලක සූත්‍රය 6 නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. අහිරිකමූලක සූත්‍රය 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් සමග එක්වෙත්, සමගි වෙත්. පවට බිය නැත්තෝ බවට බිය නැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥානැත්තන් සමග එක්වෙත්. සමගි වෙත්. හිරි (ලජ්ජා) ඇත්තෝ ලජ්ජා ඇත්තන් සමග එක්වෙත්, සමගි වෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයන් සමග එක්වෙත්, සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ, සමගිවූහ. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වූහ, සමගි වූහ, ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග සමගි වූහ, එක් වූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ, සමගි වූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය සමගි වන්නාහුය. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ලජ්ජා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

**5.** "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත් පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්."

**(9. අහිරිකමූලක 1 සූත්‍රය නිමි.)**

## 9. අහිරිකමූලක සූත්‍රය 2

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. (එහිදී) භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, අදහස් වශයෙන්, සත්වයෝ එක්වෙත්, සමගිවෙත්. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූ පිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් සමග එක්වෙත්, සමගි වෙත්.

ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක් වෙත්. සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ, සමගි වූහ. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වූහ, සමගි වූහ, ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගි වූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක් වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. අල්පශ්‍රැතයෝ අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමගිවෙත්. ප්‍රඥා ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්."

(9 අහිරිකමූලක 2 සූත්‍රය නිමි.)

---

## 9 අහිරිකමූලක සූත්‍රය 3

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක් වෙත් සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්, ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පටන්ගන්නාලද වීර්ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්, සමගි වෙත්.

**3.** "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. පටන් ගන්නාලද වීර්ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්යය ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ, සමගි වූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. කුසීතයෝ කුසීතයන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය පටන්ගන්නාද වීර්ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක් වෙත්, සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පටන් ගන්නා ලද වීර්ය ඇත්තෝ පටන් ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(9 අහිරිකමූලක සූත්‍රය නිමි.)**

---

## 9. අහිරිකමූලක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමිනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වෙත් සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ, ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. සිහිමුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත් (කෙසේද?) ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥානැත්තෝ

ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්.

(9 අහිරිකමූලක 4 සූත්‍රය නිමි)

---

## 10 අනොත්තප්පමූලක 1 සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ධාතු (අදහස්) වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. අල්ප ශ්‍රැතයෝ අල්ප ශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත් පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වෙත් සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක් වෙත්. සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් (බොහෝ ඇසූපිරූ තැන් නැත්තන්) හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ.

පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ, සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් (බොහෝ ඇසූවිරූ තැන් නැත්තන්) හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත් (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූවිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් (බොහෝ ඇසූවිරූ තැන් නැත්තන්) හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බහුශ්‍රැතයෝ බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්, සමගිවෙත්.

**(10- අනොත්තප්පමූලක සූත්‍රය 1 නිමි.)**

---

## 1 අනොත්තප්පමූලක සූත්‍රය 2

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත් පටන්ගන්නා ලද උත්සාහය ඇත්තෝ පටන්ගන්නා ලද උත්සාහය ඇත්තන් සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. “මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගි වූහ. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. පටන්ගන්නාලද උත්සාහය ඇත්තෝ පටන් ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා ඇත්තෝ ප්‍රඥා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. “මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පටන් ගන්නාලද උත්සාහය ඇත්තෝ පටන් ගන්නාලද උත්සාහය

ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පටන්ගන්නා ලද උත්සාහය ඇත්තෝ පටන් ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්.

(10 අනොත්තප්පමූලක 2 සූත්‍රය නිමි.)

---

## 10 අනොත්තප්පමූලක 3 සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහිඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥා වන්තයින් හා සමග එක්වෙත්, සමගි වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, අතීතකාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥා ඇත්තෝ ප්‍රඥා ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්, සමගිවෙත්. (කෙසේද?) පාපයට බිය නැත්තෝ පාපයට බිය නැත්තන් හා සමග එක් වෙත්, සමගිවෙත්. සිහිමුළාවූවෝ සිහිමුළාවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පාපයට බිය ඇත්තෝ පාපයට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹ සිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්, සමගිවෙත්.

(10 අනොත්තප්පමූලක 3 සූත්‍රය නිමි.)

---

## 11 අප්පස්සුත 1 සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූ පිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත් බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පටන්ගන්නා ලද වීර්‍ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්‍ය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**3.** "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වූහ. සමගිවූහ. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වූහ. සමගිවූහ. පටන්ගන්නා ලද වීර්‍ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්‍ය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ.

**4.** "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. කුසීතයෝ කුසීතයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. පටන්ගන්නාලද වීර්ය ඇත්තෝ පටන්ගන්නාලද වීර්ය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥානැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පටන්ගන්නාලද වීර්යය ඇත්තෝ පටන්ගන්නාලද වීර්යය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක් වෙත්. සමගිවෙත්.

**(11 අප්පස්සුත 1 සූත්‍රය නිමි.)**

---

## 11 අප්පස්සුත 2 සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් නැත්තෝ)

අල්පශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මුළාවූ සිහි ඇත්තෝ මුළාවූ සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹ සිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූ පිරූතැන් නැත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වූහ. සමගිවූහ. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වූහ. සමගිවූහ. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහිඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූතැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) අල්පශ්‍රැතයෝ (බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෝ) අල්පශ්‍රැතයන් හා සමග

එක්වෙත් සමගිවෙත්. සිහිමුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බහුශ්‍රැතයෝ (බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ) බහුශ්‍රැතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(11 අප්පස්සුත 2 සූත්‍රය නිමි.)**

---

## 12 කුසීත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. මුළා සිහි ඇත්තෝ මුළා සිහි ඇත්තන් හා සමග එක් වෙත්. සමගි වෙත්. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පටන්ගන්නාලද උත්සාහය ඇත්තෝ පටන්ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ. සමගිවූහ. (කෙසේද?) කුසීතයෝ කුසීතයන්

හා සමග එක්වූහ. සමගිවූහ. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. පටන්ගන්නාලද උත්සාහය ඇත්තෝ පටන්ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) කුසීතයෝ කුසීතයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රඥා නැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. පටන්ගන්නාලද උත්සාහය ඇත්තෝ පටන්ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) කුසීතයෝ කුසීතයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සිහි මුළාවූවෝ සිහි මුළාවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥානැත්තෝ ප්‍රඥා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පටන්ගන්නා ලද උත්සාහය ඇත්තෝ පටන්ගන්නාලද උත්සාහය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එළඹසිටි සිහි ඇත්තෝ එළඹසිටි සිහි ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාවන්තයෝ ප්‍රඥාවන්තයින් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(12 කුසීත සූත්‍රය නිමි.)**

(සත්තිම සූත්‍රයද, සනිදාන සූත්‍රයද, ගිඤ්ජකාවසථ සූත්‍රයද, හීනාධිමුක්තික සූත්‍රයද, චංකම සූත්‍රයද, සගාථ සූත්‍රයද, සත්වන අස්සද්ධා සූත්‍රයද, අස්සද්ධමූලක සූත්‍රයද, නොහොත් එනම් සූත්‍ර පසද, අහිරිකමූලක සූත්‍රයද, නොහොත් එනම් සූත්‍ර සතරද, අනොත්තප්පමූලක සූත්‍රයද, නොහොත් එනම් සූත්‍ර තුනද, අප්පස්සුත සූත්‍රයද, නොහොත් එනම් සූත්‍ර දෙකද, කුසීත සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දොළොසකි. නොහොත් සත්තිමාදී සතකි.

**අස්සද්ධමූලකාදී පසළොසකි.)**

(දෙවෙනි සත්තධාතු වර්ගය නිමි.)

---